"මහජන මුදලින් අධ්‍යාපනය ලැබූ අප
ලත් දැනුමෙන් රට දැය පෝෂණය කරමු"

# ලොව දිනූ චරිත
# 5



ජාත්‍යන්තර අධ්‍යයනය අධ්‍යනාංශය
කැලණිය විශ්වවිද්‍යාලය

වෙළුම 5 මුද්‍රණය 1 ජූලි 2023

# ලොව දිනූ චරිත

ජාත්‍යන්තර අධ්‍යයනය අධ්‍යයනාංශය

කැලණිය විශ්වවිද්‍යාලය

ශ්‍රී ලංකාව

# හැඳින්වීම

වර්තමාන ජාත්‍යන්තර දේශපාලනය තුළ උතුරු ඇමරිකා මහාද්වීපයට හිමිවන්නේ ඉතා සුවිශේෂී ස්ථානයකි. ලෝකයේ අනෙකුත් රාජ්‍යයන් සමග සැසඳීමේ දී ඇමරිකා එක්සත් ජනපදය හා කැනඩාව වැනි උතුරු ඇමරිකානු රාජ්‍යයන් ස්වාධීන රාජ්‍යයන් ලෙස නැගී සිටින්නේ මෑත ඉතිහාසය තුළය. කෙසේ වෙතත්, ඉතා කෙටි කාල සීමාවක් තුළ බලවත් රාජ්‍යයන් බවට මෙම රාජ්‍යයන් පත්ව ඇත. උදාහරණයකට, වර්ෂ 1776 දී ස්වාධීන රාජ්‍යයක් බවට පත්වන ඇමරිකා එක්සත් ජනපදය දෙවන ලෝක යුද්ධය අවසාන වන විට ලොව සුපිරි බලවතෙකු බවට පත්විය. කෙටි කාල සීමාවක දී ජාත්‍යන්තර දේශපාලනය තුළ මෙම රාජ්‍යයන් ආර්ථික, දේශපාලනික වශයෙන් මෙන්ම හමුදා බලය අතින් ද ප්‍රබල ස්ථානයකට පත් වීම සරල කාරණයක් නොවේ. මෙහි දී, විශේෂයෙන් සඳහන් කළ යුතු තවත් කාරණයක් වන්නේ, මෙම රාජ්‍යයන් බහු ආගමික, බහු ජනවාර්ගික හා බහු සංස්කෘතික රාජ්‍යයන් වීමයි. මෙසේ විවිධත්වයකින් යුතු ජන කොට්ඨාසයන් පොදු අරමුණක් වෙනුවෙන් ඒකරාශී කර ගැනීම අපහසු කර්තව්‍යයකි.

තවද, මෙම රාජ්‍යයන් දෙකම ඉතා විශාල භූමි ප්‍රදේශයක් පුරා විසිරී පැතිරී ඇති රාජ්‍යයන්ය. අතීතයේ ජාත්‍යන්තර දේශපාලනය පිළිබඳව සැලකීමේ දී කලක් අධිරාජ්‍යයන් ලෙස පැවති ඉතා බලවත් රාජ්‍යයන් කෙටි කාලයක් තුළ බිඳ වැටීමට හේතු වූ ප්‍රධාන කාරණයක් වූයේ, විශාල භූගෝලීය වපසරියක ජීවත් වන බහු වාර්ගික ජනතාවක් නිශ්චිත අරමුණක් වෙනුවෙන් පෙළගස්වා ගැනීමේ දුෂ්කරතාවයයි. කෙසේ වෙතත්, ඇමරිකා එක්සත් ජනපදය මෙන්ම කැනඩාව ද මෙම අභියෝගය සාර්ථකව ජයගෙන ඇති බව පැහැදිලිය. මෙම සාර්ථකත්වයට හේතු වූ ප්‍රධාන කාරණය වන්නේ, නිවැරදි දැක්මක් සහිත නායකත්වයයි. ''ලොව දිනූ චරිත-5'' කෘතිය තුළින් අවධානය යොමු කරනු ලබන්නේ මෙම නායකත්වය පිළිබඳවයි. මෙහි දී ඉතා දුෂ්කර කාල සීමා තුළ තම ජනතාවගේ අවශ්‍යතාවයන් සපුරමින් තම රාජ්‍යයන් ස්ථාවර හා දියුණු ආර්ථිකයන් බවට පත් කිරීම සඳහා දැඩි කැපවීමෙන් කටයුතු කළ ඇමරිකානු හා කැනේඩියානු රාජ්‍ය නායකයන් පිළිබඳ අවධානය යොමු කරනු ලබයි.

මෙම කෘතිය තුළින් ජෝර්ජ් වොෂින්ටන්, තෝමස් ජෙෆර්සන්, ජේම්ස් මොන්රෝ, වුඩ්රෝ විල්සන්, රිචඩ් නික්සන්, ජිමී කාටර්, රොනල්ඩ් රේගන්, බිල් ක්ලින්ටන්,

ඩොනල්ඩ් ට්‍රම්ප්, ලෙස්ටර් බෝල්ස් පියර්සන්, පියෑර් තෘඩෝ, ස්ටීවන් හාපර් යන රාජ්‍ය නායකයින්ගේ ළමා කාලය, අධ්‍යාපනය හා දේශපාලනයට පිවිසීම, නායකත්වය කරා ගිය ගමන්මග, නායකත්වයට පැමිණීමෙන් පසු සිදු කළ සේවාව, විදේශ ප්‍රතිපත්තිය මෙන්ම ඔවුන්ගේ චරිත තුළින් උගත හැකි ආදර්ශ පිළිබඳව සාකච්ඡා කෙරේ.



## කැලණිය විශ්වවිද්‍යාලයීය උපකුලපතිතුමියගේ පණිවිඩය

ගෝලීයකරණයත් සමඟම විශ්වීය සංකල්පය තුළ සීමා මායිම් පුළුල් වූ අතර, එම පුළුල් මාර්ගය ඔස්සේ යමින් සිය දැනුම අධ්‍යයන ක්ෂේත්‍රය තුළ බෙදාහැරීම විශ්වවිද්‍යාල ප්‍රජාව සතු වගකීමකි. එම වගකීම කැලණිය විශ්වවිද්‍යාල ජාත්‍යන්තර අධ්‍යයන අධ්‍යයනාංශය මඟින් පස්වන වරටත් එළි දක්වන “ලොව දිනූ චරිත” නැමැති නිර්මාණාත්මක හා විශ්ලේෂණාත්මක ග්‍රන්ථ සංග්‍රහය ඔස්සේ මනාව ඉටු කරන බව පෙනී යයි. මේ හරහා විද්‍යාර්ථීන්ගේ දැනුම මනාව ඔප් නංවනු වස් ගෝලීය ඉතිහාසයේ ශ්‍රේෂ්ඨ නායකත්වයන් සම්බන්ධ චරිතාපදානයන් නිරූපණය කිරීම සුවිශේෂීත්වයකි.

මෙය විද්‍යාර්ථීන්ගේ දැනුම, ආකල්ප, කුසලතා මෙන්ම නිර්මාණශීලීත්වය ද මනා ලෙස සංවර්ධනය කිරීමට හා පෝෂණය කිරීමට විශාල දායකත්වයක් සපයන අතර ම අධ්‍යයන විෂයන්ගෙන් පරිබාහිර දැනුම ගවේෂණයට ද දැවැන්ත රුකුලක් සම්පාදනය කරයි. එමෙන්ම විශ්වවිද්‍යාල ප්‍රජාව තුළ නායකත්ව ලක්ෂණ ඔප් නැංවීමට මහඟු පිටුවහලක් සපයන අතර විශ්වීය දැනුමෙන් ස්වයංපෝෂිත අනාගත පරපුරක් බිහි කිරීමට මෙම ග්‍රන්ථ සංග්‍රහය මංපෙත් විවර කරයි.

මේ සඳහා සිය කාලය හා ශ්‍රමය කැප කරමින් නිසි මඟ පෙන්වූ අපගේ ආචාර්ය මණ්ඩලයටත්, ජාත්‍යන්තර අධ්‍යයන අධ්‍යයනාංශයේ ශිෂ්‍ය සංසදයටත්, අධ්‍යයන අංශයේ විද්‍යාර්ථීන්ට හා කාර්ය මණ්ඩලයටත් ස්තුතිය පුදකර සිටිමි. මෙම වටිනා කටයුත්ත වසරක් පාසා අඛණ්ඩව සිදුකරගෙන යාමට හැකි වේවායි සුභාශිංසන පිරිනමමි.

**ජ්‍යෙෂ්ඨ මහාචාර්ය නිලන්ති ද සිල්වා**
**උපකුලපති**
**කැලණිය විශ්වවිද්‍යාලය**



## කැලණිය විශ්වවිද්‍යාලයීය සමාජීය විද්‍යා පීඨයේ පීඨාධිපතිතුමන්ගේ පණිවිඩය

කැලණිය විශ්වවිද්‍යාලයේ ජාත්‍යන්තර අධ්‍යයන අංශය මඟින් ලොව දිනූ චරිත නමින් ලිපි සංග්‍රහයක් වාර්ෂිකව එළි දක්වනු ලබයි. මෙවර එළිදක්වනු ලබන කලාපය විශ්ව කීර්තියට හා විශ්ව සම්භාවනාවට පාත්‍ර වූ පුද්ගලයන්ගේ චරිතාපදාන කිහිපයක් මූලික කොටගෙන සම්පාදනය කොට ඇත.

ශ්‍රී ලංකාවේ රාජ්‍ය විශ්වවිද්‍යාලවල අධ්‍යයනය ලබන විද්‍යාර්ථීන්ගේ ආත්ම විශ්වාසය, නිර්මාණශීලීත්වය, රසාස්වාදය වැනි වැදගත් ගුණාංග වර්ධනය කර ගැනීම පිණිස මෙවැනි චරිතාපදාන කියවීම් ඉතාමත් වැදගත් බව පෙන්වා දිය හැකිය. එමගින් එම චරිත පිළිබඳව මනා අධ්‍යයනයකින් විද්‍යාර්ථීන්ගේ අනාගතය සඳහා ලබා ගත හැකි ආදර්ශ බොහෝමයක් වේ.

ජාත්‍යන්තර අධ්‍යයන අංශය විසින් එළිදක්වනු ලබන මෙම ලිපි සංග්‍රහය සම්පාදනය කිරීමේදී ඒ සඳහා දායකත්වය ලබා දුන් අධ්‍යයන අංශයේ ආචාර්ය මණ්ඩලයටත්, එම අධ්‍යයන අධ්‍යයනාංශයේ ශිෂ්‍ය සංසදයේ සාමාජික සාමාජිකාවන්ටත්, විද්‍යාර්ථීන්ට හා කාර්යය මණ්ඩලයටත් මාගේ සුභාශිංසන පුද කර සිටිමි.

**මහාචාර්ය එම්. එම්. ගුණතිලක**
**පීඨාධිපති**
**සමාජීය විද්‍යා පීඨය**
**කැලණිය විශ්වවිද්‍යාලය**



## කැලණිය විශ්වවිද්‍යාලයීය ජාත්‍යන්තර අධ්‍යයනය අධ්‍යයනාංශයේ අංශාධිපතිතුමාගේ පණිවිඩය

අධ්‍යයන විෂයට පමණක් සීමා නොවී යහපත් ආකල්ප සහ කුසලතාවයන්ගෙන් පරිපූර්ණ විද්‍යාර්ථයින් බිහිකිරීම නූතන උසස් අධ්‍යාපනයේ කේන්ද්‍රීය අභිලාසයකි. ඒ බව මනාව ප්‍රකට කරමින් කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජීය විද්‍යාපීඨයේ ජාත්‍යන්තර අධ්‍යයන අධ්‍යයනාංශයේ විද්‍යාර්ථීන් විසින් වාර්ෂිකව එළි දක්වනු ලබන "ලොව දිනූ චරිත" ග්‍රන්ථ සංග්‍රහය පස්වන වරටත් එළි දැක්වීමට හැකිවීම පිළිබඳව මාගේ සතුට ප්‍රකාශ කර සිටිමි.

මෙම ග්‍රන්ථ සංග්‍රහයේ මෙවර තේමාව වී ඇත්තේ ඇමරිකා එක්සත් ජනපදයෙන් හා කැනඩාවෙන් බිහිවූ චිත්තාකර්ෂණීය නායකයන්ගේ චරිතාපදාන ඔස්සේ, ඔවුන් සිය නායකත්වය කරා ගිය ගමන් මඟ හා සිය නායකත්වය ලෝකය ඉදිරියේ මෙහෙය වූ ආකාරයයි. විශ්වවිද්‍යාල ප්‍රජාව වෙත මෙම මාහැඟි දැනුම් දොරටුව විවර කිරීම හා ඒ ඔස්සේ සිය නායකත්ව ලක්ෂණ හා කුසලතාවයන් වර්ධනය කරගැනීමට උපකාරී වීම මෙහි ප්‍රධාන අපේක්ෂාව වී ඇත.

මෙම විශ්ලේෂණාත්මක ග්‍රන්ථ සංග්‍රහය සාර්ථක ලෙස මෙවර එළිදැක්වීමට කාලය හා ශ්‍රමය කැප කරමින් සිය සහයෝගය නොමදව ලබා දුන් අපගේ ආචාර්ය මණ්ඩලයටත්, ජාත්‍යනායන්තර අධ්‍යයන අධ්‍යයනාංශයේ ශිෂ්‍ය සංසදයේ සාමාජික සාමාජිකාවන්ට හා කාර්යය මණ්ඩලයටත් හදපිරි ප්‍රශංසා පිරිනමන අතර වාර්ෂිකව සිදුකරන මෙම මාහැඟි කර්තව්‍යය ඉදිරියටත් අඛණ්ඩව සිදුකරගෙන යාමට ශක්තිය හා ධෛර්යය ලැබේවායි ප්‍රාර්ථනා කරමි.

**ආචාර්ය චාමින්ද අබේසිංහ**
**අංශ ප්‍රධාන**
**ජාත්‍යන්තර අධ්‍යයනය අධ්‍යයනාංශය**
**කැලණිය විශ්වවිද්‍යාලය**

# කර්තෘ මණ්ඩලය

ප්‍රධාන සංස්කාරක

- ආචාර්ය චාමින්ද අබේසිංහ
- කථිකාචාර්ය හෂාන් විරාජ් විජේසිංහ

සංස්කාරක

- හිමේෂ රන්දිල්
- දුලාංජලී ජයසූරිය

සහය සංස්කාරක

- වෙනුරි බණ්ඩාර
- ඕනෙල්කා දසානායක
- ජනිත් ප්‍රමෝදය සෝමරත්න
- චමල්කා දුලාංජලී ජයවර්ධන
- දුලක්ෂි හේරත්

නිර්මාණ සංකල්පය හා මෙහෙයවීම

- ලක්ෂ්මන් ප්‍රනාන්දු (බාහිර කථිකාචාර්ය)

පිටකවර නිර්මාණය

- විනුලි පෙරේරා

# පටුන

1. ජෝර්ජ් වොෂින්ටන්

2. තෝමස් ජෙෆර්සන්

3. ජේම්ස් මොන්රෝ

4. වුඩ්රෝ විල්සන්

5. රිචඩ් නික්සන්

6. ජිමී කාටර්

7. රොනල්ඩ් රේගන්

8. බිල් ක්ලින්ටන්

9. ඩොනල්ඩ් ට්‍රම්ප්

10. ලෙස්ටර් බෝල්ස් පියර්සන්

11. පියෑර් තෲඩෝ


12. ස්ටීවන් හාපර්

# පෙළගැස්ම

මෙම කෘතියේ ඇතුළත් සියලුම ලිපි පොදු ආකෘතියක් යටතේ පෙළගස්වා ඇත. එම ආකෘතිය පහත පරිදි වේ:

- හැඳින්වීම
- ළමා කාලය, අධ්‍යාපනය හා දේශපාලනයට පිවිසීම
- නායකත්වය කරා ගිය ගමන් මඟ
- නායකත්වයට පැමිණීමෙන් පසු සිදුකළ සේවාව
- විදේශ ප්‍රතිපත්තිය
- ගත හැකි ආදර්ශ
- සාරාංශය

# ජෝර්ජ් වොෂින්ටන් (George Washington)



**කණ්ඩායම් සාමාජිකයන්**

- ඒ. එම්. ඒ. එස්. අත්තනායක
- කේ. එම්. ආර්. බී. හඳුන්සූරිය
- කේ. එස්. යූ. ශ්‍රේරෝ
- එල්. එස්. ඒ. ඒ. දිල්රුක්ෂි
- එම්. මදුෂි ලක්රුවිනි

# හැඳින්වීම

ඇමරිකා එක්සත් ජනපදයේ පළමු ජනාධිපති වූ ජෝර්ජ් වොෂින්ටන්, බොහෝ විට ඇමරිකා එක්සත් ජනපදයේ පියා ලෙස හඳුන්වනු ලබන්නේ, රට පිහිටුවීමේ දී ඔහු ඉටු කළ මහඟු කාර්යභාරය නිසාවෙනි. ඔහු ඇමරිකා එක්සත් ජනපදය තුළ බිහිවූ දූරදර්ශී නායකයෙකු ලෙස හඳුන්වා දිය හැකිය. දූරදර්ශී නායකයෙකුගේ ප්‍රධාන ලක්ෂණ තුන නම්, ඉතා පැහැදිලි දුරදිග යන දැක්මක් තිබීම, අන් අයව ඔහු අනුගමනය කිරීමට ආකර්ෂණය කර ගැනීමේ හැකියාව සහ දර්ශනය සාක්ෂාත් කර ගැනීමේ පදනම නිර්මාණය කිරීමේ කුසලතාවය පිහිටා තිබීමයි. ජෝර්ජ් වොෂින්ටන්, දූරදර්ශී නායකයෙකුගේ ත්‍රිත්ව ලක්ෂණ සම්පූර්ණයෙන් පෙන්නුම් කළ අතර, එමඟින් ඔහු එක්සත් ජනපදයේ නව රාජ්‍යය ගොඩනඟන නායකත්වයේ උත්තරීතර දක්ෂයා ලෙස ප්‍රකාශ කළ හැකිය.

ඔහු කොන්ටිනෙන්ටල් හමුදාවේ (Continental Army) ප්‍රධානියා ලෙස ඇමරිකානු නිදහස් සටනේ සේවය කළ අතර, ඔහුගේ හමුදා සහ දේශපාලන නායකත්වය යටතේ 1783 දී මහා බ්‍රිතාන්‍යයෙන් ඔවුන් නිල වශයෙන් නිදහස ලබා ගත්හ. ඔහුව අණදෙන නිලධාරියා ලෙස නම් කිරීමට හේතු කිහිපයක් තිබුණි. එනම්, ඔහු යටත් විජිතවල මෙතෙක් කලකට සිටි හොඳම හමුදා නිලධාරියා වීමයි. ඔහු ඇමරිකාවේ දකුණු ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වූ අතර ඔහුට සියලු යටත්විජිතවල හමුදාවන් එක්සත් කළ හැකි බව බොහෝ නියෝජිතයෝ විශ්වාස කළහ. ඔහු ධනවත් මිනිසෙක් වූ අතර, නිර්භීත, අධිෂ්ඨානශීලී සහ දක්ෂ නායකයෙකු ලෙස බොහෝ දෙනා පිළිගත්හ. බොහෝ ඉතිහාසඥයින් විසින් පවා පිළිගත් තවත් වැදගත් කරුණක් වූයේ, බ්‍රිතාන්‍ය සහ යටත්විජිත සබඳතා සම්බන්ධයෙන් ඔහුගේ අදහස් ප්‍රසිද්ධ වීමයි. මේ අයුරින් ඔහු ඇමරිකානු හමුදාව ජයග්‍රහණය කරා ගෙන ගිය අතර එක්සත් ජනපදය එහි නිදහස ලබා ගත්හ.

මැතිවරණ ඡන්දවලින් සියලුම ඡන්ද දිනා ගැනීමෙන් පසුව 1789 අප්‍රේල් 30 වන දින එක්සත් ජනපදයේ පළමු ජනාධිපති ලෙස, ජෝර්ජ් වොෂින්ටන් ජනාධිපති කාර්යාලයේ දිවුරුම් දුන්නේය. ඔහු අලුතින් නිදහස් වූ ජාතියේ නිදහස ආරක්ෂා කිරීම සහ රාජ්‍යයේ අනෙකුත් පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා මහඟු සේවයක් කළේය. තවද, ජනාධිපතිවරයාගේ කැබිනට් මණ්ඩලය නිර්මාණය කිරීම සහ විධායක වරප්‍රසාද තහවුරු කිරීම ඇතුළු ඔහුගේ අනුප්‍රාප්තිකයින්ට රාජ්‍යය පාලනය සඳහා මඟ පෙන්වූ පූර්වාදර්ශ රැසක් ඔහු ස්ථාපිත කළේය. තවද, ඔහු මධ්‍යස්ථ

විදේශ ප්‍රතිපත්තියක් සකස් කරමින් රාජ්‍යතාන්ත්‍රික හා දේශීය ගැටලු සම්බන්ධයෙන් විධායක අධිකාරිය ද පුළුල් කළේය. එසේම, ඇමරිකාව තුළ ජාතික බැංකුවක්, ශක්තිමත් මූල්‍ය පද්ධතියක් සහ ඵලදායී බදු ක්‍රමයක් ස්ථාපිත කිරීම සඳහා අඩිතාලම මොහු විසින් දමන ලදී. මේ ආකාරයෙන්, ඔහු අලුතින් නිදහස් වූ රට එක්සේසත් කිරීමටත්, ජාතිකත්වය පිළිබඳ නව හැඟීමක් රට තුළ ප්‍රවර්ධනය කිරීමටත් උත්සුක විය. මෙම දුරදර්ශී ක්‍රියාවන් තුළින් ඔහු, දීර්ඝකාලීන බලයට වඩා ප්‍රජාතන්ත්‍රවාදය සැම විටම උතුම් යන්න අනාගත පරපුරට පසක් කළේය. තවද, ඔහුගේ මුහුණ අදටත් සෑම එක්සත් ජනපද ඩොලර් බිල්පතකම හොවා දැක්වෙයි. එමගින් පුරවැසියන්ගේ ගෞරවය අදටත් ඔහු කෙරෙහි ඇතැයි යන්න නිගමනය කල හැකිය. එම නිසා, ජෝර්ජ් වොෂින්ටන් යනු, එවකට යටත්විජිත රාජ්‍යයක්ව පැවති ඇමෙරිකානු එක්සත් ජනපදය පිහිටුවීමේ සහ පාලනය කිරීමේ පළමු ශ්‍රේෂ්ඨ නායකයා ලෙස ලොවට හඳුන්වා දිය හැකිය.

එබැවින්, මෙම ලිපිය මගින් ජෝර්ජ් වොෂින්ටන්ගේ මුල් ජීවිතය, ළමා කාලය, නායකත්වයට පැමිණි පසු කළ සේවාව, ඔහුගේ විදේශ ප්‍රතිපත්තිය සහ අවසානයේදී ඔහුගේ චරිතයෙන් වර්තමානය සඳහා ගත හැකි ආදර්ශ පිළිබඳ සවිස්තරාත්මකව ගැඹුරු විශ්ලේෂණයක් ලබා ගැනීම ප්‍රධාන වශයෙන් අරමුණු කරයි.

## ළමා කාලය, අධ්‍යාපනය හා දේශපාලනයට පිවිසීම

එක්සත් ජනපදයේ පළමු ජනාධිපති ජෝර්ජ් වොෂින්ටන්, 1732 පෙබරවාරි 22 වන දින ජෝර්ජියාවේ (Georgia) වෙස්ට්මෝර්ලන්ඩ් (Westmoreland, Georgia) ප්‍රාන්තයේ උපත ලැබීය. ඔහු ඔගස්ටීන් වොෂින්ටන්ගේ (Augustine Washington) පුත්‍රයා විය. වොෂින්ටන්ගේ මව මේරි බෝල් වොෂින්ටන්ය (Mary Ball Washington). ඇය ඔගස්ටීන්ගේ දෙවන බිරිඳ වන අතර, පළමු බිරිඳ දරුවන් දෙදෙනකු බිහි කිරීමෙන් පසු මිය ගියාය. ඔහු තම ළමා කාලය ගත කළේ රැපහැනොක් (Rappahannock) තොටුපොළේය. තවද, කුඩා ජෝර්ජ් ජීවත් වූ සියලුම නිවාස සහ වතු නඩත්තු කරනු ලැබුවේ වහල් ශ්‍රමය මගිනි. ජෝර්ජ්ට වයස අවුරුදු 11 ක් වන විට ඔහුගේ පියා මිය ගියේය. පියා මිය ගිය පසු, ඔහුගේ දේපළවලින් වැඩි කොටසක් උරුම වූයේ ජෝර්ජ්ගේ වැඩිමහල් සහෝදරයන්

දෙදෙනාටය. ඉතිරි වූ දේපළවලින් ලැබෙන ආදායම මේරි වොෂින්ටන් සහ ඇගේ දරුවන් නඩත්තු කිරීමට ප්‍රමාණවත් විය. එසේම, ඔහුගේ වැඩිමහල් සුළු සහෝදරයින් දෙදෙනා ඒ වන විට විවාහ වී ඔවුන්ගේම වතුවල ජීවත් වීම නිසා පවුලේ සියලු වගකීම් පැවරී තිබුණේ කුඩා ජෝර්ජ් හටය. එම නිසා, මේරි වොෂින්ටන්ගේ වැඩිමහල් පුත්‍රයා ලෙස ජෝර්ජ්, ඔහුගේ මවට ඔවුන් ජීවත්වූ රැපහැනොක් වතුයාය කළමනාකරණය කිරීමට උදව් කළේය.

ජෝර්ජ් වොෂින්ටන්ගේ අධ්‍යාපනය පිළිබඳව විමසා බලන විට, කුඩා කාලයේ පටන් ඔහුගේ සමකාලීනයන් මෙන් කිසි විටෙකත් පෞද්ගලික පාසල්වලට හෝ පෞද්ගලික ගුරුවරුන් විසින් නිවසේ ඉගැන්වූ පන්තිවලට ගොස් නැත. එහෙත්, ඔහුගේ වැඩිමහල් සොහොයුරන් දෙදෙනා එංගලන්තයේ කණිෂ්ඨ පාසලකට ඇතුළත් වූ නමුත්, පියාගේ අභාවයෙන් පසු අධ්‍යාපනය සඳහා පවුලේ අරමුදල් සීමා කරන ලදී. එම නිසා ජෝර්ජ් වොෂින්ටන් හට කිසිවිටෙකත් විදේශයන්හි අධ්‍යාපනය ලැබීමට වරම් නොවීය. ඔහු දේශීය පාසල්වලට ගොස් ඉතා හොඳින් අධ්‍යාපනය ලැබූ නමුත්, වයස අවුරුදු 15 වන විට ඔහු විධිමත් අධ්‍යාපනය නතර කළේය.

විධිමත් අධ්‍යාපනයට සමුදුන් ජෝර්ජ්ගේ දියුණුව පිළිබඳව වගකීම පැවරුණේ ඔහුගේ මව සහ වැඩිමහල් සුළු සහෝදරයා වන ලෝරන්ස් වොෂින්ටන් (Lawrence Washington) හටය. විශේෂයෙන්ම, ජෝර්ජ්ට නිසි ආකාරයට මහත්මයකු ලෙස හැසිරෙන ආකාරය ඉගැන්වූ අතර, සංඛ්‍යානය, ත්‍රිකෝණමිතිය, දර්ශනය, ආචාර ධර්ම මෙන්ම කලාව පිළිබඳවද, ඔහුට නිතර උපදෙස් ලැබුනේය. එසේම, ඔහු තුරුණු වියේදී ගණිත විෂය සඳහා හැකියාවක් පෙන්නුම් කළ අතර වයස අවුරුදු 16 වන විට තරුණ වොෂින්ටන් සාර්ථක මිනින්දෝරුවෙකු බවට පත්විය.

කෙසේ වෙතත්, ඔහු දැනුම හඹා යාම නතර නොකළ අතර, ඔහු එය ඔහුගේ ජීවිත කාලය පුරාවටම පවත්වාගෙන ගියේය. තරුණ ජෝර්ජ් ඇමෙරිකාවේ සහ යුරෝපයේ කතුවරුන් සහ මිතුරන් සමග ලිපි හුවමාරු කළේය. තවද, ඔහු තම කාලයේ සිදුවෙමින් පවතින කෘෂිකාර්මික, සමාජීය, දේශපාලන විප්ලවයන් පෝෂණය කරන අදහස් හුවමාරු කරගත්තේය. කෙසේ වෙතත්, වොෂින්ටන් බොහෝ දුරට ස්වයං අධ්‍යාපනය ලැබූ බවට මින් මනාව පැහැදිලි වේ.

ජෝර්ජ් වොෂින්ටන් තරුණ වියේදී සොල්දාදුවෙකු ලෙස හමුදාවට බැඳී, ප්‍රංශ සහ රතු ඉන්දියානු ස්වදේශික ජනතාව සමඟ කටයුතු කළේය. පසුකාලීනව, රජයේ නිලධාරියකු ලෙස ජෝර්ජ් මහා බ්‍රිතාන්‍ය පාලන සමයේ දී අධික බදු වැනි අසාධාරණ නීතිවලට එරෙහිව හඬ නැගීය. එසේම, 1774 සහ 1775 වසරවල දී ඔහු වර්ජිනියාවේ පළමු සහ දෙවන මහද්වීපික සම්මේලනවල සාමාජිකයෙක් බවට පත්විය. තවද, බ්‍රිතාන්‍යට විරුද්ධ වීමට හමුදාවක් පිහිටුවන ලද අතර එහි නායකත්වය සඳහා ජෝර්ජ් වොෂින්ටන් තෝරා පත් කරගන්නා ලදී. එය 'ඇමරිකානු විප්ලවය (American Revolution)' නම් වේ.

පසුව, 1783 දී මහා බ්‍රිතාන්‍ය සහ එක්සත් ජනපදය අතර සාම ගිවිසුමට අත්සන් කිරීමත් සමඟ ජෝර්ජ් විසින් තම රාජකාරී නිසි ආකාරව ඉටුකළ බව විශ්වාස කරමින් ඔහු හමුදාවෙන් ඉවත් වී අණදීම අතහැර දමා නැවත වර්ජිනියාව (Virginia) වෙත පැමිණියේය. පසුව, ඔහු සාමාන්‍ය ගොවියෙකු ලෙස ඔහුගේ ජීවිතය නැවත ආරම්භ කිරීමට අදහස් කළේය. කෙසේ වෙතත්, නැවත 1787 දී ෆිලඩෙල්ෆියා (Philadelphia) පැවති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්මුතියට සහභාගි වීමට සහ නව ව්‍යවස්ථා කෙටුම්පත් කිරීමේ කමිටුවේ ප්‍රධානියා ලෙස කටයුතු කරන ලෙස ජෝර්ජ් වොෂින්ටන් හට ආරාධනා ලැබුණි. එම සංසිද්ධීන් ඔහුට ඔහුගේ දේශපාලන ජීවිතයට පිවිසීමට මහත් රුකුලක් විය.

## නායකත්වය කරා ගිය ගමන් මඟ

නායකත්වය සංකීර්ණ මාතෘකාවක් වන්නේ නායකයෙකු වීමට බොහෝ කරුණු කාරණා ඇති බැවිනි. නායකයෙකු වීමට නම් විවිධ ගුණාංග ප්‍රගුණ කළ යුතුය. මෙම ගුණාංග අතර ප්‍රමුඛ වන්නේ, 'අභිලාෂය, දැක්ම, ධෛර්යය, ඒත්තු ගැන්වීම, තමා ගැන විශ්වාසය, නොපසුබට උත්සාහය, අවංකකම, කැපවීම සහ තම සාමාජිකයන් පිළිබඳව ඇති ප්‍රබල විශ්වාසයයි. නව ව්‍යවස්ථා කෙටුම්පත් කිරීමේ කමිටුවේ ප්‍රධානියා වශයෙන් ජෝර්ජ් වොෂින්ටන් කටයුතු කරන කාලය තුළ ඇමරිකාවේ තීරණ ගැනීම සම්බන්ධයෙන් සිටි විද්වතුන් වූයේ තෝමස් ජෙෆර්සන් (Thomas Jefferson), ඇලෙක්සැන්ඩර් හැමිල්ටන් (Alexander Hamilton) සහ බෙන්ජමින් ෆ්‍රැන්ක්ලින් (Benjamin Franklin) ය.

දූරදර්ශී නායකයෙකු ලෙස ජනාධිපති වොෂින්ටන් ජනතාවගේ පක්ෂපාතිත්වය සහ සෙනෙහස රැකගත් ආකර්ශනීය නායකයෙකු ලෙස දිගටම කටයුතු කළේය. ඔහු සියලුම ප්‍රාන්තවල සිය සංචාර හරහා සහ විශාල මහජන හමුවීම් තුළින් තමන් කෙරෙහි ඇති ගෞරවය පෝෂණය කළේය. කෙසේ වෙතත්, සමහර පුද්ගලයන් ඔහුගේ ප්‍රතිපත්තිවලට විරුද්ධව ක්‍රියා කරන ලෙස ඉල්ලා සිටි විට, ඔහු ඔහුගේ ප්‍රතිපත්ති තුළම සිටි අතර කාලයාගේ ඇවෑමෙන් ඔහු බුද්ධිමත්ව ක්‍රියාකළ බව දැනගත් ජනතාව ඔවුන්ගේ ගෞරවය හා ආදරය තවත් වැඩි කළහ.

1789 පළමු ජනාධිපතිවරණයේදී, ජෝර්ජ් වොෂින්ටන් එක්සත් ජනපදයේ ජනාධිපති ලෙස ඒකමතිකව තේරී පත්විය. නායකත්වය සඳහා සියල්ලන්ගේම ප්‍රියතාවයක් තිබූ ඔහු වැනි වෙනත් ජනාධිපතිවරයකු මේ වනතුරුත් බලයට පත් වී නැත. වොෂින්ටන්, ජනාධිපති සඳහා පැහැදිලි, පළමු තේරීම වූ අතර එවකට විශාලතම ප්‍රාන්තය වූ වර්ජිනියාවේ ප්‍රියතම පුත්‍රයා විය. ඇමරිකානු විප්ලවය සමයේ කොන්ටිනෙන්ටල් හමුදාවේ අණදෙන නිලධාරියා ලෙසත්, 1787 ෆිලඩෙල්ෆියාහි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්මුතියේ සභාපතිවරයා ලෙසත්, කටයුතු කර ඇති වොෂින්ටන්, ප්‍රායෝගික අත්දැකීම් සමඟින් ජනාධිපති ධූරයට පත් විය. එලෙස, ඔහු සුදුසු වේලාවට සුදුසුම තීරණය ගනිමින් නායකත්වය කරා ගිය පුද්ගලයා විය.

## නායකත්වයට පැමිණීමෙන් පසු සිදුකළ සේවාව

1789 දී ජෝර්ජ් වොෂින්ටන් එක්සත් ජනපදයේ පළමු ජනාධිපතිවරයා ලෙස තේරී පත් වී විධායකය සංවිධානය කිරීම හරහා නව රජයට මග පෙන්වමින් ඔහු වාර දෙකක් සේවය කළේය. ඒ වන විට ජනාධිපති කාර්යාලය ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳව පැහැදිලි අවබෝධයක් නොතිබුණි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් කාර්යාලයක් නිර්මාණය කළ නමුත්, රජයේ විධායක ක්‍රමය මෙහෙයවීම සඳහා මාර්ගෝපදේශයක් නොතිබුණි. වොෂින්ටන් හා සම්බන්ධ එක් ප්‍රධාන වර්ධනයක් වූයේ, කැබිනට් ක්‍රමය නිර්මාණය කිරීමයි. වොෂින්ටන් ඔහුගේ රාජ්‍ය ලේකම් ලෙස තෝමස් ජෙෆර්සන් සහ ඔහුගේ භාණ්ඩාගාරයේ ලේකම් ලෙස ඇලෙක්සැන්ඩර් හැමිල්ටන් පත් කළේය. වොෂින්ටන් කැබිනට් පද්ධතිය නිර්මාණය කළේ රටෙහි යහපත සඳහා වඩා හොඳ තීරණ සකස් කිරීම සඳහා විවිධ ක්ෂේත්‍රවල ප්‍රවීණයන් හවුල් කර ගැනීම සඳහා ය. ජෙෆර්සන් රාජ්‍ය ලේකම් තනතුරට පත් කිරීම මෙම

ප්‍රවේශයට උදාහරණයකි. එසේම, දේශීය වශයෙන්, ඔහු තමාගේම ජනාධිපති කැබිනට් මණ්ඩලයක් පිහිටුවා, එක්සත් ජනපද ශ්‍රේෂ්ඨාධිකරණයේ පළමු ප්‍රධාන විනිසුරුවරයා ලෙස ජෝන් ජේ (John Jay) තෝරාගෙන, ජාතියේ ප්‍රථම ජාතික බැංකුව වන එක්සත් ජනපද බැංකුව නිර්මාණය කිරීම සඳහා නීති සම්පාදනය කළේය.

ජෝර්ජ් වොෂින්ටන් යටතේ ඇති දේශීය ප්‍රතිපත්තියට 1789 අධිකරණ පනත (Judiciary Act) යටතේ ෆෙඩරල් අධිකරණ පද්ධතියක් පිහිටුවීම සහ විප්ලවවාදී යුද්ධයේදී ගිවිසුම්ගත වූ දැවැන්ත ජාතික ණය කළමනාකරණය කිරීම සඳහා මූල්‍ය වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම ඇතුළත් විය. මහා භාණ්ඩාගාරයේ ලේකම් ලෙස ඇලෙක්සැන්ඩර් හැමිල්ටන් විසින් එක්සත් ජනපද බැංකුව පිහිටුවන ලද්දේ, ෆෙඩරල් රජය විසින් ප්‍රාන්ත කිහිපයක විප්ලවීය යුද ණය භාර ගැනීම, යුද ණය ගෙවීම, නව රජය සඳහා මුදල් රැස් කිරීම සහ පොදු මුදල් ඒකකයක් නිර්මාණය කිරීම සඳහා ය.

ඇමරිකාවේ ස්ථිර අගනුවරක් ගැන කිහිප වතාවක්ම සාකච්ඡා කර ඇතත්, කලාපීය පක්ෂපාතීත්වය සහ විවිධ ආතතීන් හේතුවෙන් කොන්ටිනෙන්ටල් කොන්ග්‍රසයට (Continental Congress) ස්ථිර නගරයක් සම්බන්ධයෙන් එකඟ වීමට නොහැකි වී තිබිණි. ඒ සඳහා මූලික පදනම 1790 පදිංචිය පිළිබඳ පනත (The Residence Act) මගින් ලබා දී ඇති අතර එය නිල වශයෙන් නම් කරන ලද්දේ එක්සත් ජනපද රජයේ තාවකාලික සහ ස්ථිර අගනුවරක් පිහිටුවීම සඳහා වූ පනතක් ලෙසිනි. ඊට අමතරව, ඇමරිකාවේ ප්‍රාන්ත විසින් විප්ලවීය යුද්ධයෙන් පසු ගත වූ වසර කිහිපය තුළ ප්‍රකාශන හිමිකම් සුරක්ෂිත කිරීම සඳහා විවිධ නීති සම්මත කළ අතර 1789 දී 1 වන එක්සත් ජනපද කොන්ග්‍රසයේ පළමු සැසියේදී, නියෝජිත මන්ත්‍රී මණ්ඩලය ප්‍රකාශන හිමිකම් නීතියක් පැනවීමට සලකා බැලුවේය. එහි ප්‍රතිඵලයක් ලෙස, 1790 වර්ෂයේ දී, කතුවරුන්ගේ ප්‍රකාශන හිමිකම් ආරක්ෂා කිරීම සඳහා, ඔහු රටේ පළමු ප්‍රකාශන හිමිකම් නීතියට (The Copyright Law) අත්සන් කළේය. තවද, ඇමරිකානු නිදහස සඳහා වූ අරගලයේ ජයග්‍රහණයට ගෞරව දැක්වීම සඳහා නොවැම්බර් 26 වන දින පළමු ජාතික ස්තුති දීමේ දිනය ද ඔහු විසින් අනුමත කරන ලදී.

1793 දී මහා බ්‍රිතාන්‍ය-ප්‍රංශ යුද්ධයෙන් ඉවත්ව සිටීම සඳහා, ජනාධිපති ජෝර්ජ් වොෂින්ටන් ඔහුගේ දෙවන පරිපාලනය තුළ මධ්‍යස්ථභාවය ප්‍රකාශ කළේය. 1795 දී, වොෂින්ටන් ඔහුගේ බ්‍රිතාන්‍ය රජ අතර 'මිත්‍ර වාණිජ්‍යය සහ නාවික ගිවිසුම්' (The Treaty of Amity, Commerce, and Navigation) අත්සන් කළ අතර එය එක්සත් ජනපදයට මහා බ්‍රිතාන්‍යය සමඟ යුද්ධයෙන් වැළකී සිටීමට උපකාරී විය. වොෂින්ටන් පරිපාලනය විසින් තවත් වැදගත් ජාත්‍යන්තර ගිවිසුම් දෙකක් අත්සන් කරන ලදී. එය 1795 පින්ක්නිගේ ගිවිසුම (Pinckney's Treaty) වන අතර එය සැන් ලොරෙන්සෝ ගිවිසුම (Treaty of San Lorenzo) ලෙසද හැඳින්වේ. එය හරහා එක්සත් ජනපදය සහ ස්පාඤ්ඤය අතර මිත්‍ර සබඳතා ගොඩනඟා, උතුරු ඇමරිකාවේ එක්සත් ජනපද සහ ස්පාඤ්ඤ ප්‍රදේශ අතර දේශසීමා ශක්තිමත් කර ඇමරිකානු වෙළඳුන්ට මිසිසිපි ප්‍රාන්තය (City of Misisipi) විවෘත කළේය. ඔහු විසින් අත්සන් කරන ලද තවත් ගිවිසුමක් වන්නේ ට්‍රිපොලි ගිවිසුමයි (The Treaty of Tripoli). එහි දී, 1795 මාර්තු 30 වන දින, වොෂින්ටන්, බාර්බරි ප්‍රාන්ත සමඟ ගිවිසුමක් ඇති කර ගැනීම සඳහා ඩේවිඩ් හම්ෆ්‍රීස් (David Humphreys), කොමසාරිස්වරයා ලෙස නම් කළේය. 1796 නොවැම්බර් 4 වන දින ට්‍රිපොලිහිදී ඔහුගේ මඟ පෙන්වීම යටතේ ගිවිසුම අත්සන් කරන ලදී. එය එක්සත් ජනපදය සහ ට්‍රිපොලි (වත්මන් ලිබියාව) අතර වාණිජ නැව් අයිතිය සහතික කිරීම සහ මධ්‍යධරණී මුහුදේ දේශීය බාර්බරි මුහුදු කොල්ලකරුවන්ට එරෙහිව ඇමරිකානු නැව් ආරක්ෂා කිරීම සඳහා වූ පළමු ගිවිසුම විය. මෙම ගිවිසුම මගින් ඇමරිකානු නැව්වලට මධ්‍යධරණී නාවික මාර්ග වෙත ප්‍රවේශය ලබා දුන්නේය.

තවද, 1791 වර්ෂයේදී, මොහු විස්කි සහ ආසවනය කළ ස්ප්‍රීතු සඳහා සුරාබදු බද්දක් (Whiskey Tax) නීති ගත කළේය. මෙයට මූලිකත්වය ගෙන කටයුතු කරන ලද්දේ භාණ්ඩාගාර ලේකම් ඇලෙක්සැන්ඩර් හැමිල්ටන් ය. මෙය අලුත් රජය විසින් දේශීය නිෂ්පාදනයක් මත පැනවූ පළමු බද්ද වන අතර විප්ලවාදී යුද්ධයේදී දරණ ලද යුධ ණය පියවීම මෙන්ම මූල්‍ය දුෂ්කරතා වළක්වා ගැනීම මෙහි මූලික අරමුණු විය. මෙම බද්ද ගොවීන් අතර දැඩි ලෙස අප්‍රසාදයට පත්වූ අතර අවසානයේදී කැරැල්ලක් (Whiskey Rebellion) ඇතිවීම දක්වා වර්ධනය විය. නමුත්, මෙම බද්ද 1802 වර්ෂය දක්වා ක්‍රියාත්මක වී පසුව අවලංගු විය.

තවද, ජෝර්ජ් වොෂින්ටන් යනු, පුද්ගල නිදහස සඳහා වූ විප්ලවයේ නායකයෙකි. නමුත්, ඔහු වහල් හිමියෙකු ලෙස ඔහුගේ ජීවිත කාලය පුරාවටම ධනය උපයා ගත්තේය. අවස්ථා ගණනාවකදී, මොහුගේ වහලුන් ඔවුන්ගේ නිදහස නැවත ලබාගැනීමට උත්සාහ කරමින් පලා ගියහ. වොෂින්ටන් විසින් කිසි විටෙකත් වහල්භාවයට එරෙහිව ප්‍රසිද්ධ ප්‍රකාශයන් සිදු කර නොමැති නමුත් ඔහුගේ පුද්ගලික ලිපි ලේඛන පිරික්සා බැලීමෙන් වහල්භාවය ප්‍රතික්ෂේප කිරීමට ඔහු තීරණය කර ඇති බව පෙනී යයි. එනම්, වොෂින්ටන් ඔහුගේ ලිපියක් තුළ, 'මනුෂ්‍ය වර්ගයා අතර සිදුවන මෙවැනි තදබදවලට එරෙහිව මම ප්‍රතිපත්තිගරුක වෙමි' යනුවෙන් සඳහන් කර තිබේ. ඔහු 1799 දී, මේ සඳහා, කෙටුම්පතක් ඉදිරිපත් කළේ ය. එමගින්, ඔහුගේ සහ මාර්තාගේ (Martha) (ජෝර්ජ් වොෂින්ටන්ගේ බිරිඳ) මරණයෙන් පසු ඔහුගේ වහලුන්ට නිදහස ලබා දීමට සහ වයෝවෘද්ධ හෝ දුර්වල වූවන් රැකබලා ගැනීම සඳහා අරමුදලක් පිහිටුවීය. මෙහි ප්‍රතිඵලයක් ලෙස, 1799 දී වහල්භාවයට පත්වූ පුද්ගලයන් 317 දෙනෙකු අතරින් 123 දෙනෙකු නිදහස් වීමට සුදුසුකම් ලබා ඇත.

එක්සත් ජනපදයේ ජනාධිපති ලෙස ජෝර්ජ් වොෂින්ටන් රටේ සෑම ප්‍රදේශයකම සියලු ජනතාව අතර ඉතා ජනප්‍රිය විය. මෙම ජනප්‍රියත්වය ඔහුට 1796 මැතිවරණයේදී තවත් ජයග්‍රහණයක් ලබා දෙනු ඇත. නමුත්, තුන්වන ධූරකාලයක් සඳහා තරඟ කිරීම වෙනුවට, වොෂින්ටන් ජාතික දේශපාලනයෙන් ඉවත් වී වර්ජිනියාවේ මවුන්ට් වර්නන් (Mount Vernon) හි පිහිටි ඔහුගේ නිවසට යාමට තීරණය කළ අතර, පෙර පැවති ආකාරයටම වතුකරය ඵලදායී කිරීමට ඔහුගේ අවධානය යොමු කළේය. සිය සමුගැනීමේ දේශනයේදී ඔහු තම ජනතාවගෙන් ඉල්ලා සිටියේ දේශීය වශයෙන් ඉහළම ප්‍රමිතීන් පවත්වා ගන්නා ලෙසත් විදේශීය බලවතුන් සමඟ සම්බන්ධ වීම අවම කර ගන්නා ලෙසත් ය.

ඉතිහාසයේ ඇමරිකානුවෙකු විසින් කරන ලද වඩාත්ම කල්පවත්නා දායකත්වයක් සහ අමරණීය සේවාවක් ජනාධිපති ජෝර්ජ් වොෂින්ටන් විසින් සිදු කරන ලදී. එම නිසාවෙන්ම, ඔහුව 'ජාතියේ පියා' ලෙස හඳුන්වයි. ඔහුගේ රූපය එක්සත් ජනපදයේ ඩොලර් බිල්පතේ සහ කාර්තුවේ දිස්වන අතර එක්සත් ජනපද පාසල්, නගර සහ ප්‍රාන්ත, වොෂින්ටන් ප්‍රාන්තය සහ ඇමරිකාවේ අගනුවර ද ඔහුගේ නමින් ඔහු වෙනුවෙන් නම් කර ඇත. ඔහුගේ ධූර කාලය තුළ ජෝර්ජ් වොෂින්ටන්ගේ ක්‍රියා පටිපාටිය මඟින් ජනාධිපති තනතුර සඳහා බොහෝ

පූර්වාදර්ශ තැබීය. වොෂින්ටන්ගේ නායකත්වය සහ ඔහුගේ තීරණාත්මක භූමිකාව එක්සත් ජනපදයේ නව ජනරජයේ සාර්ථකත්වය සඳහා පදනම නිර්මාණය කළේය.

## විදේශ ප්‍රතිපත්තිය

1789 දී අලුතින් පිහිටුවන ලද ඇමරිකා එක්සත් ජනපදයේ පළමු ජනාධිපතිවරයා ලෙස ජෝර්ජ් වොෂින්ටන් බලයට පත් වන විට, රට තවමත් මුල් අවධියේ සිටියේය. මේ අනුව, ආරම්භක ජනාධිපතිවරයා වශයෙන්, අවසානයේ එහි ශ්‍රේෂ්ටත්වයට සහ හැකියාවන් පුළුල් කිරීම සඳහා ඊළඟ පියවර තැබීමට ඔහුට වැඩි වගකීමක් තිබුණි. ජෝර්ජ් වොෂින්ටන් තම රටේ ඉදිරි දවස හෝ දශකය සඳහා පමණක් සැලසුම් නොකළ බව පැහැදිලිය. නමුත්, ඔහු ඉදිරි සියවස් සඳහා සැලසුම් සකස් කළේය. රාජ්‍යය පිහිටුවීමේ සිටම ඇමරිකා එක්සත් ජනපදය සඳහා ජාත්‍යන්තර පද්ධතියේ සෙසු ප්‍රාන්ත සමඟ විදේශ සබඳතා ප්‍රධාන වැදගත්කමක් විය. ජාතියේ දිගුකාලීන පැවැත්ම සඳහා උපායමාර්ගික නමුත් සුහද රාජ්‍ය තාන්ත්‍රික උපක්‍රම තීරණාත්මක බව එහි නව ජනාධිපතිවරයා දැන සිටියේය.

ජෝර්ජ් වොෂින්ටන්ගේ විදේශ ප්‍රතිපත්තිය ඔහුගේ ධූර කාල දෙක පුරාවටම අවධානය යොමු කළේ නව ජාතියේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීම සහ මිල අධික හා දරුණු යුද්ධ වළක්වා ගැනීම සඳහා වන අතර, ඒ සඳහා ඔහුට ඔහුගේම තර්ක තිබුණි. යුරෝපීය ජාතීන් වොෂින්ටන්ගේ පළමු ධූර කාලය තුළ ඇමරිකානු ස්වෛරීත්වයට බාධා කිරීමට සෑම අවස්ථාවක්ම ප්‍රයෝජනයට ගත්හ. ස්වදේශික ඇමරිකානු ජාතීන්ට බටහිර ජනාවාසවලට පහර දීම සඳහා බ්‍රිතාන්‍ය හමුදාවන්ගෙන් පතොරම් සහ අරමුදල් ලැබුණි. ස්පාඤ්ඤ අධිරාජ්‍ය හමුදා මිසිසිපි ගඟට (Mississippi River) අත්‍යවශ්‍ය වෙළඳ ප්‍රවේශය කපා දැමූ අතර ෆ්ලොරිඩා ප්‍රජාවන් (Florida communities) දකුණු පළාත්වලින් පලා යන වහල් පුද්ගලයින් පිළිගනු ලැබීය. වොෂින්ටන් මුහුණ දෙන ප්‍රධාන රාජ්‍ය තාන්ත්‍රික දුෂ්කරතා වූයේ ඇමරිකානු බටහිර පදිංචිකරුවන් සහ ක්‍රීක් දේශය (Creek Nation) අතර ගැටුම්, විප්ලවය අවසන් කළ 1783 පැරිස් ගිවිසුමෙන් (Treaty of Paris) පැන නගින ගැටළු විසඳීම සහ මහා බ්‍රිතාන්‍යය සහ ප්‍රංශය අතර යුද්ධයයි. 1789 දී වොෂින්ටන් බලයට පත් වූ විට, ඔහු ඉතා ඉක්මනින් ක්‍රීක් දේශය සමඟ ගිවිසුම් සාකච්ඡා ආරම්භ කළේය. විවිධ අග්නිදිග ප්‍රාන්තවල පදිංචිකරුවන් ස්වදේශික ඇමරිකානුවන්

සමඟ ඇමරිකානු ඉඩම් ව්‍යාප්තිය සම්බන්ධයෙන් විරුද්ධ විය. මෙම භූමිය අල්ලා ගැනීම වොෂින්ටන් විසින් ෆෙඩරල් වගකීමක් ලෙස සලකනු ලැබූ අතර, ක්‍රීක් සමඟ ගිවිසුමක් ඇති කර ගන්නා ලදී. ක්‍රීක් ඔවුන්ගේ දේපළ සඳහා වන්දි ලබා දුන් අතර ගිවිසුමේ විධිවිධාන යටතේ ෆෙඩරල් ආරක්ෂිත කලාපවල නැවත පදිංචි විය. මෙම ප්‍රශ්නය විසඳීමේදී වොෂින්ටන්ගේ හැසිරීම ඔහුගේ රාජ්‍යතාන්ත්‍රික ගුණාංග සහ ඔහු තම රාජ්‍යතාන්ත්‍රික කටයුතුවලදී 'සාකච්ඡා කිරීමේ කලාව' (Art of Negotiation) භාවිතා කළ ආකාරය ප්‍රදර්ශනය කළේය. මෙය ඔහුගේ ධූර කාලය පුරාවටම සිදු වූ බව නිරීක්ෂණය කළ හැකිය. මේ අනුව, ඔහුගේ විදේශ ප්‍රතිපත්තිය සෑම විටම බාහිර පාර්ශ්වයන් සමඟ සුහද සාකච්ඡා හා සමීපව බැඳී තිබුණි.

ඔහුගේ පළමු ධූර කාලයෙන් ඉදිරියට යන විට, ජෝර්ජ් වොෂින්ටන්ගේ දෙවන ධූර කාලය (1793-1797) විදේශ සබඳතා කේන්ද්‍රස්ථානයක් බවට පත් කරන ලද ධූර කාලය ලෙස නිරීක්ෂණය කෙරේ. 1793 දී, සාමාන්‍ය යුරෝපීය යුද්ධයක් පුපුරා යාම, උභතෝකෝටිකය ඇමරිකානු දේශපාලනයේ පෙරමුණට තල්ලු කළේය. ඇමරිකානුවන් ප්‍රථමයෙන් ප්‍රංශ විප්ලවය (French Revolution) ප්‍රශංසා කළේ, ඇමරිකානු විප්ලවයේ පැහැදිලි අනුප්‍රාප්තිකයා ලෙස ය. එහෙත්, ඊට පටහැනිව, ප්‍රංශ විප්ලවය බොහෝ ඇමරිකානුවන් බිය ගන්වන අරාජිකත්වය සහ ප්‍රචණ්ඩත්වය දක්වා පිරිහී ගියේය. මේ අනුව, වොෂින්ටන් සහ හැමිල්ටන් වැනි ෆෙඩරල්වාදීන්, ප්‍රංශ විප්ලවයේ අන්තවාදය උතුරු ඇමරිකානු දේශසීමා දක්වා පැතිර යා හැකි බවට බිය වූ අතර, ජෙෆර්සන් වැනි ඩිමොක්‍රටික්-රිපබ්ලිකානුවන් ප්‍රචණ්ඩත්වය හෙළා දුටු නමුත් ප්‍රංශයට සහාය දුන්හ.

මේ අනුව, මෙම සිදුවීමට ක්ෂණික ප්‍රතිචාරය පැමිණියේ ප්‍රතිපත්තිමය සම්මතයකිනි. යුරෝපයේ යුද තත්ත්වය මධ්‍යයේ එක්සත් ජනපදය 'මධ්‍යස්ථව' පවතිනු ඇතැයි වොෂින්ටන් අවධාරණය කළ අතර ඔහු 1793 අප්‍රේල් මාසයේදී තම කැබිනට් මණ්ඩලය රැස් කර මධ්‍යස්ථව සිටිය යුතු ආකාරය පිළිබඳ ලේකම්වරුන්ගේ උපදෙස් ඉල්ලා සිටියේය. වොෂින්ටන් ඔහුගේ ධූර කාලය තුළ අනුගමනය කරන ලද මෙම 'මධ්‍යස්ථභාවය' පිළිබඳ ප්‍රතිපත්තිය, ශ්‍රේෂ්ඨත්වය ළඟා කර ගැනීම සඳහා ඇමරිකාවේ ප්‍රගතිශීලී ගමනේ ඉතා වැදගත් සන්ධිස්ථානයකි. යුරෝපයේ යුද්ධ ඇමරිකාවේ වාණිජ හා මූල්‍ය ප්‍රගතිය සඳහා විනාශකාරී වීමට ඉඩකඩ තිබුණි. මන්ද, රටේ අනාගතය රඳා පවතින්නේ වාණිජ්‍යය සහ බටහිර දෙසට ව්‍යාප්ත වීමෙන් ඇති වන ධනය හා අවස්ථාවන්හි වර්ධනය මත ය.

එහෙයින්, ජාතිය යුද්ධයෙන් ඈත් කිරීමට වොෂින්ටන්ගේ තීරණය, ඇමරිකාවේ අනාගත විශිෂ්ටත්වය සඳහා කරන ලද ආයෝජනයක් විය. කෙසේ වෙතත්, ඇමරිකානු ඉතිහාසයේ ඇති වූ මධ්‍යස්ථ ප්‍රතිපත්තිය සියවසකට ආසන්න කාලයක් පුරා අඛණ්ඩව පැවතියේ ඇමරිකාවට ශක්තියෙන් වර්ධනය වීමට අවශ්‍ය අවකාශය ලබා දෙමිනි. තවද, වොෂින්ටන් සහ කැබිනට් මණ්ඩලය විසින් 1793 අප්‍රේල් මාසයේදී මධ්‍යස්ථ නීති මාලාවක් කෙටුම්පත් කරන ලදී. එමගින්, සටන්කාමී රාජ්‍යවල පුද්ගලික සහ නාවික නෞකා සන්නද්ධ කිරීම තහනම් කරන ලද අතර යුද්ධය සඳහා නිර්මාණය කර නොමැති පුද්ගලික යාත්‍රා වාණිජ කිරීමට අවසර දෙන ලදී. පසුකාලීනව, කොන්ග්‍රසය එම රෙගුලාසි නීති සංග්‍රහයට ඇතුලත් කළ අතර, එය සිවිල් යුද්ධය දක්වා මධ්‍යස්ථ කාල පරිච්ඡේදයන් පාලනය කළේය.

මෙම මධ්‍යස්ථ විදේශ ප්‍රතිපත්තිය හරහා, අනෙකුත් විදේශ බලවතුන් සමඟ සබඳතා ඥානාන්විතව හැසිරවීමටත්, තම ශක්තිමත් ස්ථාවරය ආරක්ෂා කර ගැනීමටත්, මධ්‍යස්ථ ශ්‍රාවකයාට දැඩි ලෙස කැපවී සිටීමටත්, ඇමරිකා එක්සත් ජනපදයට හැකි විය. එක් සිදුවීමක් වුයේ, නව ප්‍රංශ ඇමති සිටිසන් එඩ්මන්ඩ් චාල්ස් ජෙනට් (Citizen Edmond Charles Genêt) 1793 අප්‍රේල් මාසයේදී ඇමරිකාවට පැමිණ වොෂින්ටන්ගේ මධ්‍යස්ථභාවය පිළිබඳ ප්‍රකාශය නොසලකා හැරීමයි. අමාත්‍ය ජෙනට් ෆිලඩෙල්ෆියා (Jenat Fidelfiya) වෙත ගොස් එහි වරාය සන්නද්ධ කිරීමට සහ ප්‍රංශ පෞද්ගලික නැව් සමූහයක් නිර්මාණය කිරීමට භාවිතා කළේය. ඒවා ප්‍රංශ බලපත්‍රයක් යටතේ යාත්‍රා කළ සහ බ්‍රිතාන්‍ය නැව්වලට පහර දුන් පුද්ගලික නැව් විය. මෙම ක්‍රියාව හේතුවෙන්, එක්සත් ජනපදය එසේ කළ පළමු අවස්ථාව සනිටුහන් කරමින්, ප්‍රංශයෙන් ජෙනට් ආපසු කැඳවීමට වොෂින්ටන් සහ කැබිනට් මණ්ඩලය නියෝග කළහ.

එසේම, 'ජේ ගිවිසුම (Treaty of Jay)' වොෂින්ටන්ගේ පාලන සමයේදී බ්‍රිතාන්‍යය සහ ඇමරිකා එක්සත් ජනපදය අතර විදේශ සබඳතා සම්බන්ධයෙන් තවත් වැදගත් පියවරක් සනිටුහන් කරයි. වොෂින්ටන් 1794 දී අගවිනිසුරු ජෝන් ජේ ලන්ඩනයට පිටත් කර හැරියේ බ්‍රිතාන්‍යය-ඇමරිකානු සබඳතාව සඳහා රාජ්‍ය තාන්ත්‍රික විසඳුමක් සෙවීමට ය. 1794 නොවැම්බර් 19 වන දින, ජේ බ්‍රිතාන්‍ය නව ගිවිසුමකට අත්සන් තැබීය. එමගින්, 'වෙළෙන්දන්ට ලැබිය යුතු පූර්ව යුද ණය පියවීමට කොමිෂන් සභා ඇති කිරීම, සීමිත ඇමරිකානු වෙළඳාමකට බ්‍රිතාන්‍ය වරායන් තුළ අවසර ලබා

දීම සහ ඇමරිකානු භූමියේ බටහිර බලකොටුවලින් ඉවත් වීමට බ්‍රිතාන්‍ය හමුදාවන්ට බල කිරීම' සිදුවිය.

ඊට සමගාමීව, තෝමස් පින්ක්නි ස්පාඤ්ඤය සමග වඩාත් ජනප්‍රිය ගිවිසුමක් සාකච්ඡා කළේය. එක්සත් ජනපදය සහ ස්පාඤ්ඤය අතර භෞමික ආරවුල් විසඳීමට හේතු වූ 'පින්ක්නිගේ ගිවිසුම', ඇමරිකානු නැව්වලට මිසිසිපි ගඟේ යාත්‍රා කිරීමට සහ වෙළඳාම් කිරීමට අයිතිය ලබා දුන් අතර, නිව් ඕර්ලියන්ස් වරායේ (Port of New Orlians) විකිණීම සඳහා භාණ්ඩ තැන්පත් කිරීමට ඇමරිකානුවන්ට අයිතිය ලබා දුන්නේය. මෙම ගිවිසුම විශේෂයෙන් ජනප්‍රිය වූයේ, තම භාණ්ඩ වෙළඳපොළට ප්‍රවාහනය කිරීම සඳහා ජල මාර්ග මත යැපෙන බටහිර ගොවීන් අතර ය.

එහෙයින්, ඇමරිකාව විසින් අනුගමනය කරන ලද මධ්‍යස්ථ ප්‍රතිපත්තිය වෙනුවෙන් වොෂින්ටන්ගේ ධූර කාලය කැපී පෙනෙන බැවින්, 'වොෂින්ටන්ගේ සමුගැනීමේ කතාව' (Washington's Farewell Speech) මෙම ප්‍රතිපත්තියට දැඩි ලෙස සම්බන්ධ වන ප්‍රධාන මෙවලමක් ලෙස පවතී. ඔහුගේ ධූර කාලය අවසන් වන විට, ජෝර්ජ් වොෂින්ටන් 1796 දී සමුගැනීමේ දේශනයක් ප්‍රකාශයට පත් කළේ ඇමරිකානු මහජනතාවට සහ ඔහුගේ අනුප්‍රාප්තිකයින්ට මාර්ගෝපදේශයක් ලෙස ය. වොෂින්ටන්ගේ ආමන්ත්‍රණය, නොසැලෙන සතුරන් සෑදීමෙන් මෙන්ම එක්සත් ජනපදය විදේශ සන්ධානවල පැටලීමෙන් වැළකී සිටින මිත්‍රශීලී මධ්‍යස්ථභාවයේ සුපරීක්ෂාකාරී විදේශ ප්‍රතිපත්තියක් සඳහා යොමු කළේය. එක්සත් ජනපදයේ අනාගත විදේශ ප්‍රතිපත්තිය ප්‍රකාශ කිරීමට වොෂින්ටන් උනන්දු විය. වොෂින්ටන්ගේ විදේශ ප්‍රතිපත්ති අදහස්, 'තනි ජාතීන්ට එරෙහිව ස්ථිරව මුල් බැසගත් ප්‍රතිවිරෝධතා' මෙන්ම 'එක් ජාතියක් තවත් ජාතියකට දක්වන උද්යෝගිමත් භක්තියට' එරෙහි අනතුරු ඇඟවීමක් ලෙස ප්‍රකාශ විය. විදේශ මැදිහත්වීම්වලින් ප්‍රවේශම් වන ලෙස වොෂින්ටන් පුරවැසියන්ට උපදෙස් දුන්නේය. ඔහු අපක්ෂපාතී ආර්ථික ගිවිසුම් වෙනුවෙන් පෙනී සිටි නමුත් ස්ථිර සන්ධාන ගිවිසුම්වලට විරුද්ධ වූ අතර, එක්සත් ජනපදය පවතින ඕනෑම ගිවිසුමක් පරිපූර්ණ සද්භාවයෙන් ක්‍රියාත්මක කළ යුතු බවට තර්ක කළේය.

මේ අනුව, ඇමරිකා එක්සත් ජනපදයේ පළමු ජනාධිපතිවරයාගේ සමුගැනීමේ දේශනය ඉදිරි සියවස් සඳහා ඇමරිකානු විදේශ ප්‍රතිපත්තිය සකස් කළේය. ජනාධිපති වොෂින්ටන් විසින් මධ්‍යස්ථ ප්‍රතිපත්තිය සම්මත කිරීම ඉතා වලංගු

සංවාදයක් මත පදනම්ව සිදු කරන ලදී. 1796 දී එක්සත් ජනපදය තවමත් කුඩා හා දුර්වල ජාතියක් බව වොෂින්ටන් හොඳින් දැන සිටි අතර, ප්‍රධාන අවශ්‍යතා ලෙස 'ආර්ථික සංවර්ධනය' සහ 'යුරෝපයෙන් දේශපාලනිකව හුදකලා වීම මෙන්ම දිගුකාලීන සන්ධානයන් මග හැරීම' කෙරෙහි අවධානය යොමු කළේය. තවද, ප්‍රමාණවත් කාලයක් සහ බාහිර බලපෑම්වලින් නිදහස තිබියදී, එක්සත් ජනපදය යුරෝපයේ ඕනෑම රාජ්‍යයකට වඩා උසස් හෝ සාපේක්ෂව මහා බලවතෙකු බවට වර්ධනය වන බව ඔහුට ඒත්තු ගියේය. එබැවින්, ඔහුගේ රාජ්‍යතාන්ත්‍රික ප්‍රවේශය න්‍යායික නොව ආනුභාවික විය. තවද, ඔහුගේ විදේශ ප්‍රතිපත්තියේ ප්‍රධාන නිර්ණායක වූයේ, ඇමරිකානු ජනතාව තුළ 'ජාතික හැඟීමක් නොතිබීම' සහ 'එකල එක්සත් ජනපදයේ මූල්‍ය තත්ත්වයයි.

එබැවින්, ඇමරිකානුවන් තුළ ජාතිකවාදයේ සැබෑ හැඟීම ඇති කිරීමට සහ සැබෑ ස්වාධීනත්වයේ වටිනාකම ඔවුන්ට අවබෝධ කර දීමට උත්සාහ කිරීමේදී, වොෂින්ටන් සිය සමුගැනීමේ දේශනයේදී මෙසේ ආයාචනා කළේය, 'විදේශීය බලපෑම්වල කූට උපක්‍රමවලට එරෙහිව නිදහස් ජනතාවකගේ ඊර්ෂ්‍යාව නිරන්තරයෙන් විය යුතුය. අවදියෙන් සිටින්න, මන්ද ඉතිහාසය සහ අත්දැකීම් මගින් ඔප්පු කරන්නේ විදේශ බලපෑම ජනරජ ආණ්ඩුවේ වඩාත්ම නරක සතුරන්ගෙන් එකක් බවයි.' ('Against the insidious wiles of foreign influence the jealousy of a free people ought to be constantly awake, since history and experience prove that foreign influence is one of the most baneful foes of republican government') තවද, වොෂින්ටන් සුදුසුකම් ලත් ආර්ථික විද්‍යාඥයෙකු නොවූවත්, සංවේදී මිනිසෙකු ලෙස ඔහු ප්‍රකාශ කළේ, 'රටේ විදේශ ප්‍රතිපත්තිය විචක්ෂණශීලී, සුපරීක්ෂාකාරී සහ විදේශීය ජාතීන් සම්බන්ධයෙන් මධ්‍යස්ථ නම්, ණය බරින් මිදීම සඳහා යුද්ධය මග හැරීමේ තාර්කික සම්භාවිතාවක් ඇත.' ('If the policy of the country be prudent, cautious, and neutral towards foreign nations, there is a rational probability that war may be avoided long enough to wipe off the debt.') යනුවෙනි.

# ගත හැකි ආදර්ශ

නායකයෙකු ලෙස ජෝර්ජ් වොෂින්ටන් තම මහජනතාවට ආදර්ශමත් චරිතයක් සහ විශ්වාසයක් පෙන්නුම් කළේය. වොෂින්ටන් සැබවින් ම සෑම විටම ඔහුගේ ම ප්‍රතිපත්ති හා මූලධර්ම අනුව ජීවත් වීමට උත්සාහ කළේය. වොෂින්ටන්ගේ මෙම ශක්තිමත් සදාචාරාත්මක ගති ලක්ෂණ නිසා ඔහු දුෂ්කර කාලවලදී ඔහුගේ මිනිසුන්ට මඟ පෙන්වීමට සමත්විය. නිදසුනක් වශයෙන්, 1777-1778 හි බිහිසුණු ශීත ඍතුවේ (Valley Forge) දී පවා, වොෂින්ටන්ට තම හමුදාවට අණ දීමට හැකි විය.

ජෝර්ජ් වොෂින්ටන් ජෙනරාල් සහ ප්‍රධාන අණදෙන නිලධාරියා ලෙස ඇමරිකාවේ සැබෑ වීරයා බවට පත් වූ අතර, ඇමරිකාවේ ආදර්ශය වූයේ, ඔහුගේ විශිෂ්ඨ දූරදර්ශී නායකත්වය මෙන්ම ඔහුගේ අදහස් අතර සහජීවනය පවත්වා ගැනීමට ඇති හැකියාව නිසා හෙළිදරව් වූ ඔහුගේ ආදර්ශවත් චරිතය නිසාය. තවද, වොෂින්ටන් තම වහලුන් සියල්ලන්ම නිදහස් කළ එකම ජනාධිපති වේ. ඔහු වයසින් වැඩෙත්ම සහ විශේෂයෙන්ම ඔහු ඇමරිකානු විප්ලවයේ නිදහස සඳහා සටන් කළ විට, වහල්භාවය පිළිබඳ වොෂින්ටන්ගේ ආකල්පය ක්‍රමයෙන් වෙනස් විය.

ඔහුගේ ජීවිතයෙන් ගතහැකි තවත් ආදර්ශ ලෙස, ඔහු තම අනුගාමිකයන් විශ්වාස කිරීම, සියල්ලන්ට ගරු කරමින් කටයුතු කිරීම හා ඔහු තම මිනිස්සුන්ට වගකීමෙන් සහ වගවීමෙන් කටයුතු කිරීම පෙන්වා දිය හැක. එසේම, ඔහු සියල්ලන්ගේ සුබසාධනය වෙනුවෙන් කටයුතු කරන ලදි. එපමණක් නොව, තම රටවැසියන් වෙනුවෙන් ඔහු නිවැරදි තීරණ නිවැරදි වේලාවට ගනු ලැබීය.

එසේම, 1799 ජූලි 9 වන දින ජෝර්ජ් වොෂින්ටන් විසින් කරන ලද විශේෂ ප්‍රකාශය මඟින් පෙන්වා දුන්නේ, මහලු හෝ දරුණු රෝගාබාධ වලින් පෙළෙන වහලුන්ට නිදහස් ජීවිතයක් ගත කිරීමට, ස්වාධීන වීමට හැකියාවක් නොමැති නිසා ඔවුන්ට උදව් කළ යුතු බවයි. එම පිරිසට ජීවිතාන්තය දක්වා ආහාර සහ ඇඳුම් පැළඳුම් ලබා දෙන බව තහවුරු කරන ලදී. නායකයෙකු ලෙස, ජෝර්ජ් වොෂින්ටන් ශිෂ්ටත්වයේ නීති රීති සහ විවිධ පරිසරවලට උචිත හැසිරීම් කෙරෙහි වැඩි අවධානයක් යොමු කළේය. ඔහුගේ කෘති පිරික්සීමේදී 'ශිෂ්ටත්වය සහ හැසිරීම් රීති (Civility and rules of conduct)' යන තේමාව නියතයක් ලෙස පෙනේ. ඔහු තම

අධ්‍යයන කාලයෙන් වැඩි කොටසක් මෙම න්‍යාය පරීක්ෂා කිරීමට කැප කළ අතර ඔහු එය සමාජ, දේශපාලන, ආගමික සහ වෙනත් තත්ත්වයන් යටතේ පරීක්ෂා කළේය.

නිදසුනක් වශයෙන්, ඉහත සඳහන් කළ පරිදි, ශිෂ්ටාචාරය සහ නිසි හැසිරීම්වලට පොදු හරයක් ඇති බව ඔහු ප්‍රකාශන කිහිපයකින් පෙන්වා දී ඇත. ඒවා නම්, 'වොෂින්ටන් සමාගම සහ සංවාදයේ ශිෂ්ටත්වය සහ විනීත හැසිරීම් පිළිබඳ නීති' (Washington company and the Rules of Civility and Courtesy in Conversation), 'ජෝර්ජ් වොෂින්ටන් මැසොනික් ජාතික අනුස්මරණය' (George Washington Masonic National Memorial) සහ 'කර්සිව් පිටපත' (Cursive Text) ජෝර්ජ් වොෂින්ටන්ගේ ශිෂ්ටාචාර පිළිබඳ පොත' (The book of Civilization by George Washington) වේ. වර්ජිනියා වංශාධිපතියෙකු ලෙස උපත ලැබූ ඔහු, 'ස්වයං පාලනය, මධ්‍යස්ථභාවය, ශිෂ්ටත්වය, ශාරීරික හා සදාචාරාත්මක ශක්තීන්' වැනි ගුණධර්ම හොඳින් වගා කළේය.

වොෂින්ටන් සතුව තිබූ වැදගත්ම පෞද්ගලික සහ නායකත්ව ලක්ෂණය නම්, ඔහු බලලෝභී පාලකයකු නොවීමයි. ඔහු ජනාධිපති ධූරය තුන්වන වාරයක් පිළිගන්නා ලෙස කළ ඉල්ලීම් ප්‍රතික්ෂේප කරමින් ජනාධිපති සීමාවන් සඳහා පූර්වාදර්ශයක් තැබීය. බෲක්හයිසර් (Brookhiser) මේ පිළිබඳව ලියා ඇති පරිදි: 'ඔහුගේ රටට වොෂින්ටන් කළ අවසන් සේවය වූයේ, සේවය කිරීම නැවැත්වීමයි.' ජෝර්ජ් වොෂින්ටන් ජනාධිපති ලෙස වාර දෙකකට පසු ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැනීම යුරෝපයේ සාමාන්‍ය සම්ප්‍රදායික රාජාණ්ඩු පාලනය තියුණු ලෙස වෙනස් විය. මෙම සාමකාමී බල හුවමාරුව ස්ථාපිත කිරීම එක්සත් ජනපදයේ පළමු ප්‍රධාන විධායකයා ලෙස ජෝර්ජ් වොෂින්ටන් බොහෝ දෙනා අතර තැබූ කල් පවත්නා පූර්වාදර්ශයකි. 1930-1940 වර්ෂවලදී ෆ්‍රැන්ක්ලින් රූස්වෙල්ට් (Franklin Roosevelt) සිව් වතාවක් තේරී පත්වන තෙක් මෙම ස්වේච්ඡා සීමාව සඳහා වොෂින්ටන් පිහිටුවා ඇති පූර්වාදර්ශය සෑම ජනාධිපතිවරයකු විසින්ම අනුගමනය කරන ලදී.

වොෂින්ටන් ශ්‍රේෂ්ඨ මිනිසෙක් බවට පත් වූ අතර සම්භාව්‍ය වීරයෙකු ලෙස පිළිගැනීමට ලක්වූයේ, ඔහු හැසිරුණු ආකාරය නිසා ය. ඔහු අනෙක් මිනිසුන්ගෙන් වෙනස් වූයේ ඔහුගේ එම සදාචාරාත්මක චරිතවත් බව නිසාය.

## සාරාංශය

ජෝර්ජ් වොෂින්ටන් ඇමරිකා එක්සත් ජනපදය, ජනරජයක් ලෙසින් පිහිටුවීමේ දී එහි මූලිකත්වය ගත් ආදී පීතෘවරුන් අතරින් අයෙකු ලෙස ගම්‍යමාන වේ. බහුතර ඡන්ද ලබාගනිමින් ජනාධිපති ධූරයට පත් වූ ජෝර්ජ් වොෂින්ටන්, සිය රට ප්‍රවර්ධනය කිරීම සඳහා වූ අඩිතාලම සකසන ලදී. ඔහු තම ධූර කාලය තුල මධ්‍යස්ථ විදේශ ප්‍රතිපත්තියක් අනුගමනය කළ අතර, එය තම අනුප්‍රාප්තිකයන් හට මාර්ගෝපදේශයක් සලසන ලදී. ආර්ථිකයෙන් ශක්තිමත් භාණ්ඩාගාරයක් පවත්වා ගැනීමෙන් ද යුරෝපයේ වූ යුධ කැළඹීම්වලට සහභාගී නොවී සිටීමෙන් ද යහපත් පාලනයක් ගෙන ගිය ඔහු, ජනතාව අතර ජනප්‍රියත්වයට හා ඉමහත් ප්‍රසාදයට ලක් වූ ජනාධිපතිවරයෙක් විය.

සමස්තයක් වශයෙන් ගත් කළ, ඔහු ආ ගමන් මගෙහි වූ සුවිශේෂී සංධිස්ථාන මගින් ප්‍රකාශ වනුයේ, ජෝර්ජ් වොෂින්ටන් ඇමරිකා එක්සත් ජනපදයෙහි බිහි වූ එක් ශ්‍රේෂ්ඨ සහ අසහාය ලොව දිනූ චරිතයක් වන බවයි.

## මූලාශ්‍ර නාමාවලිය

Alden, John R. (1984). "George Washington: A Biography." Louisiana State University Press. ISBN13: 9780788151583

Ferling, John E. (1988) "First of Men: A Life of George Washington." Knoxville: The University of Tennessee Press.

Freidel, F. and Sidey, H. (2017). George Washington. [online] The White House. Available at: https://www.whitehouse.gov/about-the-white-house/presidents/george-washington/.

George Washington’s Mount Vernon. (2000). George Washington’s Mount Vernon. [online] Available at: https://www.mountvernon.org/george-washington/.

Graff, H. and Nevins, A. (2022). George Washington | Life, Presidency, Accomplishments, & Facts. [online] Encyclopedia Britannica. Available at: https://www.britannica.com/biography/GeorgeWashington#:~:text=George%20Washington%20is%20often%20called [Accessed 31 Jan. 2023].

History. (2020). George Washington. [online] Available at: https://kids.nationalgeographic.com/history/article/george-washington.


Nevins, A. and Graff, H. (2018). George Washington | Life, Presidency, & Accomplishments. In: Encyclopædia Britannica. [online] Available at: https://www.britannica.com/biography/George Washington.

US Department of State (2019). Washington’s Farewell Address,1796. [online] State.gov. Available at: https://2001-2009.state.gov/r/pa/ho/time/nr/14319.htm [Accessed 22 Jan. 2023].

Washington, District of Columbia 1800 I. Street NW; Dc 20006. "PolitiFact - Goodlatte says U.S. has the oldest working national constitution". @politifact. Retrieved January 21, 2023. Available at: https://www.khanacademy.org/humanities/us-history/road-to-revolution/creating-a-nation/a/presidency-of-george-washington

Wriston, H.M. (1927). WASHINGTON AND THE FOUNDATIONS OF AMERICAN FOREIGN POLICY^. [online] Available at: http://collections.mnhs.org/MNHistoryMagazine/articles/8/v08i01p003-026.pdf [Accessed 1 Feb. 2023].

# තෝමස් ජෙෆර්සන් (Thomas Jefferson)



**කණ්ඩායම් සාමාජිකයන්**

- ඊ. එම්. කළණි විශාඛා ඒකනායක
- චේතනා සත්සරණි ඕවිටිගල
- රවීනා සචිනි දිසානායක
- ආර්. ශානිකා ගිම්හානි

## හැඳින්වීම

ඇමරිකානු රාජ්‍ය තාන්ත්‍රිකයෙකු, නීතිඥයෙකු, ගෘහ නිර්මාණ ශිල්පියෙකු, දාර්ශනිකයෙකු, වාර්තාකරුවෙකු මෙන්ම වහල් හිමිකරුවෙකු වූ තෝමස් ජෙෆර්සන් (Thomas Jefferson) 1801 සිට 1809 දක්වා කාලය තුළ ඇමරිකා එක්සත් ජනපදයේ තුන්වන ජනාධිපතිවරයා ලෙස සේවය කළේය. ගණිත ශාස්ත්‍රය, උද්‍යාන විද්‍යාව සහ යාන්ත්‍රික විද්‍යාව ආදී බොහෝ විෂයයන් ප්‍රගුණ කළ ජෙෆර්සන් භාෂා කිහිපයක් ද දැන සිටියේය. එසේම, ආගම සහ දර්ශනය කෙරෙහි ජෙෆර්සන්ගේ පැවති දැඩි උනන්දුව නිසා ඔහු ඇමරිකානු දාර්ශනික සංගමයේ සභාපතිත්වයට ද පත් විය. ඔහු ඇමරිකානු විප්ලවවාදී යුද්ධයේදී වර්ජිනියාවේ (Virginia) දෙවන ආණ්ඩුකාරවරයා ලෙස සේවය කළ අතර 1785 දී, ප්‍රංශයේ එක්සත් ජනපද ඇමතිවරයා ලෙස පත් කරන ලදී. පසුව, ජනාධිපති ජෝර්ජ් වොෂින්ටන් (George Washington) යටතේ ජාතියේ පළමු රාජ්‍ය ලේකම්වරයා වශයෙන් සේවය කරනු ලැබීය. එසේම, ඔහු ජෝන් ඇඩම්ස් (John Adams) යටතේ ජාතියේ දෙවන උප ජනාධිපතිවරයා ද විය. එක්සත් ජනපද නිදහස් ප්‍රකාශනයේ ප්‍රධාන කතුවරයා වන ජෙෆර්සන් ප්‍රජාතන්ත්‍රවාදය, (Democracy) ජනරජවාදය (Republicanism) සහ පුද්ගල අයිතිවාසිකම් (Individual Rights) වෙනුවෙන් පෙනී සිටි ශ්‍රේෂ්ඨ නායකයෙකු වශයෙන් පෙන්වා දිය හැකිය. මහා බ්‍රිතාන්‍ය රාජධානියෙන් බිඳී නව එක්සත් ජාතියක් පිහිටුවීමට එවක සිටි ඇමරිකානුවන් පොළඹවනු ලැබුවේ ජෙෆර්සන් විසිනි. ඒ අනුව මොහු ඇමරිකාවේ මුල් සංවර්ධනයේ ප්‍රමුඛ චරිතයක් විය.

නීති සම්පාදකයෙකු ලෙස ද සේවය කළ ඔහු ආගමික නිදහස සඳහා රාජ්‍ය නීතියක් ද කෙටුම්පත් කළේය. රාජ්‍ය, ජාතික සහ ජාත්‍යන්තර මට්ටමින් ආකෘතික ලේඛන සහ තීරණ ඉදිරිපත් කළ ඔහු පල්ලිය සහ රාජ්‍යය සම්පූර්ණයෙන්ම වෙන් කිරීම පිළිබඳ මුල්කාලීන උපදේශකයෙකු විය. වර්ජිනියා විශ්වවිද්‍යාලයේ (University of Virginia) නිර්මාතෘ සහ ගෘහ නිර්මාණ ශිල්පියා ද වූ මොහු ඇමරිකා එක්සත් ජනපදය බ්‍රිතාන්‍ය යටත්විජිතකරණයෙන් මුදා ගනිමින් එක්සත් රාජ්‍යක් වශයෙන් ගොඩනැගීමට කැපවී කටයුතු කළ විශිෂ්ඨ නායකයෙකු ලෙස නම් කළ හැකිය. එසේම, එක්සත් ජනපදයට වර්තමාන ලෝක බලවතා ලෙස නැගී සිටීමට මූලික අඩිතාලම දැමූ ඇමරිකානු දේශපාලන ඉතිහාසය තුළ අමරණීය හා

නොමැකෙන සටහනක් තැබූ චරිතයක් වන ජනාධිපති තෝමස් ජෙෆර්සන්ගේ චරිතාපදානය ගෙනහැර දැක්වීම මෙහි අපේක්ෂාවයි.

## ළමා කාලය, අධ්‍යාපනය හා දේශපාලනයට පිවිසීම



*තෝමස් ජෙෆර්සන් කුඩාවියේදී සිය පවුල සමග*

1743 අපේල් 13 වන දින තෝමස් ජෙෆර්සන් උපත ලැබූ අතර පීටර් ජෙෆර්සන් (Peter Jefferson) සහ ජේන් රන්ඩොල්ෆ් (Jane Randolph) ඔහුගේ දෙමාපියන් විය. ඔහුගේ පියා පීටර් ජෙෆර්සන් වැවිලිකරුවෙකු සහ මිනින්දෝරුවෙකු වූ අතර ඔහු ජෙෆර්සන්ට වයස අවුරුදු දාහතරක් වන විට මිය ගියේය. ජෙෆර්සන් ඔහුගේ පියාට ඔහුගේ වතු වලින් ඉහළ ආදායමක් තිබූ බැවින් ජෙෆර්සන් ට විධිමත්ව අධ්‍යාපනයක් ලබා ගැනීමට හැකි විය. ඔහුගේ දෙමාපියන් ඔහු තරුණ වියට එළඹෙත් ම වියෝ වූ බැවින් ඔහුට සහ ඔහුගේ සහෝදරයා ට මෙම වතු ඉඩකඩම් හා සේවකයන් නඩත්තු කිරිමේ වගකීම පැවැරිණි.

ජෙෆර්සන්ගේ පියාගේ අභාවයෙන් පසු, ඔහුට උපදෙස් දීමට හෝ මඟපෙන්වීමට කිසිවෙකු නොමැති වූ බවත් ඔහුගේ රැකවරණය හා ඔහුගේ ඉදිරි ගමන පිළිබඳ වගකීම ඔහු වෙතම පැවරුණු බවත් ඔහු පසුකාලීනව ඔහුගේ මුණුපුරාට ලියූ ලිපියක සඳහන් විය. කුඩා කළ ෂැඩ්වෙල්හි (Shadwell) ගත කළ ඔහු වයස අවුරුදු 16 දී, විලියම් හා මේරි විශ්වවිද්‍යාලයට (College of William & Mary) ඇතුළත් වීම සඳහා විලියම්ස්බර්ග් (Williamsburg) වෙත ගියේය.

ඔහු එම විද්‍යාලයට ඇතුළත් වීමෙන් පසු ගණිතය සහ ස්වාභාවික විද්‍යාවන් මෙන්ම ලතින් භාෂාව ඇතුළු තවත් සම්භාව්‍ය භාෂාවන් ද ඉගෙන ගන්නා ලදී. ජෝන් ලොක් (John Locke), ෆ්‍රැන්සිස් බේකන් (Francis Bacon) සහ අයිසැක් නිව්ටන් (Isaac Newton) වැනි සුප්‍රසිද්ධ චින්තකයින්ගේ අදහස් කෙරෙහි ජෙෆර්සන් මුලින්ම යොමු වූයේ විශ්වවිද්‍යාලයේදීය. ඒ අනුව, කුඩා කළ ඔහු ලැබූ අධ්‍යාපනය මෙන්ම, විශ්වවිද්‍යාලය තුළින් ලබාගත් අත්දැකීම් හා දැනුම ඔහුගේ චින්තනයේ අත්තිවාරම දැමීමට හේතු විය. ඉන් ඔබ්බට, එය ඇමරිකාවේ රාජ්‍ය ව්‍යුහය සහ ප්‍රතිපත්ති බොහෝමයක් හැඩගැස්වීමට මෙන්ම ඇමරිකානු ඉතිහාසයේ වඩාත්ම වැදගත් හා වටිනා ලේඛන සැකසීමට තුඩු දුන්නේය.

ජෙෆර්සන් හැදී වැඩුණු දහඅටවන සියවස දර්ශනය, අධ්‍යාපනය සහ විද්‍යාවේ විප්ලවයක් සිදු වූ කාලපරිච්ඡේදයක් විය. ඒ අනුව, එකල සම්භාව්‍ය කලාව, සංගීතය, සාහිත්‍ය සහ දර්ශනය යන ක්ෂේත්‍රයන්හි පිබිදීමක් දක්නට ලැබුණි. එසේම, ජෝන් ලොක් සහ තෝමස් හොබ්ස් වැනි ප්‍රබල ලේඛකයන්ගේ අදහස් ද මෙකල ව්‍යාප්ත විය. ඒ අනුව, කුඩා කල සිට ජෙෆර්සන් ලැබූ අත්දැකීම් හා දැනුම පසුකාලීනව ඔහු ප්‍රබල හා විප්ලවවාදී මෙන්ම ඇමරිකානු ඉතිහාසයේ කැපී පෙනෙන නායකයෙකු ලෙස ගොඩ නැංවීමට හේතු සාධක විය.

## නායකත්වය කරා ගිය ගමන් මඟ

1776 නිර්මාණය කළ ඇමරිකානු නිදහස් ප්‍රකාශනයේ ප්‍රධාන කතුවරයා ලෙස හඳුන්වනු ලබන්නේ තෝමස් ජෙෆර්සන්ය. නිදහස් ප්‍රකාශනය සම්බන්ධයෙන් මුලින්ම යෝජනා ඉදිරිපත් කරන ලද අයෙක් ලෙස තෝමස් ජෙෆර්සන් හඳුන්වනු ලබයි. ඇමරිකානු විප්ලවය සමයේ නිර්මාණය වූ II මහාද්වීපික කොංග්‍රසයට තේරී පත් වූ ඔහු, 1775 දී එම කොංග්‍රසයට (Second Continental Congress) පැමිණි ලාබාලතම නියෝජිතයන් අතරෙන් එක් අයෙකි. එවකට කොංග්‍රසය තුළ නැඟී ගෙන එමින් සිටි නායකයකු වූ ජෝන් ඇඩම්ස් සමීපව ඇසුරු කිරීමට තෝමස් ජෙෆර්සන් යොමු විය. එලෙස ගොඩනැගුණු සමීප සබඳතාවය හේතුවෙන් තෝමස් ජෙෆර්සන්ට කොංග්‍රසය තුළ වඩාත් කැපී පෙනෙන භූමිකාවක් ඉටු කිරීමට අවස්ථා ජෝන් ඇඩම්ස් විසින් සකස් කර දෙන ලදී.

ඇමරිකානු විප්ලවයේ ආරම්භක වකවානුවේ දී, එනම්, 1775 සැප්තැම්බර් 26 වන දින ඇල්බමාර්ල් ප්‍රාන්තයේ මිලිෂියාවේ (Albemarle County Militia) අණදෙන නිලධාරියා ලෙස කර්නල් ජෙෆර්සන් තේරී පත් විය. පසුව ඔහු 1776 සැප්තැම්බර් මාසයේදී ඇල්බමාර්ල් ප්‍රාන්තය සඳහා වර්ජිනියා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයට (Virginia House of Delegates) තේරී පත් විය. ප්‍රාන්ත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අවසන් කිරීම ඔවුන්ගේ ප්‍රමුඛතාවයක් විය. 1778 දී ජෙෆර්සන්ට රාජ්‍ය නීති සංශෝධනය කිරීමේ කාර්යය සඳහා ද තම දායකත්වය සැපයීමට අවස්ථා සැලසෙන ලදී. ඔහු වසර තුනක් තුළ අධිකරණ පද්ධතිය විධිමත් කිරීමට නීති ඇතුළු පනත් 126ක් කෙටුම්පත් කළේය. ඔහු "ජනරජ රජයේ" (Republican Government) පදනම ලෙස සැලකූ සාමාන්‍ය අධ්‍යාපනය සඳහා ප්‍රඥප්ති යෝජනා කළේය. 1779 සිට 1780 දක්වා එනම් වසරක කාලයක් සඳහා ආණ්ඩුකාරවරයා ලෙස ජෙෆර්සන් තේරී පත් විය. ඔහු 1784 ඉඩම් ආඥාපනතේ ප්‍රධාන කතෘ වූ අතර, එමගින් වර්ජිනියා ඔහියෝ ගඟට (Ohio River) වයඹ දෙසින් හිමිකම් කියන විශාල ප්‍රදේශය රජයට පවරා දුන්නේය. මෙම භූමිය ප්‍රාන්ත දහතුනෙන් කිසිම ප්‍රාන්තයක් විසින් යටත් විජිත ප්‍රදේශයක් ලෙස භාවිතා නොකළ යුතු බවත්, එය ප්‍රාන්ත බවට පත්විය හැකි අයුරින් කොටස්වලට බෙදිය යුතු බවත් ඔහු අවධාරණය කළේය. ඔහු නව ප්‍රාන්ත නවයකට ඔවුන්ගේ ආරම්භක අදියරයේදී දේශසීමා සැලසුම් කළ අතර, වහල්භාවය තහනම් කිරීමේ ආඥාපනතක් ද ඔහු ලිවීය. කොංග්‍රසය විසින් පුළුල් සංශෝධනයක් සිදුකළ අතර වහල්භාවය තහනම් කිරීම ප්‍රතික්ෂේප කළේය. ''ජෙෆර්සන් ප්‍රොවිසෝ" (Jefferson Proviso) ලෙස හැඳින්වෙන වහල්භාවය තහනම් කිරීමේ විධිවිධානය, වසර තුනකට පසුව එළිදැක්විය. එනම්, 1787 දී වයඹ ආඥාපනත මඟින් වෙනස් කර ක්‍රියාත්මක කරන ලද අතර එය මුළු වයඹ ප්‍රදේශයටම නීතියක් ලෙස බලාත්මක කරන ලදී. පසුව ජෝර්ජ් වොෂින්ටන් විසින් තෝමස් ජෙෆර්සන් ව රාජ්‍ය ලේකම් ලෙස පත් කළ අතර ඔහුට අගනුවර තුළම රැඳී සිටින ලෙස ජෝර්ජ් වොෂින්ටන් අණ කර තිබුණි. ඔහු තනතුර භාර ගැනීමේදී රට තුළ උද්ගතව පැවැති ගැටලුවක් වූයේ, ජාතික ණය හා ප්‍රාග්ධනයේ ස්ථිර පිහිටීමයි. මේ සඳහා ජෙෆර්සන් ගේ යෝජනාව වූයේ බ්‍රිතාන්‍ය වාණිජ්‍යය මත ඇමරිකානු යැපීම අඩු කිරීම සහ ප්‍රංශය සමග වාණිජ වෙළඳ සබඳතා පුළුල් කිරීම යි. දෙවන ප්‍රධාන ගැටළුව වූයේ අගනුවර ලෙස පිහිටුවන ස්ථානයයි. ඇලෙක්සැන්ඩර් හැමිල්ටන් (Alexander Hamilton)


ඊසානදිග තිබෙන ප්‍රධාන වාණිජ මධ්‍යස්ථානවලට ආසන්න අගනුවරකට කැමති වූ අතර වොෂින්ටන් (George Washington), ජෙෆර්සන් (Thomas Jefferson) සහ අනෙකුත් ගොවි ජනතාවන්ට එය දකුණ ප්‍රදේශය ට වන්නට අවශ්‍ය විය. කෙසේ වෙතත් දෙපාර්ශවය නිශ්චිත එකගතාවයකට නොපැමිණි හෙයින්, අගනුවර පොටෝමැක් (Potomac) ගඟ ආසන්නයේ නම් කරන ලදී.

1792 මැයි මස වන විට නැගී එමින් තිබුණු දේශපාලන ප්‍රතිවිරෝධතා හඳුනාගත් තෝමස් ජෙෆර්සන් ජෝර්ජ් වොෂින්ටන් ට ලිපියක් ලියමින් සඳහන් කරේ නැවත මැතිවරණයකට එම වසර තුළ ඉදිරිපත් වෙන ලෙසයි. ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරන පක්ෂයක වැදගත්කම ගැන ඔහු ලියූ දීර්ඝ ලිපිය පක්ෂයේ ප්‍රතිපත්ති සම්බන්ධයෙන් මුල්ම අර්ථකතනය ලෙස ඉතිහාසඥයන් හඳුන්වයි.

1793 දී බ්‍රිතාන්‍යය හා ප්‍රංශය අතර සිදු වූ සටනේදී ජෙෆර්සන්ගේ සහය ප්‍රංශයට ලැබුණි. නමුත්, ප්‍රංශ විප්ලවවාදියෙකු වූ එඩ්මන්ඩ්-චාල්ස් ජෙනට් (Edmond - Charles Genet) විසින් තෝමස් ජෙෆර්සන් ට විරුද්ධව මේ සම්බන්ධයෙන් කැබිනට් මණ්ඩලය තුළදී කතා කරන ලදී. තෝමස් ජෙෆර්සන් ට තම දේශපාලන ජීවිතය තව දුරටත් ශක්තිමත් කිරීමට අවශ්‍ය වූ හෙයින් 1793 දෙසැම්බර් මාසයේදී කැබිනට් තනතුරෙන් ඔහු ඉල්ලා අස්විය.

1794 දී වොෂින්ටන් පරිපාලනය විසින් (Washington administration) මහා බ්‍රිතාන්‍යය වෙත ජේ ගිවිසුම (Jay treaty) ඉදිරිපත් කරන ලදී. 1796 ජනාධිපතිවරණ ව්‍යාපාරයේදී, ජෙෆර්සන් ෆෙඩරල්වාදියෙක් වූ ජෝන් ඇඩම්ස් ට (John Adams) පරාජය වූ අතර උප සභාපති ලෙස ජෙෆර්සන් තේරී පත් විය. ඔහු සෙනෙට් සභාවට නිදහසේ වාද විවාද පැවැත්වීමට ඉඩ ලබා දුන් අතර ඔහුගේ සහභාගීත්වය කාර්යය පටිපාටික ගැටළුවලට පමණක් සීමා කළේය. ජෙෆර්සන් ට ඒ වන විට පාර්ලිමේන්තු නීතිය සහ ක්‍රියා පටිපාටිය පිළිබඳ මනා අවබෝධයක් තිබුණු අතර, ඔහු ට මූලසුන දැරීමට තරම් සුදුසුකම් ද තිබී ඇත. 1800 දී, ඔහු සෙනෙට් සභා ක්‍රියා පටිපාටිය පිළිබඳ ඔහුගේ එකලස් කළ සටහන් පාර්ලිමේන්තු පරිචයන් පිළිබඳ අත්පොතක් ලෙස ප්‍රකාශයට පත් කළේය. 1800 දී ජෙෆර්සන් නැවත වරක් ඇඩම්ස් ට එරෙහිව ජනාධිපති ධූරයට තරඟ වැදුණේය. ඩිමොක්‍රටික්-රිපබ්ලිකන්වරු (Democratic-Republican) අවසානයේ දී වැඩි ඡන්ද විශාල ප්‍රමාණයක් දිනා ගත්

අතර, ජෙෆර්සන් (Jefferson) සහ ඔහුගේ උප-ජනාධිපති අපේක්ෂකයා ඇරන් බර් (Aaron Burr) සමවිය.



*තෝමස් ජෙෆර්සන් තරුණ වියේදී*

## නායකත්වයට පැමිණීමෙන් පසු සිදුකළ සේවාව

ඇමරිකා එක්සත් ජනපදයේ ආදි පිතෘවරයෙක් ලෙස සලකන තෝමස් ජෙෆර්සන් නායකත්වයට පැමිණීමෙන් පසු සිදු කළ සේවාව ඇමරිකා එක්සත් ජනපදයේ දීර්ඝ කාලීන වර්ධනය කෙරෙහි මහත් සේ බලපෑවේය. ඇමරිකන් විප්ලවීය යුද්ධයේ මුල් කාලයේ දී ඔහු කොන්ටිනන්ටල් කොංග්‍රසයේ සේවය කළේ වර්ජීනියාවේ නියෝජිතවරයෙක් ලෙසිනි. අනතුරුව ඔහු යුද්ධ පැවති සමයේ වර්ජීනියාවේ ආණ්ඩුකාරයා ලෙසින් ද සේවය කළේය. යුද්ධයේ අවසානයත් සමඟ ප්‍රංශයේ පැරිස් නුවර රාජ්‍ය තාන්ත්‍රිකයෙකු ලෙසින් සේවය කළ ඔහු 1785 දී ප්‍රංශයට පත්වීම් ලද එක්සත් ජනපද ඇමතිවරයා ද විය. ජෙෆර්සන් 1790 සිට 1793 දක්වා ප්‍රථම ජනාධිපති ජෝර්ජ් වොෂින්ටන් (George Washington) යටතේ එක්සත් ජනපදයේ රාජ්‍ය ලේකම්වරයා වශයෙන් සේවය කළේය. සිය මිතුරා වූ ජේම්ස් මැඩිසන් (James Madison) සමඟින් ඔහු ඩිමොක්‍රටික් රිපබ්ලිකන් පක්ෂය (Democratic Republican Party) සංවිධානය කරන ලද්දේය. අනතුරුව ඔහු වොෂින්ටන්ගේ කැබිනට් මණ්ඩලයෙන් ඉල්ලා අස්වීමෙන් පසු 1796 දී උප ජනාධිපතිවරයා ලෙසින් තේරී පත් වූයේය. ඉන් අනතුරුව, ඔහු 1801 මාර්තු 4 වැනි දා ඇමරිකාවේ තුන්වැනි ජනාධිපතිවරයා ලෙසින් පත් විය.

තෝමස් ජෙෆර්සන් එක්සත් ජනපදයේ තුන්වන ජනාධිපතිවරයා ලෙස 1801 මාර්තු 4 සිට 1809 මාර්තු 4 දක්වා සේවය කළේය. ඔහුගේ පරිපාලනය බදු, රජයේ වියදම් සහ ජාතික ණය අඩු කළ අතර, දේශද්‍රෝහී පනත අවලංගු කළේය. ඔහුගේ දෙවන ධූර කාලය තුළදී ජෙෆර්සන්ගේ අවධානය යොමු වූ එක් සුවිශේෂී කරුණක් වූයේ, හිටපු ජනාධිපති ආරොන් බර් (Aaron Burr) රාජ්‍යද්‍රෝහී චෝදනාවට ලක් වූ නඩු විභාගය වෙතය. එම නඩු විභාගයෙන් ඔහුව නිදොස් කොට නිදහස් කිරීමට ජෙෆර්සන් කටයුතු කළේය. එසේම, වහල්භාවය පිළිබඳ ප්‍රශ්නය ඔහුගේ අවධානයට යොමු වීම තුලින් ඔහුගේ මානුෂීය ගුණාංග ප්‍රකට වේ.

1806 දී ඔහු ජාත්‍යයන්තර වහල් වෙළඳාම "මානව හිමිකම් උල්ලංඝනය කිරීමක්" ලෙස හෙළා දුටු අතර එය අපරාධයක් ලෙස සලකන ලෙස කොංග්‍රසයෙන් ඉල්ලා සිටියේය. කොංග්‍රසය එයට ප්‍රතිචාර දැක්වූයේ ඉදිරි වර්ෂයේ වහලුන් ආනයනය කිරීම තහනම් කිරීමේ පනත අනුමත කිරීමෙනි. ඔහුගේ දේශපාලන දිවියේ වඩාත් කැපී පෙනෙන අවස්ථාවක් වන්නේ, ව්‍යවස්ථාපිත බලයක් නොමැතිව වුවද ඇමරිකා එක්සත් ජනපදයේ විශාලත්වය දෙගුණ කිරීමට සමත් වූ එකල ප්‍රංශයේ ලුසියානා (Louisiana) ප්‍රදේශය කිසිදු මතභේදයකින් තොරව අත්පත් කර ගැනීම යි. එක්සත් ජනපදය සහ බ්‍රිතාන්‍ය අතර නැඟී එන ආතතීන් ජෙෆර්සන්ගේ දෙවන ධූර කාලයේ අවසාන වසරවල කැපී පෙනෙන්නට විය. බ්‍රිතාන්‍යය සමඟ ඇති වූ ආරවුල් ජෙෆර්සන් ධූරයෙන් ඉවත් වූ පසුවත්, 1812 දී ඇති වූ යුද්ධයට තුඩු දුන්නේය. කෙසේ වුවද, ශාස්ත්‍රීය ඉතිහාසඥයින් සහ දේශපාලන විද්‍යාඥයින්ගේ සමීක්ෂණවලදී, ජෙෆර්සන් ජාතියේ වඩාත්ම ගෞරවනීය ජනාධිපතිවරුන්ගෙන් කෙනෙකු ලෙස නිරන්තරයෙන් ශ්‍රේණිගත කර ඇත.

ජාතික අගනුවරක් සහ ෆෙඩරල් දිස්ත්‍රික්කයක් සැලසුම් කිරීම සහ ඉදිකිරීම සඳහා ජෙෆර්සන් ප්‍රධාන කාර්යභාරයක් ඉටු කළේය. ඔහු දැරූ විවිධ රාජ්‍ය තනතුරුවලදී සීමිත බලතල සහිත ෆෙඩරල් රජයක් පිහිටුවීමට ජෙෆර්සන් උත්සාහ කළේය. කෙසේ වෙතත්, ජෙෆර්සන් ජනාධිපතිවරණවලදී පරාජිතයන්ගෙන් ජයග්‍රාහකයින් වෙත සාමකාමීව බලය ලබා දීමේ මූලධර්මය ස්ථාපිත කළේය. ජෙෆර්සන් ඔහුගේ මැතිවරණ ජයග්‍රහණය හැඳින්වූයේ "දෙවන ඇමරිකානු විප්ලවය" යනුවෙනි.

ජනාධිපතිව සිටියදී ජෙෆර්සන්ගේ මූලධර්ම බොහෝ ආකාරවලින් පරීක්ෂාවට ලක් විය. නිදසුනක් වශයෙන්, ලුසියානා ප්‍රදේශය ප්‍රංශයෙන් මිලදී ගැනීම සඳහා ඔහු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳ පටු අර්ථකථනය පුළුල් කිරීමට කැමති විය. නමුත්,

ජෙෆර්සන් වහලුන් ආනයනය කිරීම අවසන් කිරීමට සහ පල්ලිය සහ රාජ්‍යය වෙන් කිරීම පිළිබඳ ඔහුගේ මතය පවත්වා ගැනීමට ස්ථිරව සිටියේය. ඔහුගෙන් පසු ජනාධිපති ධූරයට පත් වීමට ඔහුගේ දේශපාලන හිතවතුන් වූ ජේම්ස් මැඩිසන් (James Madison) සහ ජේම්ස් මොන්රෝට (James Monroe) ද ඔහු මග පෑදීය.

ඒ අනුව, ඇමරිකානු දේශපාලන ඉතිහාසය තුළ ශ්‍රේෂ්ඨ පාලකයෙක් වන තෝමස් ජෙෆර්සන් විසින් සිදු කළ සේවාව එකල සිටි ඇමරිකානුවන්ගේ දේශප්‍රේමී අරමුණු මුදුන්පත් කරගැනීමට, සමානාත්මතාවය ස්ථාපිත කිරීමට මෙන්ම පසුකාලීනව ලොව ප්‍රබලතම රාජ්‍යය වශයෙන් නැගී සිටීමට ද හේතුපාදක වූ බව නොඅනුමානය.

## විදේශ ප්‍රතිපත්තිය

තෝමස් ජෙෆර්සන් මුල් ඇමරිකානු විදේශ ප්‍රතිපත්තියේ නිර්මාතෘවරයා යි. ඔහු ලේඛන සහ රාජ්‍ය පත්‍රිකා ගණනාවකින් ලෝකයේ නව ජනරජයේ තත්ත්වය පිළිබඳ පැහැදිලි දැක්මක් ඉදිරිපත් කළේය. ඔහුගේ උපායමාර්ගික දැක්මෙහි ප්‍රධාන අංග වූයේ භූගෝලීය ව්‍යාප්තිය සහ නිදහස් වෙළඳාමයි. විශේෂයෙන් ඔහු රාජ්‍ය ලේකම්, උප ජනාධිපති සහ ජනාධිපති ලෙස කටයුතු කළ කාලය තුළ ඔහුගේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට දැඩිව උත්සාහ කළේය. එක්සත් ජනපදය බටහිර දෙසට ව්‍යාප්ත විය යුතු බවත්, එහි පුරවැසියන්ට ගෝලීය වශයෙන් වෙළඳාම් කිරීමට නිදහස තිබිය යුතු බවත් ඔහු විශ්වාස කළේය. ප්‍රංශ විප්ලවයෙන් සහ ඉන් පසුව ඇති වූ යුද්ධවලදී එක්සත් ජනපදයට නිදහසේ වෙළඳාම් කිරීමට ඇති අයිතිය පවත්වා ගැනීමට ඔහු උත්සාහ කළේය. එක්සත් ජනපදය ජනරජ රාජ්‍ය තාන්ත්‍රිකත්වය නව ලෝකයක් ආරම්භ කළ යුතු බවත්, එය ගෝලීය ජනරජ ව්‍යාපාරයේ පෙරටුගාමී වනු ඇති බවත් ඔහු විශ්වාස කළේය. 1763 දී මහා බ්‍රිතාන්‍යය හමුවේ ප්‍රංශ සහ ඉන්දීය යුද්ධයෙන් ප්‍රංශය පරාජය විය. 1802 දී, එකල ප්‍රංශයේ අධිරාජ්‍යයා වන නැපෝලියන් ස්පාඤ්ඤයෙන් ලුසියානා ප්‍රදේශය නැවත ලබා ගැනීමට සැලසුම් කළේය. ලුසියානා ප්‍රංශය ප්‍රදේශය නැවත අත්පත් කර ගැනීම පින්ක්නිගේ ගිවිසුම ප්‍රතික්ෂේප කරන බව ජෙෆර්සන් හඳුනා ගත් අතර ඔහු එය නැවත සාකච්ඡා කිරීමට රාජ්‍ය තාන්ත්‍රික දූත පිරිසක් පැරීසියට යැවීය. ජෙෆර්සන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව දැඩි ලෙස අර්ථකථනය කිරීමට කැමති විය. ඔහු

හදිසියේම විධායක අධිකාරිය පිළිබඳ ලිහිල් ව්‍යවස්ථාමය අර්ථ නිරූපණයකට මාරු වී මිලදී ගැනීම අනුමත කළේය. එසේ කිරීමෙන්, ඔහු එක්සත් ජනපදයේ ප්‍රමාණය දෙගුණයක් අඩුවෙන් හා යුද්ධයකින් තොරව වැඩි කළේය. ලුසියානා ප්‍රදේශය මිලදී ගැනීම ජෙෆර්සන්ගේ විශිෂ්ටතම රාජ්‍යතාන්ත්‍රික හා විදේශ ප්‍රතිපත්ති ජයග්‍රහණය විය.

ජෙෆර්සන්ගේ විදේශ ප්‍රතිපත්තිය, විශේෂයෙන්ම 1807 සම්බාධක, ඔහුගේ ෆෙඩරල්වාදී විවේචකයන්ගේ වඩාත්ම කෝපයට හේතු විය. ඔහුගේ දෙවන ධූර කාලය අවසානයේදී, ජෙෆර්සන් බ්‍රිතාන්‍යය සහ ප්‍රංශය හැරුණු විට වෙළඳාම සඳහා වූ සම්බාධක ඉවත් කරමින් (Non-Intercourse) 1808, පනතට අත්සන් කළේය. 1810 දී, කොංග්‍රසය තුන්වන සැලැස්ම, (Macon Bill No 3) ලෙස හැඳින්වූයේ බ්‍රිතාන්‍යය සහ ප්‍රංශය ඇමරිකානු යාත්‍රා දිගටම අල්ලා ගැනීම නැවැත්වීම සම්බන්ධවයි. නැපෝලියන් අධිරාජ්‍යයා ප්‍රකාශ කළේ ඇමරිකානු නැව් අල්ලා ගැනීම නැවැත්වීම නතර කරන බවයි.

ජෙෆර්සන් එක්සත් ජනපද හමුදා විදේශ යුද්ධයකට යොමු කළ පළමු ජනාධිපති විය. ට්‍රිපොලි (Tripoli) වන ලිබියාවේ අගනුවර සහ උතුරු අප්‍රිකාවේ අනෙකුත් ස්ථානවලින් යාත්‍රා කරන ම්ලේච්ඡ මුහුදු කොල්ලකරුවන්, මධ්‍යධරණී මුහුදේ ගමන් කරන ඇමරිකානු වෙළඳ නැව්වලින් කප්පම් ගෙවන ලෙස දිගු කලක් තිස්සේ ඉල්ලා සිටියහ. කෙසේ වෙතත්, 1801 දී ඔවුන් තම ඉල්ලීම් ඉදිරිපත් කළ අතර, ජෙෆර්සන් අල්ලස් ගෙවීමේ පුරුද්ද නතර කරන ලෙස ඉල්ලා සිටියේය. ජෙෆර්සන් ට්‍රිපොලි වෙත නාවික හමුදා නැව් සහ භට කණ්ඩායමක් යවන ලද අතර එහිදී මුහුදු කොල්ලකරුවන් සමඟ කෙටි ගනුදෙනුවක් එක්සත් ජනපදයේ පළමු සාර්ථක විදේශීය ව්‍යාපාරය සනිටුහන් කළේය.

එක්සත් ජනපදයට වෘත්තීයමය වශයෙන් පුහුණුව ලත් හමුදා නිලධාරි අවශ්‍ය බව ජෙෆර්සන්ට ඒත්තු ගැන්වීමට මෙම ගැටුම උපකාරී විය. එබැවින්, ඔහු වෙස්ට් පොයින්ට් (West Point) හි එක්සත් ජනපද හමුදා ඇකඩමිය නිර්මාණය කිරීමට නීති සම්පාදනය කළේය. එක්සත් ජනපද විදේශ ප්‍රතිපත්ති පිළිබඳ සාහිත්‍යයේ, ඉතිහාසඥයින් ප්‍රධාන පුහුණු පාසල් දෙකක් හඳුනා ගැනීමට නැඹුරු වී ඇත්තේ වෘත්තිකයන් විඥානවාදීන් සහ යථාර්ථවාදීන් ලෙස බෙදීමයි. ජෙෆර්සන් බොහෝ විට විඥානවාදී සම්ප්‍රදායේ ආරම්භකයා ලෙස සැලකේ.



*තෝමස් ජෙෆර්සන් රාජ්‍ය තාන්ත්‍රික කටයුතුවලට සම්බන්ධ වූ අවස්ථාවක්*

## ගත හැකි ආදර්ශ

ඇමරිකානු දේශපාලන ඉතිහාසයේ අමරණීය චරිතයක් වන තෝමස් ජෙෆර්සන්ගේ නායකත්වය තුළ ගත හැකි ආදර්ශ බොහෝ ය. කොන්ටිනෙන්ටල් කොංග්‍රසයේ (Continental Congress) දේශප්‍රේමී අරමුණට සිය දායකත්වය ලබා දුන් ඔහු, වයස අවුරුදු 33 දී ඇමරිකානු නිදහස් ප්‍රකාශය කෙටුම්පත් කරන ලදී. ඉන් නොනැවතුනු ඔහු, වසර ගණනාවකට පසුව වුවද එහි වචන යථාර්තයක් බවට පත් කිරීමට වෙහෙස වී කටයුතු කළේය.

මධ්‍යධරණී මුහුදේ ඇමරිකානු වාණිජ කටයුතුවලට හිරිහැර කරන උතුරු අප්‍රිකානු මුහුදු කොල්ලකරුවන්ට එරෙහිව සටන් කිරීමට ඔහු නාවික බලඇණියක් ද යැවීය. ඒ අනුව, මොහු ජනතා හිතකාමී නායකයෙකු මෙන්ම තම රාජ්‍යයේ ආරක්ෂාව උදෙසා කැපවීමෙන් කටයුතු කළ නායකයෙකු වශයෙන් පෙන්වා දිය හැකිය.

තවද, නව ඉඩම් අත්පත් කර ගැනීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ප්‍රතිපාදන කිසිවක් නොතිබුණද, 1803 දී නැපෝලියන්ගෙන් (Napoleon Bonaparte) ලුසියානා ප්‍රදේශය අත්පත් කර ගැනීමට අවස්ථාව ලැබුණු විට ජෙෆර්සන් ව්‍යවස්ථාපිතභාවය පිළිබඳ ඔහුගේ චකිතය යටපත් කොට යුද්ධයකින් හෝ මතභේදයකින් තොරව සාමකාමීව එම ප්‍රදේශය අත්පත් කරගනු ලැබීය. ඒ අනුව, මොහු ඇමරිකානු ඉතිහාසයේ අවස්ථාවෝචිතව නිවැරදි තීරණ ගත් එඩිතර පාලකයෙකු වශයෙන්

නම් කළ හැකිය. එසේම, වහල්භාවය හා වහල් වෙළඳාම අවසන් කිරීම සඳහා කැපවී කටයුතු කළ නායකයෙකු ලෙස මොහු නම් කළ හැකිය.

එපමණක් ද නොව, බ්‍රිතාන්‍යයන් විසින් 1812 යුද්ධයේ දී කොංග්‍රස් පුස්තකාලය ගිනිබත් කිරීමෙන් පසු එහි නැති වූ පොත් වෙනුවට 1815 දී, ජෙෆර්සන් ඔහුගේ වෙළුම් 6,700 ක පෞද්ගලික පුස්තකාලය ඩොලර් 23,950 කට කොංග්‍රසයට විකුණනු ලැබීය. ජෙෆර්සන්ගේ එම පොත්, කොංග්‍රසයේ නැවත ගොඩනඟන ලද පුස්තකාලයේ පදනම විය. එමඟින්, ඔහුගේ පරිත්‍යාගශීලී ගුණය හොඳින් පිළිබිඹු වේ. 1770 දශකයේ අගභාගයේදී ඔහු විසින් රචනා කරන ලද සහ 1786 දී වර්ජිනියා නීති සම්පාදකයින් විසින් සම්මත කරන ලද ආගමික නිදහස සඳහා වූ වර්ජිනියා ප්‍රඥප්තිය ඔහුගේ වෘත්තීය ජීවිතයේ වැදගත් ජයග්‍රහණවලින් එකක් ලෙස ඔහු සැලකුවේය. ඒ අනුව, ඔහු ජනතා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම වෙනුවෙන් පෙනී සිටි ජනතා හිතකාමී නායකයෙකු ලෙස පෙන්වා දිය හැකිය.

ජෙෆර්සන් සිය පශ්චාත්-ජනාධිපති කාල සීමාව මොන්ටිසෙලෝ හි (Monticello) ගත කළ අතර එහිදී ඔහු ගෘහ නිර්මාණ ශිල්පය, සංගීතය, කියවීම සහ ගෙවතු වගාව ආදී කාර්යයන්හි නිරත වෙමින් නිදහස් දිවියක් ගත කළේය. එසේම, විශ්‍රාම ගැනීමෙන් පසු ජෙෆර්සන් වර්ජිනියා විශ්වවිද්‍යාලය ආරම්භ කළ අතර එහි ඉදිකිරීම් කටයුතු මෙන්ම විෂය මාලාවන් සැලසුම් කිරීම කෙරෙහි ද සම්බන්ධ විය. එය එකල අනෙකුත් ඇමරිකානු විශ්වවිද්‍යාල මෙන් නොව, එහි සිසුන් සඳහා ආගමික අනුබද්ධතාවයක් හෝ ආගමික අවශ්‍යතා නොමැති බව සහතික කළේය. ඔහු සියලු ජනයාට සමානාත්මතාවයෙන් සැලකූ පාලකයෙක් බව ඒ අනුව පැහැදිලි වේ.

වර්ජිනියාවේ ආගමික නිදහස සහ ඉවසීම වෙනුවෙන් පෙනී සිටීම, යුද්ධයකින් හෝ මතභේදයකින් තොරව ලුසියානා ප්‍රදේශය ප්‍රංශයෙන් සාමකාමීව අත්පත් කර ගැනීම සහ ඔහුගේ අභිලාෂකාමී සහ සාර්ථක ලුවිස් සහ ක්ලාක් ගවේෂණය ඇතුළුව ජෙෆර්සන්ගේ තවත් බොහෝ ජයග්‍රහණ ජනාධිපති විද්වතුන් සහ ඉතිහාසඥයින් විසින් අගය කරති. එසේම, එක්සත් ඇමරිකාවක් ගොඩනැගීම උදෙසා මහඟු කාර්යභාරයක් ඉටු කළ ජෙෆර්සන් ඇමරිකානු ඉතිහාසයේ හොඳම ජනාධිපතිවරුන් දස දෙනා අතරට නිරන්තරයෙන් ශ්‍රේණිගත කර ඇත. ඒ අනුව, ඇමරිකාවට වර්තමාන ලෝක බලවතා ලෙස නැඟී සිටීම සඳහා මූලික අඩිතාලම දැමූ තෝමස් ජෙෆර්සන් චරිතය සෑම රාජ්‍ය නායකයෙකුට මෙන්ම සාමාන්‍ය ජනයාටද මහඟු ආදර්ශයක් වන බව නොඅනුමානය.



*ජනාධිපති තෝමස් ජෙෆර්සන් සිහිවීම උදෙසා ඉදි කරන ලද පිළිරුවක්*

## සාරාංශය

ඇමරිකානු දේශපාලන ඉතිහාසයේ අමරණීය චරිතයක් වන තෝමස් ජෙෆර්සන් බොහෝ දෙනාගේ දේශපාලන ප්‍රතිබිම්බයක් බවට පත් කිරීම ගැන දෙවරක් සිතන්නේ නැත. එක්සත් ජනපද නිදහස් ප්‍රකාශනයේ ප්‍රධාන කතුවරයා වන ජෙෆර්සන් ප්‍රජාතන්ත්‍රවාදය, ජනරජවාදය සහ පුද්ගල අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටි ශ්‍රේෂ්ඨ නායකයෙකු වශයෙන් පෙන්වා දිය හැකිය. ඇමරිකානු විප්ලවවාදී යුද්ධයේදී වර්ජිනියාවේ දෙවන ආණ්ඩුකාරවරයා ලෙස සේවය කළ අතර, 1785 දී ප්‍රංශයේ එක්සත් ජනපද ඇමතිවරයා ලෙස පත් කරන ලදී. පසුව, ඔහු ප්‍රංශයේ එක්සත් ජනපද අමාත්‍යවරයා සහ එක්සත් ජනපද රාජ්‍ය ලේකම් ලෙස සේවය කළ අතර ජෝන් ඇඩම්ස් (1735-1826) යටතේ උප ජනාධිපති විය. ඇමරිකාවේ මුල් සංවර්ධනයේ ප්‍රමුඛ චරිතයක් විය. වර්තමානයේදී ඇමරිකාව ලෝක බලවතා ලෙස නැගී සිටීමට මූලික අඩිතාලම දැමූ ඇමරිකානු දේශපාලන ඉතිහාසය තුළ අමරණීය හා නොමැකෙන සටහනක් තැබූ චරිතයක් ලෙස සැලකිය හැකිය.

# <u>මූලාශ්‍ර නාමාවලිය</u>


Alan, L. (2019). *Mr. Jefferson and the giant moose : natural history in early America*. : Chicago ; London: The University Of Chicago Press.

Cogliano, F.D. (2011). *A Companion to Thomas Jefferson*.John Wiley & Sons.

Jefferson, T. (1950).*The Papers of Thomas Jefferson, Volume 2*.Princeton University Press.

Jefferson, T. and Shuffelton, F. (1998).*Notes on the State of Virginia*. New York, N.Y.: Penguin Books.

Panagiotopoulos, P. (2021). *Thomas Jefferson 'I Too Am an Epicurean'*.

Ellis, J. (2001). American Sphinx: The Character of Thomas Jefferson. Vintage.

Smith, P. (2006). Thomas Jefferson: The Art of Power. Random House.

Wiencek, H. (2012). Master of the Mountain: Thomas Jefferson and His Slaves. Farrar, Straus and Giroux.

Malone, D. (1948). Jefferson the President: First Term, 1801-1805. Little, Brown and Company.

Petrie, C. (2013). The Founding Fathers and the Debate Over Religion in Revolutionary America: A History in Documents. Oxford University Press.

library of congress (2019). Establishing A Federal Republic - Thomas Jefferson | Exhibitions - Library of Congress.

Belohlavek, J.M. and Cogliano, F.D. (2014). Review of Emperor of Liberty: Thomas Jefferson's Foreign Policy. *The History Teacher*, [online] 48(1), pp.183–185.

Christopher F. Minty (2015). *The William and Mary Quarterly*, 72(4), p.693. doi:https://doi.org/10.5309/willmaryquar.72.4.0693.


Gene Allen Smith (2015). Emperor of Liberty: Thomas Jefferson's Foreign Policy. *Journal of Southern History*, [online] 81(3), pp.702–704.

History.com Editors (2018).*Thomas Jefferson*. [online] HISTORY. Available at: https://www.history.com/topics/us-presidents/thomas-jefferson.

The White House (2017).*Thomas Jefferson*. [online] The White House. Available at: https://www.whitehouse.gov/about-the-white-house/presidents/thomas-jefferson/.

Walker, C. (2017). *Thomas Jefferson*. [online] Mtsu.edu. Available at: https://www.mtsu.edu/first-amendment/article/1218/thomas-jefferson.

# ජේම්ස් මොන්රෝ (James Monroe)



**කණ්ඩායම් සාමාජිකයන්**

- දුලාංජලී ජයසූරිය
- නවෝදනී ජයතිලක
- නයෝමි සංසලා ගුණසිංහ
- අබිලා ෂෙහාරි ගුණසිංහ
- පවිත්‍රා අංජලී කංකානම්ගේ

## හැඳින්වීම

ජේම්ස් මොන්රෝ (James Monroe) යනු, 1817 සිට 1825 දක්වා එක්සත් ජනපදයේ පස්වන ජනාධිපතිවරයා මෙන්ම නීතිඥයෙක් සහ ඇමරිකානු රාජ්‍ය තාන්ත්‍රිකයෙක් ලෙස ක්‍රියා කළ ශ්‍රේෂ්ඨ පුද්ගලයෙක් ය. ඩිමොක්‍රටික්-රිපබ්ලිකන් පක්ෂයේ (Democratic-Republican Party) සාමාජිකයෙකු වූ මොන්රෝ ඇමරිකානු දේශපාලන ඉතිහාසයෙහි පළමු වරට පක්ෂ ක්‍රමය අවසන් කරමින් ඔහුගේ ජනපති ධූර කාලය තුළම සාමකාමී කාල සීමාවක් උදා කරලීමට සමත් විය.

වර්ජිනියාවේ වෙස්ට්මෝර්ලන්ඩ් ප්‍රාන්තයේ (Westmoreland County) වහලුන් හිමි වැවිලිකරු පවුලක උපත ලද මොන්රෝ ඇමරිකානු විප්ලවවාදී යුද්ධයේදී මහද්වීපික හමුදාවේ සේවය කළේය. පසුකාලීනව හමුදා සේවයෙන් ඉවත් වූ මොහු තම දේශපාලන දිවිය ආරම්භ කරනුයේ, 1780 සිට 1783 දක්වා තෝමස් ජෙෆර්සන් යටතේ නීතිය හැදෑරීමත් සමඟය. ඉන්පසුව, කොන්ටිනෙන්ටල් කොන්ග්‍රසයේ (Continental Congress) නියෝජිතයෙකු ලෙස සේවය කළ මොන්රෝ 1790 දී  සෙනෙට් සභාවට තේරී පත් වූ අතර එහිදී ඔහු ඩිමොක්‍රටික්-රිපබ්ලිකන් පක්ෂයේ නායකයෙකු ද විය.

එපමණක් නොව, ලුසියානා භූමිකලාපය මිලදී ගැනීම සඳහා සාකච්ඡා කිරීමට සහාය ලබාදීම, රෂ්-බැගොට් ගිවිසුම  (Rush-Bagot Agreement), මිසූරිසම්මුතිය අත්සන් තැබීම, 1819 ඇඩම්ස්-ඔනිස් ගිවිසුම මෙන්ම 1823 දී ඇමරිකානු විදේශ ප්‍රතිපත්තියේ සන්ධිස්ථානයක් බවට පත් වූ මොන්රෝ මූලධර්මය හඳුන්වාදීම ආදී සේවාවන් රැසක් සිදුකළ සුවිශේෂී රාජ්‍ය නායකයෙකු ලෙස ජේම්ස් මොන්රෝ පෙන්වා දිය හැකිය.

එබැවින්, මෙම ලිපිය මගින් ජේම්ස් මොන්රෝගේ ළමා කාලය, අධ්‍යාපනය, දේශපාලනයට පිවිසීම, නායකත්වය කරා ගිය ගමන්මග, සිදුකළ සේවාව, විදේශ ප්‍රතිපත්තිය සහ ඔහුගේ චරිතයෙන් අපට ගත හැකි ආදර්ශ පිළිබඳව සවිස්තරාත්මක විශ්ලේෂණයක් සිදුකරනු ලබයි.

## ළමා කාලය, අධ්‍යාපනය හා දේශපාලනයට පිවිසීම



*ජේම්ස් මොන්රෝ කුඩා කාලයේ තම පවුල සමග*

1758 අප්‍රේල් 28 වන දා වර්ජිනියාවේ වෙස්ටර්මර්ලන්ත ප්‍රාන්තයේ (Westmoreland County, Virginia) දී ජේම්ස් මොන්රෝ උපත ලැබී ය. වහලුන් හිමි වැවිලිකරු පවුලක උපත ලද මොන්රෝගේ පියා වූයේ වඩු කාර්මිකයෙකු වූ ස්පෙන්ස් මොන්රෝ (Spence Monroe) ය. ඔහුගේ මව වූ එලිසබෙත් ජෝන්ස් (Elizabeth Jones), වේල්ස් සම්භවයක් සහිත කාන්තාවක් විය. වයස අවුරුදු එකොළහේ දී පමණ කුඩා ජේම්ස්, පූජක කැම්බල් විසින් පවත්වාගෙන ගිය පාසලකට ඇතුළත් කරන ලදී. ඔහුගේ මව ඔහු කුඩා කාලයේ දී මිය ගිය අතර, ජේම්ස්ට අවුරුදු දහසයේ දී ඔහු ගේ පියාද ජීවිතයෙන් සමුගත්තේය. පියාගේ මරණයෙන් පසු ව ඔහු සහ ඔහුගේ අනෙක් සහෝදර සහෝදරියන් ඔහුගේ මාමා වන ජෝශප ජෝන්ස් (Joseph Jones) යටතේ හැදී වැඩුණේ ය. දෙමාපියන්ගේ වියෝව ඔහුගේ ජීවිතයේ අඳුරුතම යුගයක් විය. ඔහුගේ පවුල මෙන් නොව මාමා විප්ලවවාදී යුගයේ කැපී පෙනෙන නායකයෙක් වූ අතර මොන්රෝගේ මාමා මොන්රෝ පිළිබඳ විශාල බලාපොරොත්තුවක් සිත තුළ තබාගෙන තිබිණි. ඔහු නිරන්තරයෙන්ම මොන්රෝ ව අධ්‍යාපනය තුළින් ඉදිරියට ගෙනයාමට උනන්දු කළේය.

එහි ප්‍රතිඵලයක් වශයෙන්, මොන්රෝ 1774 දී වර්ජිනියාවේ විලියම් සහ මේරි විද්‍යාලයට (William and Mary College) ඇතුළත් විය. මොන්රෝ නීතිය පිළිබඳ හැදෑරීමට අදහස් කළ නමුත් ඇතුළත් වී වැඩි කල් නොගොස් විද්‍යාලයෙන් ඉවත් විය. ඉන්පසුව ඔහු 1776 ඇමරිකානු විප්ලවයේ සටන් කිරීමට පිටත් විය. එහිදී

උරහිසේ මාරාන්තික තුවාලයක් සහිත ව සිටි මොන්රෝව යුධ පිටියෙන් ගෙන යන ලදී. සුවය ලැබීමෙන් පසු ඔහු කපිතාන් තනතුර තෙක් උසස් කරන ලද අතර ඔහු බොහෝ සටන් සඳහා සහභාගී විය. මේජර් තනතුර දක්වා උසස් වූ ඔහු ජෙනරාල් විලියම් ඇලෙක්සැන්ඩර්ගේ (William Alexander )සහායකයෙකු බවට පත් වූ අතර 1777-78 කාල සීමාවේ දී වැලි ෆෝර්ජ් (Valley Forge) හි සිදු වූ යුද්ධයේ දී යුධ භටයින්ගේ දුක් වේදනා ඔහු සමඟ බෙදා ගත්තේය. 1780 දී ඔහු වර්ජිනියා ආණ්ඩුකාරවරයා වූ තෝමස් ජෙෆර්සන් (Thomas Jefferson) යටතේ නීතිය හැදෑරීමට පටන් ගත්තේ ය. ඔවුන් දෙදෙනා අතර සමීප සබඳතාවක් ඇති වූ අතර එය මොන්රෝගේ පසුකාලීන වෘත්තියට ප්‍රබල බලපෑමක් ඇති කළේය. එපමණක් නොව තෝමස් ජෙෆර්සන්, මොන්රෝ සහ ජේම්ස් මැඩිසන් (James Madison) අතර මිත්‍රත්වයක් ද වර්ධනය විය. ඔහුගේ හමුදා සේවයෙන් පසුව මොන්රෝ තම දේශපාලන වෘත්තිය ආරම්භ කළේය.

## <u>නායකත්වය කරා ගිය ගමන් මඟ</u>

මොන්රෝගේ රාජ්‍ය සේවය ආරම්භ වූයේ 1782 දී ඔහු වර්ජිනියා (Virginia) මහා සභාවට තේරී පත්වීමත් සමඟ ය. 1783 සිට 1786 දක්වා කොන්ටිනෙන්ටල් කොන්ග්‍රසයේ ද සේවය කළේය. පසුව ඔහු 1790 දී කොන්ග්‍රස් මැතිවරණයකින් ජේම්ස් මැඩිසන්ට පරාජය වුවද, වර්ජිනියා ප්‍රාන්ත ව්‍යවස්ථාදායකය ඔහුව එක්සත් ජනපද සෙනෙට් සභාවට (United States Senate) පත් කළේය. එම ආයතනයේ සාමාජිකයෙකු ලෙස ඔහු උප සභාපති ජෝන් ඇඩම්ස් (John Adams) සහ භාණ්ඩාගාර ලේකම් ඇලෙක්සැන්ඩර් හැමිල්ටන් (Alexander Hamilton) විසින් නායකත්වය දුන් ෆෙඩරල්වාදී කණ්ඩායමට එරෙහිව ඔහුගේ සමීපතම මිතුරන් වූ මැඩිසන් (Madison) සහ තෝමස් ජෙෆර්සන් (Thomas Jefferson) සමඟ සන්ධානගත විය.

ඔහු 1794 දී ප්‍රංශ-ඇමරිකානු තානාපතිවරයා ලෙස සේවය කිරීම සඳහා සෙනෙට් සභාව හැර ගිය නමුත් 1796 දී වොෂින්ටනය (Washington) වෙත නැවත කැඳවනු ලැබීය. මොන්රෝ 1799 දී වර්ජිනියාවේ ආණ්ඩුකාරවරයා ලෙස

මැතිවරණය ජයග්‍රහණය කළ අතර 1800 ජනාධිපතිවරණයේ දී ජෙෆර්සන්ගේ අපේක්ෂකත්වයට දැඩි ලෙස සහාය දුන්නේය. පසුව ජනාධිපති ජෙෆර්සන්ගේ විශේෂ නියෝජිතයා ලෙස, මොන්රෝ ලද විශාලතම ජයග්‍රහණය වූයේ, 1803 දී ලුසියානා භූමි කාලාපය මිලදී ගැනීම සඳහා වූ සාකච්ඡාවයි. මෙම කාර්යයෙන් අනතුරුව ඔහුට මහා බ්‍රිතාන්‍යයේ එක්සත් ජනපද තානාපතිවරයා ලෙස පත්වීමක් ලබා දෙන ලදී. ඔහු 1803 සිට 1807 දක්වා එම තනතුර දැරීය. ඔහු 1808 ජනාධිපතිවරණයේ දී ඩිමොක්‍රටික්-රිපබ්ලිකන් පක්ෂයේ නාමයෝජනා සඳහා මැඩිසන්ට එරෙහිව අභියෝග කළ නමුත්, 1811 දී ඔහු රාජ්‍ය ලේකම් ලෙස මැඩිසන්ගේ පරිපාලනයට සම්බන්ධ විය. මොන්රෝ 1812 සිට 1815 දක්වා සිදු වූ New Orleans යුද්ධයේදී යුධ ලේකම් ලෙස ද කටයුතු කළේය.

1816 දී මොන්රෝ ඩිමොක්‍රටික්-රිපබ්ලිකානුවෙකු ලෙස ජනාධිපති ධූරයට තරඟ කළ අතර ෆෙඩරල්වාදී අපේක්ෂක රූෆස් කිං (Rufus King) පරාජය කළේය. 1817 මාර්තු 4 වන දින ජනපති ධූරයේ දිවුරුම් දුන් මොන්රෝ සිය මංගල දේශනය එළිමහනේ පැවැත් වූ පළමු එක්සත් ජනපද ජනාධිපතිවරයා බවට පත්විය.

## නායකත්වයට පැමිණීමෙන් පසු සිදුකළ සේවාව

1817 සිට 1825 දක්වා ජනාධිපති ධූරය හෙබ වූ ජේම්ස් මොන්රෝ ජනාධිපති වශයෙන් සේවය කළ මෙම කාලය එක්සත් ජනපදය තුළ සුවිශේෂි වූ කාල පරාසයක් විය. එකල ගනු ලැබූ තීරණ අනාගතය උදෙසා ද මහත් බලපෑමක් කළේය.

දේශපාලන පක්ෂ පිළිබඳ මොන්රෝට පැවතියේ වෙනස්ම හැඟීමකි. ඔහු පක්ෂ ක්‍රමයට එතරම් ප්‍රියතාවයක් නොදැක් වූ අතර ඒවා තුරන් කිරීමට ද කටයුතු කළේය. මොන්රෝ සෑම විටම උත්සහ කළේ එක්සත් ජනපදයේ ස්වාධීනත්වය බාහිර යුරෝපීය රාජ්‍යන්ගෙන් ආරක්ෂා කරගැනීමටය. ඒ අතරම එක්සත් ජනපදය ශක්තිමත් කිරීම ඔහුගේ මූලික අරමුණ විය.

ජේම්ස් මොන්රෝ සිය ජනාධිපති ධූර කාලය තුළ දේශීය ප්‍රතිපත්ති සම්බන්ධයෙන් මුහුණ දුන් විශාලතම සිදුවීම වූයේ 1819 දී සිදු වූ සන්ත්‍රාසයයි. 1819 සන්ත්‍රාසය

(Panic of 1819)යනු, 1812 යුද්ධයෙන් පසු පශ්චාත් යුධ උත්පාතය අවසන් වීම නිසා ඇති වූවකි. මෙකල පැවති මූල්‍ය අර්බුදයන් හා ආර්ථික අවපාතය මෙය උත්සන්න වීමට හේතු විය. මීට බලපෑම් කළ තවත් සාධක නම්, කපු මිලෙහි විශාල පහත වැටීම, 1817 දී උද්ධමනයට එරෙහිව සටන් කිරීමට එක්සත් ජනපදයේ බැංකුවෙහි ණය ප්‍රමාණවත් නොවීමත් පෙන්වා දිය හැකිය. එක්සත් ජනපද ආර්ථිකයට විදේශීය තරඟකරුවන්ට මැදිහත් වීමට නොහැකි වූ අතර, එම නිසා එරට කර්මාන්තශාලා ද වැසී ගියේය. ඉහළ විරැකියාව, උකස් කිරීම, පුලුල්ව පැතිරුණු නාගරික දරිද්‍රතාවය, බැංකු අසාර්ථක වීමට හේතු විය. ඊට අමතරව, කෘෂිකාර්මික භාණ්ඩවල මිල අඩකින් පහත වැටුණි. මොන්රෝ පාලනය මෙම ආර්ථික අර්බුදය මැඩපැවැත්වීමට බොහෝදේ සිදුකළ අතර, එහිදී ඔහු කළ එක් දෙයක් නම්, ෆෙඩරල් රජයෙන් මිලදී ගත් ඉඩම් සඳහා ගෙවීමේ කොන්දේසි ලිහිල් කොට භාණ්ඩාගාර ලේකම් විලියම් එච්. ක්‍රොෆර්ඩ් (Wlliam H. Crawford) විසින් ඉදිරිපත් කරන ලද ප්‍රතිපත්තියකට සහාය වීමයි.

එම වසරේම "මිසූරි සම්මුතිය" (Missouri Convention) පිළිබඳ වාද විවාද මගින් මොන්රෝගේ පරිපාලනය අඩාල විය. එසේ වුවද, මිසූරි සම්මුතිය යනු; මොන්රෝ විසින් ලද දේශපාලන ජයග්‍රහණවලින් එකකි. එමෙන්ම නිදහස් කරන ලද කළු ජාතිකයින් සඳහා බටහිර අප්‍රිකානු ලයිබීරියාවේ (Liberia) රාජ්‍යයන් පිහිටුවන ලද ඇමරිකානු ජනපදකරණ සංගමයට මොන්රෝ සහාය දුන්නේය. ඔහුට කරන ලද ගෞරවයක් ලෙස එහි අගනුවර "මොන්රෝවියා" (Monroevia) ලෙස නම් කරන ලදී.

රාජ්‍ය තාන්ත්‍රිකත්වය සහ ආරක්ෂාව පිළිබඳ ජාතිකවාදියෙකු වූ ජේම්ස් මොන්රෝ ෆෙඩරල් රජයේ සීමිත විධායක ශාඛාවකට සහාය දැක්විය. රට තුළ ගොවියන් සහ ශිල්පීන් ප්‍රශංසා කිරීමට මොන්රෝ ප්‍රිය කළේය.

ජේම්ස් මොන්රෝ ජනාධිපති ලෙස ශක්තිමත් සහ දක්ෂ කැබිනට් මණ්ඩලයක් රැස් කළේය. ප්‍රකට John C. Calhoun ඔහුගේ යුද ලේකම් ලෙස සේවය කිරීමට තෝරා ගන්නා ලද අතර නව එංගලන්ත John Quincy Adams රාජ්‍ය ලේකම් විය. මීට අමතරව, ජෝර්ජියාවේ (Georgia) William H. Crawford භාණ්ඩාගාර ලේකම් ලෙස නම් කරන ලද අතර, William Wirt සහ Benjamin Crowninshield

පිළිවෙලින් නාවික හමුදාවේ නීතිපති සහ ලේකම් ලෙස කටයුතු කර ඇත. මේ සෑම කෙනෙකුම තම රැකියාව සඳහා ඉහළ සුදුසුකම් ඇති අය වූ අතර, ඔවුන්ගේ හැකියාවන් හඳුනාගත් මොන්රෝ විසින් ඔවුන්ට අදාළ තනතුර හරහා දියුණු වීමට ඉඩ ලබා දුන්නේය. අනෙක් අතට, ඔවුන් ඔහුගේ අධිකාරිය සහ නායකත්වය හඳුනා ගත් අතර, ඕනෑම තීරණයක අවසාන තීරණය ගැනීමට මොන්රෝ වෙත ඉඩකඩ සලසා තිබුණි.

මොන්රෝ ට අවශ්‍ය වූ මූලිකම දේ ඔහු සංක්ෂිප්තව සඳහන් කළේ “ඇමරිකානුවන් උදෙසා ඇමරිකාව” (“America For Americans”) යනුවෙනි. යටත්විජිතකරණය (Decolonization) තරයේම හෙළා දුටු මොන්රෝ ප්‍රකාශ කළ සිටියේ එවැනි උත්සහයන් පවා එක්සත් ජනපදයට එරෙහිව කරන යුද්ධයක් ලෙස සලකන බවයි. එම කාල වකවානුව "හොඳ හැඟීම් ඇති යුගය" ("The Era of Good Feelings") ලෙස නම් කරන ලදී.


## විදේශ ප්‍රතිපත්තිය

සැබෑ ඇමරිකානු විප්ලවීය වීරයෙක් ලෙස හඳුන්වන ජේම්ස් මොන්රෝ ඇමරිකාවේ රාජ්‍ය ලේකම් සහ යුධ ලේකම් ලෙස කටයුතු කළ එකම පුද්ගලයා විය. දැඩි ස්ථාවර ෆෙඩරල්වාදියෙකු වූ මොන්රෝ ජනාධිපතිවරයා ඇමරිකානු මූලික විදේශ ප්‍රතිපත්තිය තුළ අමරණීය සටහනක් සනිටුහන් කරන ලදී. ඒ ඔහු විසින් ඉදිරිපත් කළ “මොන්රෝ මූලධර්මය” ("Monroe Doctrine") හරහායි.

විදේශ කටයුතුවලදී මොන්රෝ විසින් රටේ කීර්තිය වැඩි දියුණු කිරීම සඳහා මෙන්ම ඇමරිකානු ස්වාධීනත්වය ආරක්ෂා කිරීම සඳහා විවිධ උත්සහයන් ගන්නා ලදී. විශේෂයෙන්ම මොන්රෝ ජනාධිපතිවරයා එක්සත් ජනපදයේ රාජ්‍ය ලේකම්වරයා සමඟ එකතු වෙමින් යුරෝපීයන් ඇමරිකාව තුළ සිදු කරන මැදිහත්වීමට එරෙහිව ආක්‍රමණශීලී විදේශ ප්‍රතිපත්තියක් අනුගමනය කරන ලදී.

මුල් කාලයේ මොන්රෝ පරිපාලනයට අවශ්‍ය වූයේ බ්‍රිතාන්‍ය සමඟ අන්තර් සබඳතා වර්ධනය කර ගැනීමට ය. ඒ සඳහා මූලික අඩිතාලම ලෙස, 1812 සිදු වූ New Orleans යුද්ධයේ සිට පැවති දේශ සීමා ආරවුල් විසඳා ගැනීම සම්බන්ධයෙන්

වැදගත් ගිවිසුම් දෙකක් පිළිබඳව සාකච්ඡා කරන ලදී. පළමු ගිවිසුම ලෙස 1817 වසරේ රෂ් බැගොට් ගිවිසුම (Rush-Bagot Agreement) මගින් මහා බ්‍රිතාන්‍ය හමුදාව යුධහරණය කරන ලදී. රෂ් බැගොට් ගිවිසුම යනු, වැඩ බලන රාජ්‍ය ලේකම් රිචර්ඩ් රෂ් (Richerad Rush) සහ බ්‍රිතාන්‍ය ඇමති චාල්ස් බැගොට්ගේ (Charles Bagot) නමින් නම් කරන ලද ගිවිසුමකි. එමෙන්ම,චැප්ලින් විල (Chaplin Lake) සහ ඔන්ටාරියෝ විල (Lake Ontario) මත රාත්තල් 18 ක තනි කාලතුවක්කුවකින් සමන්විත ටොන් 100 ක බරැති යාත්‍රාවකට ගමන් කිරීමට සෑම රටකටම සීමා පනවන ලදී. එපමණක් නොව දෙවනුව, 1818 වසරේ සිදු වූ සම්මුතිය තුළින් වර්තමානයේ මිනසෝටා (Minnesota) සිට පාෂාණ කඳුකරය දක්වා එක්සත් ජනපද - කැනේඩියානු දේශසීමා නම් කිරීම ද සිදුවිය.


Clerk

To the Senate of the United States.

An arrangement having been made and concluded between this Government and that of Great Britain, with respect to the naval armament of the two Governments respectively, on the Lakes, I lay before the Senate, a copy of the correspondence upon that subject, including the stipulations mutually agreed upon, by the two parties. I submit it to the consideration of the Senate, whether this is such an arrangement, as the executive, is competent to enter into, by the powers vested in it by the constitution, or is such an one as requires, the advice and consent of the Senate, and in the latter case, for their advice and consent should it be approved.

James Monroe

~~Washington~~ April 6th 1818.

*රෂ්-බැගොට් ගිවිසුම*

මොන්රෝ ජනාධිපතිවරයා විදේශ ප්‍රතිපත්තිය බොහෝ විට ස්පාඤ්ඤයේ ලතින් ඇමරිකානු (Latin American) යටත්විජිත සම්බන්ධ රාජ්‍ය කටයුතු වෙත යොමු විය. විශේෂයෙන්ම මෙම ලතින් ඇමරිකානු රටවල්වල ස්වාධීනත්වය පිළිගැනීමට කොන්ග්‍රසයේ සිටි බොහෝ දෙනෙක් උනන්දු වූ නමුත් එසේ කිරීම හරහා ස්පාඤ්ඤය හා එහි මිත්‍ර රටවල් සමඟ යුධමය තත්වයන් ඇතිවේ යැයි මොන්රෝ ජනාධිපතිවරයා බියට පත් විය. එසේම ආජන්ටිනාව (Argentina), පේරු (Peru),

කොලොම්බියාව (Colombia), චිලී (Chile) සහ මෙක්සිකෝව (Mexico) යන රටවල්වල ස්වාධීනත්වය පිළිබද ඔහුගේ අවධානය යොමු විය.

පසුකාලීනව බටහිර අර්ධගෝලයේ යුරෝපීය මැදිහත් වීමට එරෙහිව එක්සත් ජනපදය හා බ්‍රිතාන්‍ය අතර ඒකාබද්ධ ප්‍රකාශනයක් යෝජනා වූවේ ද මොහුගේ විදේශ ප්‍රතිපත්තියට නව මානයක් එක් කරමිනි. නමුත්, එක්සත් ජනපද රාජ්‍ය ලේකම් ඇඩම්ස්ගේ තර්කය වූයේ, එක්සත් ජනපදය බටහිර අර්ධගෝලයේ එම නැඟී සිටීමට ආමන්ත්‍රණය කිරීම සඳහා තමන්ගේම උපාය මාර්ගයක් සකස් කිරීම ට අවශ්‍ය බවයි. විශේෂයෙන් ඇමරිකානු ප්‍රතිපත්තිය තුළ අමරණීය සන්ධිස්ථානයක් ලෙස මොන්රෝ මූලධර්මය බිහිවූවේ මෙම අවකාශය තුළ දීය.

1823 දෙසැම්බර් මස 2 දින කොන්ග්‍රසය අමතා සිදු කරන ලද ප්‍රකාශනය තුළ මොන්රෝ ජනාධිපතිවරයා ප්‍රධාන කොටස් 03 ක් ඉදිරිපත් කරන ලදී. ප්‍රථමයෙන්ම මුල් කාලයේ සිට යුරෝපීය යුද්ධ හා ගැටුම් සම්බන්ධයෙන් එක්සත් ජනපදයේ සාම්ප්‍රදායික මධ්‍යස්ථ ප්‍රතිපත්තිය පිළිබඳ නැවත අවධාරණය කළේය. දෙවනුව, මොන්රෝ ජනාධිපතිවරයාගේ ප්‍රතිපත්තිමය අදහස වූයේ ඇමරිකාවේ පවතින යුරෝපීය යටත්විජිතවලට මැදිහත් නොවුණද, යුරෝපීයන් විසින් නැවත යටත්විජිතකරණ ක්‍රියාවලිය සිදු කිරීම ද එක්සත් ජනපදය පිළිනොගන්නා බවයි. අවසාන වශයෙන්, මොන්රෝ ජනාධිපතිවරයා පැවසුවේ බටහිර අර්ධගෝලය තුළ යටත්විජිතකරණ ක්‍රියාවලියකට යුරෝපයේ රටවල් අවධානය යොමු නොකළ යුතු බවත්, එය මූලික වශයෙන්ම උතුරු පැසිෆික් වෙරළ තීරය තුළ යටත්විජිත ව්‍යාප්ත කර ගැනීමට රුසියාව (Russia) දරණ උත්සාහයට ප්‍රතිඋත්තරයක් වශයෙන් සිදු කරන්නක් බවයි. මේ හරහා ඔහු තම විදේශ ප්‍රතිපත්තියේ මධ්‍යස්ථ බව අවධාරණය කළේය. මොන්රෝ මූලධර්මය ලෙස හැඳින් වූ මෙම ප්‍රකාශනයට බ්‍රිතාන්‍යය විසින් අනුග්‍රහය දක්වා ඇති බව ඉතිහාසයේ සඳහන් වේ.

එම මූලධර්මය බටහිර අර්ධගෝලයේ අනාගතය පිළිබඳ එක්සත් ජනපදය විසින් සිදු කෙරූ පළමුවන වැදගත් ප්‍රතිපත්ති ප්‍රකාශනය යි. මොන්රෝ ජනාධිපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද බටහිර අර්ධගෝලයේ යුරෝපීය ආක්‍රමණයට එරෙහි මෙම ප්‍රකාශනය දහ නවවන සියවස තුළ ලතින් ඇමරිකාවේ එක්සත් ජනපද ප්‍රතිපත්තියේ පදනම විය. එය මොන්රෝ ජනාධිපතිවරයාගේ කල් පවත්නා ජයග්‍රහණවලින් එක් ජයග්‍රහණයක්ද විය.

# <u>ගත හැකි ආදර්ශ</u>




*Ash Lawn – Higland හි ජේම්ස් මොන්රෝගේ අනුරුවක්*

ජනාධිපතිවරයෙකු ලෙස, දේශපාලඥයෙකු ලෙස මෙන්ම ආණ්ඩුකාරවරයෙකු ලෙස ද ජේම්ස් මොන්රෝ, තම නායකත්වය හොබවමින් එක්සත් ජනපදයේ උන්නතිය උදෙසා මහත් සේවයක් ඉටු කළේය.

ජේම්ස් මොන්රෝගේ චරිතය තුළ ඔහු ඉතාමත් උත්සහවන්ත මෙන්ම දක්ෂ පාලකයෙකි. උත්සහවන්තභාවය හා දක්ෂ බව සාර්ථක පාලකයෙකුට අත්‍යවශ්‍යම ගුණාංග වේ. තම දේශපාලන දිවිය තුළ ආටෝප නොමැති වූද අවංක හා ඍජු ප්‍රතිපත්ති ඇති වූද පාලකයෙකු ලෙස මොන්රෝ අත්කරගත් සාර්ථකත්වය ඉතා ඉහළය.

මොන්රෝ, එක්සත් ජනපදයේ ජනාධිපති ධූරයට පත් වූ 1817 සිට 1825 දක්වා වූ කාලය, එක්සත් ජනපදය බලවත් රාජ්‍යක් ලෙස ගොඩනැගෙන්නට උත්සහ කරන මූලික අවධියයි. අද පවතින එක්සත් ජනපදය, එදා පැවති දක්ෂ හැසිරවීමේ ප්‍රතිඵලයකි. ඒ අතරතුර මොන්රෝගේ පාලන කාලය සුවිශේෂී වේ. මිසූරි සම්මුතිය පිළිබඳ අවධානය යොමු කරන්නෙකුට මොන්රෝගේ නායකත්ව ලක්ෂණ හඳුනාගත හැකිය. මොන්රෝ මෙහිදී තම රාජ්‍යයේ උන්නතිය උදෙසා මෙම මිසූරි සම්මුතිය වාසියක් කරගත්තේය.

මොන්රෝ චරිතයේ ආදර්ශ පිළිබඳ කතාකරන විට තවත් අමතක කළ නොහැකි සහ ප්‍රධාන අවස්ථාවක් වන්නේ, ඔහු විසින් ඉදිරිපත් කරන ලද මොන්රෝ

මූලධර්මයයි. "ඇමරිකානුවන් උදෙසා ඇමරිකාව" යන වැකිය පෙරටුකර ගනිමින් 1823දී මොන්රෝ තම මූලධර්මය ඉදිරිපත් කළේය. ඕනෑම විශිෂ්ට නායකයෙකුගේ ලක්ෂණයක් වන්නේ තම රාජ්‍යයේ සහ ජනතාවගේ අරක්ෂාව තහවුරු කිරීමයි. ඔහු තම මූලධර්මය හරහා යුරෝපීය බලවතුන්ගෙන් තම රටේ ස්වාධීනත්වය ආරක්ෂා කර ගැනීමට අවශ්‍ය පසුබිම සම්පාදනය කළේය. ඔහු සෑම විටම තම විදේශ ප්‍රතිපත්තිය හරහා යුරෝපීයන්ට බැඳී සිටීමේ පිළිවෙත බැහැර කළේය. විශේෂයෙන්ම, ඔහුගේ ආක්‍රමණශීලි සහ සිතීමේ හැකියාව, එක්සත් ජනපදය තවදුරටත් ශක්තිමත් කළේය.

මොන්රෝ යනු, දූරදර්ශී පාලකයෙකි. ඔහුගේ මෙම මූලධර්මය එවකට පමණක් නොව අනාගතයටද ප්‍රතිලාභ ලබා දුන්නේය. පාලකයා හා සේවකයා අතර සෑම විටම සුහද බව හා නිවැරදි අවබෝධය රාජ්‍යයේ දියුණුවට බොහෝ ප්‍රතිලාභ ගෙනදෙන බවට කදිම උදාහරණයක් ලෙස මොන්රෝ සහ ඔහුගේ රාජ්‍ය ලේකම් අතර පැවති සබඳතාවය දැක්විය හැකිය.

තවදුරටත් ඔහුගේ චරිතයෙන් ගත හැකි ආදර්ශ පිළිබඳ කතා කරනවිට, විශේෂයෙන් ඔහු නිරහංකාර අයෙකු විය. සැමවිටම අලුත් දේ දැන ගැනීමේ කුතුහලයෙන් යුක්ත වීමද ඔහු තුළ දක්නට ලැබෙන පරමාදර්ශයකි.

## සාරාංශය

දෙමාපියන්ගේ වියෝවෙන් පසු තම මාමා යටතේ හැදී වැඩුණු ජේම්ස් මොන්රෝ වැඩි කල් නොගොස් හමුදා සේවයට බැඳුණේය. කපිතාන් තනතුර දක්වා උසස් කළ ඔහු බොහෝ සටන් සඳහා සහභාගි විය. හමුදා සේවයට තිත තැබූ ඔහු 1782 දී වර්ජිනියා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයට තේරී පත්වූ අතර, ආණ්ඩුකාර මණ්ඩලයේ සාමාජිකයෙකු ද විය. මොන්රෝ 1790 දී කොන්ග්‍රස් මැතිවරණයකින් ජේම්ස් මැඩිසන්ට පරාජය වුවද, එක්සත් ජනපද සෙනෙට් සභාවට ඇතුළත් වීමට සමත් විය. නැවතත් ජේම්ස් මැඩිසන්ට විරුද්ධව තරග කිරීම තුළින් මොන්රෝ තමන්ගේ ආත්ම විශ්වාසය දැඩි ලෙස පෙන්නුම් කළේය. නැවත වරක් ජේම්ස් මැඩිසන් පහසුවෙන් මැතිවරණය ජයගත් අතර ජනාධිපති මැඩිසන් මොන්රෝව රාජ්‍ය ලේකම් ලෙස නම් කරන ලදී.

පක්ෂ ක්‍රමයට එතරම් ප්‍රියතාවක් නොදැක් වූ ජනාධිපති ජේම්ස් මොන්රෝ එම ක්‍රමය තුරන් කිරීමට කටයුතු කළේය. ඇමරිකා එක්සත් ජනපදය ශක්තිමත් කිරීම මූලික අරමුණ කරගත් මොන්රෝ නිරන්තරයෙන් උත්සහ කළේ එක්සත් ජනපදයේ ස්වාධීනත්වය යුරෝපීය රාජ්‍යයන් ගෙන් ආරක්ෂා කර ගැනීමටය. මොන්රෝ මූලධර්මය හඳුන්වාදීම, ජේම්ස් මොන්රෝ ගේ අවධිය තුළ දැකිය හැකි වැදගත්ම සන්ධිස්ථානයකි. යටත්විජිතකරණයට වෛර කළ ජේම්ස් මොන්රෝ ඇමරිකා එක්සත් ජනපදය ස්වාධීන රාජ්‍යක් ලෙස නඟා සිටුවීමට තම ධූර කාලය තුළ උත්සහ කරන ලදී. ජේම්ස් මොන්රෝ ඇඩම්ස්-ඔනිස් ගිවිසුම අත්සන් කිරීම හරහා ස්පාඤ්ඤය යටතේ තිබූ නැගෙනහිර ෆ්ලොරිඩාව අත්පත් කර ගැනීමට සමත් විය. එසේම බ්‍රිතාන්‍යය සමග අත්සන් කළ රෂ් බැගොට් ගිවිසුම ද එක්සත් ජනපදය ස්වාධීනත්වය කරා යන ගමනට අඩිතාලම දමන ලදී.

ඇමරිකාවේ රාජ්‍ය ලේකම් සහ යුධ ලේකම් යන තනතුරු දෙකම දැරූ එකම පුද්ගලයා වූ ජේම්ස් මොන්රෝ තමන්ගේ විදේශ ප්‍රතිපත්ති තුළින් තම අරමුණු ඉටුකර ගැනීමට නිරන්තරයෙන් උත්සහ කරන ලදී. ඔහු ඉදිරිපත් කරන ලද මොන්රෝ මූලධර්මය ඔහුගේ විදේශ ප්‍රතිපත්තිය තුළ තවදුරටත් කැපී පෙනෙන අංගයක් විය. එක්සත් ජනපදයේ රාජ්‍ය ලේකම් හා සම්බන්ධ වෙමින් මොන්රෝ ජනාධිපතිවරයා ආක්‍රමණශීලී විදේශ ප්‍රතිපත්තියක් අනුගමනය කළේය. ස්වාධීනත්වය කරා යන ගමනේදී, ඇමරිකා එක්සත් ජනපදයට ජනාධිපති ජේම්ස් මොන්රෝගේ විදේශ ප්‍රතිපත්තිය බෙහෙවින් උපකාරී විය.

එක්සත් ජනපදයේ උන්නතිය උදෙසා නායකත්වය දුන් ජේම්ස් මොන්රෝ උත්සහවන්ත මෙන්ම දක්ෂ දූරදර්ශී පාලකයෙකි. අවංක මෙන්ම ඍජු ප්‍රතිපත්ති තම දේශපාලන දිවිය තුළ පෙන්නුම් කළ ජනාධිපති මොන්රෝගේ නායකත්ව ගුණාංග ඇමරිකා එක්සත් ජනපදය ලෝකය තුළ බලවතෙකු වීමට ඍජුවම බලපාන ලදී. තම විදේශ ප්‍රතිපත්තිය හරහා යුරෝපීයන්ට ගැති නොවීමට වග බලාගත් මොන්රෝ තම රටේ පුරවැසියන් ආරක්ෂා කරමින් පෙන්නුම් කරන ලද්දේ නියම පාලකයෙකුගේ වගකීමය. ඇමරිකා එක්සත් ජනපදය වර්තමානයෙත් ලොව ප්‍රබල රාජ්‍යක් ලෙස නැගී සිටීමට ජනාධිපති ජේම්ස් මොන්රෝ දැමූ අඩිතාලම ඉවහල් වූ බව නිතර්කයෙන් ම පැවසිය හැකි ය. ලෝක බලවතෙකු කරා යන ගමනේදී එක්සත් ජනපදය නම් මහා වෘක්ෂයට යෝධ සෙවණැල්ල වූ ජනාධිපති

ජේම්ස් මොන්රෝ 1831 ජූලි මස 4 වන දින තම හුස්ම වා තලයට මුසු කරන ලද්දේ වීර නායකයෙකු ලෙසය.

## මූලාශ්‍ර නාමාවලිය

Preston, D. (2016, October 4). *James Monroe: Life Before the Presidency*. Miller Center. https://millercenter.org/president/monroe/life-before-the-presidency

James Monroe's Highland. (2022, October 11). *A Brief Biography of James Monroe - Highland*. Highland. https://highland.org/discover-monroe/

Preston, D. (2016, October 4). James Monroe: Foreign Affairs | Miller Center. Miller Center. https://millercenter.org/president/monroe/foreign-affairs

Monroe Doctrine (1823). (2022, May 10). National Archives. https://www.archives.gov/milestone-documents/monroe-doctrine#:~:text=President%20James%20Monroe%27s%201823%20annual,nations%20of%20the%20Western%20Hemisphere

Gilman, D. C. (1887). James Monroe in his relations to the public service. Boston Houghton Meffin and company.

# වුඩ්රෝ විල්සන් (Woodrow Wilson)



**කණ්ඩායම් සාමාජිකයන්**

- අනුදි ගුණසේකර
- දසුනි හපුගොඩ
- ඔසුනි සෙනෙවිරත්න
- සුහන්‍යා දෙවාන්ජී
- තරුෂි පින්නවල

## හැඳින්වීම

"දූරදර්ශී නායකයෙකු අභියෝගාත්මක අවස්ථාවන් හීදී නොබියව කටයුතු කරයි" යන කියමනට මූලික උදාහරණයක් ලෙස වුඩ්රෝ විල්සන් පෙන්වා දිය හැකිය. ඔහු ක්ෂේත්‍ර ගණනාවක පොත් කෙරෙහි විශාල උනන්දුවක් දැක්වූ අතර ඔහුගේ ධූර කාලය තුළ ඔහු ගත් තීරණ ඔහුගේ දූරදක්නා බව සහ බුද්ධිය පිළිබිඹු කරයි. වුඩ්රෝ විල්සන් ශාස්ත්‍රඥයෙකු ලෙස ඇරඹූ ගමන නතර වූයේ, ඇමරිකා එක්සත් ජනපදයේ විසි අටවන ජනාධිපතිවරයා බවට පත් වීමෙනි. ඔහු සිය ධූරයේ ආරම්භයේ එක්සත් ජනපදයේ ප්‍රතිපත්ති සැලකිය යුතු ලෙස වෙනස් කිරීමට දායක විය.

වුඩ්රෝ විල්සන් ප්‍රගතිශීලී හා පරමාදර්ශී මිනිසෙකු ලෙස, එක්සත් ජනපදයේ අධිරාජ්‍යවාදී (Imperialistic) සහ අන්ත ජාතිකවාදී (Ultra Nationalism) සංකල්ප ඉවත දැමීමට උත්සාහ කළේය. ඒ අතරම, සමානාත්මතාවයකින් යුතු නිදහස් ජාත්‍යන්තර පරිසරයක් ගොඩනැඟීමේ පියවරක් ලෙස, එක්සත් ජනපදයේ ප්‍රාථමික සාරධර්මවලට ප්‍රජාතන්ත්‍රවාදය (Democracy) සහ ස්වයං නිර්ණය (Self Determination) වැනි මූලධර්ම ඇතුළත් කිරීම කෙරෙහි ලා අවධානය යොමු කළේය. විල්සන් ජනාධිපතිවරයා සාමූහිකව ආරක්ෂා වූ ලෝකයක් ගොඩනැඟීමට වෙහෙස නොබලා කටයුතු කළේය. ඔහු මුල් අවධියේදී පළවෙනි ලෝක යුද්ධයට සම්බන්ධ වූ පාර්ශව දෙක අතර මැදිහත්කරුවෙකු ලෙස සටන් නැවැත්වීමට ද උත්සහ කළේය. ඔහු ජාතීන්ගේ ලීගය (League of Nations) ස්ථාපිත කිරීමට ද නායකත්වය දුන් අතර, අද වනවිට විශාල ධනාත්මක වර්ධනයන්ට තුඩු දී ඇති විල්සෝනියානු වාදය (WilsonianIdeology) ජාත්‍යන්තරය තුළ සාර්ථකව රෝපණය කිරීමට ද සමත් විය.

වුඩ්රෝ විල්සන් සෑම මිනිසෙකුටම, වඩා හොඳ ලෝකයක් නිර්මාණය කිරීමට උත්සාහ කළේය. එමෙන්ම, නොයෙක් අභියෝගයන්ට මුහුණ දුන්නද ඔහු සිය පරමාදර්ශයන් අඛණ්ඩව විශ්වාස කළ අතරම, ඒවා සාක්ෂාත් කර ගැනීම සඳහා කටයුතු කළේය. මෙම ක්‍රියාවන් හේතුවෙන් ඇමරිකා එක්සත් ජනපදය විසින් බිහි කරන ලද ශ්‍රේෂ්ඨතම ජනාධිපතිවරයෙකු ලෙස මොහු හඳුනාගත හැකි අතර ඔහුගේ සේවය සැබවින්ම ප්‍රශංසනීය වේ.

## ළමා කාලය, අධ්‍යාපනය සහ දේශපාලනයට පිවිසීම

තෝමස් වුඩ්රෝ විල්සන් (Thomas Woodrow Wilson) 1856 දෙසැම්බර් 28 වන දින වර්ජිනියාවේ ස්ටෝටන් (Staunton) හි උපත ලැබීය. ඔහුගේ පියා ජෝෂප් රග්ල්ස් විල්සන් (Joseph Ruggles Wilson) දේවධර්ම මහාචාර්යවරයෙක් (Theology Lecturer) වූ අතර ඔහුගේ මව ජැනට් වුඩ්රෝ විල්සන් (Jessie Janet Woodrow) නම් විය. වුඩ්රෝ විල්සන් දරුවන් හතර දෙනෙකුගෙන් යුත් පවුලක වැඩිමහල් පුතා විය. ඔහුට සහෝදරයන් දෙදෙනෙකු සහ එක් සහෝදරියක් සිටියේය. ඔහුගේ පියා දැඩි විනයගරුක පුද්ගලයෙකු වූ අතර ඔහුට බොහෝ විට තම පියාගේ අපේක්ෂාවන්ට අනුව ජීවත්වීමට නොහැකි විය. ඔහු ඉතා දක්ෂ පාඨකයෙකු වූ අතර ඉතිහාසය, භූගෝල විද්‍යාව සහ විද්‍යාව යන විෂයන් හැදෑරීම ඔහුට මහත් තෘප්තියක් ගෙන දුන්නේය. ඔහු දක්ෂ සංගීතඥයකු ද වූ අතර පියානෝව සහ වයලීනය වාදනය කළේය.

ඔහු උතුරු කැරොලිනාවේ (North Carolina) චාලට් හි (Charlotte) ඩේවිඩ්සන් විද්‍යාලයේ (Davidson College) වසරක් අධ්‍යාපනය ලැබීමෙන් පසුව 1875 දී ප්‍රින්ස් (Princeton) විශ්වවිද්‍යාලයේ ලියාපදිංචි විය. ඔහු ප්‍රින්ස්ටන් විශ්වවිද්‍යාලයේදී, නොයෙක් සාකච්ඡා වලට සහභාගී වූ අතර ශිෂ්‍ය පුවත්පත (Student Newspaper) සංස්කරණය කිරීමට ද දායක වුණි. ඔහු ශිෂ්‍යයෙකු ලෙස සිටියදී ඇමරිකානු සහ බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තු රාජ්‍ය පද්ධති පිළිබඳ විද්‍යාත්මක සංසන්දනයක් ලියා, පසුව එය ඔහුගේ පළමු පොත තුළ තවදුරටත් සාකච්ඡාවට ලක් කළ අතර එමඟින් ඔහුගේ දේශපාලන ජීවිතය පිළිබඳ පුළුල් අර්ථකථනයක් ලබා දීමට ඔහු සමත් විය.



*ජනාධිපති වුඩ්රෝ විල්සන් ප්‍රින්ස්ටන් විශ්වවිද්‍යාලයේ රෝල්-ටොප් මේසයක් අසල*

1879 දී ප්‍රින්ස්ටන් හිදී උපාධිය ලැබීමෙන් පසු වුඩ්රෝ විල්සන්, වර්ජිනියා විශ්වවිද්‍යාලයට (University of Virginia) ඇතුළත් වූයේ නීතිය හැදෑරීම සඳහා වන බලාපොරොත්තුවෙනි. ඇට්ලන්ටා (Atlanta) හි වසර දෙකක නීතිමය කටයුතුවලින් පසු ඔහු කලකිරීමට පත් වූ අතර ජෝන්ස් හොප්කින්ස් විශ්වවිද්‍යාලයේ (Johns Hopkins University) රජයේ හා ඉතිහාසයේ උපාධිධාරී වැඩ කටයුතු කරගෙන යාම සඳහා සිය නීති වෘත්තිය අතහැර දැමීය. 1986 වර්ෂයේ දී ඔහු ආචාර්ය උපාධියක් ලබා ගත් අතර, ඒ වන විට ආචාර්ය උපාධියක් ලබා ගත් පළමු ජනාධිපතිවරයා බවට ඔහු පත්විය. වුඩ්රෝ විල්සන්ගේ ආචාර්ය උපාධි නිබන්ධනය, ''කොන්ග්‍රස් රජයඃ ඇමරිකානු දේශපාලනය පිළිබඳ අධ්‍යයනයක් (Congressional Government A Study in American Politics)'' ලෙස 1885 දී ඇමරිකානු සහ පාර්ලිමේන්තු පද්ධති සංසන්දනය කිරීම පුළුල් කොට, ඇමරිකානු පාර්ලිමේන්තු රාජ්‍ය ක්‍රමය වඩාත් ඵලදායී හා මහජන මතයට ප්‍රතිචාර දැක්වීමේ වෙනස්කම් සඳහා නිර්දේශ ඉදිරිපත් කළ අතර එය ඔහුගේ පළමු පොත ද විය.

එක්සත් ජනපදය, බෙදී යාම සහ නැවත එක්වීම පිළිබඳ ඉතිහාසයක් (History of the United States, Division and Reunion)1893, ඇමරිකානු ජනතාවගේ වෙළුම් පහක ඉතිහාසය (The five volume: A History of the American People)1902, සහ එක්සත් ජනපදයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා රජය (Constitutional Government in the United States)1908 ඔහුගේ පසුකාලීන කෘති වේ. රාජ්‍යයේ ඓතිහාසික හා ප්‍රායෝගික දේශපාලනයේ මූලද්‍රව්‍යයන් (The State Elements of Historical and Practical Politics) 1889 යන කෘතියේ ඔහු සදහන් කළ පරිදි "ජනාධිපතිවරයා සියලු පුරවැසියකුම නියෝජනය කරයි" (The representative of no constituency, but of the whole people).

## <u>නායකත්වය කරා ගිය ගමන් මඟ</u>

විල්සන් ජනාධිපතිවරයා බලයට පැමිණීමට පෙර වෘත්තීය ශාස්ත්‍රඥයෙකි. වෙස්ලියන් විශ්වවිද්‍යාලයේ ඉතිහාසය පිළිබඳ මහාචාර්ය ධූරයක් පිළිගැනීමට පෙර

ඔහු 1885 සිට 1888 දක්වා පෙන්සිල්වේනියාවේ බ්‍රයින් මාවර් විද්‍යාලයේ (Bryn Mawr College) දේශපාලන ආර්ථිකය සහ මහජන නීතිය ඉගැන්වීය. එහිදී ඔහු (Comparative State) පිළිබඳ අධ්‍යයනයක් වන "ද ස්ටේට්" (The State) ප්‍රකාශයට පත් කළ අතර එය ඔහුගේ ධූර කාලයේ කටයුතු සඳහා ඉවහල් විය. වසර දෙකකට පසු ඔහු නිතී විද්‍යාව (Jurisprudence) සහ ප්‍රින්ස්ටන්හි දේශපාලන ආර්ථිකය පිළිබඳ මහාචාර්ය ධූරය භාර ගත් අතර එහිදී ඔහු ඉතා ජනප්‍රිය හා ඉහළම වැටුප් ලබන පීඨ සාමාජිකයා බවට පත්විය. මෙම කාලය තුළ ඔහු ජෝර්ජ් වොෂින්ටන් (George Washington) චරිතාපදානයක් සහ එක්සත් ජනපදයේ ඉතිහාසය පිළිබඳ වෙළුම් පහකින් සමන්විත ප්‍රකාශයක් ඇතුළු තවත් පොත් නවයක් ප්‍රකාශයට පත් කළේය. ඉන්පසුව, 1902 දී ඔහුව ප්‍රින්ස්ටන් විශ්වවිද්‍යාලයේ සභාපතිවරයා ලෙස ඒකමතිකව තේරී පත්විය. එහිදී, ඔහු ප්‍රින්ස්ටන් විශ්වවිද්‍යාලය මූල්‍යමය හා බුද්ධිමය වශයෙන් වැඩිදියුණු කළ අතර, ඔහු එහි උසස් අධ්‍යාපනය වඩාත් ඵලදායී ලෙස ප්‍රතිසංස්කරණ කිරීමට උත්සාහ කළේය. ඔහු ඔහුගේ ප්‍රතිපත්ති කිහිපයක් සම්මත කිරීමට සමත් වූ නමුත් විශ්වවිද්‍යාලය ප්‍රතිව්‍යුහගත කිරීම හා ප්‍රජාතන්ත්‍රීයකරණය කිරීම සඳහා ඔහු කළ ප්‍රතිසංස්කරණ, පීඨ ගතානුගතිකයින්ගේ සහ ධනවත් ආදි ශිෂ්‍යයන්ගේ විරුද්ධත්වයට ලක්විය.

වුඩ්රෝ විල්සන් ප්‍රින්ස්ටන්හි සභාපතිවරයා ලෙස දැරූ ප්‍රසිද්ධිය ඩිමොක්‍රටික් පක්ෂයේ කොන්සර්වේටිව්වරුන්ගේ අවධානයට ලක් වූ අතර, ඔහුව 1910 දී නිව් ජර්සි (New Jersey) හි ආණ්ඩුකාර ධූරය සඳහා නම් කරන ලදී. ඉන්පසු වුඩ්රෝ විල්සන් විශ්වවිද්‍යාලයෙන් ඉල්ලා අස් වූ අතර, ඔහු ගතික හා ප්‍රගතිශීලී ව්‍යාපාරයක් මඟින් ආණ්ඩුකාර ධූරය දිනා ගැනීමට සමත් විය. බලයට පත්වූ පසු, ඔහු සතුව පෙර පැවති පාර්ලිමේන්තු භාවිතයන් පිළිබඳ දැනුම, ප්‍රතිසංස්කරණ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සඳහා යොදාගන්නා ලදී. එය ඔහුට ජාතික කීර්තියක් ලබා දුන් අතර ඩිමොක්‍රටික් ජනාධිපති නාමයෝජනා සඳහා ඔහුව නම් කිරීමට මහත් රුකුලක් විය.

මොහු විසින් Corrupt Practices Act යන පනත සම්මත කළ අතර මෙහි මූලික අරමුණ වූයේ දූෂිත අපේක්ෂකයින් නීති විරෝධීමය කටයුතු වල නියැලීම වළක්වා ගැනීමයි. වුඩ්රෝ විල්සන් මහජන උපයෝගිතා කොමිෂන් සභාවක් (Public Utility Commision) ඉල්ලා සිටි අතර, මෙමඟින් රැකියාවෙන් මියගිය හෝ තුවාල ලැබූ

කම්කරුවන්ගේ පවුල්වලට ආධාර කිරීම සඳහා කම්කරුවන්ගේ වන්දි නීතියක්ද සම්මත කරන ලදී. තවද, ප්‍රාන්ත ඉතිහාසයේ ප්‍රථම වතාවට වුඩ්රෝ විල්සන් ව්‍යවස්ථාදායක සැසිවාරයේ සිටියදී දිනපතා පුවත්පත් සාකච්ඡා පැවැත්වීම ආරම්භ කළේය. 1911 වන විට ඔහු ඩිමොක්‍රටික් පක්ෂයේ (Democratic Party) ප්‍රමුඛ චරිතය වූ විලියම් ජෙනිංස් බ්‍රයන් (William Jennings Bryan) ඇතුළු ජාතියේ ප්‍රගතිශීලී නායකයින්ගේ අවධානයට ලක් විය.

1912 සම්මුතියේදී වුඩ්රෝ විල්සන් ප්‍රබල ප්‍රතිවාදීන්ට එරෙහිව දැඩි සටනකින් පසු ජනාධිපති ධූරය සඳහා අවතීර්ණ විය. හිටපු ජනාධිපති තියඩෝර් රූස්වෙල්ට්ගේ (Theodore Roosevelt) ප්‍රගතිශීලී (Bull Moose) පක්ෂය ප්‍රමුඛ රිපබ්ලිකන් පක්ෂය බෙදී තිබීම, විල්සන්ට ජනාධිපතිවරණයෙන් 42% ලබාගැනීමට ඉවහල් විය. එමඟින් සිවිල් යුද්ධයෙන් පසු දකුණු ප්‍රදේශයෙන් තේරී පත් වූ පළමු ජනාධිපතිවරයා ලෙස වුඩ්රෝ විල්සන් ඉතිහාසගත විය.

## නායකත්වයට පැමිණීමෙන් පසු සිදුකළ සේවාව

වුඩ්රෝ විල්සන් ජනාධිපති ධූරයට පැමිණීමට පෙර සිටම ව්‍යවස්ථාදායක වැඩපිළිවෙළක් සකස් කළ අතර පෙර ජනාධිපති ධූරයන් හී සිදු නොවූ පරිදි කොන්ග්‍රසය ඉදිරියේ පෞද්ගලිකව පෙනී සිටිමින් ප්‍රධාන වශයෙන් ඔහුගේ පක්ෂය හරහා වැඩ කළේය. වුඩ්රෝ විල්සන් අඛණ්ඩව කොන්ග්‍රස් සැසිවාර පැවැත්වූ අතර මෙය සිවිල් යුද කාලයේදී පවා කිසි විටෙකත් සිදු නොවූ දෙයක් ලෙස පෙන්වාදිය හැකිය.

මොහුගේ පළමු ජයග්‍රහණය සමග ම අන්ඩර්වුඩ්-සිමන්ස් නම් තීරු බදු අඩු කිරීමේ පනත (Underwood-Simmons Tariff) සම්මත වූ අතර මෙමඟින් වසර 40 කට පසු පළමු වරට තීරු බදු අඩු විය. මෙම නැතිවූ ආදායම පියවා ගැනීම සඳහා ඒ සමයේ දී වෙනත් ආදායම් බද්දක් ද පිහිට වූ අතර මෙය පසුකාලීනව 16 වන සංශෝධනයේ දී සම්මත කරන ලදී.

වුඩ්රෝ විල්සන්ගේ දෙවන ජයග්‍රහණය ලෙස මාස ගණනක සංකීර්ණ විවාද, බැංකු හා මුදල් ප්‍රතිසංස්කරණයන්ගෙන් පිහිට වූ ෆෙඩරල් සංචිත පද්ධතිය

(Federal Reserve System) හඳුන්වාදිය හැකිය. මෙය වර්තමානයේ ද වඩාත් ම බලවත් රාජ්‍ය ආයතනය ලෙස හැඳින්විය හැකිය.

තුන්වන ජයග්‍රහණය පැමිණියේ ක්ලේටන් විශ්වාසභංග පනත (Clayton Antitrust Act) 1914 සම්මත වීමත් සමගය. මෙමගින් තරගකාරී ව්‍යාපාරයන්ට එරෙහිව පවත්නා නීති ශක්තිමත් කරන ලද අතර කම්කරු සංගම්වලට අධිකරණ නියෝගවලින් සහන ලබාදීම වැනි දෑ සම්මත විය. මෙම පනත සමග ෆෙඩරල් වෙළඳ කොමිෂන් පනත ද (Federal Trade Commission Act) සම්මත කරන ලදී. මෙහි පරමාර්ථය වූයේ, ව්‍යාපාර කාර්යක්ෂමව පවත්වාගෙන යාම වේ. 1912 දී රූස්වෙල්ට්ගේ (Roosevelt) පක්ෂයේ ඡන්දදායකින් ආකර්ෂණය කර ගැනීම සඳහා වුඩ්රෝ විල්සන් විසින් පළමු වරට ගොවීන්ට රජයේ ණය ලබා දීම සඳහා පහසුකම් ද, ළමා ශ්‍රමය තහනම් කිරීම, ආදායම සහ උරුමය බදු ඉහළ නැංවීම පළිබඳව විමසීම සඳහා වෙනම ආයතනයක් ද ස්ථාපිත කරන ලදී.

මොහුගේ දෙවන ජනාධිපති ධූර කාලය 1916 දී ආරම්භ විය. මෙය මොහු ජයග්‍රහණය කරන ලද්දේ අඛණ්ඩව දෙවන වරටත් ජනාධිපති ධූරයට තේරී පත්වූ ඩිමොක්‍රටික් පක්ෂයේ තරගකරුවෙක් ලෙසිනි. එම වර්ෂයේදීම දුම්රිය සේවකයින් විසින් කරන ලද වැඩ වර්ජනයක් හේතු කොටගෙන ඇමරිකා එක්සත් ජනපදයේ ආර්ථිකයට තර්ජනයක් ඇති විය. මෙය වුඩ්රෝ විල්සන් ඇඩම්සන් පනත (The Adamson Act) සම්මත කිරීමත් සමග සමථයකට පත්කළ අතර, මෙමගින් අන්තර් රාජ්‍ය දුම්රිය සේවකයින් සඳහා අතිකාල වැඩ සඳහා අමතර වැටුපක් සහිත පැය අටක වැඩ දිනයක් ස්ථාපිත කරන ලදී.

## විදේශ ප්‍රතිපත්තිය

ඇමරිකා එක්සත් ජනපදය 1776 පිහිටුවීමෙන් පසු නව රාජ්‍යයේ නායකයින්ගේ ප්‍රධාන අභිප්‍රාය වූයේ, යටත්විජිත බලවතුන්ගේ බල තරගයෙන් වෙන්ව සිටීම සහ රට තුළ අභ්‍යන්තර සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කිරීමයි. මෙය සාක්ෂාත් කරගැනීම සඳහා "මොන්රෝ මූලධර්මය" (Monroe Doctrine) අනුගමනය කළ අතර මේ හේතුවෙන් ඇමරිකා එක්සත් ජනපදය හුදකලා විදේශ ප්‍රතිපත්තියක්

අනුගමනය කරන ලදී. කෙසේ වෙතත්, මොන්රෝ මූලධර්මය පමණක් නොව, Exceptionalism සහ Unilateralism වැනි ඇමරිකානු සංකල්ප ද ආරම්භක අවධියේ දී ඇමරිකානු විදේශ ප්‍රතිපත්තිය හැඩගැස්විය. එහෙත්, දිනෙන් දින ජාත්‍යන්තර පද්ධතියේ අන්තර් සම්බන්ධතාවය වැඩිවීමත් සමඟ වුඩ්රෝ විල්සන්ගේ පූර්වගාමීන් වූ රූස්වෙල් සහ මැකින්ලි (Mckinley) වැනි නායකයින් හුදෙකලා ප්‍රතිපත්තියකට වඩා විවෘත ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමේ වැදගත්කම දුටුවෝය. ඒ අනුව, 1913 වර්ෂයේදී ඇමරිකා එක්සත් ජනපදයේ විසි අටවන ජනාධිපතිවරයා ලෙස වුඩ්රෝ විල්සන් බලයට පත්වන විට ඇමරිකානු විදේශ ප්‍රතිපත්තිය ආක්‍රමණශීලී, ජාතිකවාදී (Aggressive Nationalist) හා අධිරාජ්‍යවාදී (Imperialist) සංකල්පවලින් හැඩගැසී තිබුණි.

වුඩ්රෝ විල්සන් සිය ධූර කාලය ආරම්භ කරන විට, ඔහු දේශීය පාලන කටයුතුවල පමණක් නිරත වනු ඇතැයි බොහෝ දෙනා විශ්වාස කළ අතර, ඔහු පවා එය කියා සිටියේය; "It would be an irony of fate if my administration had to deal chiefly with & foreign affairs". කෙසේ බලාපොරොත්තු වූවත් වුඩ්රෝ විල්සන්ට ධූරකාල දෙක තුළ ලතින් ඇමරිකා (Latin America) හා මෙක්සිකෝව (Mexico) සමඟ ගැටුම් මැද පළමු ලෝක යුද්ධය සහ ජාතීන්ගේ ලීගය පිහිටුවීම වැනි විදේශ කටයුතු ගණනාවකට සහභාගී වීමට සිදුවිය.

මොහුගේ පූර්වගාමීන් මෙන් නොව, වුඩ්රෝ විල්සන් ප්‍රගතිශීලී මිනිසෙකු වූ අතර එක් එක් පුද්ගලයාගේ ප්‍රජාතන්ත්‍රවාදය සහ ස්වයං නිර්ණය ආරක්ෂා කිරීමට මොහු විසින් උත්සහ කරන ලදී. මෙම පරමාදර්ශයන් ඔහුගේ විදේශ ප්‍රතිපත්තියේ සාරය වූ අතර පසුව එය "විල්සෝනියානු වාදය" (Wilsonianism) ලෙස ප්‍රසිද්ධියට පත්විය. මෙම වාදය ලෝකය කෙරෙහි විඥානවාදී දෘෂ්ඨිකෝනයකින් (Idealistic View) බැලීමට පළමු පියවර තබන ලදී. වුඩ්රෝ විල්සන් අධිරාජ්‍යවාදයෙන් ඉවත් වූ අතර ඉදිරි දශක කිහිපය තුළ විල්සන්ගේ නායකත්වය යටතේ රටේ විදේශ ප්‍රතිපත්තිය පරිවර්තනය වූ අතර ඇමරිකා එක්සත් ජනපදය ප්‍රජාතන්ත්‍රවාදයේ ආරක්ෂකයා ලෙස ජාත්‍යන්තර පද්ධතිය තුළ ප්‍රචලිත විය.

## පළමු ලෝක යුද්ධය ආරම්භ වීමට පෙර විදේශ ප්‍රතිපත්තිය

වුඩ්රෝ විල්සන් සිය ජනාධිපති ධූර කාලය තුළ ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරන ලද්දේ ඇමරිකාවේ සාම්ප්‍රදායික බලපෑම් ක්ෂේත්‍රය (Traditional Sphere of Influence) සහ ඇමරිකාවට ඈඳා ගත් ප්‍රදේශ (Annexed territories) කෙරෙහි ය. ජනාධිපති වූ පසු නිවේදනයක් නිකුත් කරමින් වුඩ්රෝ විල්සන් ප්‍රකාශ කළේ එක්සත් ජනපදය අනෙකුත් රටවල් සමඟ මිත්‍රත්වය වර්ධනය කර ගැනීමට සැලසුම් කර ඇති බවත්, ඔහු ප්‍රජාතන්ත්‍රවාදී පරමාදර්ශයන් මත පාලනය කිරීම විශ්වාස කරන බවත් ය. මෙම ප්‍රකාශය ලතින් ඇමරිකානු රටවල් සහ ඈඳා ගත් ප්‍රදේශ රාජ්‍යයන්ට ස්වයං පාලනයක් ගැන බලාපොරොත්තුවක් ලබා දුන්නේ ය. ඔහුගේ නායකත්වය යටතේ ඇමරිකානු කොන්ග්‍රසය පිලිපීනයට (Philippines) වැඩි දේශපාලන ස්වාධීනත්වයක් ලබා දුන් ජෝන්ස් පනත (Jones Act) සම්මත කළ අතර ඔහු රූස්වෙල්ට්ගේ ක්‍රියාවන්ට සමාව අයැද කොලොම්බියාව (Colombia) සමඟ ගිවිසුමක් අත්සන් කළේය. නමුත්, වුඩ්රෝ විල්සන්ට සැමවිටම ඔහුගේ වචනවලට එකඟව සිටීමට නොහැකි වූ අතර, ඔහු හයිටියට (Haiti) (1915) සහ ඩොමිනික් ජනරජයට (Dominican Republic) (1916) හමුදාව යැවූ අතරම ඔහු වර්ජින් දූපත (Virgin Islands), ඩෙන්මාර්කයෙන් අධිරාජ්‍යවාදී ලෙස තම බලයට නතුකර ගත්තේය.

## පළමු ලෝක සංග්‍රාමයේදී සහ ඉන් පසුව විදේශ ප්‍රතිපත්තිය

1914 පළමුවන ලෝක යුද්ධය ආරම්භ වූ විට, යුද්ධය සම්බන්ධයෙන් වුඩ්රෝ විල්සන් මධ්‍යස්ථභාවය (Neutrality) ප්‍රකාශ කළ අතර ගැටුමට පිවිසුණු පාර්ශව දෙක අතර සාමය ඇති කිරීමට මැදිහත්කරුවෙකු ලෙස කටයුතු කිරීම ඔහුගේ මූලික බලාපොරොත්තුව විය. මෙම මධ්‍යස්ථභාවය ඔහුගේ දෙවන ධූර කාලය සඳහා මැතිවරණ ව්‍යාපාරයේ මූලික බලවේගය බවට පත් වූ අතර වුඩ්රෝ විල්සන් ඔහුගේ දෙවන ධූර කාලය සඳහා තේරී පත් වූයේ "ඔහු අපව යුද්ධයෙන් ඈත් කළේය" (He kept us out of war) යන මැතිවරණ සටන් පාඨය යටතේය. කෙසේ වෙතත්, ජර්මානු බෝට්ටුවල අඛණ්ඩ ප්‍රහාරවලට ලක්වීම හේතුවෙන් මධ්‍යස්ථ විදේශ ප්‍රතිපත්තිය තවදුරටත් විකල්පයක් නොවීය.

1915 දී ජර්මානු හමුදා ලුසිටානියා (Lusitania) නැවට පහර දීමෙන් පසුව වුඩ්රෝ විල්සන් සිවිල් වැසියන්ට එරෙහි සබ්මැරීන් යුද්ධය අවසන් කරන ලෙස ජර්මනියෙන් ඉල්ලා සිටි අතර 1916 දී ජර්මානු රජය මෙම කොන්දේසිවලට එකඟව සසෙක්ස් ප්‍රතිඥාව (Sussex Pledge) ලබා දුන්නේය. කෙසේ වෙතත් 1917 වන විට ජර්මානු හමුදා ඔවුන්ගේ මෙහෙයුම් සහ ප්‍රහාර පුළුල් කළ අතර එමඟින් ඇමරිකා එක්සත් ජනපදය සහ ජර්මනිය අතර දැඩි රාජ්‍යතාන්ත්‍රික ගැටළු වර්ධනය විය. තවද එක්සත් ජනපදයට එරෙහිව මෙක්සිකෝවට සහයෝගය දැක්වීමට ජර්මනිය එකඟ වූ සිමර්මන් ටෙලිග්‍රෑමය (Zimmermann Telegram) මධ්‍යස්ථභාවය තවදුරටත් සුදුසු ප්‍රතිපත්තියක් නොවන බව පෙන්නුම් කරන ලදී. මෙම තත්ත්වය යටතේ වුඩ්රෝ විල්සන් ජර්මනියට එරෙහිව යුද්ධ ප්‍රකාශ කරන ලෙස කොන්ග්‍රසයෙන් ඉල්ලා සිටි අතර සෙනෙට් සභාවේදී එය 82ට 6ක් ලෙස සම්මත විය.

වුඩ්රෝ විල්සන්ගේ යුධ පණිවිඩය (War Message) සහ කරුණු 14 දේශනය (14 Points Speech) ඔහුගේ විදේශ ප්‍රතිපත්තිය පිළිබඳ අවබෝධයක් ලබා දෙන වැදගත්ම ලියකියවිලි ලෙස හඳුනාගත හැකිය. වුඩ්රෝ විල්සන්ගේ යුධ පණිවිඩය මහා යුද්ධයේදී ඔහුගේ විදේශ ප්‍රතිපත්තියේ ප්‍රධාන අංග ඉස්මතු කළ අතර ගෝලීය සිදුවීම් සම්බන්ධයෙන් ඇමරිකානු මධ්‍යස්ථභාවයේ අවසානය සංකේතවත් කරයි. වුඩ්රෝ විල්සන් ඔහුගේ දේශන මඟින් අවධාරණය කළේ "ප්‍රජාතන්ත්‍රවාදය සඳහා ලෝකය ආරක්ෂිත කළ යුතු බව" (World should be made safe for democracy) සහ සියලු රටවල් ප්‍රජාතන්ත්‍රවාදී කිරීමෙන් සියලු යුද්ධ අවසන් වනු ඇති බවයි.

සාමකාමී හා ප්‍රජාතන්ත්‍රවාදී ලෝක පිළිවෙල (International Order) පිළිබඳ ඔහුගේ විඥානවාදී අදහස් සහ අපේක්ෂාවන් 1918 ජනවාරි 8 වන දින පවත්වන ලද කරුණු 14 දේශනය (14 Point) තුළින් තවදුරටත් විදහා දැක්වීය. ඔහු ඔහුගේ මෙම දේශනය මඟින් භෞමික ගැටළු කෙරෙහි අවධානය යොමු කළ කරුණු අටක්, සාමකාමී ලෝකයක් සඳහා වන මූලධර්ම පහක් සහ ජාතීන්ගේ ලීගය පිහිටුවීම කෙරෙහි එක කරුණක් අවධාරණය කළේය. මෙම කරුණු ඔහු වර්සේල්ස් ගිවිසුමේ (Treaty of Versailles) සාකච්ඡාවලට ද පදනම් කර ගැනීය.



*පැරිස් සාම සමුළුවේ ආරම්භක දිනයේ වමේ සිට: බ්‍රිතාන්‍ය අගමැති ලොයිඩ් ජෝර්ජ්,විටෝරියෝ ඕර්ලන්ඩෝ, ජෝර්ජස් ක්ලෙමෙන්සියෝ සහ ජනාධිපති වුඩ්රෝ විල්සන්*

මිත්‍ර පාක්ෂිකයින්ගේ ජයග්‍රහණයත් සමඟ පළමු ලෝක යුද්ධය අවසන් වූ පසු, සාම සාකච්ඡාවලට සහභාගී වීම සඳහා වුඩ්රෝ විල්සන් ප්‍රංශයට ගිය අතර මෙහිදී මොහු විසින් සාමූහික ආරක්ෂාව (Collective Security) මගින් ආරක්ෂා කෙරෙන ප්‍රජාතන්ත්‍රවාදී ජාත්‍යන්තර පිළිවෙලක් නිර්මාණය කෙරෙහි මූලික වශයෙන් අවධානය යොමු කරන ලදි. එසේම, එක්සත් ජාතීන්ගේ සංවිධානය සඳහා අඩිතාලම දැමූ ජාතීන්ගේ ලීගය (League of Nations) ස්ථාපිත කිරීමට ද ඔහු පෙනී සිටියේය. ඔහු ඇමරිකා එක්සත් ජනපදය ජාතීන්ගේ ලීගයෙහි සාමාජිකත්වය ලබාගැනීම උදෙසා වෙහෙස නොබලා පෙනී සිටියද, වුඩ්රෝ විල්සන්ගේ බලාපොරොත්තු සුන් කරමින් මෙය ඇමරිකානු කොංග්‍රසය විසින් ප්‍රතික්ෂේප කරන ලදී. එක්සත් ජනපදය ජාතීන්ගේ ලීගය හා සම්බන්ධ නොවූ අතර ඒ වෙනුවට (1921) දී බර්ලින් ගිවිසුමට (Berlin Treaty) අත්සන් තැබීය.

## <u>ගත හැකි ආදර්ශ</u>

ජනාධිපති වුඩ්රෝ විල්සන් පිළිබඳව සාකච්ඡා කිරීමෙදී සංක්ෂිප්තව ඔහු අභිලාෂකාමී, විශ්වාසවන්ත, බුද්ධිමත්, ත්‍යාගශීලී සහ කඩිසර පුද්ගලයෙක් ලෙස විස්තර කළ හැකිය.

වුඩ්රෝ විල්සන්, ධවල මන්දිරයෙන් (White House) පිටව ගියේ ශාරීරිකව දුර්වලවීමෙන් පසුවය. එහෙත් ඉන් පසුවත් ඇමරිකාව ජාතීන්ගේ ලීගයෙහි කේන්ද්‍රීය භූමිකාවක් ඉටු කරයි යන බලාපොරොත්තුව ඔහු සතුව තිබිණි. ඔහුගේ

මුරණ්ඩුකම හා ඔහුගේ ශාරීරිකව දුර්වල වීම 1919 දී ඔහුගේ ග්‍රහණයේ තිබූ සිහිනය සැබෑ කර ගැනීමට බාධා කළ බවට විටෙක තර්ක කළ හැකි වුවද, ඔහුගේ පරමාදර්ශය බොහෝ ඇමරිකානුවන් දිරිමත් කරමින් ඇමරිකානු විදේශ ප්‍රතිපත්තියේ බොහෝ දේ හැඩගස්වා ඇති බවට සැකයක් නැත.

ඇමරිකානු විදේශ ප්‍රතිපත්තියේ මූලික පරමාර්ථය හුදකලා වීමේ සිට ජාත්‍යන්තරවාදය දක්වා පරිවර්තනය කිරීම, ඩිමොක්‍රටික් පක්ෂය ප්‍රතිසංස්කරණ පක්ෂයක් බවට පත්කිරීම සහ මහජන මතය හැඩගස්වා බලමුලු ගැන්වීම යන අංග නූතන ජනාධිපති ධූරයට එක් කරන ලද්දේ වුඩ්රෝ විල්සන් විසිනි.

මොහු විසින් ආරම්භ කරන ලද දේශපාලන හා ආර්ථික ප්‍රතිසංස්කරණ ලොව පුරා තිබූ අනෙකුත් රාජ්‍යයන්ටද හිමිවූ මහඟු දායාදයකි. මෙපමණක් නොව, මෙම ප්‍රතිසංස්කරණ නවීන සුභසාධක රාජ්‍ය බිහිකිරීම සඳහා ද පදනම දැමීය. පළමු ලෝක යුධ සමයේදී මොහු විසින් කරන ලද යුධ බලමුලු ගැන්වීමේ වැඩසටහන් (Wartime MobilizationProgram) දෙවන ලෝක යුධ සමයේදී ෆ්‍රැන්ක්ලින් රූස්වෙල්ට් විසින් ආදර්ශයට ගන්නා ලදී.

මොහුගේ දේශපාලන චරිතය අප විසින් විශ්ලේෂණය කළහොත් ඇමරිකා එක්සත් ජනපදයට පමණක් නොව ලොව අනෙකුත් රාජ්‍යයන්ටද ගත හැකි දායාද ඇත. රිචඩ් නික්සන්, වුඩ්රෝ විල්සන්ගේ අනුප්‍රාප්තිකයා ලෙස ඕවල් මන්දිරයට (Oval Office) පැමිණි පසු වුඩ්රෝ විල්සන්ගෙන් ගත හැකි ආදර්ශ ප්‍රසිද්ධියේ කියා සිටියේය.

තවද, සාමූහික සුරක්ෂිතතාවය (Collective Security), මිනිස් ස්වභාවයේ යහපත් බව මෙන්ම අනාගතයේ ජාත්‍යන්තර සංවිධාන ගොඩනැංවීම සඳහා විඥානවාදී සංකල්ප (Idealism) ලොවට හඳුන්වාදීමේ පුරෝගාමියා ලෙස මොහු හැඳින්විය හැකිය. තෝමස් හොබ්ස් (Thomas Hobbes) වැනි යථාර්ථවාදීන්ට අනුව එතෙක් ලොව දුටු මිනිසාගේ කෲර, අධම සහ ආත්මාර්ථකාමී දෘෂ්ටිකෝණයෙන් මිදී වර්තමානයට ද සරිලන මිනිසාගේ යහපත් ගුණාංග ඉදිරිපත් කිරීම මොහුගෙන් ගත හැකි තවත් ආදර්ශයකි.

වර්තමාන තාක්ෂණික දියුණුවත් සමග කාර්යබහුල මිනිසාගේ ජීවිතය දේශපාලන වශයෙන් පමණක් නොව සදාචාරාත්මක වශයෙන් ද ගොඩනගා ගැනීමට වුඩ්රෝ

විල්සන්ගේ විඥානවාදය මහගු උපකාරයක් විය. එමනිසා දේශපාලනඥයකු, ඉතිහාසයඥයකු මෙන්ම නායකයෙකු ලෙස වුඩ්රෝ විල්සන්ගෙන් ගත හැකි ආදර්ශ වචනවලින් නිමකළ නොහැක.

## සාරාංශය

කුඩා දරුවෙකුට ලොව දිනූ චරිතයක් පිළිබඳව හඳුන්වාදීමට යමෙකුට කිවහොත් වුඩ්රෝ විල්සන්ගේ චරිතය කදිම නිදසුනකි. මක්නිසාද යත්, මොහුගේ ජීවිත කතාවෙන් ගතහැකි ආදර්ශ මහගු වීමයි. කුඩාකල සිට වුඩ්රෝ විල්සන් පොත් කියවීමට දැක්වූ රුචිය පසුකාලීනව ලෝකයේ බිහිවූ විශිෂ්ට ශාස්ත්‍රඥයකු මෙන්ම දේශපාලනඥයකු ද බිහිකිරීමට පිටිවහලක් විය. ඇමරිකාවේ විසි අටවන ජනාධිපතිවරයා ලෙස තේරී පත්වූ වුඩ්රෝ විල්සන් රාජ්‍යයට තවත් ජනාධිපතිවරයෙකු පමණක් නොවී රාජ්‍යයේ ප්‍රගතිය උදෙසා කැපවී වෙහෙසෙන ලදී. මොහු විසින් ඉදිරිපත් කරන ලද දේශපාලන හා ආර්ථික ප්‍රතිසංස්කරණ ඇමරිකාව නව මුහුණුවරක් කරා ගෙනයාමට පිටිවහලක් විය. එමෙන්ම, පළවන ලෝක යුධ සමයේදී ඇමරිකාව මිත්‍ර පක්ෂයේ සාමාජිකයෙකු වූවා පමණක් නොව මොහු එහි ජයග්‍රහණය සඳහාද උපකාර කළේය. තවද නවීන සුභසාධකවාදය (Modern Socialism) බිහිකිරීම සඳහා අවශ්‍ය පසුබිම මොහුගේ කරුණු 14 ඇතුළත් දේශනය තුළින් සකසන ලදී. මෙය පසුකාලීනව වර්සේල් ගිවිසුම ප්‍රතිෂ්ඨාපනය කිරීමට සහ ජාතීන්ගේ ලීගය ද බිහිකිරීමට පුරෝගාමී විය. ඇමරිකාවට ජාතීන්ගේ ලීගයේ සාමාජිකත්වය ලබාගැනීමට කොන්ග්‍රසයෙන් අවසර නොලැබුණද පසුකාලීනව වුඩ්රෝ විල්සන්ගේ අදහස් එක්සත් ජාතීන්ගේ සංවිධානය (United Nations) බිහිකිරීමට පළමු පියවර තබන ලදී.

වුඩ්රෝ විල්සන් මීට අමතරව වඩාත් යහපත් ලෝකයක් බිහිකිරීම සඳහා විඥානවාදී සංකල්ප (Idealistic Ideology) ඉදිරිපත් කළ අතර සාමූහික සුරක්ෂිතතාවය වැනි සංකල්ප තුළින් දෙවන ලෝක යුද්ධයක් වැළැක්වීමට උපරිම උත්සාහ දරන ලදී. විල්සෝනියානු වාදය, සදාචාරවාදය (Moralism) සහ මිෂනාරි රාජ්‍ය තාන්ත්‍රිකභාවය (Missionary Diplomacy) යන සංකල්ප අදටත් ඇමරිකානු ප්‍රතිපත්තිවලට බලපෑම් කරන අතර ප්‍රජාතන්ත්‍රවාදය, නිදහස් වෙළඳාම (Free

Trade), ධනවාදය (Capitalism) වැනි විල්සෝනියානු මූලධර්ම අදටත් ප්‍රචලිත වේ. වුඩ්රෝ විල්සන් ශාරීරිකව දුර්වල වූ ජනාධිපතිවරයෙකු ලෙස තම තනතුරෙන් නික්ම ගියද පුද්ගලයෙකු වශයෙන් ඔහුගෙන් ගතහැකි ආදර්ශ මහඟු වේ.

## මූලාශ්‍ර නාමාවලිය

The White House (2017). *The White House*. [online] The White House. Available at: https://www.whitehouse.gov/about-the-white-house/presidents/woodrow-wilson/

NobelPrize.org. (2019). *The Nobel Peace Prize 1919*. [online] Available at: https://www.nobelprize.org/prizes/peace/1919/wilson/biographical/.

Ambar, S. (2017). *Woodrow Wilson: Life Before the Presidency | Miller Center*. [online] Miller Center. Available at: https://millercenter.org/president/wilson/life-before-the-presidency.

millercenter.org. (2016). *Woodrow Wilson: Foreign Affairs | Miller Center*. [online] Available at: https://millercenter.org/president/wilson/foreign-affairs#:~:text=Wilson%20wanted%20to%20dismantle%20the.

Ambar, S. (2016). *Woodrow Wilson: Impact and Legacy | Miller Center*. [online] Miller Center. Available at: https://millercenter.org/president/wilson/impact-and-legacy.

NobelPrize.org. (2019). *The Nobel Peace Prize 1919*. [online] Available at: https://www.nobelprize.org/prizes/peace/1919/wilson/biographical/.

Anirudh (2015). *10 Major Accomplishments of US President Woodrow Wilson | Learnodo Newtonic*. [online] Learnodo-newtonic.com. Available at: https://learnodo-newtonic.com/woodrow-wilson-accomplishments.

# රිචඩ් නික්සන් (Richard Nixon)



**කණ්ඩායම් සාමාජිකයන්**

- ජී. එම්. ජනිත් ප්‍රමෝදය සෝමරත්න
- ජේ. එම්. චමල්කා දුලාංජලී ජයවර්ධන
- ඩබ්ලිව්. ඩබ්ලිව්. පී. ඤාලිකා දිල්රුක්ෂි
- එම්. ඒ. සිත්ති අනීසා
- ජී. සී. එස්. ටී. කේ. විමලානන්ද

# හැඳින්වීම

අළු ගසා දමා නැගී සිටින ෆීනික්ස් පක්ෂියකු මෙන් විශ්වීය දහරාවේ ප්‍රබල බලවතෙකු වූ ඇමරිකානු රාජ්‍යය එදා මෙදා තුර ලෝකයේ නොමැකෙන අමරණීය නාමයක් සනිටුහන් කළ විශිෂ්ට ලෝක බලවතෙකි. එකී රාජ්‍ය භූමිකාව තුළ නායකත්වය දැරීමට සුදුසුකම් ලැබීම සුළුවෙන් තැකිය හැකි කරුණක් නම් නොවේ. මන්ද, ඇමරිකාව දශක කිහිපයක් පුරාවටම අත්පත් කරගෙන සිටින්නා වූ අසහාය බලයේ විශිෂ්ටත්වය නිසාවෙනි. ඒ කරුණු කාරණා එකින් එක ගැළපීමේ දී ඇමරිකානු රාජ්‍යයත්වයේ බිහි වූ නායකත්ව පෞරුෂයන් අතරින් ජන හදවත් තුළ නොමැකෙන නාමයක් සනිටුහන් කළ, වර්ෂ 1960 දී බිහි වූ ප්‍රබලතම ජනතා පරමාධිපත්‍යයේ ජන හදවත්හි ලැගුම් ගත් අසහාය නායකයෙකු ලෙස රිචඩ් නික්සන් ජනාධිපතිවරයා හැඳින්විය හැකිය.

දේශපාලනය කරා ඔහු පැමිණි ගමන් මග රෝස මල් යහනාවක් නම් නොවේ. එය කුඩා කළ සිටම විවිධ හැලහැප්පීම්, බිඳවැටීම්, පරාජයන් මතින් ඉතා වෙහෙස වී ලද සාර්ථක ජයග්‍රහණයකි. හසල දේශපාලනික අත්දැකීම් සතු මොහුගේ පාලන සමය තුළ පැමිණි අභියෝගවලට සාර්ථකව මුහුණ දුන් මොහු, දේශපාලන වේදිකාවේ පෙරළිකාර චරිතකි. ඔහු සතු විඥානවාදී ආකල්පයන් ඇමරිකා එක්සත් ජනපදය සශ්‍රීකත්ව ජයග්‍රහණයක් කරා මෙහෙය වීය. නික්සන් විසින් දීර්ඝකාලීන සාර්ථකත්වයේ යතුර ආර්ථික ප්‍රතිපත්තිය බව වටහා ගන්නා ලදී. ඒ අනුසාරයෙන් දේශපාලනික, ආර්ථික හා සමාජීය වශයෙන් ඇමරිකාව ස්ථාවර කිරීමෙහිලා වඩාත් ක්‍රියාකාරී ප්‍රායෝගික විදේශ ප්‍රතිපත්තියක් අනුව යමින් ලෝකයේ කැපී පෙනෙන බලවතෙකු බවට පත් කිරීමට ගත් උත්සාහය අති මහත්ය.

ජාත්‍යන්තරය තුළ ඇමරිකානු ධජය ජයග්‍රහණයේ මාවත ඔස්සේ ඔසවාලීමටත්, ඇමරිකානු නාමය ප්‍රතාපවත් යෝධයෙක් සේ නැංවීමටත් නායකත්වය දුන් ඇමරිකාවේ තිස්හත් වන ජනාධිපති වූ රිචඩ් නික්සන්ගේ දැවැන්ත සේවාව අමරණීය වේ. එවන් විශිෂ්ට පෞරුෂයකට හිමිකම් කියන නික්සන්ගේ ලෝක සම්ප්‍රාප්තිය මෙන්ම ළමා කාලය, අධ්‍යාපනය, දේශපාලන ගමන් මඟ, විවිධ ක්ෂේත්‍රවලට සිදු වූ සේවාවන් හා පරිපාලනයේ දූරදර්ශී ප්‍රතිපත්ති පිළිබඳ විශ්ලේෂණය කර බැලීමේදී අවසානයේ මෙවන් උදාර වූ චරිතයකින් ගත හැකි ආදර්ශ අතිමහත්ය. මෙවන් නොයෙක් මානයන් ඔස්සේ ඔහු පිළිබඳව කළ ගවේෂණයන්හි ප්‍රතිඵලයක් වශයෙන් සාර්ථක නායකත්වය පිළිබඳ පූර්වාදර්ශයන්

විවරණය කර ගත හැකිය. ධනය හා බලය යන්න මිනිසා තුළ අත්‍යන්තයෙන්ම හට ගන්නා ආශාවන් වූවද නික්සන්ගේ යදම් බිඳි දෘෂ්ටිය ඔස්සේ ප්‍රතාපවත් යුග පුරුෂයකු ලෙස ඔහු කළ සේවාව ඇමරිකානු රාජ්‍යයෙහි උන්නතියට මහත් රුකුලක් විය. පාලන සමය කෙතරම් කෙටි වුවද චිත්තපීඩා හා සන්තාප නොතකා නික්සන් ආ ගමන් මඟ මානුෂ්‍යත්වයේ ප්‍රතිභාව විදහා පායි.

## ළමා කාලය, අධ්‍යාපනය හා දේශපාලනයට පිවිසීම

"විජයග්‍රහණයේ සැමරුම අභිමුවද අන් සියල්ලන් පෙරමුණෙහිද ඔබ ඔවුන් පසුපසින්ද සිටිමින් නායකත්වය දිය යුතු වන්නේය. එහෙත් අභියෝගයන් සහ අනතුරු අබිමුවෙහි දී ඔබ සැමවිටම පෙරමුණ ගත යුතු වන්නේය. එවිට නායකයකු ලෙස ඔබ සියල්ලන්ගේ ගෞරවාදරයට පාත්‍ර වනු ඇත". නෙල්සන් මැන්ඩෙලා (Nelson Mandela) විසින් ප්‍රකාශ කරන ලද මෙම පාඨය සාධාරණීකරණය කරමින්, ලෝක බලවතෙකු ලෙස විරුදාවලිය ලත්, ඇමරිකානු රාජ්‍යයෙහි ජනතා පරමාධිපත්‍යයේ ජනවරමින් ජනපති අසුන තමා සතු කර ගැනීමට වරම් ලැබූ, එදා මෙදා තුර ඇමෙරිකානු වංශකතාවේ බිහිවූ විශිෂ්ට නායකයෙකු ලෙස රිචඩ් නික්සන් (Richard Nixon) හැඳින්විය හැකිය. "ලොවෙන් එකෙක් එක් දෙයකට වෙයි සමත" යන පාඨය නිශ්ඵල යැයි පවසන්නට තරම් ඔහු තුළ සිටි බහුවිධ දක්ෂතා පිරි මිනිසාට හැකියාව පැවති බව නික්සන් පිළිබඳ අධ්‍යයනයේ දී හමුවන සාක්ෂිවලින් පැහැදිලිය. ඇමරිකානු රාජකීය සිංහාසනයේ තිස්හත් වන ජනාධිපති වශයෙන් බලයට පත් වූ මොහුගේ සම්පූර්ණ නාමය වූයේ රිචඩ් මිල්හවුස් නික්සන් (Richard Milhous Nixon) ය.



*කුඩා රිචඩ් නික්සන් තම මව, පියා සහ සහෝදරයින් සමඟ*

ෆ්‍රැන්සිස් ඇන්තනී නික්සන් (Francis Anthony Nixon,1878-1956) සහ හැනා එලිසබෙත් මිල්හවුස් නික්සන් (Hannah Elizabeth Milhous Nixon,1885-1967) යන යුවලට දාව කැලිෆෝනියාවේ යොර්බා ලින්ඩාහි (Yorba Linda, California, United State) කුඩා නික්සන් උපත ලැබීය. පවුලේ ගොවිපළක වූ තම නිවසේ දී එක්දහස් නවසිය දහතුනේ ජනවාරි මස නව වන දින මෙලොව එළිය දුටු කුඩා නික්සන් සහෝදරයන් පස් දෙනෙකුගෙන් යුත් පවුලේ දෙවෙනියාය. කුඩා නික්සන්ගේ පවුලත්, අන් අයගේ මෙන්ම කම්කරු පන්තියේ එකක් විය. ඔහු කුඩා කළ සිටම නොයෙකුත් දුෂ්කරතා අගහිඟකම්වලට මුහුණ දුන් අතර එය වඩාත් තීව්‍ර වූයේ, ඔහුගේ සහෝදරයන් වූ හැරල්ඩ් හා ආතර්ගේ හදිසි මරණවලින් පසුවය. ඒ ඛේදනීය සිදුවීම්වලින් පසු 1922 දී නික්සන් පවුලේ ගොවිපළ අසාර්ථක වීමත් සමඟ ඔවුන් කැලිෆෝනියාවේ විටියර් (Whittier) වෙත සංක්‍රමණය විය. එහිදී වෙළඳසැලක් හා ඉන්ධන පිරවුම්හලක් විවෘත කළ අතර එයින් මුළු පවුලෙහි එදිනෙදා අවශ්‍යතා සපුරාලීම උදෙසා සියලු දෙනාටම වෙහෙස වී වැඩ කිරීමට සිදුවිය.

ක්‍රියාශීලී දීප්තිමත් ශිෂ්‍ය අවධියකට හිමිකම් කියන නික්සන් 1930 සැප්තැම්බර් මස විටියර් විද්‍යාලයට (Whittier College) ඇතුළත් විය. කුඩා අවධියේ පටන් ඔහු සියලු ක්ෂේත්‍රයන්ට උපන් හපන් දස්කම් දැක්වූ අතර පාසල් කාලයේදී විෂය බාහිර කටයුතු සඳහාද සුවිශේෂී දස්කම් දැක්වීය. නාට්‍ය හා පාපන්දු ක්‍රීඩාවට මෙන්ම විවාද කිරීමටද රුචිකත්වයක් දැක් වූ ඔහු පියානෝ වාදනයෙහි ප්‍රවීණයකු විය. කල්යත්ම, දෙමව්පියන්ගේ මඟ පෙන්වීම යටතේ ෆුලටර් යූනියන් උසස් පාසලට (Fullerton Union High School) ඇතුළත් වූ ඔහු එහිදී විශිෂ්ට ලකුණු ලබා ගත්තේය. පසුව, 1934 මැයි මාසයේදී ඩියුක් විශ්වවිද්‍යාලයෙහි (Duke University School of Law) නීති පීඨයට ඇතුළත් වීම සඳහා ශිෂ්‍යත්වයක් දිනා ගත් ඔහු, එහිදී ශිෂ්‍ය නීතිඥ සංගමයේ සභාපති හා නීති සමාලෝචන සාමාජිකයෙකු වශයෙන් කටයුතු කරන ලදී. ඔහු විසින් 1937 ජුනි මස වනවිට ඩියුක්හි තම උපාධිය සම්පූර්ණ කළ අතර උපාධිය ලැබීමෙන් පසු ඔහුගේ සැලසුම වූයේ, ෆෙඩරල් විමර්ශන කාර්යාංශයට බැඳීමටය. නමුත්, ඒ වෙනුවට ඔහු වයින්ගාට් (Wingert) සහ බෙව්ලි ෆර්ම්හි (Bewley) වැඩ කිරීමට විටියර් වෙත ආපසු ගියේය.

ඔහු විටියර්හිදී දේශීය චිත්‍රපටි නිෂ්පාදනයකට රංගනයෙන් දායක වූ අවධියේ ඔහුට පැට්‍රිෂියා රයන් (Patricia Ryan) නම් නිළියකගේ හමුවිය. ඔවුන් 1940 දී විවාහ වූ අතර තම දිගු දේශපාලන දිවියේ උස් පහත්වීම් වලදී ඇයගෙන් ඔහුට අපමණ සහයෝගයක් හිමිවිය. මෙම දෙපළට දාව දරුවන් දෙදෙනෙක් විය. ඒ "පැට්‍රිෂියා" (Patricia) සහ "ජුලී" (Julie) ය. නික්සන් ඔහුගේ පවුලට ඉතා සමීප විය. විශේෂයෙන්ම, වෝටර්ගේට් (Watergate) සිද්ධියත් සමඟ ඔහුගේ ඉල්ලා අස්වීමෙන් පසුව නික්සන් දෙපල කැපවූයේ වැඩිහිටියන් වශයෙන් තම මුණුබුරු මිනිබිරියන්ගේ වගකීම් නොපිරිහෙළා ඉටුකිරීම සඳහාය. නික්සන් මිල පරිපාලන කාර්යාලයේ සේවය කළ බැවින් ඔවුන් වොෂිංටන් ඩී. සී (Washington, D.C) වෙත යන තෙක් 1942 ජනවාරි දක්වා විටියර්හි පදිංචි විය.

පසුව, නික්සන් එක්සත් ජනපද නාවික හමුදාවට බැඳීමට තීරණය කළේය. වර්ෂ 1946 අලුත් අවුරුදු දිනයෙහි ලුතිනන් කමාන්ඩර් (Commander) ලෙස පත් වූ ඔහු ඉල්ලා අස්වන තෙක්ම සේවය කළේය. ඔහු විටියර් වෙත ආපසු පැමිණි පසු, විටියර්හි රිපබ්ලිකානුවන් විසින් ජෙරී වෝර්හිස්ට (Jerry Voorhis) එරෙහිව කොංග්‍රසයට තරඟ කරන ලෙස ඉල්ලා සිටියේය. ඔහු මැතිවරණය ජයග්‍රහණය කිරීමත් සමඟ දේශපාලන ජීවිතය ආරම්භ වූ අතර 1949 නොවැම්බර් මාසයේදී සෙනෙට් සභාවට තරඟ කිරීමට මඟ පෑදුණේය. ඔහු විසින් නව භූමිකාවට ක්‍රියාකාරීව සහභාගී වූ අතර පසුව උප ජනාධිපති අපේක්ෂකයෙකු ලෙස ඩ්වයිට් ඩී. අයිසන්හවර් (Dwight D. Eisenhower) වෙත නිර්දේශ විය. නික්සන් 1960 දී ජනාධිපති ධූරයට තරඟ කිරීමට තීරණය කරන තෙක් ඔවුන්ගේ හවුල්කාරිත්වය අඛණ්ඩව වාර දෙකක් දක්වා සාර්ථක විය. 1968 වන තෙක් ඔහුට සැබවින්ම ජනාධිපති ධූරය නොලැබෙන අතර 1969 දී ඔහු ඇමරිකාවේ තිස්හත් වන ජනාධිපතිවරයා ලෙස බලයට පත්විය. ක්‍රමයෙන් මුහුකුරා ගිය අදහස් ඇති මොහු තම වෘත්තීය ජීවිතයේ ලබා ගත් දැනුම, අත්දැකීම් හා පරිණතභාවය ස්වකීය දේශපාලන ජීවිතයට පදනම ලෙස යොදා ගත්තේය.

## නායකත්වය කරා ගිය ගමන් මඟ

වෘත්තීය ජීවිතයට මද විරාමයක් ලබා දුන් රිචඩ් නික්සන් 1946 දී ඔහුගේ පළමු දේශපාලන ව්‍යාපාරය ආරම්භ කළේය. ඔහු ඒ සඳහා යොදාගනු ලැබුවේ දෙවන ලෝක මහා සංග්‍රාම (Second World War) සමයෙහි එක්සත් ජනපද නාවික හමුදාවේ සේවය කරන කාලයේ දී පෝකර් (Poker) ක්‍රීඩාවෙන් දිනාගත් විශාල මුදලයි. දෙවන ලෝක මහා සංග්‍රාමයෙන් පසුව නික්සන් ඔහුගේ දේශපාලන දිවියට පිවිසීය.

ප්‍රථමයෙන්ම ඔහු එක්සත් ජනපද නියෝජිත මන්ත්‍රී (House of Deputie) මණ්ඩලයේ කැලිෆෝනියා ප්‍රාන්තය නියෝජනය කළේය. නික්සන් කොංග්‍රස් සභිකයෙකු ලෙස "House in American Activities Committee" කමිටුවෙහි සේවය කළේය. 1948 දී කොංග්‍රසයට නැවත තේරී පත්වූ, නික්සන් ඉන් වසර දෙකකට පසුව ඒනම් 1950 දී එක්සත් ජනපද සෙනෙට් සභාවේ ආසනයක් දිනා ගත්තේය. එහිදී, ඔහු විසින් ඩිමොක්‍රටික් සහ කොංග්‍රස් යන සභික "හෙලන්" (Helen) සහ "ඩලස්" (Dallas) පරාජය කරමින් කැලිෆෝනියාවේ හිස් වූ එක්සත් ජනපද ආසනය මිලියන භාගයකට වඩා වැඩි ඡන්ද සංඛ්‍යාවකින් ජයග්‍රහණය කරන ලදී. සෙනට් සභිකයකු වූ නික්සන් එවකට ජනාධිපති වූ "හැරී එස්. ටෲමන්" (Harry S. Truman) විසින් කොරියානු යුද්ධය හසුරවන ආකාරය විවේචනය කළේය. 1952 දී නික්සන්, ජනාධිපති "අයිසන්හවර්" යටතේ උප ජනාධිපති ධූරය ලබාගත් අතර එහිදී වැදගත් කාර්යයන් රාශියක් ඉටු කළේය.



*නික්සන් අයිසන්හවර් යටතේ උප ජනාධිපතිවරයකු ලෙස (1952)*

නික්සන් විසින් ජනාධිපතිවරයා නොමැති අවස්ථාවලදී ජාතික ආරක්ෂක කවුන්සලයේ රැස්වීම්වල මුලසුන දැරීය. එමෙන්ම, ඔහු තෘෂ්ණා යුද්ධ, සමයේ ඇමරිකානු ප්‍රතිපත්තිය සැකසීම සඳහා සහයෝගය ලබා ගැනීමේ උත්සාහයක්

ලෙස විදේශ රටවල බොහෝ සුහද සංචාරයන් සිදුකළේය. ඔහුගේ උපන් ප්‍රාන්ත ආණ්ඩුකාර ධූරය අහිමි වීමෙන් වසර හයකට පසුව නික්සන් කැපී පෙනෙන දේශපාලන පුනරාගමනයක් සිදුකළේය. ඔහු තම පක්ෂයේ ජනාධිපති අපේක්ෂකත්වයට හිමිකම් කීවේය. ඔහු විසින් 1968 දී එක්සත් ජනපද ජනාධිපතිවරණයේ ඩිමොක්‍රටික් පාක්ෂික "හියුබට් හම්ප්‍රි" (Hubert Humphrey) සහ තෙවන පාර්ශවීය අපේක්ෂක "ජෝර්ජ් වොලස්" (George Wallace) යන අයව පරාජය කළේය.

නික්සන් බලයට පත් වූයේ, එක්සත් ජනපද දේශපාලනයෙහි වියවුල් සහගත කාල පරිච්ඡේදයකය. ඇමරිකානු ජනතාවගේ සිතුවිලි වියට්නාමීය යුද්ධය සම්බන්ධයෙන් දැඩි ලෙස බිඳී ගිය, කාන්තාවන් සමාන අයතිවාසිකම් සඳහා පෙළපාලි යන, වාර්ගික ප්‍රචණ්ඩත්වය සහ ජාතිය, නගර සොලවා දමන අවස්ථාවන් මේ සමය තුළ සුලබ විය.

නික්සන් ඔහුගේ දේශපාලන ක්‍රියාවලිය සඳහා පියවර කිහිපයක් අනුගමනය කළ බව පැහැදිලි වේ. එනම්, ඔහු 1968 දී දේශපාලන ව්‍යාපාරයක් ආරම්භ කළේය. 1968 ජනවාරි මාසයේදී නික්සන් නැවත වරක් රිපබ්ලිකන් පක්ෂයේ ජනාධිපති අපේක්ෂකත්වයට ඉල්ලා සිටීමට තීරණය කළේය. ජාතික පෙරළියක් සහිත සමයක ස්ථාවරත්වයකින් යුත් චරිතයක් ලෙස තමා නිරූපණය කරමින් නික්සන් සාම්ප්‍රදායික වටිනාකම්, නීතිය සහ සාමය නැවත ළඟා කර දෙන බවට ජනතාව හමුවේ පොරොන්දු විය. ඔහු රිපබ්ලිකන් සම්මේලනයේ නාමයෝජනා ලබා ගන්නා අවධියේදී කැලිෆෝනියා ආණ්ඩුකාර "රොනල්ඩ් රේගන්" (Ronald Reagan), නිව්යෝර්ක් ආණ්ඩුකාර "නෙල්සන් රොක්ෆෙලර්" (Nelson Rockefeller) සහ මිචිගන් ආණ්ඩුකාර "ජෝර්ජ් රොම්නි" (George Romney) වැනි අනෙකුත් අපේක්ෂකයන්ගෙන් එල්ල වූ අභියෝග ජයගත්තේය. එවකට පැවති එක් එක් පක්ෂයන්හි ප්‍රචණ්ඩකාරී ක්‍රියාවලීන් හමුවේ පසුනොබට නික්සන් මහජන ඡන්ද ලක්ෂ 50 කට ආසන්න ප්‍රමාණයක් හිමිකරගනිමින් ජනාධිපති ධූරය ජයග්‍රහණය කළේය.

බලයට පැමිණි පසු නික්සන් සහ ඔහුගේ කාර්ය මණ්ඩලය "වියට්නාම් යුද්ධය අවසන් කරන්නේ කෙසේද" යන ගැටළුවට මුහුණ දුන් අතර 1969 නොවැම්බර් 3 වන දින ජාතික රූපවාහිනිය හරහා ජාතිය අමතමින් සමස්ත ඇමෙරිකානුවන්ගෙන්

ඉල්ලා සිටියේ "ඇමෙරිකානු රජය කෙරෙහි තබන විශ්වාසය රැකගැනීම සහ ඔහුගේ ප්‍රතිපත්තීන් උදෙසා පිටුබලය අවශ්‍ය බවයි".

මේ ආකාරයට විවිධ හැලහැප්පීම් මධ්‍යයේ පියවරෙන් පියවර තම දේශපාලන ගමන් මඟ සාර්ථක අයුරින් නිර්මාණය කර ගත් ජනපති නික්සන් නායකත්වය කරා ආ ගමන් මඟ මෙසේ සනිටුහන් කළ හැකිය.

## නායකත්වයට පැමිණීමෙන් පසු සිදුකළ සේවාව

රාජ්‍යත්ව භූමිකාවන් අතර ස්වකීය ජනතාව උදෙසා බලයට පත් වූ නායකත්ව පෞරුෂයන් දැකගත හැකිය. එකී චරිත තුළ කළු මෙන්ම සුදු පැතිකඩයන් ද විද්‍යමාන වේ. එනම්, මනා දැක්මකින් යුතුව තම රට දියුණුව කරා ගෙනගිය පාලකයින් මෙන්ම වැරදි තීන්දු තීරණ හේතුවෙන් තම රට අගාධයට ඇද දැමූ පාලකයන් ද සිටී. එවැනි වූ නොයෙකුත් නායකයන් අතුරින් අපහට හමුවන සුවිශේෂී නායකත්ව පෞරුෂයක් ලෙස රිචඩ් නික්සන් හඳුනාගත හැකිය. ලොව සුපතල නායකයින් අතරින් මොහු සුවිශේෂී වනුයේ, වර්තමාන ලෝක බලවතා වන ඇමරිකා එක්සත් ජනපදය එකී තලයට ගෙන ඒමට උරදුන් නායකයකු වන නිසාවෙන්මය.

ජනතා පරමාධිපත්‍ය බලයේ පිලිබිඹුවක් ලෙස බලයට පත්වන නික්සන් ඉතා විශිෂ්ට නායකත්ව ගුණාංගයන්ගෙන් හෙබි චරිතයකි. නිරවද්‍ය තීරණවලට එළඹීමේ හැකියාවක්, මනා අවබෝධයක් හා දැක්මකින් යුතු නායකයකු ලෙස ඔහුගේ චරිතය පෙන්වා දිය හැකිය. සිය පෞරුෂයත්, නායකත්ව හැකියාවත් ප්‍රකට කරමින් නික්සන් විසින් ජනාධිපති ධූර දෙකක් ජයග්‍රහණය කළ අතර උප ජනාධිපතිවරයකු, සෙනෙට් සභිකයකු මෙන්ම නියෝජ්‍ය මන්ත්‍රී මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන්ද ඇමරිකා එක්සත් ජනපදය තුළ අමරණීය නායකත්ව සලකුණක් සනිටුහන් කරන්නට විය.

ධූරකාලය ආරම්භයේ සිටම අවසන් වන තෙක්ම තම උරමත පැටවුණු වගකීම මහත් ඕනෑකමින් ඉටු කළ අග්‍රගන්‍ය රාජ්‍ය නායකයකු වන මොහු, සිය ජනතාවගේ පක්ෂපාතීත්වය ලබා ගනිමින් පාලන කටයුතු සිදුකරන ලදී. තමා කෙරෙහි විශ්වාසය තබා බලය ලබාදුන් ජනතාව වෙනුවෙන් අනුපමේය සේවාවක් සිදුකළ

ජන නායකයකු වන නික්සන් පළමුව ෆෙඩරල් රජයේ බලය අඩු කිරීමට කටයුතු කරන ලදී. වියදම හා නාස්තිය කප්පාදු කළ නික්සන් තුන්කල් දැක්මක් සහිත වැඩපිළිවෙළක් මත පිහිටා සංවර්ධනය විය යුතු සෑම අන්තයකටම අවධානය ලබා දෙන ලදී.

එමෙන්ම, රාජ්‍ය නායකයකු වශයෙන් ඔහු කළ සේවාවන් අතර පාරිසරික සංරක්ෂණ ඒජන්සිය EAP (Environmental Protection Agency) නිර්මාණය කිරීමෙහිලා පුරෝගාමීත්වය ගෙන කටයුතු කිරීම පැසසුමට ලක්විය යුතු කරුණකි. ඔහු පරිසර සංරක්ෂණ ඒජන්සිය බිහි කිරීම හරහා ජාතික මාර්ගෝපදේශන සහ ඒවා නිරීක්ෂණය කිරීම මෙන්ම බලාත්මක කිරීම සිදුකරන ලදී. එමෙන්ම, ඒ හරහා ෆෙඩරල් දෙපාර්තමේන්තු ත්‍රිත්වයක අභ්‍යන්තර, කෘෂිකර්මික, සෞඛ්‍ය, අධ්‍යාපනික සහ සුබසාධන කටයුතු නියාමනය කිරීමට ෆෙඩරල් ආයතන සතු කාර්යයන් නව නියෝජිතායතනයට මාරු කරන ලදී. වර්ෂ 1970 - 1980 කාල පරිච්ඡේදය පරිසර දශකය ලෙස හඳුනාගන්නා ලදී. එම කාලය තුළ නික්සන්ගේ මූලිකත්වයෙන් ජාතික පාරිසරික ප්‍රතිපත්ති පනත NEPA (National Environmental Policy Act) 1971 ජනවාරි 01 දින අත්සන් කරන ලදී.



*රිචඩ් නික්සන් ඇමරිකාවෙහි පාරිසරික සංරක්ෂණ නියෝජිතායතනයේ සිට*

වර්තමානය තුළදී ක්‍රියාත්මක වන පරිදි  මෙන්ම එහි වැදගත්කම හීන නොවන පරිදිද නික්සන් විසින් ආරම්භ කළ OSHA (Occupational Safety and Health Administration) පනත ඇමරිකානුවන් උදෙසා ඉටුකළ ඉතා වැදගත් සේවාවකි. ජනපති නික්සන් වර්ෂ 1970 දෙසැම්බර් 29 වන දින වෘත්තිය සුරක්ෂිතතා මෙන්ම සෞඛ්‍ය යන පනත් සඳහා අත්සන් තබන ලදී. එය 1971 අප්‍රේල් 28 දින සිට බලාත්මක කරන ලදී. ඔහු පළමු අර්ධ ශතවර්ෂයට අදාළ සේවා කටයුතුවලදී රැකියා ස්ථානයේ සිදුවන මරණ, තුවාල සහ රෝගාබාධ සැලකිය යුතු ලෙස අඩු කර ඇමරිකානු සේවා ස්ථානවල පරිවර්තනීය වෙනසක් ඇති කිරීමට සමත් විය.

නික්සන් විසින් ධවල මන්දිරයෙහි ගත කළ ධූර කාලය තුළ වියට්නාම් යුද්ධයට එක්සත් ජනපදයේ මැදිහත්වීම අඩු කිරීමට කටයුතු කරන ලදී. එමෙන්ම, සෝවියට් සංගමය (Soviet Union) සහ චීනය (China) සමඟ සමීපව කටයුතු කළ අතර අජටාකාශ ගවේෂණය තුළද සැලකිය යුතු සේවාවන් බොහෝමයක් සිදුකර තිබේ. එනම්, පළමු මිනිසුන් රැගත් රොකට් යානය සඳ මත ගොඩබැස්සවීමට අවශ්‍ය අනුග්‍රාහකත්වය ලබාදෙන ලද්දේ මෙතුමා විසිනි.

රිචඩ් නික්සන් තම ධූර කාලය තුළ සිදුකළ සේවාවන් පිළිබඳ විමර්ශනය කිරීමේදී, එම කාල පරාසය තුළ දේශපාලන, ආර්ථික හා සමාජයීය යන ක්ෂේත්‍රයන්හි පුළුල් පරිවර්තන ගනණාවක් සිදුවිය.

**දේශපාලනික සේවා**


ජනාධිපති ධූරයට පත් වීමෙන් පසු දේශපාලන වශයෙන් වෙනස්කම් රැසක් සිදු කරන ලද පාලකයෙකු ලෙස නික්සන් පෙන්වා දිය හැකිය. විශේෂයෙන්ම ඔහු " නව ෆෙඩරල්වාදය" (New Federalism) නමින් හඳුන්වන ආදායම් බෙදා ගැනීමේ වැඩසටහන හරහා ප්‍රාන්ත සහ ප්‍රාදේශීය ආණ්ඩුවලට ෆෙඩරල් බදු, ඩොලර් මිලියන ගණනක් ලබා දුන්නේය. එමෙන්ම, මොහුගේ දේශපාලන ගමන් මඟ තුළ පැවැත්වූ විදේශ සම්බන්ධතා හරහා විවිධ දේශපාලනික සේවාවන් සපයා තිබේ.

- වියට්නාම යුද්ධය (Vietnam War) - වියට්නාම් යුද්ධයෙහි ගෞරවය හා සාමය සාක්ෂාත් කරගැනීම අරමුණු කරගනිමින්, නික්සන් විසින් වියට්නාමයෙහි රඳවා තැබූ එක්සත් ජනපද හමුදා සාමාජිකයින් සංඛ්‍යාව ක්‍රමයෙන් අඩු කිරීමට පියවර ගන්නා ලදී. ඔහුගේ "වියට්නාමකරණ" (Vietnamization) ප්‍රතිපත්තිය යටතේ සටන් භූමිකාවන් දකුණු වියට්නාම හමුදා වෙත මාරු කරන ලදී.
- චීනය සමඟ සම්බන්ධතා පැවැත්වීම - විදේශ කටයුතු සම්බන්ධයෙන් නික්සන්ගේ වඩාත්ම කැපී පෙනෙන ජයග්‍රහණය වන්නේ, වසර 21ක විරසකයකින් පසු චීන මහජන සමූහාණ්ඩුව සමඟ සෘජු සබඳතා ඇති කර ගැනීමය. 1970 දී පහත් මට්ටමේ රාජ්‍යතාන්ත්‍රික සම්බන්ධතා මාලාවකින් සහ ඊළඟ වසරේ එක්සත් ජනපද වෙළඳ සහ සංචාරක සීමාවන් ඉවත් කිරීමෙන් පසුව, චීන ජාතිකයන් ඉහළ මට්ටමේ සාකච්ඡා පිළිගන්නා බව ඇඟවුම් කළේය. ඊට පිළිතුරු වශයෙන් දෙරට අතර සබඳතාවන්හි

තීව්‍රත්වය සහතික කිරීම උදෙසා නික්සන් ඔහුගේ ජාතික ආරක්ෂක උපදේශක හෙන්රි කිසිංගර් (Henry Kissinger) චීනයට යැවීය. 1972 පෙබරවාරි-මාර්තු මාසයන්හි නික්සන් සහභාගී වූ චීන සංචාරය, නිලයේ සිටියදී ඇමරිකානු ජනාධිපතිවරයෙකු සහභාගී වූ ප්‍රථම සංචාරය වූ අතර එය ෂැංහයි ප්‍රකාශය (Shanghai Declaration) සමග අවසන් විය.

**ආර්ථික සේවා**

1973 ට පෙර නික්සන්ගේ වැඩි අවධානයකට බඳුන් වූ අංශයක් ලෙස ආර්ථික පැතිකඩ පෙන්වා දිය හැකිය. මිල පාලනය සහ උද්ධමනය අඩු කිරීම සඳහා ඔහු මුලින් ෆෙඩරල් වියදම් සීමා කිරීමට කටයුතු කළේය. අඛණ්ඩ උද්ධමනය, වැඩිවන විරැකියාව සහ පිරිහෙන වෙළඳ හිගයට ප්‍රතිචාර වශයෙන් 1971 අගෝස්තු මාසයේදී ප්‍රකාශයට පත් කරන ලද නික්සන්ගේ නව ආර්ථික ප්‍රතිපත්තිය වැදගත් විය. මෙම ප්‍රතිපත්ති ඔස්සේ ගිය නික්සන් 1972 වර්ෂයේ අවසානය කාර්තුව වන විට ආර්ථිකයේ වැඩි දියුණු කිරීම් ඇති කළේය.




*රිචඩ් නික්සන්ගේ වැටුප් සහ මිල පාලනය පිළිබඳ දත්ත සටහනක් (1971)*

**සමාජීය සේවා**

උණුසුම් මැතිවරණයකින් පසු තේරී පත් වූ රිචඩ් නික්සන් පරිපාලනය, සුභසාධන ප්‍රතිපත්ති, සිවිල් අයිතිවාසිකම්, නීතිය ක්‍රියාත්මක කිරීම් මෙන්ම පාරිසරික හා වෙනත් ක්ෂේත්‍රවල වැදගත් ප්‍රතිසංස්කරණ ගණනාවක් සිදුකරන ලදී. එහිදී, නික්සන්ගේ යෝජිත පවුල් ආධාර වැඩසටහන FAP (Family Assistance Program), යැපෙන දරුවන් සිටින පවුල් සඳහා සේවා නැඹුරු ආධාර, AFDC (Aid to Families with Dependent Children) වැනි වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අදහස් කර ඇත. එමෙන්ම, නික්සන් විසින් වැඩ කරන හා වැඩ නොකරන දිළිඳු පවුල් සඳහා සහතික කළ වාර්ෂික ආදායම් මුදලක් ලබා දීමට අපේක්ෂා කරන ලදී.

පසුකාලීනව වැඩිහිටි, අන්ධ සහ ආබාධිත පුද්ගලයින්ට සහතික කළ ආදායමක් සපයන පරිපූරක ආරක්ෂණ ආදායම SSI (Supplemental Security Income) වැනි වර්ධන නීති සම්පාදනය සඳහා එම වැඩසටහන් උපකාරී විය. එමෙන්ම, සමාජ ආරක්ෂණ ලබන්නන් සඳහා ස්වයංක්‍රීය ජීවන වියදම් ගැළපීම් COLAs (Cost-of-living Adjustments) සහ අඩු ආදායම්ලාභී පවුල් සඳහා ආහාර සලාක සහ සෞඛ්‍ය රක්ෂණ (Food stamps and Health insurance) වැනි වැඩසටහන් පුළුල් කිරීමට පෙළඹවීමක් ඇති කළේය.

එමෙන්ම, සිවිල් අයිතිවාසිකම් ක්ෂේත්‍රය තුළ නික්සන්ගේ පරිපාලනය විසින් ෆෙඩරල් අරමුදල් සහිත ඉදිකිරීම් ව්‍යාපෘතිවලට සුළු ජාතීන් සඳහා රැකියාවලින් යම් ප්‍රතිශතයක් වෙන් කිරීමට කටයුතු කරන ලදී. මීට අමතරව, බොහෝ ෆෙඩරල් සිවිල් අයිතිවාසිකම් නියෝජිත ආයතන සඳහා අරමුදල් සැපයීම, විශේෂයෙන්ම සමාන රැකියා අවස්ථා කොමිසම EEOC (Equal Employment Opportunity Commission) යනාදිය නික්සන් විසින් සැලකිය යුතු ලෙස වැඩි කරන ලදී. පාරිභෝගික සහ පාරිසරික කණ්ඩායම්වල පීඩනයට ප්‍රතිචාර වශයෙන් නික්සන් විසින් OSHA (Occupational safety and Health Administration) සහ EPA (Environment Protection Agency) නිර්මාණය කිරීමට නීති සම්පාදනය කරන ලදී.

මේ අනුව විසිවන සියවස තුළ ඇමරිකානුවන්ගේ ජනාදරයට පත් වූ අති විශිෂ්ට නායකයකු ලෙස නික්සන්ගේ අනුපමේය චරිතය හඳුනාගත හැකිය. ජනතාවගේ නිරන්තර ගෞරවයට පාත්‍ර වූ මෙම ප්‍රජාතන්ත්‍රවාදී නායකයා සමස්ත ජාත්‍යන්තර පද්ධතියටම ආලෝකයක් එක් කළ අසමසම හෘදයාංගමයෙකි.

## විදේශ ප්‍රතිපත්තිය

ජනාධිපති නික්සන් තම පරම ප්‍රතිවාදියා වූ ජෝන්. එෆ්. කෙනඩි (John F. Kennedy) මෙන් දේශීය කටයුතුවලට වඩා විදේශීය ප්‍රතිපත්තිමය කටයුතු කෙරෙහි වැඩි උනන්දුවක් දැක්වීය. එමෙන්ම, නික්සන් අනෙකුත් ජනපතිවරුන් මෙන් නොව, සෝවියට් සංගමය සහ මහජන චීනය සමඟ සබඳතා වැඩි දියුණු කර ගැනීමේ අවස්ථා දුටු අතර එම අවස්ථා තුළින් ප්‍රයෝජන ගැනීමට ද කටයුතු කරන ලදී. දේශපාලනික වශයෙන් ජනාධිපති නික්සන් බලාපොරොත්තු වූයේ, සීතල යුද්ධයේ පැවති පීඩනය ලිහිල් කිරීමේ ගෞරවය ලබා ගැනීමට මෙන්ම භූ දේශපාලනික වශයෙන් යුද්ධය අවසන් කිරීමට හෝ අවම වශයෙන් එයට බාධා කිරීමට හෝ සමථයකට පත්කිරීමටය. ඉන් නොනැවතුනු නික්සන් උතුරු වියට්නාමයට (North Vietnam) බලපෑම් කිරීම සඳහා ආයුධයක් ලෙස මොස්කව් (Moscow) සහ බීජිං (Beijing) සමඟ ශක්තිමත් වූ සබඳතා භාවිතා කිරීමට බලාපොරොත්තු විය.

ජනාධිපති නික්සන් ධවල මන්දිර විදේශ ප්‍රතිපත්තියේ පාලනය තහවුරු කර කර ගැනීමේ අරමුණින් බලයට පත්වූ අතර ඔහු විසින් රාජ්‍ය ලේකම් විලියම් රොජර්ස් (William Rogers) සහ ආරක්ෂක ලේකම් මෙල්වින් ලෙයාර්ඩ් (Melvin Laird) යන අය විදේශ ප්‍රතිපත්තියේ ප්‍රධාන කාරණා සම්බන්ධයෙන් බැහැර කිරීමට කටයුතු කරන ලදී. එමෙන්ම, ඔහු විසින් නිලධාරීවාදය පාලනය කිරීමේ අවියක් ලෙස ජාතික ආරක්ෂක කටයුතු සම්බන්ධයෙන් කිසින්ගර් සහයක ලෙස පත්කර ගන්නා ලදී. ජනාධිපති නික්සන් සහ කිසින්ගර් එක්ව ධවල මන්දිරය තුළ බලය සංකේන්ද්‍රගත කිරීමට ජාතික ආරක්ෂක කවුන්සිලයේ කාර්ය මණ්ඩලය යොදවා ගත්හ. නික්සන් සහ කිසින්ගර් කෙතරම් සමීපව කටයුතු කළේ ද යන්න

ඔවුන්ව ''නික්සින්ගර්" (Nixinger) යන අනුවර්ථ නාමයෙන් හැඳින්වීම තුළින් පැහැදිලි වේ.

ක්‍රි. ව. 1950 සිටම කොමියුනිස්ට්වාදයේ බලවත් පුරුක් ද්විත්වය වූ සෝවියට් රුසියාව හා චීනය අතර තිබූ සම්බන්ධතා පිරිහෙමින් පැවති අතර ජනාධිපති නික්සන්ගේ පළමු පාලන වසර තුළදී එම තත්ත්වය දේශ සීමා ගැටුම් සමග විවෘත ගැටුමක් දක්වා ව්‍යාප්ත විය. එම ගැටුම් අවස්ථාවේ ඇති වැදගත්කම වටහා ගත් ජනාධිපති නික්සන් චීනය වෙත තාවකාලික රාජතාන්ත්‍රිකයන් පිටත් කර යැවීමට මුලපිරුවේය. වසර 1971 දී මහජන චීන සමූහාණ්ඩුවේ පාලක මාඕ සේතුං (Mao Zedong) විසින් ඇමෙරිකානු මේස පන්දු කණ්ඩායමක් වෙත ප්‍රදර්ශන තරඟයක් සඳහා චීනයට ආරාධනා කිරීමත් සමග යම් ආකාරයක පෙරළියක් සිදුවිය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, වැඩිකල් යාමට මත්තෙන් නික්සන් විසින් කිසින්ගර් චීන නිලධාරීන් සමඟ රහස් සාකච්ඡා සඳහා පිටත් කර යවන ලදී. එමෙන්ම, ජනාධිපති නික්සන් සඳහා චීනය වෙත යාමට ආරාධනා ලැබුණු අතර කොමියුනිස්ට් විරෝධී ප්‍රතිපත්තියක සිටි ඔහු, චීනය වෙත රාජතාන්ත්‍රික දෑත් දිගු කිරීම අද්විතීය ක්‍රියාමාර්ගයක් විය. වර්ෂ 1972 දී ජනාධිපතිගේ චීන සංචාරය පුළුල් ලෙස රූපවාහිනිය තුළ විකාශනය විය. ජනපති නික්සන්ගේ චීන සංචාරය රාජ්‍යයන් අතර සහයෝගීතාවයේ පළමු පියවර පමණක් වුවද එය තීරණාත්මක පියවරක් ලෙස ද සැලකිය හැකි වේ.



*රිචඩ් නික්සන් සහභාගී වූ ප්‍රථම චීන සංචාරය අතරතුර මාඕ සේතුං සමඟ (1972)*

ජනාධිපති නික්සන් පිළිබඳ ප්‍රවෘත්තිය සෝවියට් සහ ඇමරිකානු සබඳතාවල ක්ෂණික වර්ධනයක් ඇති කිරීමට හේතු විය. බලාපොරොත්තු වූ පරිදිම චීන හා එක්සත් ජනපද සබඳතා දියුණු වේ යැයි බියෙන් සෝවියට් සංගමය සහ එක්සත් ජනපදය ඔවුන්ගේම සබඳතා වඩාත් යහපත් මට්ටමක පවත්වාගෙන යාමට කටයුතු කරන ලදී. එමෙන්ම, සෝවියට් ජනාධිපති හමුවීමට ගිය නික්සන්ගේ සංචාරය,

ඇමරිකානු ජනාධිපතිවරයෙකු මොස්කව් වෙත ගිය ප්‍රථම සංචාරය ලෙස සඳහන් කළ හැකි වේ. රුසියාවේ ජනපති ලියොනිඩ් බ්‍රෙශ්නෙව් (Leonid Brezhnev) සමඟ අත්සන් කළ ගිවිසුම් අතර,

- අවි ආයුධ වර්ධනය සීමා කිරීමේ ගිවිසුම (Arms Development Limitation Agreement)
- උපායමාර්ගික අවි සීමා කිරීමේ ගිවිසුම (Strategic Arms Limitation Treaty)
- බැලැස්ටික් මිසයිල විරෝධී ගිවිසුම (The Anti-Ballistic Missile Treaty) ප්‍රධාන වේ.

මෙලෙස දෙපාර්ශවයන් ගිවිසුම්ගත වූ නමුත් අවිආයුධ තරගය අත්හළේ නැත. ජනාධිපති නික්සන් විසින් චීනය හා සෝවියට් දේශය සමඟ ඇතිකරගත් සබඳතා වැඩිදියුණු කරගනිමින් හා උපයෝගී කරගනිමින් උතුරු වියට්නාමය සඳහා යුද සමථයකට පැමිණීමට බලපෑම් කරන ලදී. ජනාධිපති නික්සන් තමා ජනාධිපති ධූරයට පත් වී පළමු වසර තුළදී වාසිදායක කොන්දේසි මත යුද්ධය සමථයකට පත් කිරීමට උත්සාහ දරන ලද අතර ඒ සඳහා තව තවත් විශ්වාසවන්ත කිසින්ගර් හරහා වියට්නාමයට අනතුරු ඇඟවීමට කටයුතු කරන ලදී. ඒ අනුව NSC (National Security Council) කාර්ය මණ්ඩලය උතුරු වියට්නාම්යට බෝම්බ හෙලීම් සහ හයිෆොන්ග් වරායේ (Hyphen Harbour) පතල් කැණීම් ඇතුළු විකල්පයන් කිහිපයක් සඳහා සැලසුම් සකස් කරන ලදී.

ජනාධිපති නික්සන් විසින් කොමියුනිස්ට් සැපයුමට බාධා කිරීම උදෙසා අදූරදර්ශී පියවරක් ගන්නා ලදී. මේ අනුව, නික්සන්ගේ ක්ෂණික තීරණයක් වශයෙන් ජනතාවට සිතෙන ආකාරයේ පියවරක් ලෙස ජනාධිපති නික්සන් විසින් ලොව පුරා න්‍යෂ්ටික අනතුරු ඇඟවීමක් දියත් කරන ලදී. ජනාධිපති නික්සන්ගේ මෙම සියලු උත්සාහයන් ව්‍යාර්ථ වූ අතර ඔහුගේ අනතුරු ඇඟවීම්වලට බිය වීමට හෝ යටත්වීමට උතුරු වියට්නාම ජාතිකයන් එකඟත්වය පළ නොකරන ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන් වඩා ඥානාන්විත වූ ජනාධිපති නික්සන් මෙම අනතුරු ඇඟවීම් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළේ නැත. මේ අනුව, වියට්නාම යුද්ධය දිගින් දිගටම පැවති අතර මෙම ගැටුමට සාර්ථක විසඳුමක් ගෙන එන්නේ කෙසේද

යන්න ජනාධිපති නික්සන්ට අවබෝධයක් නොවීය. ජනාධිපති නික්සන් විසින් තම අසාර්ථකත්වය පිළිබඳව කිසිවක් ඇමරිකානු ජනතාවට හෙළි නොකිරීමට වග බලා ගත් අතර දකුණු වියට්නාම ජාතිකයන්ට තමන් පිළිබඳව වගකීමෙන් කටයුතු කිරීමට පුහුණු කිරීමේ සහ හමුදා සංවිධානය කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස, ඇමරිකානු හමුදාවන්ට දකුණු වියට්නාමයෙන් ඉවත් වීමට හැකියාව ලැබුණි. මේ අතරතුර ජනාධිපති නික්සන් තාවකාලිකව කාම්බෝජය ආක්‍රමණය කිරීමට නියෝග කිරීමත් සමඟ ඇමරිකානු ඉතිහාසය තුළ පැවැති විශාලතම යුධ විරෝධතාවය ආරම්භ විය. ජනාධිපති නික්සන් මෙම විරෝධතා දැඩිව මර්දනය කිරීමට කටයුතු කරන ලදී.

ජනාධිපති නික්සන්ගේ විදේශ ප්‍රතිපත්තිය පිළිබඳව විමර්ශනය කරන විට පෙනී යන්නේ එක්සත් ජනපද ඉතිහාසය තුළ කැපී පෙනෙන විදේශ ප්‍රතිපත්තියක් අනුගමනය කළ පාලකයකු ලෙසයි.

## ගත හැකි ආදර්ශ

ඇමරිකානු රාජ්‍ය සන්දර්භය තුළ කැපී පෙනෙන අද්විතීය මෙහෙවරක් සිදුකළ රාජ්‍ය නායකයකු ලෙස රිචඩ් නික්සන් ජනාධිපතිවරයා හැඳින්විය හැකිය. සැලසුම් සහගත ඉලක්කයන් පසුපස තම බලය මෙහෙයවූ ඔහු අසීමිත ජනතා පරමාධිපත්‍යය තුළින් බලයට පැමිණි නායකයෙකි. ආශ්චර්යයේ හිනි පෙත්තටම ඇමරිකාව ගොඩ නැගීමෙහිලා මෙතුමාගේ කැපවීම, උත්සාහය, අධිෂ්ඨානය ඉතා අගනේය. ඒ අනුව, මෙතුමාගේ ජීවිත කතාව තුළින් ගත හැකි ආදර්ශ බොහෝමයකි. එය එතුමාගේ කුඩා කල පටන් මරණය දක්වාම සුවිශේෂී සන්ධිස්ථානයන්හිදී විවිධාකාරයෙන් උද්දීපනය වී ඇත. ජනාධිපතිවරයකු ලෙස මුලසුන හෙබ වූ පළමු අවස්ථාවේ ඔහුගේ පළමු ඉලක්කය වූයේ සංහිඳියාවයි. නගරවල කැළඹිලි සහ විදේශයන්හි යුද්ධය සමඟ ජාතිය වේදනාකාරී ලෙස බෙදී ගියේය. ඔහුගේ ජනාධිපති ධූර කාලය තුළ, වියට්නාමයේ ඇමරිකානු සටන් අවසන් කිරීමට සහ සෝවියට් සංගමය සහ චීනය සමඟ සබඳතා වැඩිදියුණු කිරීමට සමත් විය. එමගින්, ඔහුගේ ඉල්ලකය සාක්ෂාත් කරගැනීමට හැකි වූ අතර එය ඔහුගේ ස්ථානෝචිත ප්‍රඥාව විදහා දක්වන අවස්ථාවකි. ධූරයේ සිටියදී ඔහුගේ ජයග්‍රහණ

අතර ආදායම් බෙදාගැනීම, කෙටුම්පත් අවසන් කිරීම, නව අපරාධ විරෝධී නීති සහ පුළුල් පාරිසරික වැඩසටහනක් ඇතුළත් විය.

ඔහු පොරොන්දු වූ පරිදි, ශ්‍රේෂ්ඨාධිකරණයට ගතානුගතික දර්ශනයේ විනිසුරුවන් පත් කළේය. ඔහුගේ පළමු වාරයේ සිදුවූ වඩා වැදගත්ම සිදුවීම වූයේ, 1969 දී ඇමරිකානු ගගනගාමීන්ගේ ප්‍රථම සඳ තරණයයි. ඔහුගේ වඩාත් පිළිගත් ජයග්‍රහණ සමහරක් ලෝක ස්ථාවරත්වය සඳහා වූ ඔහුගේ ගවේෂණය තුළ විය.

ඔහු 1994 අප්‍රේල් 22 වන දින මිය යන විට රාජ්‍ය ජීවිතයේ, විදේශ ප්‍රතිපත්ති සහ අත්දැකීම් පිළිබඳ පොත් රාශියක් ලියා තිබුණි. ඒ ඔහු සතු බහුවිධ ක්ෂේත්‍රයන්හි ප්‍රවීණත්වය නිසාවෙනි. මීට අමතරව, නික්සන් විසින් රාජ්‍ය පරිපාලනය, පාරිසරික ආරක්ෂණ ඒජන්සිය, වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍ය පරිපාලනය ආරම්භ කිරීමට මෙන්ම පුළුල් කිරීමට විධිවිධාන සකස් කළේය. ඇමරිකානුවන්ට රැකියා අහිමි වුවහොත් ඔවුන්ගේ විශ්‍රාම වැටුප අහිමි වන හෙයින් එය ආරක්ෂා කිරීම සඳහා විශ්‍රාම වැටුප් ප්‍රතිසංස්කරණ ස්ථාපිත කරන ලෙස ඔහු කොන්ග්‍රසයෙන් ඉල්ලා සිටියේය. ෆෙඩරල් ඉදිකිරීම් ව්‍යාපෘතිවල සුළු ජාතීන්ට රැකියා වැඩි කිරීමට උපකාර වූ ෆිලඩෙල්ෆියා (Filadelfia) සැලැස්ම දීර්ඝකාලීනව පවත්වාගෙන යාමට නික්සන් විධායක නියෝගයක් අත්සන් කළේය. ඔහු ෆෙඩරල් ඉන්දියානු ප්‍රතිපත්ති වැඩිදියුණු කිරීම සඳහා ඇමරිකානු ඉන්දියානුවන් වෙනුවෙන් ව්‍යවස්ථාදායකයට අත්සන් තැබීය. තවද, අප්‍රිකානු-ඇමරිකානු විද්‍යාල සඳහා අරමුදල් වැඩි කිරීම ආදී ක්‍රියාවලීන් තුළින් ඔහු සතු බුද්ධිමත්භාවය, අධිෂ්ඨානශීලී බව, අභිලාෂකාමීත්වය හා ආත්ම විශ්වාසය වැනි උත්කෘෂ්ට ගුණාංග කැපී පෙනේ.

මීට අමතරව, ඔහු කලාව සඳහා වූ ජාතික පරිත්‍යාගයට අරමුදල් සම්පාදනය කළේය. ඔහු ජනාධිපති වී සටියදී විශාල ගෙවීම් කිසිවක් ලබා ගත්තේ නැත. ඔහු කිසිවිටෙක ජාතික ආරක්ෂක රහස්, පගා මුදල් සඳහා හෙළි කළේ නැත. ඔහු මිසයිල තාක්ෂණය හුවමාරු නොකළ අතර ලාභ ලැබීමේ අරමුණින් ඔහු කිසිදු යුද්ධයක් ආරම්භ කළේ නැත. ඔහුගේ ශ්‍රේෂ්ඨතම ජයග්‍රහණ අතර න්‍යෂ්ටික අවි පාලනය, චීනය සමඟ සහ සෝවියට් සංගමය සමඟ ආතතීන් අඩු කිරීම මූලික විය. ඔහු වියට්නාම් යුද්ධය අවසන් කිරීම සම්බන්ධයෙන් ද ප්‍රසිද්ධය. එතුළින් ඔහුගේ නොසැලෙන පෞරුෂය මනාව පිළිඹිබු වන්නේය. එය ඇමරිකානු ඉතිහාසයේ දීර්ඝතම හා වියදම් අධිකම පසුබැසීමක් වුවද, ජනාධිපති නික්සන් දූරදර්ශී වූ අතර ජයග්‍රහණය ඔහුගේ උන්නතියට මහත් රුකුලක් විය.

නික්සන් විසින් රුසියානු නායක ලියොනිඩ් අයි. බ්‍රෙෂ්නෙව් (Leonid Brezhnev) සමඟ ඇතිකරගත් සමුළු රැස්වීම් ඔස්සේ උපායමාර්ගික න්‍යෂ්ටික අවි සීමා කිරීමේ ගිවිසුමකට එළඹිණි. 1973 ජනවාරි මාසයේදී ඔහු ඉන්දු-චීන-ඇමරිකානු මැදිහත්වීම අවසන් කිරීම සඳහා උතුරු-වියට්නාමය සමඟ ගිවිසුමක් නිවේදනය කළේය. 1974 දී ඔහුගේ රාජ්‍ය ලේකම් හෙන්රි කිසිංගර් ඊශ්‍රායලය (Israel) සහ එහි විරුද්ධවාදීන් වන ඊජිප්තුව සහ සිරියාව (Syria) අතර විසන්ධි කිරීමේ ගිවිසුම් සාකච්ඡා කළේය. මේ සියලුම සිද්ධීන් එකින් එක සලකා බැලීමේදී ඔහුගේ උපාය මාර්ගික රාජ්‍ය පරිපාලනයේ දක්ෂතාවය හා නිවැරැදි මාර්ගෝපදේශකත්වය මනාව දෘශ්‍යමාන කරයි. බලයෙන් පසු ඔහුගේ අවසාන වසරවල සිටියදී, නික්සන් වැඩිහිටි රාජ්‍ය නායකයෙකු ලෙස ප්‍රශංසාව ලබා ගත්තේය.

ඔහු සතු නායකත්වය නිසාවෙන් බලයේ සිටියදී ජාත්‍යන්තර කටයුතු පිළිබඳ දැනුම සහ අවබෝධය සමඟ ලෝකය සාමයෙන් තබා ගැනීමට උපකාරී විය. ඔහුව බොහෝ විට විස්තර කරනු ලැබුවේ "ඔහු නරක වූ විට, ඔහු ඇත්තෙන්ම නරක ය, නමුත් ඔහු හොඳ වූ විට, ඔහු ශ්‍රේෂ්ඨයි" (When he's bad, he's really bad. But when he's good, he's really great) යන වාක්‍ය ඛණ්ඩයෙනි. ඔහු බුද්ධිමය වශයෙන් දක්ෂ නායකයකු විය. ඔහු ප්‍රතිවිරෝධතාවලින් පිරුණු පෞරුෂයක් ඇති මිනිසෙක් විය. ඒ කෙසේවෙතත්, ශක්තිමත් දූරදර්ශි නායකත්ව ගති ලක්ෂණ පෙන්නුම් කළ ඇමරිකානු ඉතිහාසයේ නොමැකෙන නාමයක් සටහන් කළ රිචඩ් නික්සන් ජනාධිපතිවරයා ඇමරිකානු ඉතිහාස වංශ කතාවේ සැලකිය යුතු ස්ථානයක අදටත් පැසසුම් ලබයි. එතුළින් ඔහුගේ නායකත්වයේ ඵලදායීතාවය සාක්ෂාත් කරගත හැකි අතරම එම උත්කෘෂ්ට මිනිසා තුළින් උකහා ගත හැකි ආදර්ශ ද බොහෝමයක් අද වන තුරුත් නොනැසී පවතී.

## සාරාංශය

ඇමරිකානු ඉතිහාසයේ සදා නොමැකෙන නාමයක් සනිටුහන් කළ දේශයේ අභිමානය ජාත්‍යන්තරය කරා රැගෙන ගිය අද්විතීය නායකයෙකු ලෙස රිචඩ් නික්සන් ජනාධිපතිවරයා හැඳින්විය හැකිය. ඉතා සරල දිවිපෙවතක් ගත කල මොහු කුඩා කාලයේ සිටම විවිධ වූ ආර්ථික අපහසුතා, හැලහැප්පීම් සහ පරාජයන්

අතින් බැට කෑ අතර කල්යත්ම සියලු බාධක මධ්‍යයේ අධ්‍යාපනයේ නිම්වළලු සීමා පරයමින් උපාධිධාරියකු සේ සමාජයට පියවර තබන ලදී.

දේශපාලනය දිවියට පිවිසීමට පෙර ගෞරවනීය රැකියාවක නියුතු මොහු 1946 දී එයින් ඉවත් වී දේශපාලනයට පිවිසීමේ මංගල ගමන ආරම්භ කළේය. වසර කිහිපයක අනේකවිධ ව්‍යාර්ථ ඔස්සේ කලක් උප ජනාධිපති ලෙස ජෙනරාල් අයින්සවර් යටතේ විශිෂ්ට සේවයක් ඉටු කළ මොහු 1969 ඇමරිකාවේ තිස් හත් වන ජනාධිපති ලෙස බලයට පත්විය. තමා සතු අත්දැකීම්, දැනුම හා පරිණතභාවය තම දේශපාලන ජීවිතයට ඈදා ගනිමින් රට වෙනුවෙන් අමිල සේවයක් ඔහු ඉටු කළේය.

ලෝකයක් ලෙස ගත් විට ගඟන තරණය අනුසාරයෙන් මිනිසාට ලැබිය හැකි උපරිම ජයග්‍රහණය වන එනම්, මුල්ම සඳ මත පා තැබීමේ විශිෂ්ට ක්‍රියාවලියට පුරෝගාමී වූයේ ද, එය සිදුවූයේ ද රිචඩ් නික්සන් ගේ පාලන සමයේ ය. රාජ්‍ය නායකයෙකු වශයෙන් ඔහු කළ අසාහය සේවාවන් අතර පාරිසරික සංරක්ෂණය ඒජන්සිය ආරම්භ කිරීම මෙන්ම වියට්නාමකරණය දැක්විය හැකිය. සියලු රාජ්‍යයන් සමඟ සාමකාමී මෙන්ම මිත්‍රශීලී සබඳතා ඇති කරගනිමින් ජාත්‍යන්තර ලෝකය තුළ ඉතා නිහඬ පිළිවෙතක් වෙත ඇමරිකාව දිශානුගත කළ මොහු ඇමරිකානු ඉතිහාසයේ නව පරිච්ඡේදයක් සනිටුහන් කළ කෘතහස්ත නායකයෙකි. ඇමරිකාව ආර්ථික හා දේශපාලන මෙන්ම සමාජයීය වශයෙන් ඉහළ නැංවීමෙහිලා ඔහුගේ කාර්යභාරය අතිමහත් ය.

තමා සතු සහජ දක්ෂතා හා ගති ලක්ෂණ මත ගොඩනඟාගත් තම පෞරුෂය නිසාම ජනතාව තුළ ඔහු පිළිබඳ යහපත් ප්‍රතිරූපයක් ගොඩ නැඟීම පුදුමයට කරුණක් නම් නොවේ. ඉතා දක්ෂ, මාර්ගෝපදේශනාත්මක හා සහජ බුද්ධිමත් නායකයෙකු ලෙස හඳුනාගත හැකි නික්සන් තම අභිමුවට පැමිණි සියලු අභියෝගයන්ට උපායශීලී පාලන වින්‍යාසය ආධාරයෙන් විසඳුම් සෙවීමට තරම් සමතෙකු විය. ඇමරිකාව ලෝක බලවතෙකු කිරීමේ කාර්යයෙහි පුරෝගාමී මෙහෙවරක් ඉටු කළ, තිරය පිටුපස සැබෑ පතාක යෝධයකු ලෙස රිචඩ් නික්සන් ජනාධිපතිවරයා හඳුන්වා දිය හැකිය. මනා නායකත්වය මතින් ඔහු ඇමරිකාව තුළ කැපී පෙනෙන සේවාවක් ඉටු කරමින් ජන හදවත් තුළ ලැගුම් ගත් විශිෂ්ට ගණයේ නායකයෙකු වග මෙම කරුණු විශ්ලේෂණය තුළින් මනාව ගම්‍යමාන වේ. හුදෙක් නාමයක් පමණක් නොවූ අසහායත්වයේ හා දරාගැනීමෙහි සංකලනය යන්න

**ඇමරිකානු නායකත්ව අනුක්‍රමයේ තිස්හත් වන ජනාධිපති ධූරයට නිර්දේශ වූ රිචඩ් මිල්හවුස් නික්සන්ගේ ප්‍රතාපවත් චරිතාප්‍රදානය කාලීන නායකත්වයට පූර්වාදර්ශකි.**

## මූලාශ්‍ර නාමාවලිය

A. FARRELL, J. (2017). *Richard Nixon: The Life.* New York: Doubleday, a division of Penguin Random House LLC.

Perlstein, R. (2008). *Richard Nixon: Speeches, Writings, Documents.* New Jersey: Princeton University Press.

Pich, C. (2013). *Richar Nixon.* ZAMAN University.

imperial presidency - Political Dictionary. (2023, February 5). Retrieved February 12, 2023, from politicaldictionary.com website: https://politicaldictionary.com/words/imperial-presidency

History.com Editors. (2019, February 8). Richard M. Nixon. Retrieved February 12, 2023, from HISTORY website: https://www.history.com/topics/us-presidents/richard-m-nixon

Hughes, K. (2023). *Richord Nixon Domestic Affairs*. Retrieved from UVA Miller Center: https://millercenter.org/president/nixon/domestic-affairs

Murdock, R. S. (2012, 03). *US Foreign Policy During the Nixon and Ford Administrations*. Retrieved from via.library.depaul.edu: https://via.library.depaul.edu/cgi/viewcontent.cgi?referer=&httpsredir=1&article=1116&context=etd

Samuels, R. J. (2019, Sep 05). *Nixon Doctrine*. Retrieved from britannica: https://www.britannica.com/event/Nixon-Doctrine/additional-info#history

RICHARD NIXON FOUNDATION. (2023). *BIOGRAPHY OF PRESIDENT RICHARD NIXON*. Retrieved from Richard Nixon Biography: https://www.nixonfoundation.org/resources/richard-nixon-biography/

# ජිමී කාටර් (Jimmy Carter)



**කණ්ඩායම් සාමාජිකයන්**

- ඩබ්. ජී. ජී. ඒ උත්පලා රන්මලී
- පී. ඩබ්. ජී ඉරේෂා ලක්මාලි ගුණසිංහ
- කේ. ජී. රශ්මි ප්‍රමෝධ්‍යා මිෂාරි
- වයි. එම්. රවිඳි දිව්‍යාංජලී
- ආර්. එම්. සිතුමිණි විජේසූරිය

## හැඳින්වීම

ජේම්ස් අර්ල් කාටර් ජූනියර් (James Earl Carter Jr,) ලොව කා අතරත් ප්‍රසිද්ධියට පත්ව ඇත්තේ ජිමී කාටර් නමිනි. ඇමරිකානු ජනාධිපති ඉතිහාසයට තම නම සනිටුහන් කිරීමට පෙර ඔහුගේ වෘත්තීය ගමන් මගේ පිටු පෙරලා බැලීමේදී නාවික හමුදාවේ සබ්මැරීන්වරයෙකු ලෙස අත්ලාන්තික් සහ පැසිෆික් බල ඇණි දෙකෙහි ම සේවය කරමින් ලුතිනන් තනතුර දක්වා ඉහළ තනතුරු දැරීමට තරම් දස්කම් පෑ ඔහු න්‍යෂ්ටික උප අංශයේ ඉංජිනේරු නිලධාරියෙකු ලෙස ද තම රාජකාරිය නොපිරිහෙලා ඉටු කර ඇත.

කාටර්ගේ ජීවිතයේ දේශපාලන ගමන් මඟට පියවර තැබීමට ඔහු ව්‍යවසායකයෙකු ලෙස වසර දහයක් තුළ ලබාගත් සීඝ්‍ර දියුණුවත් ප්‍රධාන පිටුවහලක් විය. ප්ලේන්ස් හි නිර්මාණය කරන ලද ටයිම් බිස්නස් කවුන්සිලයට සම්බන්ධ වීම ජිමී කාටර් විසින් ප්‍රතික්ෂේප කිරීම මෙහිදී ඔහුගේ දේශපාලන ගමන් මඟට මූලබීජ සපයන ලදී. ඒ තුළින් ලැබූ පන්නරය මගින් කාටර් 1962 දී ප්‍රාන්ත දේශපාලනයට අවතීර්ණය වී නොනැවතුණු කාටර් වසර අටකට පසුව ජෝර්ජියාවේ ආණ්ඩුකාරවරයා බවට පත් වී එයින් වසර පහලොවකට පසු ඇමෙරිකානු ජනාධිපති ධූරය දක්වා සිය දේශපාලන දිවිය ගෙන ගියේය.

ලොව පුරා ඇමරිකාවේ නාමය තව තවත් ඔප් නැංවීමට කටයුතු කළ අද්විතීය නායකයකු ලෙස කාටර් ඇමරිකාවේ තම දේශපාලන සමය තුළ ආර්ථික, දේශපාලන, සමාජීය, ආදී සෑම ක්ෂේත්‍රයකම කැපී පෙනෙන වර්ධනයක් ඇති කළේය. මෙහිදී කාටර් ජනාධිපතිවරයාගේ ළමා කාලය, අධ්‍යාපන, දේශපාලනයට පිවිසීම, නායකත්වය කරා ගිය ගමන් මඟ, ඉන් පසුව සිදු කළ විවිධ සේවාවන් සහ කාටර් චරිතයෙන් ගත හැකි ආදර්ශ පිළිබඳව මෙහිදී විවරණය කෙරේ.

## ළමා කාලය, අධ්‍යාපනය හා දේශපාලනයට පිවිසීම

ජිමී කාටර් නොහොත් ජේම්ස් අර්ල් කාටර් ජූනියර් (James Earl Carter Jr,) 1924 ඔක්තොම්බර් මස 01 දින ජෝර්ජියා ප්‍රාන්තයේ, කෘෂිකර්මාන්තය මුල් කරගත් ප්ලේන්ස් (Plains) නැමැති කුඩා නගරයේ උපත ලැබීය. ඔහුගේ පියා ජේම්ස් අර්ල් කාටර් (James Earl Carter Sr,) ගොවියෙක් මෙන්ම ව්‍යාපාරිකයෙක්ද

විය. මව බෙසී ලිලියන් (Bessi Lillian) වෘත්තියෙන් හෙදියක් විය. කාටර්ගේ දෙමව්පියන්ට ප්ලේන්ස් නගරයෙන් රටකජු ගොවිපළක් සහ ගබඩාවක් හිමිවිය. 1930 දශකයේ මැද භාගයේ එනම් ඇමරිකාව මහා ආර්ථික අවපාතයට මුහුණ දෙන මුල් අවධිය තුළ කුඩා ජිමී කාටර්ගේ ළමා කාලය ගෙවුණි. මවගේ සහෝදරයා එනම් ඔහුගේ මාමා නාවිකයෙකු වූ අතර තම මාමාගෙන් ලැබුණු ආභාෂයත් සමඟ ඔහු නාවික හමුදාවට බැඳීමට කුඩාකල සිට සිහින දැක්කේය. කාටර් කුඩා කල සිටම සාමකාමී සහ අධ්‍යාපනයට ලැදි පිරිමි දරුවෙකු විය. ඔහු වයස අවුරුදු දහයේ දී තම පියාගේ වෙළඳසැලහි වැඩ කරමින් ඔහුට සහය වන්නට වුණි.

ජිමී කාටර් ඔහුගේ පාසල් අධ්‍යාපනය ප්ලේන්ස් නගරයෙහි ඇති රජයේ පාසලක ලබා ඇත. කාටර්ගේ දෙමව්පියන් දෙදෙනාම දැඩි ක්‍රිස්තියානි භක්තිකයෝ වූහ. එම නිසා කාටර් හට ප්ලේන්සි බැප්ටිස් පල්ලියේ ඉරිදා දහම් පාසලට සහභාගි වීම අනිවාර්ය විය. කාටර්, ජෝර්ජියා නිරිතදිග විද්‍යාලයට ඇතුළත් වී ඉංජිනේරු විද්‍යාව හදාරා ඇති අතර පසුව ජෝර්ජියා තාක්ෂණික ආයතනයට ඇතුළත් වී වැඩිදුර ඉංජිනේරු අධ්‍යාපනය හැදෑරීය.

දෙවන ලෝක යුද්ධ (Second World War) සමයේ (1939-1945) ජිමී වැනි බොහෝ ඇමරිකානු දේශප්‍රේමී තරුණයන් හමුදා සේවයට ඇතුළත් වීමට පෙළඹුණි. එම කාලවකවානුවේ දී ඔහු මේරිලන්ඩ්හි (Maryland) හි පිහිටි ඇනපොලිස් (Annapolis) නාවික ඇකඩමියට අයදුම් කළ අතර එකල එම ඇකඩමියට ඇතුළත් වීම ඉතා තරඟකාරී විය. ඔහු නාවික හමුදා ඇකඩමියට 1943 වසරේ දී ඇතුළත් වී 1946 වසරේ අගෝස්තු මසදී එනම් ලෝක යුද්ධයේ අවසානයේදී ඇකඩමියෙන් ඉවත් වන්නේ පන්තියේ දක්ෂතම සිසුන් 10 අතරට එමින් තම උපාධිය ලබා ගනිමිනි. 1946 දී නාවික හමුදා ඇකඩමියෙන් පිටවී ගිය ජිමී කාටර් පසුව නාවික හමුදාවට බැඳෙමින් තම කුඩා කල සිහිනය සැබෑ කර ගත්තේය. නාවික හමුදාවේදී ඔහු සබ්මැරීන් බල ඇණියේ නාවික බටයෙකු ලෙස කටයුතු කළ අතර 1952 වන විට නව න්‍යෂ්ටික බලයෙන් ක්‍රියාත්මක සබ්මැරීන් තාක්ෂණය හැදෑරීමේ අවස්ථාව ඔහුට හිමිවිය. ජිමී කාටර් නාවික හමුදාවේ සේවය කරන කාලයේදී ම ඔහුගේ විවාහය සිදුවී ඇත. කාටර් කුඩා කල සිටම හඳුනනා රෝසලියන් ස්මිත් (Rosalynn Smith) නැමැති තරුණිය සමග 1946 ජුනි මාසයේ දී විවාහ විය. ජිමී සහ රොසලින් කාටර් තරුණ ඇමෙරිකානු යුවළ හට ඊළඟ අවුරුදු අට ගෙවීමට සිදු

වූයේ පශ්චාත් යුද සමයක ය. ඔවුහු විවාහ වී වසරක් ඇතුළත කුළුදුල් දරු උපත ලෙස පුතෙකු ලැබූ අතර පසුව තවත් පුතුන් දෙදෙනකු සහ දියණියක ඔවුනට දාව උපත ලැබීය.

1953 ජූලි මාසයේදී කාටර්ගේ පියා පිළිකාවක් වැළඳීමෙන් මිය ගිය අතර පසුව ඔවුනට උදාවන්නේ අසීරු කාලයකි. පියාගේ අවසන් කාලයේ දී ගොඩනගා තිබූ රටකජු ගොවිපළ පරිහානියට පත්ව තිබූ අතර එය කාටර් පවුලෙන් ගිලිහී යාමේ අනතුරකට මුහුණපා තිබුණේය. එය ලිලියන් කාටර්, කාටර්ගේ මවට දැඩි ලෙස බලපාන්නට විය. පසුව සිය නාවික හමුදා දිවියට සමුදී නැවත තම උපන් ගම කරා සම්ප්‍රාප්ත වීමට ජිමි කාටර් තීරණය කරන ලදී. මෙලෙසින් කාටර් 1953 ඔක්තෝබර් මස සිය නාවික හමුදා දිවියෙන් ඉල්ලා අස්විය. නාවික හමුදා ලුතිනල් කාටර්ට කෘෂිකාර්මික විෂය තරමක් අභියෝගාත්මක විය. ගොවිපල තුළ පළමු අවුරුදු කිහිපය තුළ කාටර් හට අභියෝග රැසකට මුහුණ දෙන්නට සිදු විය. කජු අස්වැන්න අඩු වීම, කෘෂිකාර්මික දැනුම අඩු බව, ආදායම් වියදම් ලිපි කළමනාකරණ කටයුතු පිළිබඳ අඩු දැනුම ඔහුට මුහුණපාන්නට සිදු වූ අභියෝග කිහිපයකි. නමුත් ඔහුගේ බිරිඳ රොසලින්ගේ දැඩි සහයෝගය කාටර්හට නොමදව හිමි විය. මුල් අවුරුදු කිහිපය තුළ බැංකු ණය ලබා ගනිමින් අත්දැකීම් මතින් ක්‍රම ක්‍රමයෙන් වෙහෙසකාරී අවුරුදු කිහිපයකට පසු ඔහු සාර්ථක ගොවිපලක හිමිකාරයෙක් බවට පත්විය. එලෙස කාටර් ඔහුගේ මූල්‍ය තත්ත්වය ස්ථාවරයට පත් කරගැනීමට සමත් විය.

1954 මෙම කාල වකවානුව වන විට ජෝර්ජියා ප්‍රාන්තයේ දේශපාලනය තරමක් උද්වේගකාරී පෙනුමක් දරූ කාලවකවානුවකි. එමෙන්ම ඇමරිකාවේ ජෝර්ජියා ප්‍රාන්තය යනු කළු සුදු වර්ණ භේදය උග්‍ර ලෙස තිබූ ප්‍රාන්තයකි. 1954 එක්සත් ජනපද ශ්‍රේෂ්ඨාධිකරණය විසින් බ්‍රවුන් අධ්‍යාපන මණ්ඩලයේ (Bgrown v. Board of Education) දුන් කළු සහ සුදු ජාතීන් වෙන් කිරීමේ විරෝධී තීන්දුව ජ්ලේන්හි වාර්ගික ආතතිය උග්‍ර කළේය. මුල්කාලීන ජිමී කාටර් එනම් දේශපාලන දිවියට පිවිසීමට පෙර ඔහු වර්ණභේදවාදයට තරමක් පක්ෂපාතී අදහස් දැරූ පුද්ගලයෙක් වුවත් සතුරන් ඇති කර නොගැනීම සඳහා බොහෝ විට ඔහු තම අදහස් එළිපිට ප්‍රකාශ නොකළේය. 1961 වන විට ඔහු බැප්ටිස් පල්ලියේ ප්‍රමුඛ සාමාජිකයෙක් සහ සම්ස්ටර් ප්‍රාන්ත පාසල් මණ්ඩලයේ සභාපතිවරයා ලෙස පත් වූ අතර එහිදී ඔහු කළු සුදු ජාතීන් ඒකාබද්ධතාවය පිළිබඳ කැපීපෙනෙන අදහස්

දැක්වීය. මෙම සිද්ධිය ඔහුගේ දේශපාලන දිවියට තිබූ මූලික පියවරක් ලෙස ද සැලකිය හැක.

කාටර් ප්‍රථමයෙන් දේශපාලන දිවියට සම්ප්‍රාප්ත වීම 1962 දී සනිටුහන් වෙයි. ඒ 1962 ජෝර්ජියාවේ ප්‍රාන්ත ඒකක පද්ධතිය විසුරුවා හැරීමත් සමග විවෘත වූ ප්‍රාන්ත සෙනෙට් (State Senate) ආසනයට තරඟ කිරීමට තීරණය කිරීමත් සමඟයි. ඔහු මැතිවරණයට දින පහළොවකට පෙර ප්‍රාන්ත සෙනෙට් සභාව සඳහා සිය අපේක්ෂකත්වය නිවේදනය කළේය. ප්‍රථම ඡන්ද ගණන් කිරීමේ දී කාටර් ඔහුගේ ප්‍රතිවාදියා වූ හෝමර් මුවර්ට (Homer Moor) පසුපසින් සිටින බව පෙන්නුම් කළ නමුත් මෙය ක්විට්මන් (Quitman) ප්‍රාන්තයේ ඩිමොක්‍රටික් පක්ෂයේ සභාපති ජෝ හර්ස්ට් (Joe Hurst) විසින් මෙහෙය වූ වංචනික ඡන්ද ප්‍රතිඵලයක් බව මැතිවරණ පරීක්ෂණයකදී තහවුරු විය. පසුව පැවැත් වූ මැතිවරණයේ දී කාටර් එකම ඩිමොක්‍රටික් අපේක්ෂකයා ලෙස මුවර්ට එරෙහිව 3013 ට 2182 ක ඡන්ද පරතරයකින් ජයග්‍රහණය කළේය. ජිමි කාටර්ගේ ප්‍රථම දේශපාලන පිවිසීම මේ අයුරින් ජයග්‍රහණයකින් සනිටුවන් කිරීමට ඔහුට හැකි විය.

කාටර් ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රාන්ත විධායක කමිටුවට වසර දෙකක කාලයකට බලයට පත් වූ අතර එහිදී ඔහු රාජ්‍ය පක්ෂයේ නීති නැවත ලිවීමට උදව් කළේ ය. එලෙසම ඔහු බටහිර මධ්‍යම ජෝර්ජියා සැලසුම් සහ සංවර්ධන කොමිෂන් සභාවේ (West Central Georgia Planning and Development Commission) සභාපති බවට පත් වූ අතර, එහිදී ඔහු ඓතිහාසික ස්ථාන ප්‍රතිසංස්කරණය වැනි ව්‍යාපෘති සඳහා ෆෙඩරල් සහ රාජ්‍ය බලය බෙදා හැරීම සම්බන්ධයෙන් අධීක්ෂණය කරන ලදී. කාටර් 1964 දී වසර දෙකක ධූර කාලයක් නැවත සෙනෙට් සභාවට සඳහා තේරී පත් විය. ඔහු ප්‍රාන්ත සෙනෙට් සභාවේ යම් කාලයක් එහි අධ්‍යාපන කමිටුවේ (Education Committee) මුලසුන දැරූ අතර සිය දෙවන ධූර කාලය අවසන් වනවිට විසර්ජන කමිටුවේ (Appropriations Committee) අසුනක් දැරීය. සිය දෙවසරක ධූර කාලය අවසන් වීමට පෙර ඔහු අධ්‍යාපන සඳහා වෙන් වූ අරමුදල් වඩාත් ඵලදායී ලෙස ව්‍යාප්ත කිරීමේ පනතකට දායක විය. ඔහු තම ප්‍රාන්ත සැලසුම් කාර්යය ප්‍රයෝජනයට ගනිමින් දිස්ත්‍රික්කය පුරා කතා පවත්වමින් ඡන්ද දායකයින් අතරට ගිය අතර, එමඟින් ඔහුට සිය අනාගත දේශපාලන අත්තිවාරම තවත් ශක්තිමත් කිරීමට හැකියාව ලැබුණි. සිය ප්‍රාන්ත සෙනෙට් සභික ධූරය

අවසන් කරමින් කාටර්ගේ ඉදිරි දේශපාලන සැලසුම, කොංග්‍රසයටද තරග කිරීමේ තීරණය ප්‍රකාශ කළේය. කාටර් 1971 ජනවාරි 12 දින ජෝර්ජියාවේ 76 වන ආණ්ඩුකාරවරයා ලෙස දිවුරුම් දුන්නේය.

## නායකත්වය කරා ගිය ගමන් මඟ

ජිමි කාටර් සිය ධවල මන්දිරයට යන මාවතේ පළමු පියවර 1972 දි ඩිමොක්‍රටික් ආණ්ඩුකාර ප්‍රචාරක කමිටුවේ (Democratic Gubernatorial Campaign Committee) සභාපති ධූරයට පත් වෙමින් ආරම්භ කළේය. 1974 දී ඔහුගේ දෙවන පියවර ලෙස ඩිමොක්‍රටික් ජාතික කමිටුවේ (Democratic National Committee) ප්‍රචාරක සභාපති ලෙස පත් වීම පෙන්වා දිය හැක. ඔහු පත්වූ මෙම නව ධූරය රට පුරා සිටින ඩිමොක්‍රටික් පාක්ෂිකයන්ට පහසුවෙන්ම ලඟා වීමේ හැකියාව ලබා දුන් අතර පළමු වෝටර්ගේට් (Watergate) මැතිවරණ ජයග්‍රහණය මඟින් ඔහුට ඩිමොක්‍රටික් පාක්ෂිකයන් අතර කීර්තියට පත් වීමට හැකි විය. වසර අවසානයට පෙර එනම් 1974 දෙසැම්බර් 12 දින කාටර් සිය ජනාධිපති අපේක්ෂකත්වය නිවේදනය කළේය. ඩිමොක්‍රටික් පක්ෂයට පමණක් නිරාවරණය වීම මඟින් ජනාධිපති අපේක්ෂකත්වයට තරග වැදීම කාටර්ට පුළුල් පිළිගැනීමක් ලබා ගැනීමට ප්‍රමාණවත් නොවන බව ඔහුගේ කතාව ඇසීමෙන් පසු මහජන ප්‍රතිචාර මඟින් හෙළි විය. ජනාධිපති ධූරයට තරග කිරීමට තරම් ප්‍රසිද්ධියක් කාටර්ට නැතිවීම එයට ප්‍රධාන හේතුව විය.

එමෙන්ම ඔහුගේ උපන් බිම වන ජෝර්ජියානා ප්‍රාන්තයේ ප්‍රමුඛතම පුවත්පතක් කාටර්ගේ ජනාධිපති අපේක්ෂකත්වය නිවේදනය කළ දිනට සිරස් තලයක් පළ කළේය. එහි සඳහන්ව තිබුණේ "ජිමි කවුද? තරග කරන්නේ කුමක් සඳහා ද?" (Jimmy Who? Running for what) ලෙස උපහාසාත්මකවයි. මෙයට ප්‍රතිචාර වශයෙන් කාටර් ඔහුගේ නම සහ ඔහු පෙනී සිටින ජාතික අරමුණ අවධාරණය කරමින් ඔහු තම ප්‍රචාරණ කටයුතු පුළුල් කළේය. "මම ජිමි කාටර් සහ මම ජනාධිපති ධූරයට තරග කරමි." (My Name is Jimmy Carter, and I'm running for president) ඔහුගේ මෙම උපාය සාර්ථක විය. 1976 මාර්තු මැදවන විට කාටර් ඩිමොක්‍රටික් ජනාධිපති අපේක්ෂකත්වය සඳහා ක්‍රියාකාරී තරගකරුවන්ට වඩා

බොහෝ ඉදිරියෙන් සිටියා පමණක් නොව, වත්මන් ජනාධිපති ජෙරල්ඩ් ෆෝඩ්ට (Geld Ford) එරෙහිව ප්‍රතිශත ලකුණු කිහිපයකින් ඉදිරියෙන් සිටියේය. කාටර්ගේ යටත් පාඨය වුයේ, වෙනසක් සඳහා නායකයෙක්, (A Leader, for a Change) යන්නයි. 1976 ගිම්හානයේ ඩිමොක්‍රටිස් පක්ෂ සම්මේලනයේදී ඔහු පළමු ඡන්දයෙන් නාමයෝජනා දිනා ගත්තේය. ඔහුගේ උප ජනාධිපති අපේක්ෂක ධූරය සඳහා ඔහු මිනසෝටා ප්‍රාන්තයෙහි සෙනෙට් සභික වෝල්ටර් මොන්ඩේල් (Walter Mondale) තෝරා ගත්තේය. මොන්ඩේල් විසින් “Nothern Presence” නමින් ඡන්දයට අවශ්‍ය භූගෝලීය සමතුලිතතාවය ලබා ගැනීම සඳහා ව්‍යාපෘතියක් ඉදිරිපත් කළේය.

මැතිවරණය ඉතා ආසන්න වූ අතර ෆෝර්ඩ් හට අවශ්‍ය වූයේ ප්‍රසිද්ධ ප්‍රාන්ත අටක් වූ කැලිෆෝනියා (California), ඉලිනොයිස් (Illinois), මිචිගන් (Michigan), නිව්ජර්සි (New Jersey), නිව්යෝර්ක් (New York), ඔහායෝ (Ohio), පෙන්සිල්වේනියා (Pennsylvania) සහ ටෙක්සාස් (Texas) යන ප්‍රාන්ත වලින් පහක ජයග්‍රහණය ලබා ගැනීමටයි. ඔහුට ලබා ගැනීමට හැකි වූයේ ප්‍රාන්ත හතරක ජයග්‍රහණයක් පමණි. ජිමී කාටර් නිව්යෝර්ක් සහ පෙන්සිල්වේනියා වැනි උතුරේ කාර්මික බලවතුන්ගේ සහයත් සමග දකුණු ඇමරිකානු ප්‍රදේශ ජයග්‍රහණය කිරිමට හැකි විය. එලෙසින් කාටර්ගේ ජනපති අපේක්ෂාව දිප්තිමත් විය. ජනතාව නව නායකත්වයක් අපේක්ෂා කළ අතර කාටර් හට කොංග්‍රසයේ සභා දෙකෙහිම ඩිමොක්‍රටික් බහුතරයක් භුක්ති විදිමට හැකි විය. කාටර් මැතිවරණ ඡන්ද 297 කින් ෆෝර්ඩ්ට එරෙහිව 241 ක් ලබා ගනිමින් 1977 ජනවාරි 20 දින ඇමරිකා එක්සත් ජනපදයේ තිස්නව වැනි ජනාධිපතිවරයා ලෙස පත් විය.

## <u>නායකත්වයට පැමිණීමෙන් පසු සිදුකළ සේවාව</u>

ජිමී කාටර් එක්සත් ජනපදයේ තිස්නව වැනි ජනාධිපතිවරයා වූ අතර, 1977 සිට 1981 දක්වා වූ ජනාධිපති ධූර කාලය තුළ ඔහුගේ දේශීය ප්‍රතිපත්තිය ඉතා අගනේ ය. ඔහු ඔහුගේ නිහතමානී හා දයානුකම්පිත ස්වභාවය නිසාවෙන් ප්‍රසිද්ධියට පත් වූ අතර, මානව හිමිකම්, ප්‍රජාතන්ත්‍රවාදය හා සාමය සඳහා ඔහුගේ දැඩි කැපවීම නිසා දේශීය වශයෙන් ඉහළ ගෞරවාදරයට පාත්‍ර විය. ජිමී කාටර් ජනාධිපතිවරයාගේ දේශීය ප්‍රතිපත්තිය මුල් බැස ගත්තේ, ‘රජය පොදු යහපත

සඳහා ක්‍රියා කළ යුතු අතර, සමාජ සාධාරණත්වය ප්‍රවර්ධනය කළ යුතුය' යන විශ්වාසය තුළ ය. ඔහු නායකත්වයට පැමිණීමෙන් පසු ක්‍රියාත්මක කරන ලද ප්‍රතිපත්ති කිහිපයක් පහත පරිදි විස්තර කළ හැකිය.

ජනාධිපති කාටර් පරිසරය ආරක්ෂා කිරීමට කැප වූ අතර, ඒ සඳහා නීති පද්ධති කිහිපයක් අත්සන් කරමින් ක්‍රියාත්මක කළේය. එපමණක් නොව, ඔහු පරිසර සංරක්ෂණය සඳහා ශක්තිමත් උපදේශකයකු වූ අතර, ඔහුගේ පරිපාලන කාලය තුළදී ජාතික වනෝද්‍යාන කිහිපයක් නිර්මාණය කර, අක්කර මිලියන ගණනක් වනාන්තර ආරක්ෂා කළේය. ඔහු පරිසරය වැඩි දියුණු කිරීමට උත්සාහ කළ බවට කදිම නිදසුනක් වන්නේ, ඔහුගේ ජාතික වනෝද්‍යාන පද්ධතිය පුළුල් කිරීම සඳහා ඇලස්කන් ඉඩම් (Alaska Lands) අක්කර මිලියන එකසිය තුනක් ආරක්ෂා කිරීම ඇතුළත් වීමයි.

එපමණක් නොව, රටේ බලශක්ති කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා වගකිව යුතු කාර්යභාරයක් ඔහු විසින් සිදුකර ඇත. විදේශීය තෙල් මත එක්සත් ජනපදය යැපීම අඩු කිරීමේ සහ සූර්ය හා සුළං බලය වැනි විකල්ප බලශක්ති ප්‍රභවයන් භාවිතයේ වැදගත්කම ඔහු හඳුනා ගත්තේය. එහි ප්‍රතිඵලයක් ලෙස, කාටර් විසින් 1978 දී 'ජාතික බලශක්ති පනත' (National Energy Act) හඳුන්වා දුන් අතර, එමගින් විකල්ප බලශක්ති ප්‍රභවයන් සංවර්ධනය සඳහා දිරිගැන්වීම් ලබා දුන්නේය.

ජනාධිපති කාටර්ගේ ජනාධිපති ධූරයේ තවත් කැපී පෙනෙන ලක්ෂණයක් වූයේ, මානව හිමිකම් කෙරෙහි අවධානය යොමු කිරීමයි. ඔහුගේ දේශීය ප්‍රතිපත්ති ඇමෙරිකානු සමාජයට කල්පවත්නා බලපෑමක් ඇති කළ අතර, ඔහු විසින් සමාජ සාධාරණත්වය ප්‍රවර්ධනය කිරීම සහ ඇමෙරිකානුවන්ගේ ජීවන තත්වය වැඩි දියුණු කිරීම කෙරෙහි ද අවධානය යොමු කර ඇත. සමස්තයක් ලෙස ගත් ගත්කල, ජිමී කාටර්ගේ ජනාධිපති ධූර කාලය තුළ දේශීය වශයෙන් ඔහු සිය රටට සැලකිය යුතු දායකත්වයක් ලබාදුන් බව කිව හැකිය. එසේම, ඔහු විසි වන සියවසේ ගෞරවනීය හා අගය කළ යුතු නායකයෙකු ලෙස ඇතැමුන් සළකයි.

## විදේශ ප්‍රතිපත්තිය

රටක අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා ජාත්‍යන්තරය සමඟ කරන ගනුදෙනුවක් ලෙස විදේශ ප්‍රතිපත්ති හඳුන්වා දිය හැකි අතර, කුමන ආකාරයෙන් හෝ ජාත්‍යන්තරය සමග කේවල් කිරීමේ ක්‍රමවේදය ලෙස ද අර්ථ දැක්විය හැකිය. 1776 ඇමරිකන් විප්ලවයෙන් පසුව එක්සත් ජනපදය යටත්විජිතකරණයෙන් නිදහස් විය. නිදහසින් පසු සීතල යුද්ධය ආරම්භ වන තුරුම ඇමෙරිකාව ගෙන ගියේ හුදකලා විදේශ ප්‍රතිපත්තියකි (Isolated foreign policy). හැරී ට්‍රෑමන් (Harry Truman) ජනාධිපති පාලන සමයත් සමඟ හුදකලා ප්‍රතිපත්තියෙන් එක්සත් ජනපදය ඉවත් වීම සිදු විය. 1977 දී ඩිමොක්‍රටික් පාක්ෂිකයකු වූ ජිමී කාටර් ජනාධිපති වීම, ඇමෙරිකාවේ විදේශ ප්‍රතිපත්තියට පුද්ගලික මතවාද මත පදනම් වූ නව අවධාරණයක් පිළිබිඹු කළේය. හුදෙක් ඇමරිකාව කාලයක් තිස්සේ මුහුණ දුන් ප්‍රශ්නවලට පිළිතුරු සෙවීමට කාටර්ට සිදුවිය. මේ නිසා ඇමරිකාව ලෝක අර්බුද වලට වැඩි අවධානයක් යොමු කළ කාල පරිච්ඡේදයක් විය. කෙසේ වෙතත් ඔහුට ඔහුගේම විදේශ ඉලක්ක තිබුණි. නීතියේ ආධිපත්‍ය සහ සියලු මිනිසුන් සඳහා ස්වයං නිර්ණය පිළිබඳ මූලධර්මය කාටර් ජාත්‍යන්තර කටයුතුවලදී විශ්වාස කලේය. ඔහුගේ පරමාර්ථය වූයේ මානව හිමිකම් ප්‍රවර්ධනයේ දී එක්සත් ජනපදය පෙරමුණ ගැනීමත්, මිලිටරි මැදිහත් වීමෙන් වළක්වා ගැනීමත් ය.

### මානව හිමිකම්

මානව අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම ඇමරිකාවේ විදේශ ප්‍රතිපත්තිය තුළ ප්‍රධාන අරමුණක් විය යුතු බව කාටර් වැඩ බාරගනිමින් පළමු සංවාදයේ දීම ප්‍රකාශ කළේය. කාටර්ගේ විදේශ ප්‍රතිපත්ති තුළ මානව හිමිකම් ප්‍රධාන අංගයක් බවට පත් කිරීම යනුවෙන් අදහස් කෙරෙන්නේ මානව හිමිකම් හා එක්සත් ජනපදයේ සහයෝගය ලොව පුරා මානව නිදහස ප්‍රවර්ධනය කිරීම සඳහා රාජ්‍යයේ අත්තනෝමතික බලයෙන් පුද්ගලයා ආරක්ෂා කිරීම හා සම්බන්ධ වන බවයි. ඔහුගේ උපදේශකයින් වන බ්‍රසන්ස්කි (Brsezinski) සහ වැන්ස් (Vance) දෙදෙනා ප්‍රබල විදේශ ප්‍රතිපත්ති හස්තයන් ලෙස ක්‍රියා කළහ. කාටර් පරිපාලනයේ මානව හිමිකම් පිළිබඳ විමසීමේ දී ජනාධිපතිවරයා හා ඔහුගේ උපදේශකයින් සෝවියට් සංගමය සහ එහි නැගෙනහිර යුරෝපීය සහචරයන් විසින් මානව හිමිකම් කඩ කිරීම හෙළා දුටුවේය.

## කැම්ප් ඩේවිඩ් ගිවිසුම (Camp David Accords)

මැදපෙරදිග සාම ක්‍රියාදාමය ශීඝ්‍රයෙන් වර්ධනය කළ යුතුව තිබුණි. කාටර්ගේ විදේශ ප්‍රතිපත්ති සාර්ථක බවට පිළිබිඹු වන්නේ මැදපෙරදිග සමඟ සම්බන්ධ වීම හරහාය. ඊජිප්තු සිරියා යුද්ධයේදී කිසිම පාර්ශවයක් අනෙකාට පහර නොදිය යුතු බව සහතික කිරීමට එක්සත් ජනපදය විසින් අධීක්ෂණ ආයතන පිහිටුවා ඇත. ජනාධිපති ජිමී කාටර්ගේ සහාය ඇතිව ඊශ්‍රායලයේ මෙනචෙම් බෙගින් (Menachem Begin) සහ ඊජිප්තුවේ අන්වර් එල්-සාදාත් (Anwar el-Sādāt) අතර ගිවිසුම් දෙකක් අත්සන් කරනු ලැබීය. ඊජිප්තුව සහ ඊශ්‍රායලය අතර ගිවිසුමක් වන මෙය ඊශ්‍රායලය-ඊජිප්තු සාම ගිවිසුම ලෙස ද හැඳින්වීය. වසර තිහක පමණ කාලයක් පැවති යුදමය වාතාවරණයක් නිල වශයෙන් අවසන් කිරීම සිදුවිය. 1978 වොෂිංටනයේ දී විධිමත් ලෙස අත්සන් කළ කැම්ප් ඩේවිඩ් ගිවිසුම කාටර් විදේශ ප්‍රතිපත්තියේ ප්‍රබල ජයග්‍රහනයක් විය.

තවදුරටත් කාටර්ගේ විදේශ ප්‍රතිපත්ති පිළිබඳ විමසා බැලීමේදී මානව අයිතිවාසිකම් සදහා නික්සන් (Nixon) හා කිසිංජර්ගේ (Kissinger) ගෙනගිය ජාතීන් අතර පළුදු වූ සබඳතා නැවත ගොඩනැගීමේ ප්‍රතිපත්තිය ඔහු අනුගමනය කළේය. චීනය සමඟ සබඳතා පැවැත්වීමේ දී එක්සත් ජනපදය තායිවානය (Taiwan) නිල වශයෙන් පිළිගැනීම අවසන් කළ අතර කාටර් කොමියුනිස්ට් චීනය සමඟ ඇමරිකානු සබඳතා පුළුල් කරමින්, 1979 ජනවාරි 01 වන දින කොමියුනිස්ට් පාලනයට විධිමත් රාජ්‍යතාන්ත්‍රික පිළිගැනීමක් ලබා දුන්නේය. මානව අයිතිවාසිකම් වලට මුල්තැන දුන් ඔහු චිලි හා ආර්ජන්ටිනා රාජ්‍යවලට දුන් ආධාර නවත්වා දැමුවේ මානව අයිතිවාසිකම් කඩ කළ හෙයිනි. පැනමා ඇල (Penama Canal) ක්‍රමයෙන් ආපසු භාරදීමේ ගිවිසුම්වලට අත්සන් තැබිණ. රුසියාවේ ඇතැම් ක්‍රියා කලාපයන් හේතුවෙන් එම රට සමඟ පැවැති සබඳතා යහපත් නොවීය. 1979 දී රුසියාව සමඟ අත්සන් කළ SLAT II (Strategic Arms Limitation Talks) ගිවිසුම සෙනෙට් සභා අනුමැතිය ඉදිරිපත් කොට ආපසු කැඳවූයේ රුසියාව (Russia) විසින් ඇෆ්ගනිස්ථානය (Afganistan) ආක්‍රමණය කිරීමට එරෙහිවය. රුසියාව තවත් එවැනි ආක්‍රමණ කළහොත් ඇමරිකාව ඊට විරුද්ධව හමුදා යොදවන බවට ද අනතුරු ඇඟවීය. 1980 පැවති මොස්කව් ඔලිම්පික් උළෙලට ඇමරිකානු ක්‍රීඩකයන්

යැවීම ද තහනම් කළේය. මේ අනුව කාටර් නව ප්‍රතිපත්ති වර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීමේදී අභියෝග රැසකට මුහුණ දුන්නේය.

ලොව දිනූ චරිතයක් ලෙස වර්ෂ 2002 දී ජාත්‍යන්තර ගැටුම් වලට සාමකාමී විසඳුම් සෙවීම, ප්‍රජාතන්ත්‍රවාදය, මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීම, ආර්ථික හා සමාජ සංවර්ධන කිරීම සඳහා වූ ක්‍රියා පිළිවෙල උදෙසා නොබෙල් සාම ත්‍යාගයෙන් කාටර් පිදුම් ලබන ලදී.

## <u>ගත හැකි ආදර්ශ</u>

ඇමරිකානුවන් අතර පමණක් නොව ලොව ප්‍රසිද්ධියට පත් චරිතයක් ලෙස ජිමී කාටර්ගේ චරිතය අප කාටත් මනා ආදර්ශයක් සපයයි. සිය ළමා කාලයේ සිට යහපත් ගතිගුණ ඔප නැංවූ ජිමී කාටර් මානව සබඳතා පැවැත්වීමේ දී මානුෂීයත්වය ඉහළ තලයක රැඳවූ චරිතයකි. කළු ජාතිකයන් සහ සුදු ජාතිකයන් අතර ඇසුරක් නොපවත්වා වර්ණභේදය සමාජයේ පැවති අවධියක දී පවා කළු ජාතික ගොවීන්ගේ දරුවන් සමඟ මිතුරුකම් පවත්වමින් කාලය ගත කිරීම මඟින් ජිමි කාටර්ගේ මානුෂීය ගුණාංග ඉස්මතු කරවයි. කියවීමට ඉතා ලැදි ජිමී කාටර් ඒ තුළින් තම ජීවිතයට අවශ්‍ය පන්නරය ගොඩනගා ගත හැකිය යන ආදර්ශය පිළිබිඹු කරවයි. කාටර් සිය පාසල් වියේදී පැසි පන්දු ක්‍රීඩා කළ අතර එමඟින් ඔහුගේ මානසික ශක්තිය මෙන්ම ශාරීරික සෞඛ්‍ය වර්ධනයට ද ක්‍රීඩාව වැදගත් බව ඔහු තම ළමා කාලයේදීම පෙන්වා දුන්නේය. එමෙන්ම ඔහු තම පවුලට ඉතාමත් ලැදියාවක් දක්වන පුද්ගලයෙකු විය.

ජිමී කාටර්ගේ ප්‍රථම දේශපාලනික ජීවිතය තුළදී ඔහුගේ චරිතයෙන් ලබාගත හැකි ආදර්ශ කිහිපයකි. ඔහුගේ ප්‍රථම මැතිවරණය වංචාකාරී බව තහවුරු වූ පසුව නැවත මැතිවරණයක් පැවැත්වීමට බල කරන ලදී. එහිදී ජයග්‍රහණය කළ කාටර් සිවිල් අයිතිවාසිකම් හොඳින් ක්‍රියාත්මක කිරීමට පෙළඹුණි. ඔහුගේ සක්‍රීය දේශපාලන කාල වකවානුව තුළදී බොහෝ සේවාවන් සිදු කරන ලදී. ජනාධිපතිවරණයට ඉදිරිපත්ව සිටින අවධියේ දී ඔහුට ප්‍රතිවාදීන්ගෙන් ලැබුණු නින්දා හා අපහාස හමුවේ නොපසුබට ධෛර්යය තුළින් තම ජනාධිපතිවරණ ව්‍යාපාරය සාර්ථක කර ගැනීමට කාටර්ට හැකි විය. කිසිදු අවස්ථාවක අභියෝගය

අත්නොහැරි ජිමී කාටර්, තම අභියෝග ජය ගත් ආකාරය අනර්ඝ වන අතර එය තරුණ ජීවිත සඳහා ආදර්ශ සපයයි.

කාටර් ජනාධිපතිවරයා ලෙස තේරී පත්වීමෙන් අනතුරුව, ජනතාවට දුන් ඡන්ද පොරොන්දු ඉටු කරන ලද නායකයකු ලෙස මොහු ජනතාව අතර ප්‍රසිද්ධ වී ඇත. ඇමරිකානු වැසියන්ට පොරොන්දු වූ පරිදි ඔහු වියට්නාම යුද්ධයෙන් ඉවත්ව යන්නට කොන්දේසි විරහිත සමාවක් ප්‍රකාශයට පත්කරන ලදී. තමන්ට පැවරී ඇති භාරදූර වගකීම තේරුම් ගනිමින් ජිමී කාටර් සිය සේවා කාලය තුළ ජනතාවට සේවය කර ඇත. එකල ඇමරිකාව මුහුණ දුන් බලශක්ති අර්බුදයට පිළියම් සැපයීම ඒවා අතරින් ප්‍රධාන වේ.

ජනාධිපති ධූරයෙන් සමුගත් පසු ඔහු කාටර් මධ්‍යස්ථානය ආරම්භ කරන ලදි. අපක්ෂපාතී ලාභ නොලබන මෙම මධ්‍යස්ථානය ආරම්භ කිරීමේ ප්‍රධාන අරමුණ වූයේ, අමෙරිකානු රාජ්‍ය ප්‍රතිපත්තියේ තිබූ ජාතික හා ජාත්‍යන්තර ගැටළු ආමන්ත්‍රණය කිරීමයි. බලයේ රැඳී සිටියදී වූවද සේවය නොකරන දේශපාලනඥයින් අතරින් බලයෙන් ඉවත් වූ පසුවත් ජනතාවට සේවය කරන ජිමී කාටර් වැනි නායකයන් අප සැමටම පූර්වාදර්ශයක් සපයයි.

## සාරාංශය

ඇමරිකානු දේශපාලන ඉතිහාසයේ නොමැකෙන නාමයක් සනිටුහන් කළ ජිමී කාටර් ඇමරිකානුවන් තුළ පමණක් නොව මුළු ලෝකයේම පිළිගැනීමට ලක් වූ ලොව දිනූ චරිතයකි. ඩිමොක්‍රටික් අපේක්ෂක ජෝර්ජ් මැක්ගවර්න්ට (George McGovern) පසු 1960 ගණන්වල පැරණි ලිබරල් දේශපාලනයේ දෙවැනි මරුමුවට පත්වූයේ ජිමී කාටර් ය. ලිබරල්වාදය කෙරෙහි සමස්ත අප්‍රසාදය හඳුනාගත් පළමු අයගෙන් කෙනෙකු ලෙස සාර්ථකත්වයට පත් වූ ඇමරිකානු තිස්නව වන ජනාධිපති ජිමී කාටර් ඩිමොක්‍රටික් පාක්ෂිකයකු ලෙස සමාජය තුළ කැපී පෙනීමට උත්සාහ කළ දේශපාලකයෙකි. 1976 සිට 1981 දක්වා වසර හතරක කාලයක් ජනාධිපතිවරයකු ලෙස සිය ගමන් මඟ ගෙන යාමට පෙර ගොවියෙක්, ව්‍යාපාරිකයෙක්, නාවික නිලධාරියෙක්, ජෝර්ජ් ප්‍රාන්ත සෙනෙට් සභිකයෙක් සහ ආණ්ඩුකාරයෙක් මෙන්ම ලේඛකයෙක් ලෙස ද සිය භූමිකාව ඉටු කොට ඇත.

කාටර් ජනාධිපතිවරයෙකු ලෙස සිය පාලන කාලය තුළදී විශිෂ්ට සේවාවන් රැසක් ඉටු කළ අතර ජාතික බලශක්ති ප්‍රතිපත්තිය සම්මත කිරීම, ප්‍රවාහන කර්මාන්ත සහ කටයුතු නියාමනය කිරීම, ප්‍රවාහන කර්මාන්ත සහ බැංකු කටයුතු නියාමනය කිරීම ආදී ඒ අතර කැපී පෙනෙන කිහිපයකි. ජනාධිපති ධුරයෙන් ඉවත් වී ගිය පසුවද ඔහු විසින් ඉටුකළ සේවය සැබැවින්ම අගනේය.

ඇමරිකාවේ උද්ධමනය සහ විරැකියාව තුරන් කිරීමට දැඩි ලෙස කැප වූ කාටර් ඔහුගේ පාලනය අවසන් වන විට දළ ජාතික නිෂ්පාදනයේ ප්‍රතිශතයක් මනිනු ලබන රැකියා මිලියන අටකට ආසන්න ප්‍රමාණයක් වැඩි කිරීමට කටයුතු කළ අතර අයවැය හිගයේ අඩු වීමක් පෙන්වීමට තරම් සාර්ථක විය. ඉතා දක්ෂ අයුරින් විදේශ ප්‍රතිපත්ති හැසිරවීමට මෙන්ම කාටර් දේශීය වශයෙන් ද වර්ධනයක් අත්පත් කර දීමට සමත්කම් පෑ නායකයෙකි. "ජිමී කාටර්" යන නාමයෙන් ඇමරිකානුවන් අතර ජනප්‍රියත්වයට පත් ජෝර්ජියා ප්‍රාන්තයේ කුඩා රට කජු ගොවියෙකු ලෙස සිට ඇමරිකාවේ ජනාධිපති ධූරයට පත්වූ ජේම්ස් අර්ල් කාටර්, ජූනියර් ලොව දිනූ චරිතයකි.

## මූලාශ්‍ර නාමාවලිය

Anon., 2017.Khan Academy. [Online]

Available at: https://www.khanacademy.org/humanities/us-history/postwarera/1970s-america/a/the-presidency-of-jimmy-carter

Hochman., S. H., 2022. *Jimmy Carter.* [Online] Available at: https://www.cartercenter.org/about/experts/jimmy_carter.html

Hochman, S. H., 2023. *Cartercenter.* [Online] Available at: https://www.cartercenter.org/about/experts/jimmy_carter.html [Accessed 10 Feb 2023].

House, T. W., 2022. *James Carter.* [Online] Available at: https://www.whitehouse.gov/about-the-white-house/presidents/james-carter/

Khan Academy. (2017). *The presidency of Jimmy Carter*. [online] Available at: https://www.khanacademy.org/humanities/us-history/postwarera/1970s-america/a/the-presidency-of-jimmy-carter [Accessed 3 Feb. 2023].

Strong, R., 2016. Jimmy Carter: Domestic Affairs | Miller Center. [Online] Available at: https://millercenter.org/president/carter/domestic-affairs [Accessed 04 10 2016].

# රොනල්ඩ් රේගන් (Ronald Reagan)



**කණ්ඩායම් සාමාජිකයන්**

- වයි. එම්. කෞෂලයා යාපා බැද්දවෙල
- ඩබ්. ඒ. පංචාලී අනුත්තරා
- කේ. පී. කුලතිලක
- ආර්. ඩී. දේවින්දි දිසානායක
- ආර්. එම්. එස්. මීදුම් උපනන්ද

## හැඳින්වීම

"මගේ ජීවිතයේ දර්ශනය නම්, අපගේ ජීවිතවලින් අප කුමක් කිරීමට යන්නේද යන්න අපගේ මනසෙහි තබාගෙන, එම ඉලක්කය කරා වෙහෙස මහන්සි වී වැඩ කළහොත්, අපට කිසි විටෙකත් අහිමි නොවනු ඇත. කෙසේ හෝ අපි ජය ගනිමු".

- රොනල්ඩ් රේගන් -

එතෙක් මෙතෙක් ඇමරිකාවේ පහළ වූ විශිෂ්ටතම නායකයින් අතරෙන් දීප්තිමත් චරිතයක් ලෙස රොනල්ඩ් විල්සන් රේගන් හැඳින්විය හැක. එතුමාගේ සාර්ථකත්වයේ ගමන්මග රෝස මල් යහනාවක් මතින් සිදුවූවක් නොවේ. විවිධ හැලහැප්පීම්, පලිගැනීම්, සිත් රිදවීම් අතරින් නොපසුබස්නා චිත්ත ශක්තියෙන් සාර්ථකත්වයේ හිනිපෙත්තටම ගමන් කළ අතරම එතුමා තුළ පැවති දුර්ලභ නායකත්ව ගති ලක්ෂණ නිසාවෙන්ම ඔහු ඇමරිකාවේ පමණක් නොව ලෝකයේම ගෞරවයට පාත්‍ර විය. ආර්ථික, සමාජීය, දේශපාලනික ආදී විවිධ පැතිකඩ ඔස්සේ ඇමරිකානු ඉතිහාසය නැවත ලිවීමට තරම් ප්‍රබල කාලෝචිත ප්‍රතිසංස්කරණ හා ප්‍රතිපත්ති මෙතුමා ක්‍රියාත්මක කළේය. මේ නිසාවෙන් ලෝකයේ සෑම රටකටම අවැසි මුත්, තවමත් ඒ කිසිඳු රටකට නොලැබුණු නායකයෙක් ලෙස රොනල්ඩ් රේගන් හැඳින්වුවහොත් වඩාත් නිවැරදිය. ලෝකයක්, රටක් හෝ දේශපාලන පක්ෂයක් බරපතල නායකත්ව අර්බුදයකට මුහුණ දෙන අවස්ථාවක ඔවුන්ගේ ප්‍රාර්ථනය රොනල්ඩ් රේගන් වැනි නායකයෙකුගේ නායකත්වය සොයා ගැනීමයි. මේ නිසා දේශපාලන විචාරකයන් සහ සාමාන්‍ය ජනතාව අතර ඔහුගේ නාමය නිරන්තරයෙන් බැබළේ. ඇමරිකානු ජනාධිපතිවරුන්ගේ නාමාවලියේ ඉහළ පෙළේ සිටින නායකයෙකි; රොනල්ඩ් රේගන්.

එවන් වූ අමරණීය මිනිස් පෞරුෂයක, ළමා කාලය, අධ්‍යාපනය, දේශපාලන ගමන් මග, එතුමාගෙන් විවිධ ක්ෂේත්‍රවලට සිදු වූ සේවාවන්, ලෝකය හා සම්බන්ධ වීමට එතුමා අනුගමනය කළ ප්‍රතිපත්ති සහ අවසානයේ මෙවැනි නොසැලෙන දක්ෂ නායකත්වයකින් ගත හැකි ආදර්ශ පිළිබඳව මෙහිදී ගැඹුරින් විශ්ලේෂණය කෙරේ.

## ළමා කාලය, අධ්‍යාපනය හා දේශපාලනයට පිවිසීම

විශිෂ්ට නායකයෙකි, කලාකරුවෙකි, දක්ෂ ක්‍රීඩකයෙකි, ඔහු නමින් රොනල්ඩ් විල්සන් රේගන් ය (Ronald Wilson Reagan). 1911 පෙබරවාරි මස 6 වන දින ඇමරිකා එක්සත් ජනපදයේ ටෙම්පිකො (Tampico) ඉලිනොඉස් හි දී, (Illinois) එඩ්වඩ් ජැක් රේගන්ට (Edward Jack Reagon) සහ නෙල් විල්සන් රේගන්ට (Nelle Wilson Reagon) දාව රොනල්ඩ් රේගන් නම් ඒ අසහාය නායකයා උපත ලැබීය. රේගන්ගේ පියා සපත්තු වෙළෙන්දෙකු වන අතර මව ගෘහනියකි. ලැබෙන්නා වූ සුලු මුදල සිය පවුලක් ම රැක බලා ගැනීමට නොහැකි නිසා ම ඉහළ වැටුපක් ඇති රැකියාවක් සොයා 1920 දී ඩික්සන් (Dixon) හි ස්ථිර පදිංචියට රේගන් පවුල ගියහ. 1928 දී ඩික්සන් උසස් පාසලට (Dixon high school) ඇතුළු වූ රේගන් එතැන් සිට සිය නායකත්ව ගමනට අවශ්‍ය පන්නරය ලබා ගත්තේය. ඔහු කුඩා කල සිටම අධ්‍යාපනයට මෙන් ම ක්‍රීඩාවට ද හපන්කම් දැක් වූ ශිෂ්‍යයෙකු විය. ඩික්සන් උසස් පාසලේ පැසි පන්දු හා පාපන්දු කණ්ඩායම්වල කැපී පෙනෙන ක්‍රීඩකයකු වූ ඔහු නායකයකුට අවශ්‍ය ගුණාංග පන්ති කාමරය තුළ දී මෙන්ම ක්‍රීඩා පිටිය තුළ දී, ප්‍රගුණ කළේය. ඔහුගේ පාසල් අධ්‍යාපනය අවසන් වීමෙන් පසුව උසස් අධ්‍යාපනය සඳහා යුරේකා විශ්වවිද්‍යාලයට (Eureka University) ඇතුළු විය. විශ්වවිද්‍යාලය තුළදී ද කැපී පෙනෙන විද්‍යාර්ථියකු වූ රේගන් පිහිනුම් කණ්ඩායමේ ද, පාපන්දු කණ්ඩායමේ සාමාජිකයකු ද විය. එමෙන්ම, විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය සංගම් නායකයෙකු වශයෙන් ද රේගන් ක්‍රියා කළේය. එතැන් සිට ඔහුගේ පළමු නායකත්ව ගමන් මග ආරම්භ විය.

1932 වසරේ දී ආර්ථික විද්‍යාව හා සමාජ විද්‍යාව පිළිබඳ ගෞරව උපාධිය (Bachelor's Degree in Economics and Sociolocy) ලබාගත් රේගන් එම වසරේ දී ම ඔහුගේ පළමු රැකියාව ලෙස, ගුවන්විදුලි ක්‍රීඩා නිවේදකයකු වශයෙන් සිය වෘත්තීය ජීවිතය ආරම්භ කළේය. ඉන් පසුව, 1937 දී රේගන් කැලිෆෝනියාවේ වොර්නර් බ්‍රදර් නම් චිත්‍රපටි චිත්‍රාගාරය හී දී (Warner Brother Movie studio in California) පැවති තිර පරීක්ෂණයට පෙනී සිටි අතර එයින් සමත් වීමත් සමග රේගන්, Love is on the Air චිත්‍රපටියෙහි නිවේදයකුගේ චරිතය හරහා නළුවෙකු ලෙස ඇමරිකානු සිනමාවට සම්ප්‍රාප්ත විය. නළුවෙකු ලෙස රේගන් අතිශය

සාර්ථක විය. චිත්‍රපටි පනහකට ආසන්න ප්‍රමාණයක් රඟ දක්වා ඇති අතර, ඒ අතරින් Kings Row, Win One for The Gipper ඔහුගේ සුප්‍රසිද්ධ චිත්‍රපට වේ.

රේගන්ට දේශපාලන මාවත විවර වූයේ, ඔහු සතු වූ චතුර කථික හැකියාව නිසාවෙනි. එවක විකාශය වූ ව්‍යාපාරමය කතිකා වැඩසටහනකට පැමිණ, එවකට රජයේ පැවති අක්‍රමික පාලන රටාව හා ආර්ථික දුර්වලතා පෙන්වා දීමත් සමඟ රේගන් නම් චරිතය ඇමරිකානු දේශපාලනය තුළ කැපී පෙනෙන චරිතයක් බවට පත් විය. එතැන් සිට ඔහුට දේශපාලන මංපෙත් විවරවිය. තරුණ වියේ දීම ඩිමොක්‍රටික් පක්ෂ (Democrats party) සාමාජිකත්වය ලබා ගත් අතර පසු කාලයේ දී රේගන් රිපබ්ලිකන් පක්ෂ (Republican party) සාමාජිකයකු විය. 1964 දී බැරී ගොල්ඩ්වොර්ටගේ (Barry Goldwater) මැතිවරණ ව්‍යාපාරවලට සහභාගී වීමත් සමඟ දේශපාලන කටයුතුවලට ප්‍රමුඛතාව ලබා දුන්නේය. වසර දෙකකට පසුව රේගන් කැලිෆෝනියා ප්‍රාන්තයේ (California) ආණ්ඩුකාර ධූරය සඳහා තරඟ කළේය. 1970 වසරේ දී මිලියනයකට ආසන්න ඡන්ද ප්‍රමාණයකින් ජයග්‍රහණය කළ රේගන්, එම ප්‍රාන්තයේ ආණ්ඩුකාරවරයා ලෙස තේරී පත්විය. මෙලෙස රොනල්ඩ් රේගන්ගේ දේශපාලන ගමන් මග ආරම්භ විය.



*රේගන් පාසල් අවධියේ දී*



*රේගන් සිය පියා, මව සහ සහෝදරයා සමඟ*

## නායකත්වය කරා ගිය ගමන් මඟ

"The greatest leader is not necessarily the one who does the greatest things. He is the one who gets the people to do the greatest things."

රොනල්ඩ් රේගන් නම් ඒ අසහාය පුද්ගලයා තම නායකත්ව ගුණාංග ප්‍රදර්ශනය කළේ උසස් පාසලේ ඉගෙනුම ලබන කාලයේ සිටය. උපාධිය අවසන් කළ ඔහු වැඩිදුර ඉගෙනීම් අතරතුර ආරක්ෂකයෙකු ලෙස ද සේවය කළේය.

නායකයෙකු යනු, සැබැවින්ම ඔහු යන මාර්ගය දන්නා, එම මාර්ගයේ යන, අන් අයට ද මග පාදා දෙන්නෙකි. ආරක්ෂකයෙකු ලෙස තම වෘත්තීය ජීවිතයට එළඹෙන රේගන් ආර්ථිකය හා සමාජ විද්‍යාව හැදෑරීමට යුරේකා විශ්වවිද්‍යාලයට ඇතුළත් වන අතර එහිදී ද ඔහුගේ නායකත්ව ගුණාංගයන් කැපී පෙනුණේය. ඒ ඔහු පාපන්දු ක්‍රීඩාවේ නියැලෙමින් දක්ෂතා පෙන්වීමත්, පිහිනුම් කම්ටුවේ ද නායකයා ලෙස කටයුතු කරමින් දක්ෂතා පෙන්වීමත් සමගය.

ඔහුගේ ගමන් මග කිසිවෙකුටත් නතර කිරීමට නොහැකි විය. සියලු අංශයන් පාහේ ආවරණය කරමින් ඔහු ඒ සියලු අංශයන්හි තම නායකත්ව ලක්ෂණයන් විදහා පෑවේය. උපාධිය ලබාගැනීමෙන් අනතුරුව මොහු ලෝවා (Lowa) හි ගුවන්විදුලි ක්‍රීඩා නිවේදකයෙකු ලෙස ද සේවය කර ඇත. ඔහුගේ දක්ෂතාවය හේතුවෙන්ම WHO (1040kHz" Newsradio 1040) නම් ගුවන්විදුලි සේවය මොහුව නිවේදකයෙකු ලෙස සේවයට බඳවාගනු ලැබීය.

දරිද්‍රතාවයෙන් පෙළෙන පවුලක හැදී වැඩීම නිසැකවම රොනල්ඩ් රේගන්ගේ නායකත්වය ඔහු වටා සිටින අන් අය සමග සමීපව සම්බන්ධ වීමට ඉවහල් විය. ඔහුගේම අත්දැකීම් භාවිත කරමින් තම නායකත්ව ගුණාංගයන් පෝෂණය කරගැනීමට ඔහු ක්‍රියා කළේය.

පාසල තුළ මෙන්ම විශ්වවිද්‍යාලය තුළ ද අනෙකුත් බාහිර ක්‍රියාකාරකම් වලින් ඔහු ලැබූ පන්නරය ජනාධිපතිවරයෙකු ලෙස නියෝජනය වන්නට තරම් ශක්තිමත් විය. එමෙන්ම, එම ධූරයට සුදුසුකම් ලබන්නට ඔහුගේ සන්නිවේදන නායකත්ව විලාසය ද සෘජුවම ඉවහල් විය. බොහෝ අය ඔහුට සවන් දීමට සහ ඔහු පවසන දේ ඇසීමට කැමැත්තෙන් සිටියෝය. ඇමරිකාවේ ජනතාව විශ්වාසනීය නායකත්වයක් අපේක්ෂාවෙන් සිටි අතර බොහෝ දෙනෙකුට සැනසීම ලබාදෙන විශ්වාසවන්තභාවය ලබාදීමට රොනල්ඩ් රේගන් සමත් විය.

රොනල්ඩ් රේගන් ජනාධිපති වීමට පෙර, ඇමරිකා එක්සත් ජනපදය දුෂ්කර කාලපරිච්ඡේදයක් පසුකරමින් සිටියේය. අනෙකුත් රටවල් ඇමරිකාව දුටුවේ දුර්වල ජාතියක් ලෙසය. බදු වැඩිවීම සහ විරැකියාව හේතුවෙන් එක්සත් ජනපද ආර්ථිකය අවුල් සහගත තත්ත්වයකට ද අවතීර්ණ වෙමින් සිටියේය. ලෝකයේ නිදහස සහ ප්‍රජාතන්ත්‍රවාදය හැකිලෙන විට නායකත්වයේ සහ විශ්වාසනීයත්වයේ අවශ්‍යතාවය වර්ධනය විය. මේ අසහාය නායකයා ක්‍රියාත්මක වූයේ මෙහිදීය.

මෙම කාලය තුළ ඔහු ජනාධිපතිවරණයට ඉදිරිපත් වූයේ බොහෝ පුද්ගලයන් විසින් ඔහුව අධෛර්යමත් කර තිබියදීය. රොනල්ඩ් රේගන් නම් මේ අසහාය නායකයා අප මතකයේ රඳවාගත යුතුම පුද්ගලයෙකි. ඒ දැවැන්ත පුද්ගලයාගේ නායකත්ව ගුණාංගයන් වත්මන් සමාජයට මෙකල අවශ්‍යම වී ඇති ප්‍රබල නායකයන් බිහිකිරීමට ප්‍රායෝගිකව යොදාගැනීමට හැකිනම් එය අගනේය.

## නායකත්වයට පැමිණීමෙන් පසු සිදුකළ සේවාව

රොනල්ඩ් රේගන් වර්ෂ 1980 දී පැවැත්වූ ජනාධිපතිවරණයට තරග කළ අතර ඩිමොක්‍රටික් ජනාධිපති ජිමී කාටර් (Jimmy Carter) පහසුවෙන් පරාජය කරමින් ජයග්‍රහණය කරනු ලැබීය. ඇමරිකා එක්සත් ජනපදයේ ජනාධිපති ලෙස වර්ෂ 1981 ජනවාරි මස විසිවන දින දිවුරුම් දෙනු ලැබූ අතර එතැන් පටන් නව පාලන යුගයක් ආරම්භ කළේය. ජනාධිපති ලෙස රේගන්ගේ ඉලක්කය වූයේ ඇමෙරිකානුවන්ට තමන් ගැන නැවත විශ්වාසයක් ඇති කළ ජනාධිපතිවරයා ලෙස ඉතිහාසයට එක් වීමයි. ඔහුගේ මූලික අරමුණ වූයේ, මිනිසුන් හට ඔවුන්ගේම හැකියාවන් පිළිබඳ විශ්වාසයක් ඇතිකර ගැනීම මෙන්ම සියලු දේ වෙනුවෙන් රජය මත රැඳී නොසිටීමයි. රේගන්ගේ සේවා කාලය තුළ දී හමුදා අයවැය, ආහාර සලාක (Food Rations), හැකියා වර්ධන වැඩසටහන් (Capacity Building Programs) සහ ව්‍යාපාර පාලනයේ රීති හා සීමා ඉවත් කොට තිබීම ආදී වියදම් අවම කරන ලදී. එමෙන්ම, විශේෂ සමාජ වැඩසටහන් සම්බන්ධයෙන් අවධානය යොමු කරනු ලැබීය. ගෘහස්ථ තෙල් මිල පාලනය කිරීම සම්බන්ධයෙන් දැඩි අවධානයක් යොමු කරනු ලැබුවේය. ආයෝජන වැඩි කිරීම, ආර්ථික වර්ධනය ඇති කිරීම සහ රැකියා උසස් කිරීම සහ වැටුප් වැඩිදියුණු කිරීම ආදී ඇමරිකානු ආර්ථිකය නැවත ප්‍රාණවත් කිරීමට අවශ්‍ය යෝජනා ඉදිරිපත් කරනු ලැබුවේය.

නික්සන් යුගයේ මිල පාලනයන් ඉවත් කිරීම සඳහා රේගන් ප්‍රශංසාවට ලක්විය. ඔහු තෙල් හා ගෑස්, කේබල්, රූපවාහිනී හා දුරකථන සේවා පාලනය ඉවත් කළේය.

රේගන් පරිපාලනය, විශාල බදු කප්පාදුවක් සහ මිලිටරි නොවන වියදම් කපා හැරීමට උත්සාහ කල අතර ෆෙඩරල් රෙගුලාසි ඉවත් කළේ යහපරිපාලනයේ ආර්ථික ප්‍රතිපත්ති (Reganomics) හඳුන්වාදීමත් සමගය. නිලයේ පළමු වසර තුළදී රේගන් විසින් ඩොලර් බිලියන 39 ක අයවැය කප්පාදුවක් නීතියට සම්මත කිරීම මෙන්ම පුද්ගලයන් සඳහා වසර තුනක් පුරා පැතිරුණු සියයට 20ක දැවැන්ත බදු කප්පාදුවක් සහ ව්‍යාපාර සඳහා ප්‍රාග්ධන ආයෝජනය උදෙසා සැලසුම් සකස් කළේය. වර්ෂ 1984 පැවැත් වූ ජනාධිපතිවරණයේ දී නැවත වතාවක් වෝල්ටර් මොන්ඩේල්ට (Walter Mondale) එරෙහිව ජයග්‍රහණය කරනු ලැබූ අතර ධූරය දරණ දෙවන වකවානුවේ මත්ද්‍රව්‍යවලට එරෙහිව මෙන්ම මත්ද්‍රව්‍යවලින් තොර පාසල් හා වැඩ කරන ආයතන ඇති කිරීමට පොරොන්දු වූ අතර ඊට අමතරව මත්ද්‍රව්‍යවලට එරෙහිව ශක්තිමත් නීති බලාත්මක කිරීමට පියවර ගනු ලැබීය. එමෙන්ම, ඒ පිළිබඳ විශාල මහජන දැනුවත් කිරීම් ද සිදු කරනු ලැබුවේය. ඔහු අපේක්ෂා කළ පරිදි ආරක්ෂාව සඳහා වැඩි අරමුදල් ලබා ගැනීමට හැකි විය. පොලී අනුපාත පහළ හෙළීම සහ බදු කප්පාදුවලින් අභිමත ආදායම එකතු කිරීම වාර්තාගත ආර්ථික වර්ධනයක් ඇති කළ අතර එමගින් විරැකියාව සීඝ්‍රයෙන් අවම විය.

1986 බදු ප්‍රතිසංස්කරණ පනත අත්සන් කරනු ලැබූ අතර සංක්‍රමණ ප්‍රතිසංස්කරණ හා පාලන පනත මගින් එක්සත් ජනපද සංක්‍රමණ නීතියට විශාල වෙනස්කම් සිදුකරනු ලැබූ අතර නීති විරෝධී සංක්‍රමණිකයන් මිලියන තුනකට සමාව දෙනු ලැබීය. රේගන්ගේ ප්‍රතිපත්ති කොමියුනිස්ට් විරෝධී විය. ඔහු සීතල යුද්ධය (Cold War) අවසන් කිරීමේ උත්සාහයක් ලෙස සෝවියට් සංගමයේ ගෝලීය බලපෑම ආපසු හැරවීමට උත්සාහ කළේය. මෙම මූලධර්මය යටතේ රේගන් පරිපාලනය විසින් එක්සත් ජනපද හමුදාවේ දැවැන්ත ගොඩනැගීමක් ආරම්භ කළේය.

ඔහු 1985 දී බලයට පත්වූ නව සෝවියට් නායක මිහායිල් ගොර්බචෙෆ් (Mikhail Gorbachev) සමඟ හොඳින් ඇසුරු කළේය. එබැවින් 1987 ජූනි 12 වන දින ජර්මනියේ බර්ලින් තාප්පය (The Berlin Wall) අසල දී රේගන් දේශනයක් පැවැත්වූ අතර එහිදී ඔහු රුසියානු නායකයාගෙන් ඉල්ලීමක් කළේය. නැගෙනහිර

බර්ලිනයේ කොමියුනිස්ට් ආණ්ඩුවේ සහ බටහිර බර්ලිනයේ ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුවේ පුරවැසියන් බෙදූ තාප්පය, මානසික අවපීඩන සංකේතයක් ලෙස සලකනු ලැබීය. ඔහුගේ කතාවේ දී රේගන් ඉල්ලා සිටියේ මෙම බිත්තිය කඩා දමන්න යනුවෙනි. 1989 දී රේගන් ජනාධිපති ලෙස අවසන් වසර තුළ තාප්පය කඩා දැමීය. මෙය බොහෝ දෙනා දුටුවේ 1991 දක්වා පැවති සීතල යුද්ධයේ අවසානය ලෙසය. මෙම ඇමතුම මානව ඉතිහාසයේ ගමන් මගට මහත් බලපෑමක් ඇති කරනු ලැබීය.

මිලිටරි වියදම්වල වැඩිවීම ප්‍රතිලාභ ගණනාවක් ලබා දුන්නේය. පළමුව, හමුදාව එහි හමුදා සහ උපකරණ වැඩිදියුණු කර නවීකරණය කළේය. දෙවනුව, මිලිටරි ආශ්‍රිත පර්යේෂණ හා සංවර්ධන සඳහා ආයෝජනය කරන ලද මුදල් ආර්ථිකයේ ඇතැම් කොටස්වලට, විශේෂයෙන් අධි තාක්‍ෂණික අංශයට දිරිගැන්වීමක් විය. අවසාන වශයෙන්, ආරක්ෂක වියදම් වැඩිවීම, ඇමරිකානු මිලිටරිය නැවතත් අසමසම වනු ඇති බවට වූ පොරොන්දු, මහජන විශ්වාසය ඉහල නැංවීය. කෙසේ වෙතත්, මෙම වියදම් ෆෙඩරල් ආණ්ඩුවේ සදාකාලික අයවැය හිඟයන් සහ ජාතික ණය සඳහා බෙහෙවින් දායක විය. වර්ධනය වන ආරක්ෂක අයවැය, රේගන්ගේ බදු කප්පාදු සහ මිල අධික දේශීය හිමිකම් වැඩසටහන් කපා හැරීමට ඇති අකමැත්ත සමග සමගාමීව, රේගන් වසර තුළ සමතුලිත අයවැයක් සඳහා වූ හැකියාව අවසන් කළේය.

රොනල්ඩ් රේගන් ඔහුගේ ජීවිත කාලය තුළ ගුවන්විදුලි නිවේදකයෙක්, චිත්‍රපට තරුවක්, වෘත්තීය සමිති ප්‍රධානියෙක්, රූපවාහිනී නළුවෙක් සහ සත්කාරක ආණ්ඩුකාරවරයෙකු ලෙස විශාල සේවාවක් ඉටු කරන ලදී.

## විදේශ ප්‍රතිපත්තිය

ඇමරිකා එක්සත් ජනපදයේ හතළිස්වන ජනාධිපතිවරයා වූ රොනල්ඩ් රේගන් නිරවි යුධ සමයේ අමතක නොවන ජනාධිපතිවරයකු ලෙස හඳුන්වාදිය හැකිය. 1980 දී ජනාධිපති ජිමී කාටර් (Jimmy Carter) සමග ඔහුගේ අවසන් ජනාධිපතිවරණ විවාදයේදී රොනල්ඩ් රේගන් ඇමරිකානු මහජනතාවගෙන් මෙසේ ඇසීයඃ "ඇමරිකාව ලෝකය පුරා ගෞරවාදරයට පාත්‍ර වී තිබේද? ඔබට එය

දැනෙනවාද?, අප  සිව් වසරකට පෙර සේ ශක්තිමත්ද?" විවාදය පුරාවටම, රේගන් තම විශ්වාසය පැහැදිලි කළේ, ඇමරිකාවේ ජාත්‍යන්තර කීර්තිය සහ බලය පසුගිය සිව් වසර තුළ පමණක් නොව, ඊට පෙර පැවති සමස්ත දශකය තුළම ශීඝ්‍රයෙන් පහත වැටී ඇති බවයි.

රේගන්ගේ විදේශ ප්‍රතිපත්ති සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමේදී මොහුගේ පළමු සේවා කාලය තුළදී වැඩි අවධානයක් යොමු වූ ගැටළුව වූයේ, සීතල යුද්ධය යි. මෙහිදී සෝවියට් තර්ජනයෙන් රට ආරක්ෂා කර ගැනීම සඳහා ආයුධ සහ හේවා භටයන් ඇති කිරීමට නියෝග කරනු ලැබිණි. එලෙසම, මීට අමතරව අප්‍රිකාවේ, ආසියාවේ සහ ලතින් ඇමරිකාවේ කොමියුනිස්ට් විරෝධී ව්‍යාපාර (Anti-Communist Movements in Africa, Asia and Latin America) සඳහා ආධාර කිරීමට "රේගන් ධර්මය" (Reagan Doctrine) හඳුන්වාදීමක් සිදු කරනු ලැබිණි. රේගන්ට විශේෂයෙන්ම සෝවියට් සංගමය (Soviet Union) කෙරෙහි ජාතික ප්‍රතිපත්තිය නැවත අර්ථ දැක්වීමට අවශ්‍ය විය. ජනාධිපති හැරී ටෲමන් (Harry Truman) 1947 දී සම්මත කරන ලද සෝවියට් සංගමය මිඩංගු කිරීමේ මූලික ප්‍රතිපත්තියට පසුකාලීනව පක්ෂ දෙකෙහිම බිහිවූ ජනාධිපතිවරුන් සේම රොනල්ඩ් රේගන්ද සිය සහය ලබාදෙනු ලැබිණි. නමුත්, රේගන් විශ්වාස කළේ ජනාධිපති නික්සන්, ෆෝඩ් සහ කාටර් (Nixon, Ford, Carter) විසින් භාවිතා කරන ලද ඩෙටෙන්ටේ කාලසමය (Détente Time period) සෝවියට් දේශය විසින් ලබාගෙන ඇති බවයි. උදාහරණයක් ලෙස, රේගන් තර්ක කළේ කාටර් විසින් සාකච්ඡා කරන ලද නමුත් සෙනෙට් සභාව (The Senate) විසින් කිසි විටෙකත් අනුමත නොකළ න්‍යෂ්ටික ගිවිසුම (Strategic Arms Limitations Talk II Agreement), සෝවියට් සංගමයට වඩා එක්සත් ජනපදයට විශාල සීමාවන් පනවා ඇති බවයි. ඒ අතරම, බුද්ධි ප්‍රජාව විශ්වාස කරනවාට වඩා සෝවියට් දේශය ආර්ථික වශයෙන් දුර්වල බව රේගන්ට ඒත්තු ගියේය.

ඔහු ජනාධිපති වීමට පෙර දශක කිහිපය තුළ, රේගන් ඇමරිකානු විදේශ ප්‍රතිපත්තිය සම්බන්ධව ගැඹුරින් කියවා නව අදහස් ගණනාවක් ධවල මන්දිරයට ගෙන ආවේය. ඔහු කොමියුනිස්ට්වාදය (Communism), දුරාචාර හා විනාශකාරී මතවාදයක් ලෙස සැලකූ අතර සෝවියට් සංගමය ලෝක ආධිපත්‍යය සඳහා

නැඹුරු බව විශ්වාස කළේය. 1983 මාර්තු 8 වැනි දින ප්‍රසිද්ධ කථාවකදී ඔහු සෝවියට් සංගමය "නපුරු අධිරාජ්‍යයක්" (Evil empire) ලෙස හැඳින්වූ අතර, ඔහු සෝවියට් දේශය නූතන ලෝකයේ නපුරේ කේන්ද්‍රස්ථානය (The epicentre of evil in the modern world) ලෙසද හැඳින්විය. සෝවියට් සංගමය පරමාණුක ආයුධ (Mutual assured destruction) අත්පත් කරගත් දා සිට පැවති පිළිගත් ජාතික ප්‍රතිපත්තිය ගැන දැඩි කනස්සල්ලට පත්වූයේය. න්‍යෂ්ටික හුවමාරුවකදී ජාතීන් දෙකම සහමුලින්ම විනාශ වනු ඇතැයි යන අන්‍යෝන්‍ය බිය නිසා සෝවියට් සංගමය හෝ එක්සත් ජනපදය කිසි විටෙකත් එකිනෙකාට පහර නොදෙන බව මෙයින් උපකල්පනය කරන ලදී. මෙය "සැබවින්ම පදනම් විරහිත ප්‍රතිපත්තියක්" බව රේගන් පැවසීය. පළිගැනීමේ ප්‍රහාරයකින් වෙනත් රටක සිවිල් ජනතාව විනාශ කිරීම සදාචාරාත්මක නොවන බව ඔහු දැඩිව විශ්වාස කළේය.

කාටර් පරිපාලනය සහ ඩිමොක්‍රටික් කොංග්‍රසය (Democratic Congress) 1970 ගණන්වල අග භාගයේදී ආරක්ෂක අයවැය විශාල වශයෙන් වැඩි කළ අතර, 1981 මාර්තු මාසයේදී වෙයින්බර්ගර්ගේ (Weinberger) උපදෙස් මත රේගන් විසින් මිල ඩොලර් බිලියන 220ක් ලෙස නියම කළේය. ඉතිහාසයේ විශාලතම සාමකාල මිලිටරි අයවැය ලෙස මෙය හැඳින්වේ. එපමණක් නොව, රේගන්ගේ අයවැය සැලසුම්කරුවන් 1981 සහ 1985 අතර ආරක්ෂක වියදම් සියයට 7කින් වැඩි කරන ලෙස ඉල්ලා සිටි අතර එය ඩොලර් ට්‍රිලියන 1කට ආසන්න විය. මෙම අරමුදල් පුළුල් පරාසයක නව ආයුධ පද්ධති, පර්යේෂණ සහ සංවර්ධනය සහ සටන් සූදානම සහ හමුදා සංචලනය වැඩිදියුණු කිරීම සඳහා වෙන් කරන ලදී.

රොනල්ඩ් රේගන්ගේ විදේශ ප්‍රතිපත්තිය ඇමරිකානු ජාතිකවාදය, හමුදා ශක්තිය සහ කොමියුනිස්ට් විරෝධය කෙරෙහි දැඩි ලෙස අවධාරණය කිරීම හරහා හඳුනාගත හැකිවේ. ඔහු උත්සාහ කළේ, ජාතියේ මිලිටරි හා ආර්ථික ශක්තිය කෙරෙහි විශ්වාසය නැවත ඇති කිරීමට සහ විදේශයන්හි ඇමරිකානු වටිනාකම් ප්‍රවර්ධනය කිරීමටය. රේගන්ගේ විදේශ ප්‍රතිපත්තියේ ප්‍රධාන අංග කිහිපයක් ලෙසඃ

- **සීතල යුද්ධය**

රේගන්ගේ විදේශ ප්‍රතිපත්තිය නිර්වචනය කරන ලද්දේ සීතල යුද්ධය සහ සෝවියට් සංගමයේ ව්‍යාප්තවාදී ප්‍රතිපත්තිවලට අභියෝග කිරීමට සහ ගැටුම අවසන් කිරීමට ඔහුගේ පරිපාලනය දැරූ උත්සාහයන් මගිනි. රේගන් මිලිටරි වියදම් වැඩි කර, නව ආයුධ පද්ධති සංවර්ධනය කරමින්, සාම ප්‍රතිපත්තියක් අනුගමනය කළ අතර, එය හරහා ඇමරිකානු මිලිටරි සහ ආර්ථික බලය ප්‍රදර්ශනය කිරීමට ඔහු අදහස් කළේය.

- **සෝවියට් සංගමය සමඟ රාජතාන්ත්‍රික සබඳතා**

සෝවියට් සංගමයට එරෙහිව ඔහුගේ දැඩි ස්ථාවරය තිබියදීත්, රේගන් ඔවුන් සමඟ රාජතාන්ත්‍රික කටයුතු සඳහා විවෘත විය. ඔහු සෝවියට් නායකයින් සමඟ අවි පාලන සාකච්ඡාවල නිරත වූ අතර 1987 දී INF ගිවිසුම (Intermediate-Range Nuclear Forces Treaty) අත්සන් කළ අතර එය යුරෝපයේ අතරමැදි න්‍යෂ්ටික මිසයිල (Nuclear Missiles) සංඛ්‍යාව අඩු කළේය.

සමස්තයක් වශයෙන්, රේගන්ගේ විදේශ ප්‍රතිපත්තිය ඇමරිකානු ජාතිකවාදය, මිලිටරි ශක්තිය සහ කොමියුනිස්ට් විරෝධය කෙරෙහි දැඩි අවධාරණයකින් සලකුණු විය. ඔහුගේ ප්‍රවේශය ගැටුම්කාරී සහ භේදකාරී ලෙස ඇතැමුන් විසින් විවේචනය කරන ලද අතර, එය සීතල යුද්ධයේ අවසානය සහ අවසානයේ සෝවියට් සංගමයේ බිඳවැටීමට ද සාධක විය.

## <u>ගත හැකි ආදර්ශ</u>

ඇමරිකාවේ හතළිස් වන ජනාධිපතිවරයා ලෙස රොනල්ඩ් රේගන් සතුව පැවති චරිතය ඔහු සුවිශේෂී පුද්ගලයකු බවට පරිවර්තනය කර හමාරය. ජනාධිපතිවරයකු තුළ ඔහුගේ චරිතය යනු පෞරුෂත්වය නංවාලන එක්තරා ගුණාංගයකි. වෙනත් ආකාරයකට කිවහොත් ධෛර්යය, විනීතභාවය මිලදී ගත නොහැක. එමෙන්ම, ශක්තිමත් සදාචාරාත්මක හැඟීමක් කිසිදිනෙක කුලියට ගත නොහැක. ජනාධිපතිවරයකු තුළ මෙවැනි ගුණාංග පැවතීම ඔහුට ආශිර්වාදයක් වැනිය. රේගන්ගේ චරිතය පිළිබඳ විමසූ කළ ඔහුගේ චරිතයේ හරය වූයේ ධෛර්යයයි. එය මුළු රටටම ඉමහත් ශක්තියක් විය. ඔහු අභියෝග හා දුෂ්කරතා හමුවේ නොසැලී ධෛර්යය සම්පන්නව කටයුතු කළ තැනැත්තෙකි. තව දුරටත් ඔහුගේ සුභවාදීත්වය

නායකත්වය සහ සන්නිවේදන කුසලතා හේතුවෙන් ඔහු නායකයින් අතරින් කැපී පෙනෙන නායකයෙකු බවට පත්විය.

රේගන් සුභවාදී හා ධනාත්මකවාදයේ බලය විශ්වාස කළ අතර ඔහු බොහෝ දුරට ඇමරිකානු ජනතාව දිරි ගැන්වීමට සහ නඟාසිටුවීමට සුභවාදී දැක්ම භාවිත කරන ලදී. ඔහු සැමවිටම ඔහුව විශ්වාස කළ අතරම ඔහුගේ ශක්තිමත් මූලධර්ම කෙරෙහි නොසැලෙන කැපවීමක් ද පෙන්නුම් කළේය. එපමණක් නොව, ඔහුගේ සන්නිවේදන කුසලතාව අගය කළ යුතුය. රේගන් දක්ෂ සන්නිවේදකයකු වූ අතර ඔහුගේ රංගන පසුබිම ද උපයෝගී කරගනිමින් ප්‍රබල කතා පැවැත්වීමට සහ ඇමරිකානු ජනතාව සමඟ සම්බන්ධ වීමට කටයුතු කරන ලදී. නායකයෙක් ලෙස ඔහු තුළ පවත්නා තවත් සුවිශේෂී ලක්ෂණයක් වූයේ, ප්‍රතිවාදීන් හමුවේ වුවද සහයෝගයෙන් කටයුතු කිරීමයි. රේගන්  සතුව එම ගුණාංගය ඇමරිකාව ශක්තිමත් කිරීමට හේතු විය. ඔහු දේශපාලන ප්‍රතිවාදීන් ඇතුළු සෑම තරාතිරමක පුද්ගලයින් සමඟ සබඳතා ගොඩනැඟීමට සමත් විය.

නායකයෙකු අසාධාරණ ලෙස කටයුතු කරනවා නම් හෝ ආගම, ජාතිකත්වය, ලිංගිකත්වය, සමාජ පන්තිය, කුලය හෝ මතවාදීමය තෝරාගැනීම් තුළ ඇතිවන වෙනස්කම් නොසලකමින් සැමට එක සමානව සැලකීමට අපොහොසත් වුවහොත් ඔහුගේ හෝ ඇයගේ අවංකභාවය පිළිබඳ බරපතල සැක සංකා ඇතිවිය හැකිය. නමුත්, රේගන් එසේ නොවීය. ඔහු ශ්‍රේෂ්ඨ නායකයෙකු විය. අවංකභාවය යනු දීර්ඝ කාලයක් තිස්සේ පෝෂණය කළ යුතු ගුණාංගයකි. ඒ පුරවැසියන් තම නායකයින්ගේ අවංකභාවය හඳුනාගන්නේ, විවිධ අවස්ථාවන් ගණනාවකදී ඔවුන්ගේ ප්‍රකාශයන් සහ ක්‍රියාවන් හා අඛණ්ඩ අරමුණකින් යුතුව සිදුකිරීම තුළ සහ එක් වැරදි තීරණයක් හෝ ක්‍රියාවකින් සිදු නොකිරීම නිසාවෙනි. රේගන්ගේ චරිතය තුළින් අවංකභාවය යන මානුෂිය ගුණාංගය මැනවින් ප්‍රකට විය. අනෙක් අතට සාර්ථක නායකයෙක් විසින් නොවරදින දෘෂ්ටියකින් යුතුව ඉහළ කුසලතාවයන් සහිත පිරිස් සහ ඔවුන්ගේ දක්ෂතාවයන් හඳුනාගනිමින්, ඔවුන්ව ඒ හැකියාවන් හරහා අදාළ භූමිකා තුළ ක්‍රියාකාරී වීම සඳහා පෙළඹවීමට හැකි විය යුතුය. ඒ අනුව ජීවිතයේ සෑම දෙයක්ම සැලසුම් සහගතව සිදුකළ යුතු බවට පසක් කරමින් රේගන් බලයට පත් වීමත් සමඟ ආර්ථික ප්‍රතිසංස්කරණ සිදු කරන ලදී. එහිදී ඉදිරි දියුණුව ආර්ථික වර්ධනය තකා ප්‍රතිසංස්කරණ සිදු කරන ලදී. තවද ආර්ථික දිරිගැන්වීම් කටයුතු උදෙසා විවිධ ක්‍රමෝපායන් භාවිත කළේය. මීට අමතරව, ඔහු

විසින් දියත් කරන ලද කාලෝචිත ප්‍රතිපත්ති ඇමරිකාවේ සාර්ථකත්වයට මඟ පෑදුවකි.

සමස්තයක් ලෙස, රේගන්ගේ චරිතය පිළිබඳ විමසූ කල්හි ඔහුගේ චරිතය තුළ පවත්නා වූ මානව හිතවාදී ගුණාංග රාශියක් අපට දක්නට ලැබේ. ඒවා අතර ශුභවාදි බව, සන්නිවේදන කුසලතා, සබඳතා ගොඩ නගා ගැනීම, තැනට සුදුසු නුවණ අවංක බව යනාදිය ගෙනහැර දැක්විය හැකිය.

## සාරාංශය

ඇමරිකා එක්සත් ජනපදය අදවන විට ලෝක බලවතා ලෙස ආධිපත්‍යය දරනු ලබයි. එහි සංවර්ධනය කෙරෙහි දායක වූ නායකයෙකු ලෙස රොනල්ඩ් රේගන් හැඳින්විය හැකිය. ඇමරිකාව ලෝකයටම විවෘත කර ඓතිහාසික විජයග්‍රහණයකට මඟ පෑදූ රොනල්ඩ් රේගන් ජනාධිපතිවරයෙකුට අවැසි සියලු ගුණාංග ප්‍රගුණ කරන ලද විශිෂ්ට චරිතයකි. නලුවෙකු ලෙස මෙන්ම දේශපාලන නායකයෙකු ලෙස ද ඔහුගේ භූමිකාව අගය කළ යුතුය. සිය ජීවිත කාලය තුළ කොතෙකුත් අභියෝගවලට මුහුණ දුන්නද ඇමරිකාවේ හතළිස් වන ජනාධිපති ලෙස ඔහු තම ඉලක්ක සර්ව සම්පූර්ණ කරගැනීමට නිරන්තරයෙන් කටයුතු කළ පුද්ගලයෙකි. එපමණක් නොව, ඔහුගේ චරිතය තුළ නායකත්වය, ශුභවාදි දැක්ම, ඵලදායි සන්නිවේදන සහ සබඳතා ගොඩනගා ගැනීම නායකයන් අතරින් කැපී පෙනෙන නායකයෙකු වීමට ඔහුට ආශිර්වාදයක් විය. තවද, ඔහු තම සේවා කාලය තුළ දී ආර්ථික උද්දමනය, විරැකියාව වැනි සමාජ ප්‍රශ්න රාශියකට සහන සැලසීමට කටයුතු කරන ලදි.

රේගන් මූලික වශයෙන් මෙවන් විශිෂ්ටත්වයකට පත් වූයේ ඔහු ආරම්භ කළ ආර්ථික ප්‍රතිසංස්කරණ නිසාවෙනි. ඒ අතර ඇමරිකාව ඉහළ ආර්ථික වර්ධනයකට මංපෙත් විවර කිරීම, මිලියන සිය ගණනකගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම, පෞද්ගලික හා සංස්කෘතික නිදහස පුළුල් කිරීම යන කරුණු හරහා වඩාත් මොහුගේ නායකත්වය කැපී පෙනේ. ඔහුගේ නායකත්වය තුළ මානව ඉතිහාසයේ අන් කවරදාකටත් වඩා වැඩි පිරිසක් දරිද්‍රතාවයෙන් මිදී හිස ඔසවනු ලැබීය. ඒ ඔහුගේ ප්‍රතිසංස්කරණවල යහපත් බලපෑම නිසාවෙනි. ඉතා දක්ෂ බුද්ධිමත් මෙන්ම දැනුමෙන් සන්නද්ධ නායකයෙකු ලෙස හඳුනා ගත හැකි රේගන් කුඩා කළ පටන්ම

දැනුම එකතු කිරීමේ පිපාසයකින් පෙළුණු අයෙකි. තමා වෙත පැමිණි විවිධ බාධක සාර්ථක ලෙස නොපසුබස්නා වීරියෙන් හා තමා සතු බුද්ධියෙන් ජයගත් ඔහු විවිධ හැල හැප්පීම් හමුවේ නොසැලී නායකත්වයේ විශිෂ්ටත්වය ලොවට පෙන්වීය.

වර්තමානය වන විට ඇමරිකාව ළඟා කරගෙන ඇති  සාර්ථකත්වයන්ගේ සහ එම සාර්ථකත්වයන් සඳහා වූ පදනම දමන ලද්දේ, රොනල්ඩ් රේගන් නම් කෘතහස්ත නායකයාය. ඔහු විසින් අනුගමනය කරන ලද යම් යම් ප්‍රතිපත්තිවලින් එය පිළිඹිබු වේ. මේ සියලු සාධක නිසාවෙන්ම ඇමරිකානු ජන ජීවිතයටත්, ආර්ථිකයටත් පමණක් නොව මුළු මහත් ඇමරිකානු ඉතිහාසයටම නව පරිච්ඡේදයක් එක් කළ ඇමරිකානු  ජන හදවත් දේශානුරාගයේ උදම් නදින් මොහොතකට සලිත කරවන ලොව ප්‍රබලම නායකයන් අතර තවමත් වැජඹෙන අමරණීය නායකයෙකු ලෙස රොනල්ඩ් රේගන් සපථ කෙරුමට තවත් තර්ක විතර්ක සැබැවින්ම අනවශ්‍යය. මේ අනුව, රොනල්ඩ් රේගන්ගේ චරිතය තුළින් ගම්‍ය වනුයේ ඔහු නිරවි යුධ සමයේ සිටි අමතක නොවන පාලයෙකු බවය.

## මූලාශ්‍ර නාමාවලිය.

Tucker, R. W. (1988). Reagan's Foreign Policy.Foreign Affairs, 68(1), 1–27. https://doi.org/10.2307/20043881

Ronald Reagan: Foreign Policy. (2017, March 23). Ronald Reagan: Foreign Policy. Exploros.https://www.exploros.com/summary/Ronald-Reagan-Foreign-Policy-1

Policy Roundtable: Does Reagan's Foreign Policy Legacy Live On?. (2018, October 9). Policy Roundtable: Does Reagan's Foreign Policy Legacy Live On?.Texas National Security Review.https://tnsr.org/roundtable/policy-roundtable-does-reagans-foreign-policy-legacy-live-on/

Ronald Reagan: Life Before the Presidency | Miller Center. (2016, October 4). Miller Center.https://millercenter.org/president/reagan/life-before-the-presidency

Deeds, C. (1986, January 1). Reaganomics and thatcherism.origins, similarities and differences. GB and US: How far? How close? - Reaganomics and Thatcherism. Origins, Similarities and Differences. Retrieved March 23, 2023, from https://books.openedition.org/pufr/4464?lang=en

Charismatic leadership case study with Ronald Reagan as Exemplar.Regent University. (2022, July 6). Retrieved March 23, 2023, from https://www.regent.edu/journal/emerging-leadership-journeys/ronald-reagan-leadership-style-charismatic-leadership/


Strock, J. (2023, February 6). 15 Reagan leadership lessons. Serve to Lead | James Strock. Retrieved March 23, 2023, from https://servetolead.com/15-reagan-leadership-lessons/

Beinart, P. (2010, June 7). Think Again: Ronald Reagan. Foreign Policy.https://foreignpolicy.com/2010/06/07/think-again-ronald-reagan/

Ronald Reagan Library. (2009, November 9). Ronald Reagan: Biography, Facts & Movies. In History. Retrieved February 10, 2023, from https://www.history.com/topics/us-presidents/ronald-reagan

weußldfõ ^40& jk ckm;s frdk,aâ fra.ka' (2018, June 22). Roar Media. Retrieved February 14, 2023, from https://roar.media/sinhala/main/identities/former-us-president-ronald-reagan

# බිල් ක්ලින්ටන් (Bill Clinton)



**කණ්ඩායම් සාමාජිකයින්**

- ටී. එම්. නවෝදා ලක්මිණි බණ්ඩාර
- ජේ. ඒ. ඩී. අශිනි මහේෂිකා ජයකොඩි
- ඩී. සිතුමිනී මලීශා ජයසුන්දර
- එස්. වී. ඒ. ඩී. මල්කි බිහානි පෙරේරා
- එච්. කේ. අයෝධ්‍යා සඳරුක්ෂි දිසානායක

## හැඳින්වීම

ඇමරිකානු දේශපාලන ඉතිහාසයේ ශ්‍රේෂ්ඨතම ජනාධිපතිවරයෙක් ලෙස සැලකෙන බිල් ක්ලින්ටන් නැතහොත් විලියම් ජෙෆර්සන් ක්ලින්ටන් (William Jefferson Clinton) එක්සත් ජනපදයේ හතළිස් දෙවන ජනාධිපතිවරයා ය. 1946 අගෝස්තු 19 වැනි දින උපත ලැබූ ඔහුගේ මවගේ දෙවැනි සැමියා වන රොජර් ක්ලින්ටන්ගේ (Roger Clinton) අවසාන නම ඔහුගේ නමට එක් විය. එයට හේතු වූයේ, ඔහුගේ ජීව විද්‍යාත්මක පියාගේ මෝටර් රථ අනතුරින් සිදු වූ මරණයෙන් ටික කලකට පසුව උපත ලැබීමය. එමෙන්ම කුඩා කාලයේ සිටම දේශපාලන උනන්දුවක් මෙන්ම මනා තීක්ෂණ ඥානයක් සතු වූ ඔහු දේශපාලනයට පිවිසීමට පෙර සිටම සමාජයට ඉතා වැදගත් සේවයක් සපයන්නෙකු විය. ඒ අනුව, 1977 - 1979 දක්වා කාල වකවානුවේ දී රජයේ නීතීපති ලෙස සේවයේ නියුතු වූ ඔහු 1979 - 1981 දක්වා ද 1983 - 1992 දක්වා කාල වකවානුවෙහි ද කිහිප වතාවක්ම ආණ්ඩුකාරවරයා ලෙස සේවයේ නියැලෙන්නට විය. මෙලෙස සේවයේ යෙදී සිටින අතරතුර ඔහු ආකැන්ස් (Arkanas) හි අධ්‍යාපනය ප්‍රතිසංස්කරණය සිදු කළ අතර, හිතකර බදු ප්‍රතිපත්ති මඟින් එවකට පැවති කර්මාන්තයන්හි වර්ධනයන් ද සිදු කිරීමට උත්සහ කළේය. මෙලෙස ඉතා සමාජශීලී ලෙස සමාජයට සේවය කළ අයෙකු ලෙස බිල් ක්ලින්ටන් 1992 වර්ෂයේ දී ඩිමොක්‍රටික් පක්ෂයෙන් (Democratic Party) ජනාධිපති අපේක්ෂකත්වය දිනා ගත්තේය.

ඒ අනුව, මෙම අධ්‍යයනයේ දී බිල් ක්ලින්ටන්ගේ ළමා කාලය, අධ්‍යාපනය හා දේශපාලනයට පිවිසීම, නායකත්වය කරා ගිය ගමන් මඟ, නායකත්වයට පැමිණීමෙන් පසු සිදුකළ සේවාව, විදේශ ප්‍රතිපත්තිය සහ ගතහැකි ආදර්ශ පිළිබඳව මෙමඟින් විශ්ලේෂණයක යෙදේ.

## ළමා කාලය, අධ්‍යාපනය හා දේශපාලනයට පිවිසීම

විලියම් ජෙෆර්සන් ක්ලින්ටන් (William Jefferson Clinton) නොහොත් බිල් ක්ලින්ටන් 1946 වසරේ දී අගෝස්තු මස 19 වැනි දින ආකැන්ස් (Arkanas) හෝප් (Hope) හි උපත ලැබීය. ඔහුගේ නමෙහි අවසානයට "ක්ලින්ටන්" යනුවෙන් එක් වීමට පෙරතුව ඔහුගේ මුල් නම වූයේ "විලියම් ජෙෆර්සන් බ්ලයිත්" (William Jefferson Blythe) ය. ඔහුගේ ජීව විද්‍යාත්මක පියාගේ මරණය ක්ලින්ටන්ගේ උපතට මාස තුනකට පෙර සිදු වූ අතර ඔහුගේ මවගේ දෙවන විවාහයේ ස්වාමිපුරුෂයා නැතහොත් ඔහුගේ සුළු පියාගේ නම ක්ලින්ටන්ගේ අවසාන නමට එක් වී පසුව ඔහු "විලියම් ජෙෆර්සන් ක්ලින්ටන්" (William Jefferson Clinton) බවට පත් විය. ඔහුගේ මව එවකට හෙද අධ්‍යාපනය හැදෑරූ අතර තම අධ්‍යාපන කටයුතු සඳහා නිවසින් පිටවීමත් සමඟ ක්ලින්ටන් කුඩා කාලයේ දී තම මිත්තණිය සහ සීයා සමඟ ජීවත් විය. එවකට ඔවුන්ගේ ජීවන තත්ත්වය කම්කරු පන්තියේ කම්කරු නිවසක් ලෙස පිළිඹිබු විය. බිල් ක්ලින්ටන්ගේ ප්‍රාථමික අධ්‍යාපනය ආකැන්ස් හි හොට් ස්ප්‍රින්ග් (Hot Spring) හි ශාන්ත ජෝන් කතෝලික ප්‍රාථමික පාසලෙන් හැදෑරූ අතර තම ද්විතීයික අධ්‍යාපනය හොට් ස්ප්‍රින්ග් ද්විතීයික උසස් පාසලෙන් හදාරනු ලැබීය.



*විලියම් ජේ. ක්ලින්ටන් ළමා අවධියේ දී*

බිල් ක්ලින්ටන් කුඩා වියේදීම තම දේශපාලන අභිලාෂයන් වර්ධනය කළ අතර ඔහු තරුණ වියට එළඹෙත්ම සමාජ ක්‍රියාකාරකයෙකු බවට පත්විය. 1964 දී වොෂින්ටන් හි ජෝර්ජ්ටවුන් (Georgtown) විශ්වවිද්‍යාලයට ඇතුළත් වූ අතර එහිදී ජාත්‍යන්තර කටයුතු පිළිබඳව උපාධියක් ලබා ගත්තේය. ඔහුගේ විශ්වවිද්‍යාල පළමු සහ දෙවන වසර තුළ ඔහු ශිෂ්‍ය සභාපති ලෙස පත් වූ අතර එමගින් ලැබූ සමාජ අත්දැකීම් ඔහුගේ දේශපාලනයට පිවිසීමට ඇති අභිලාෂයන් තව තවත් ශක්තිමත් කළේය. පසුකාලීනව 1973 දී යේල් විශ්වවිද්‍යාලයෙන් (Yale University) නීතී උපාධියක් ලබාගත් ඔහු අනතුරුව ආකැන්ස් විශ්වවිද්‍යාලයේ නීතී පීඨයට සම්බන්ධව එහි ඉගැන්වීය. තවද 1973 දීම යේල් විශ්වවිද්‍යාලයෙන් "ජුරිස් ඩොක්ටර්" (Juris Doctor) නැමැති උපාධිය ද ඔහු ලබා ගත්තේය. එමෙන්ම, තරුණ වියේ පටන්ම ඔහු තුළ දක්නට තිබූ ගති ලක්ෂණයක් වන්නේ ඉතා සාමකාමී වටපිටාවක් තුළ ජීවත් වීමට අදහස් කිරීමයි. ඒ හේතුවෙන් ඔහුගේ දේශපාලනයට පිවිසීමේ අභිලාෂයන් තුළ  ඉතා සාමකාමී ප්‍රතිපත්තියක් පැවති අතර යුද්ධය පිළිබඳ හැඟීම ඔහු ප්‍රතික්ෂේප කළේය. 1975 දී ඔහුගේ ජීවිතයේ සිදුවූ තවත් වැදගත්ම සංධිස්ථානයක් වන්නේ නීතී උපාධිධාරිනියෙකු වූ "හිලරි රොඩම්" (Hillary Rodham) සමග ඔහු විවාහ වීමයි. ඇය තුළ පැවති දේශපාලන ක්‍රියාකාරී භූමිකාවන් ද බිල් ක්ලින්ටන්ගේ දේශපාලනයට පිවිසීමේ ගමන් මග ශක්තිමත් කරන්නට විය. ඒ අනුව, මෙලෙස ඔහුගේ ළමා කාලය තුළින් ලැබූ පන්නරය, ඔහුගේ අධ්‍යාපනික වටපිටාව සහ සුදුසුකම් යනාදී සියලු දේ එකට එකතු වී නායකත්වයට පිවිසීමට ශක්තිමත් අභිලාෂයන් එක් කරමින් නායකත්ව ගමන් මග සකසන්නට විය.

## නායකත්වය කරා ගිය ගමන් මග

බිල් ක්ලින්ටන්ගේ නායකත්වය කරා ගිය ගමන් මග පිළිබඳව සාකච්ඡා කිරීමේදී එය අවධීන් කිහිපයක් මත ගොඩ නැඟී ඇත. ඒ අනුව, සාර්ථක ලෙස සිය අධ්‍යාපන දිවිය අවසන් කරන බිල් ක්ලින්ටන් යේල් නීති විද්‍යාලයේ උපාධිය ලැබීමෙන් පසු ඔහුගේ උපන් ප්‍රදේශය වූ ආකැන්සාස් වෙත ආපසු ගොස් ආකැන්සාස් විශ්වවිද්‍යාලයේ නීති මහාචාර්යවරයකු ලෙස සේවය කරන ලදී.

පසුව බිල් ක්ලින්ටන් සිය නායකත්වය කරා ගිය ගමන් මග තුළ සනිටුහන් කළ පළමු පියවර ලෙස 1972 දී නියෝජිත මන්ත්‍රී මණ්ඩලය (House of Represantative) සඳහා තරග කිරීම දැක්විය හැකිය. 1974 දී ඔහු නියෝජිත මන්ත්‍රී මණ්ඩලයට ඉදිරිපත් විය. නමුත්, එහිදී ඔහුට ජයග්‍රහණය කිරීමට නොහැකි විය. බිල් ක්ලින්ටන් 1976 දී ආකැන්සාස්හි නීතිපති තනතුරට තරග කළේය.



*බිල් ක්ලින්ටන් ඔහුගේ දේශපාලන රැස්වීමක් අමතන අවස්ථාවකි*

එහිදී රාජ්‍ය ලේකම් සහ නියෝජ්‍ය නීතිපති පරාජය කරමින් කිසිදු විරුද්ධත්වයකින් තොරව ක්ලින්ටන් ආකැන්සාස්හි නීතිපතිවරයා ලෙස තේරී පත්විය. 1978 වර්ෂයේදී ක්ලින්ටන් ආකැන්සාස් ආණ්ඩුකාර ධූරයට අයදුම් කළේය. එවකට වයස අවුරුදු 31ක් වූ ඔහු ප්‍රාන්ත ඉතිහාසයේ ලාබාලතම ආණ්ඩුකාර අපේක්ෂකයා විය. එහිදී රිපබ්ලික් අපේක්ෂක ලින් ලෝ (Lynn Lowe) පරාජය කරමින් ක්ලින්ටන් 1978 දී ආකැන්සාස් ආණ්ඩුකාරවරයා ලෙස තේරී පත්විය. 1982 දී ඔහු දෙවන වරටත් ආකැන්සාස්හී ආණ්ඩුකාරවරයා ලෙස තේරී පත්විය. ඒ අනුව, 1982 සිට 1992 දක්වා වසර දහයක කාල පරිච්ඡේදයක් ඔහු එම ධූරය හොබවන ලදී.

බිල් ක්ලින්ටන් ආකැන්සාස්හි ආණ්ඩුකාරවරයා ලෙස සේවය කරන කාල පරිච්ඡේදය තුළදීම එක්සත් ජනපද ජනාධිපති වෙනුවෙන් මැතිවරණ ප්‍රචාරක

කටයුතුවලට සහභාගි විය. එය කොතෙක් දුරට සාර්ථක වූයේ ද කිවහොත්, 1992 වර්ෂයේ පැවැත්වූ ඇමරිකා එක්සත් ජනපද ජනාධිපතිවරණයෙන් බිල් ක්ලින්ටන්ට අති සාර්ථක ජයග්‍රහණයක් ලබා ගැනීමට හැකි විය.

## නායකත්වයට පැමිණීමෙන් පසු සිදුකළ සේවාව

ලොව බලවත්ම රාජ්‍යයක් ලෙස ඇමරිකාවෙහි වර්තමානය මෙන්ම අතීතය දෙස බැලීමේ දී එහි නායකත්වය දැරූ ජනාධිපතිවරුන් විසින් නායකත්වයට පැමිණීමෙන් පසු සිදු කරන ලද කාර්යයන් මනා ලෙස කැපී පෙනෙනු ඇත. මෙය විවිධ අවස්ථාවන්ට අනුව වෙනස් වන අතර එක් එක් ජනාධිපතිවරයාට අනුව ද වෙනස් වේ.



*බිල් ක්ලින්ටන් ජනාධිපති ධූරයෙහි දිවුරුම් දෙන අවස්ථාවේදී ලබාගත් ඡායාරූපයකි*

ඇමෙරිකානු ජනාධිපති ඉතිහාසයේ ජනාධිපති ධූරය මෙහෙයවූ නායකයින් අතුරින් එක් සුවිශේෂී පුද්ගලයෙකු ලෙස  බිල් ක්ලින්ටන් අපට පෙන්වා දිය හැකිය. එවකට ඇමෙරිකාවෙහි සිටි ආදර්ශමත් නායකයෙකු වූ ඔහු නායකත්වයට පැමිණීමෙන් පසු කළ සේවාව පිළිබඳව විමසා බැලීමේ දී අපට පෙනී යන්නේ, ලොව පුරා සිටි රාජ්‍ය, රාජ්‍ය නොවන අංශවල, පෞද්ගලික අංශවල නායකයින් සමග දහනව වන සියවසේ සහ විසි එක් වන සියවසේ ආරම්භයේ පැවති ගැටලු විසඳීම උදෙසා අවබෝධය, උපාය මාර්ග සැකැස්ම කෙරෙහි මනා ලෙස පිවිසීමට පියවරයන් සකස් කිරීමට උත්සාහ කර ඇති බවකි. තව ද ඔහුගේ පරිත්‍යාගශීලීත්වය මනා ලෙස පිළිඹිබු කරනුයේ ඔහු විසින් ඇති කරන ලද බිල් ක්ලින්ටන් පදනම (Bill Clinton Foundation) මගිනි. එමගින් සමාජයට බොහෝ සේවාවන් ඉටු කිරීමට හැකියාව ලැබුණි. මූලිකවම මොහුගේ නායකත්වයට පැමිණීමෙන් පසු සිදුකළ සේවාව ඉතා ආකර්ශනීය වූ අතර සැබවින්ම ආදර්ශමත් සහ සාර්ථක නායකත්වයක් පිළිඹිබු කරයි. එහිදී ඔහු තුළ පැවැති අවබෝධය, සංවේදනය හේතු වූ අතර තව ද ඔහුගේ යටත් නිළධාරීන් සහ සගයන් කෙරෙහි අවිනිශ්චිත විනිශ්චයන් ලබා නොදීම ද  සාර්ථකත්වයට හේතු වී ඇත.

බිල් ක්ලින්ටන් ජනාධිපති ධූරයෙහි ක්‍රියා කිරීමට පටන් ගත්තේ තම ජාතීන්ගේ ආර්ථික අවශ්‍යතා, විරැකියාව, සෞඛ්‍ය ආරක්ෂණ ප්‍රතිසංස්කරණය කෙරෙහි තම අවධානය යොමු කරන බවට සහතික කරමිනි. එහිදී, ඔහුගේ අවධානය සේවා කාලය තුළ සෞඛ්‍ය ආරක්ෂණ ප්‍රතිසංස්කරණය කෙරෙහි යොමු වූ අතර එය හැර අනෙකුත් සෑම අංශයකින් ම සැලකිය යුතු ලෙස සාර්ථක වී ඇත. ඔහුගේ ධූර කාලය අවසානයේ දී, බදු වැඩි කිරීම් සහ වියදම් කප්පාදු ඒකාබද්ධ කළ ආර්ථික පැකේජය සම්මත කර ගැනීමට කොන්ග්‍රසයට එරෙහිව සටන් කළේය. 1993 හිදී නව ආර්ථික පැකේජයක් හඳුන්වා දුන් අතර, නමුත් එය මතභේදාත්මක සහ විවේචනාත්මක එකක් විය. මක්නිසාදයත් එය ආර්ථික අවුල් ජාලයකට තුඩු දෙනු ඇතැයි සැලකූ බැවිනි. එමෙන්ම 1993 දී, කොන්ග්‍රසය නිෂ්කාශනය කරන ලද උතුරු ඇමරිකානු නිදහස් වෙළඳ ගිවිසුම (North American Free Trade Agreemant - NAFTA) සම්මත කිරීමේ දී ඇති වූ ගැටලු සම්බන්ධයෙන් ක්ලින්ටන් විවිධ වැඩසටහන් අනුමත කරන ලදී. තවද, 1992 හි පැවති ඔහුගේ මැතිවරණ ව්‍යාපාරයෙහි පොරොන්දු ඉටු කරමින් විශාල ප්‍රතිසංස්කරණ පනතක් නිර්මාණය කළ අතර එමගින් දරුවන් සහිත පවුල් උදෙසා දිගුකාලීන ආධාර

වැඩසටහන් ප්‍රතිස්ථාපනය කරන ලදී. තවද, අවම වැටුප පැයකට ඩොලර් 5.15 දක්වා වැඩි කිරීම සිදු කෙරිණි. එමෙන්ම, තවත් එක් සුවිශේෂී සේවාවක් වන්නේ නීතී විරෝධී සංක්‍රමණිකයින්ගේ දරුවන්ට රාජ්‍යය තුළ අධ්‍යාපනය හැදෑරීම තහනම් කිරීමට රිපබ්ලික් පක්ෂය දැරූ උත්සහයන් ක්ලින්ටන් විසින් වැළැක්වීමයි.

මේ අයුරින් ලොව සිටි ආදර්ශමත් නායකයෙකු ලෙස බිල් ක්ලින්ටන් පෙන්වා දිය හැකි අතර ඔහුගේ සේවා කාලයේ දී සිදු කරන ලද සේවාවන් මෙලෙස පෙන්වා දිය හැකිය.

## විදේශ ප්‍රතිපත්තිය

බිල් ක්ලින්ටන්ගේ විදේශ ප්‍රතිපත්තිය (Foreign Policy) දෙස අවධානය යොමු කරන විට එය දේශීය ප්‍රතිපත්තිය (Domestic Policy) මත ගොඩනැගෙන ආර්ථික වර්ධනය අරමුණු කරගත් ප්‍රතිපත්තියක් බව පෙනේ. සිවිල් වැසියන් ආරක්ෂා කිරීම සඳහා ඇමරිකානු නේටෝ (North Atlantic Treaty Organization - NATO) සහ එක්සත් ජාතීන්ගේ මැදිහත් වීම් පිළිබඳ ක්ලින්ටන්ගේ මතය වෙනස් ආකාරයේ මතයක් විය. 1992 දී ජනාධිපති ජෝර්ජ් ඩබ්ලිව්. බුෂ් (George W. Bush) සෝමාලියාවේ (Somalia) මානුෂීය ගලවා ගැනීම් සඳහා ඇමරිකානු හමුදා යැවූ අතර ජීවිත හානි රැසක් විය. එනමුත්, ක්ලින්ටන් කිසි දිනෙක තම සන්නද්ධ හමුදා එලෙස අනතුරේ නොහෙළීය. ඔහු ලෝකයේ අනෙක් රටවල් විසින් ඇති කර ගන්නා සිවිල් යුද්ධයන්ට තම සන්නද්ධ හමුදාවන්ගේ ජීවිත අනතුරේ හෙළීම කිසි විටෙකත් අනුමත නොකරන ලදී. 1994 දී ජීවිත හානි සිදු නොවන ලෙස හයිටි (Haiti) මෙහෙයුම්වලට මෙන්ම 1995 දී යුගොස්ලෝවියාවේ (Yugoslavia) මෙහෙයුම්වලට තම හමුදා යැවීය. මේ අනුව ක්ලින්ටන් සෑම විටකදීම මානුෂීය මැදිහත්වීම්වල ඇති ගැටලුකාරී බව දුටුවේය. ඒ අනුව ක්ලින්ටන්ගේ අවධානය සෑම විටම යොමු වූයේ, ලෝකයේ සාමය පවත්වා ගැනීම කෙරෙහිය. මන්දයත්, ක්ලින්ටන් සෑම විටම අනෙක් රටවල පවත්නා ගැටුම් තම රටෙහි ජාතික ප්‍රතිපත්තියට බලපෑම් ඇති කරන බව විශ්වාස කළේය. එමෙන්ම, ක්ලින්ටන්ගේ විදේශ ප්‍රතිපත්තිය තුළින් ඔහු මීළඟට සැලසුම් කළ විශාලතම පියවර වන්නේ ඇමරිකානු වෙළඳාම ප්‍රවර්ධනය කිරීමයි.

ඇමරිකාවට මහා බලවතෙකුව නැගිටීමට ඇති අවශ්‍යතාවය මෙකල විදේශ ප්‍රතිපත්තිය තුළින් ද දක්නට ලැබුණි. ඒ අනුව එකල පැවති එක් විශාල අභියෝගයක් වූයේ එක්සත් ජනපදය (United States), චීනය (China), රුසියාව (Russia), ජපානය (Japan), ජර්මනිය (Germany) සහ බටහිර යුරෝපීය රටවල් (Western European Countries) සමඟ සබඳතාවයන් පැවැත්වීමයි. එයට ප්‍රධානතම හේතුව වූයේ මෙම රටවල පැවති යුධ බලය සහ ආර්ථික ශක්තියයි.

මෙම රටවල් සමඟ සබඳතා පැවැත්වීමට අවශ්‍ය වුවද එයට ඇමරිකානු විදේශ ප්‍රතිපත්තිය තීරණය කිරීමට කිසිදු විටෙක ක්ලින්ටන් ඉඩ නොදුන්නේය. පර්සියානු ගල්ෆ් කලාපය (Persian Gulf Region) සහ ඊසාන දිග ආසියාව (Northeast Asia) සමඟ ද විදේශ සබඳතා ගෙන යාම මෙම කාලය තුළ අභියෝගාත්මකව පැවතුණේය. මන්දයත්, මෙම කලාප දෙක තුළම ඇමරිකානු ජාතික අවශ්‍යතාවයන් පැවතුන අතර ඇතැම් විට ඒවා තර්ජනයට ලක් වෙමින් පැවති නිසාවෙනි. ඇමරිකාව වෙත මෙම කාලයේ පැවති අභියෝග නම් කොරියානු (Korean), ඉරාන (Iran), ඉරාක (Iraq) ගැටුම් අවම කර ගැනීමයි. හොංකොං (Hong Kong) හි ඉරණම පිළිබඳ ඇති අවිනිශ්චිතභාවය ග්‍රීසිය (Greece) හා තුර්කිය (Turkey) අතර ඇති ගැටලු සහ ලොව පවතින අනෙකුත් යුධමය තත්ත්වයන් ඇමරිකානු ජාතික අවශ්‍යතාවයට බලපෑම් කිරීමට ඉඩ නොදීමට තම විදේශ ප්‍රතිපත්තිය නිර්මාණය කිරීම ක්ලින්ටන්ට අභියෝගයක් විය.

1994 වන විට ක්ලින්ටන් තම ධූර කාලයේදී නේටෝව පුළුල් කිරීමට සහ බොස්නියාවේ (Bosniya) ඝාතන නතර කිරීමට ක්‍රියා කළේය. නේටෝව පුළුල් කිරීමට ක්ලින්ටන් විවෘත ප්‍රතිපත්තියක් (Open - Door Policy) අනුගමනය කළේය. එතුළින් සීතල යුද්ධය (Cold War) අවසන් කිරීම සහ රුසියාවේ බලය බිඳීම එක් අරමුණක් විය. මෙතුළින් එක්සත් ජනපදය සහ යුරෝපය (Europe) අතර ඇති සබඳතා ද වර්ධනය කරන්නට ක්ලින්ටන් සමත් විය. එමෙන්ම, ඔහු ජපානය සමඟ ඇමෙරිකාවට පැවති උපාය මාර්ගික සංධානය යාවත්කාලීන කළ අතර තම රාජ්‍යතාන්ත්‍රිකභාවය යොදමින් උතුරු කොරියාව (North Korea) හා පැවති තර්ජන අවම කළේය. තවද ක්ලින්ටන් තම විදේශ ප්‍රතිපත්තිය තුළින් දකුණු කොරියාව (South Korea) හා පැවති සබඳතා පුළුල් කළේය. ක්ලින්ටන් ජනාධිපතිවරයා 1994

දී බෝල්ටික් කලාපයෙන් (Baltic Region) රුසියානු හමුදා ඉවත් කිරීම මෙන්ම 1999 දී කොසෝවෝ (Kosovo) හි යුද්ධය අවසන් කිරීමට රුසියාවේ සහයෝගය ලබාගැනීම ආදිය තම විදේශ ප්‍රතිපත්තිය තුළින් සාක්ෂාත් කළේය. අනතුරුව රුසියාව Group Of Eight (G-8), Asia -Pasific Economic Cooperation (APEC), NATO සහ ජාත්‍යන්තර මූල්‍ය ආයතන හා සබඳතා ඇති කර ගත්තේ ය. මීට අමතරව න්‍යෂ්ටික අවි අවධානම අවම කිරීම සහ ආර්ථික ප්‍රතිසංස්කරණයන්ට රුසියාවට සහය දීම ද මෙකල එක්සත් ජනපදය විසින් සිදුකළේය. එමෙන්ම, ක්ලින්ටන්ගේ විදේශ ප්‍රතිපත්තිය යටතේ තායිවාන් සමුද්‍ර සන්ධිය (Taiwan Strait) සාමය පවත්වා ගැනීමට සහ කොරියාවේ ස්වෛරීත්වය පිළිබඳව ද කටයුතු කිරීමට ආරම්භ කළේය. ක්ලින්ටන් දේශීය ගැටුම් ගෝලීය ප්‍රතිවිපාක ඇති කරන බව විශ්වාස කළ අතර ගැටුම් උත්සන්න වී ඇමරිකානු ජාතික අවශ්‍යතාවයන්ට හානි කිරීමට පෙර සාමය ඇති කළ යුතු බව සිතීය. එබැවින් තම අධිපති බලය සාමය ඇති කිරීමට යොදාගන්නා ලදී. එබැවින් මැදපෙරදිග (Middle East), බෝල්කන් (Balkans), ග්‍රීසිය හා තුර්කිය, ඉන්දියාව (India) හා පාකිස්තානය (Pakistan), උතුරු අයර්ලන්තය (North Ireland) ආදී රටවල ගැටලුවලට ඇමරිකාව මැදිහත් විය.

ක්ලින්ටන් තම විදේශ ප්‍රතිපත්තිය තුළ සහ තම පරිපාලනය තුළ සමකාලීන තර්ජන වන ත්‍රස්තවාදය, ජාත්‍යන්තර අපරාධ, බෝවන රෝග, සහ පාරිසරික හානි (Terrorism, International crime, Infectious diseases and Environmental damage) අවම කිරීමට ද වගබලා ගත්තේය. ජාත්‍යන්තර ආර්ථික සබඳතා සහ ඇමරිකාවේ සුබසාධනය ද ක්ලින්ටන් තම විදේශ ප්‍රත්පත්තිය තුළින් හුවා දක්වා ඇත. ඒ අනුව, ලෝක ඉතිහාසය තුළ ඇමරිකාව ඉහළ ආර්ථික ව්‍යාප්තියකට ගෙන යාමට ක්ලින්ටන් සමත් විය. ක්ලින්ටන් 1993 දී ඇමරිකානු නිදහස් වෙළඳ ගිවිසුම නීත්‍යානුකූලව අත්සන් කළේය. ඔහු විදේශීය රටවල එක්සත් ජනපද අපනයන සහ වෙළඳපොළවල් විවෘත කළ අතර නිදහස් වෙළඳ ගිවිසුම් 300 කට අධික ප්‍රමාණයක් ඇති කර ගත්තේය. මෙවැනි වූ විදේශ ප්‍රතිපත්තියක් සමගින් ක්ලින්ටන් ඇමරිකාව තුළ ශක්තිමත් ආර්ථික වර්ධනයක් (4% වාර්ෂික වර්ධනයක්) ස්ථාපිත කළේය. එමෙන්ම මිලියන 2.27 ක රැකියා වර්ධයක් ද ඇති කළේය. 1993 දී GATT හි උරුගුවේ වටය (The Uruguay Round of the GATT) තුළින් තීරුබදු අවම

කිරීම, වෙළඳ ආරවුල් සමනය කිරීම සහ ලෝක වෙළඳ සංවිධානය (World Trade Organization) නිර්මාණය කිරීමට ද ඔහු මූලික විය. 1999 දී Group Of Seven (G-7) සමුළුවේදී ණය අවම කිරීමට ඔහු තම සහය ලබා දුන්නේය. එපමණක් නොව ප්‍රජාතාන්ත්‍රික ආණ්ඩු ශක්තිමත් කිරීමට නිතර තම විදේශ ප්‍රතිපත්තිය තුළින් කටයුතු කළේය.

බිල් ක්ලින්ටන් නැමති ජනාධිපතිවරයා තම ජාතික ප්‍රතිපත්තිය මූලික කරගනිමින් ගෝලීයකරණයට පත් ලෝකය තුළ තම විදේශ ප්‍රතිපත්තිය හසුරුවමින් ක්‍රියා කළ ආකාරය ප්‍රශංසනීයය. ප්‍රජාතන්ත්‍රවාදය (Democracy), හවුල් ආර්ථික හා සාම සැලසුම් (Sharing economy and Peace planning) ඔස්සේ ගිය ක්ලින්ටන් ජනාධිපතිවරයාගේ විදේශ ප්‍රතිපත්තිය මෙලෙස සාරාංශ කළ නොහැකි නමුත් අවුරුදු අටක් පුරාවට ඔහුගේ විදේශ ප්‍රතිපත්තිය නිර්මාණය කළ ඉහත මූලධර්මවලින් එය මැනවින් පිළිබිඹු වේ.

## ගත හැකි ආදර්ශ

බිල් ක්ලින්ටන් ඇමරිකා එක්සත් ජනපදය තුළ හඳුනාගනු ලබන්නේ මෙතෙක් බිහි වූ ඇමරිකානු ජනාධිපතිවරුන් අතර ශ්‍රේෂ්ඨතම පුද්ගලයෙකු ලෙසටය. මක්නිසාදයත් ඔහුගේ නායකත්ව ගුණාංග, අධ්‍යාපනය පිළිබඳ දෘෂ්ටිකෝණය, මෙන් ම විදේශ කටයුතුවලදී ඔහුගේ තිබූ ඍජු බව, මුළු ලෝකයම මවිත කරවන්නක් විය. කුඩා කල සිටම අධ්‍යාපනයට දැක්වූ දක්ෂතාවය නිසාවෙන් ඔහුගේ උසස් අධ්‍යාපනය සඳහා ඔක්ස්ෆර්ඩ් සරසවියට (Oxford University) ඇතුළුවීමට ශිෂ්‍යත්වයක් දිනා ගැනීමට සමත් විය. එසේම යේල් නීති පාසල (Yale Law School) මඟින් ඔහුගේ නීති උපාධිය ලබා ගැනීමට ද සමත් විය. බිල් ක්ලින්ටන්ගේ අධ්‍යාපනික කාලය තුළ ඔහු ක්‍රියාශීලී ශිෂ්‍ය නායකයෙකු, උද්යෝගිමත් පාඨකයෙකු, දක්ෂ සංගීතඥයකු මෙන්ම අතිදක්ෂ කථිකයෙකු ලෙස ද හඳුන්වා ඇත. එමෙන්ම තරුණ ක්ලින්ටන් ජෝර්ජ්ටවුන් (Georgetown) විද්‍යාලයට ඇතුළු වූ අතර එහිදී ඔහු විශ්වවිද්‍යාල දේශපාලනයට ද සම්බන්ධ විය. නායකයෙකු වශයෙන් පසුකාලීන ව ඉස්මතු වීමට ඔහු ලද එම නායකත්ව ලක්ෂණ නිසැකවම පිටිවහලක් වූ බව නිසැකය. අධ්‍යාපනයට දැක්වූ දැඩි ආශාව නිසාම නායකත්වයට

පැමිණීමෙන් පසුවත් අධ්‍යාපනික ක්ෂේත්‍රය තාක්ෂණයත් සමඟ සම්බන්ධ කරමින් ඉතා උසස් අධ්‍යාපනික ක්‍රමයක් ඇති කළේය. එසේම සියලුම දරුවන් අධ්‍යාපනය ලැබීමට පෙළඹවීමට ඔහු ඉමහත් උත්සාහයක යෙදිණි.

අධ්‍යාපනයට පමණක් නොව විෂය පරිබාහිර කටයුතු සමඟ සම්බන්ධ වීමට ද බිල් ක්ලින්ටන් සමත් විය. විශේෂයෙන්ම ක්ලින්ටන් ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාලයේ පැසිපන්දු සමාජයේ සාමාජිකයෙකු වූ අතර එම විශ්වවිද්‍යාලයේම රග්බි සංගම් කණ්ඩායමට ද ක්‍රීඩා කරන ලදී. ක්ලින්ටන්ට ඔහුගේ පරිපාලනය සමෘද්ධිමත් වීමට ඉඩ සලසන නායකත්වය පිළිබඳ ශක්තිමත් හැඟීමක් තිබුණි. පාලන සමය තුළ දී අභ්‍යන්තර ගැටලු පමණක් නොව බාහිර ගැටලු විසඳාගැනීමට සමත් වීම බිල් ක්ලින්ටන් ලැබූ අතිමහත් ජයග්‍රහණයක් විය. ඒ අනුව ගෝලීය ගැටලු විසඳන්නේ කෙසේදැයි හඳුනාගැනීමට ඔහු සතුව තිබූ බුද්ධිමය ගුණාංගය සෙසු නායකයන්ගේ අවධානය ඔහු කෙරෙහි ඇදගන්නට සමත් විය. විශේෂයෙන්ම ඇමරිකානු ඉතිහාසයේ දීර්ඝතම සාමකාමී ආර්ථික ව්‍යාප්තියට ජනාධිපති බිල් ක්ලින්ටන් නායකත්වය දුන්නේද ඉහත කී ගුණාංගය නිසාවෙනි.

බිල් ක්ලින්ටන් අතිදක්ෂ කළමනාකරුවකු ලෙස ද දක්වයි. ඒ එක්සත් ජනපදයේ දුෂ්කර ආර්ථික කාලවලදී තත්ත්ව කළමනාකරණය කිරීමට ඔහු සමත් වීම නිසාවෙනි. එලෙස තීරණ ගත නොහැකි අවස්ථාවකදී පවා එම තත්ත්වය කළමනාකරණය කරගත හැකි මට්ටමකට පැමිණීමට යම් පුද්ගලයෙකුට හැකි වේ නම් එය අදාළ පුද්ගලයාගේ ශූරත්වය විදහා දක්වයි. එසේම බිල් ක්ලින්ටන් ඉතාම ධනාත්මක පෞරුෂයක් තිබුණු නායකයෙකු ලෙස ඇමරිකානු ඉතිහාසයේ සඳහන්ව ඇත. ඔහුගේ මේ ධනාත්මක බව නිසාම බොහෝ දුෂ්කර අවස්ථාවන් වලදී නිවැරදි තීරණ ඉතා සාර්ථකව ගැනීමට බෙහෙවින් ඉවහල් විය. මේ හේතුව නිසාම බිල් ක්ලින්ටන්ගේ ධූර කාලය තුළදී ජනතාවගේ විවේචන අවම වූ වඩාත් ජනප්‍රියම ජනාධිපතිවරයා බවට ද පත් විය.

එපමණක් නොව ඔහුගේ චරිතයෙන් ගත හැකි ආදර්ශයන් අතර අගය කරන්නන් අගය කළ යුතු තැන අගය කිරීම සහ අනෙකුන් සමඟ ගෞරවය බෙදා ගැනීම වැනි ගුණාංග සමකාලීන දේශපාලඥයන් අතර ඉමහත් ප්‍රශංසාවට ලක්විය. බිල් ක්ලින්ටන්ගේ චරිතයෙන් ගත හැකි වටිනාම ආදර්ශයක් වන්නේ සෑම විටම පැහැදිලි ඉලක්කයක් ඔස්සේ ගමන් කිරීමයි. ඔහුගේ මෙම ගුණාංගය විශේෂයෙන්ම

විදෙස් කටයුතු සමබරව ගෙන යාමට මෙන්ම ඉතාම අසීරු අවස්ථාවලදී සාර්ථකව මුහුණ දීමට ඔහුට පිටිවහල් වූ බවට සැක නැත. බිල් ක්ලින්ටන්ට අනුව සෑම පුද්ගලයකුටම ගෞරවයෙන් සැලකීම තමන්ගේ වටිනාකම තක්සේරු කරයි. පාලන සමය තුළ දී අන් අයගේ අදහස් ලබා ගැනීමට, සැලකීමට මෙන්ම ඒ අනුව තම කටයුතු සකසා ගැනීමට බෙහෙවින් පෙළඹිණි. ඔහුගේ මෙම ගුණාංගය තුළින් අපට පෙන්වා දෙන්නේ අන් අයගේ අදහස්වලට ගරු කිරීම සහ එම අදහස්වලට අනුව තම කටයුතු සකසා ගැනීමෙන් වඩා විශිෂ්ට අවස්ථාවන් ළඟා කරගත හැකි බවයි.

බිල් ක්ලින්ටන්ගේ චරිතය පුරාවටම විශේෂයෙන්ම කැපී පෙනෙන්නේ ඔහුට ම ආවේණික වූ නායකත්ව ලක්ෂණයයි. සාර්ථක නායකයකු ලෙස තම ජනතාවට සේවය කළ යුත්තේ කෙසේ ද, ඔවුන්ට තම සේවය සැපයිය යුත්තේ කෙසේ ද, යන්න බිල් ක්ලින්ටන් තම ධූර කාලය තුලදී අති සාර්ථකව පෙන්වා දුන්නේ ය. විශ්‍රාමික ජනාධිපතිවරයෙකු ලෙසත් බිල් ක්ලින්ටන් දේශන පවත්වමින්, සමාජ සුභසාධන කටයුතු සංවිධානය කරමින්, අනාගත ඇමරිකානු ජනාධිපතිවරුන්ට පෙන්වා දුන්නේ නායකයෙකු, නායකත්වයේ සිටියදී මෙන්ම ඉන් පසුවත් තම ජනතාව පිළිබඳ වග විය යුතු බවයි. ඇමරිකා එක්සත් ජනපදයේ හතළිස් දෙවන ජනාධිපතිවරයාව සිටිය දී බිල් ක්ලින්ටන් කළ සේවාව අදටත් එරට ඉතිහාසය තුළ අනුස්මරණීය ලෙස සටහන්ව ඇත.

## සාරාංශය

ඇමරිකානු එක්සත් ජනපදයේ ඉතිහාසය පිළිබඳ අවධානය යොමු කිරීම් දී හිටපු ඇමරිකානු ජනාධිපති බිල් ක්ලින්ටන් ප්‍රමුඛ පෙළේ අවධානයක් ලබා ගන්නා නායකයෙක් ලෙස හඳුන්වාදිය හැකිය. ලොව ප්‍රධාන රටක් ලෙසට ඇමරිකා එක්සත් ජනපදය ප්‍රජාතන්ත්‍රවාදී නව මාවතකට යොමු කිරීමට මොහුගේ ආගමනය හේතු විය. කුඩා කල පටන්ම ක්ලින්ටන් තුළ පැවති නායකත්ව ගුණාංග ඔහුව ජනාධිපති ධූරය දක්වාම ඔසවා තැබුවේය. විශේෂයෙන්ම ජනාධිපති වීමට ප්‍රථම ආණ්ඩුකාරවරයා ලෙස සිටියදී ආකැන්ස් හි අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සිදු කළ අතර හිතකර බදු ප්‍රතිපත්ති මගින් එවකට පැවති කර්මාන්තයන්හි වර්ධනයක් ද සිදු කිරීමට උත්සාහ කළේය.

ඒ අනුව බිල් ක්ලින්ටන් යනු, බාධක කම්කටොළු මතින් සාර්ථක ගමනක් කරා ළඟා වූ ඇමරිකානු ඉතිහාසයේ සිටි ශ්‍රේෂ්ඨ පුද්ගලයෙකි. මූලිකවම ඔහුගේ නායකත්වයට පැමිණීමෙන් පසුව සිදු කළ සේවාව ඉතා ආකර්ශනීය වූ අතර සැබැවින්ම ආදර්ශමත් සහ සාර්ථක නායකත්වයක් පිළිබිඹු කළේය. ක්ලින්ටන්ගේ පාලන කාලය තුළ තවත් කැපී පෙනෙන සේවයක් වන්නේ විදේශ කටයුතු සම්බන්ධයෙන් ඔහු දැක්වූ දක්ෂතාවය සහ සූක්ෂමභාවයයි. මොහුගේ කාලය තුළ දී රුසියාව සමඟ ඉතාම සියුම් ලෙස ගනුදෙනු කිරීමට ක්ලින්ටන් සමත් විය. 1994 දී ක්ලින්ටන් නේටෝව පුළුල් කරමින් රුසියාවේ බලය බිඳීමට උත්සාහ කළත්, එම වර්ෂයේදීම බෝල්ටික් කලාපයෙන් රුසියානු හමුදා ඉවත් කිරීමට මෙන්ම 1999 දී කොසෝවෝහී යුද්ධය අවසන් කිරීමට රුසියාවේ සහයෝගය ලබා ගැනීමට සමත් වීම මේ අතරින් කැපී පෙනේ. ඊට අමතරව එතෙක් සංකීර්ණව පැවති උතුරු කොරියානු සබඳතා ද තම රාජ්‍යතාන්ත්‍රිකභාවය යොදා ගනිමින් සාර්ථක මාවතකට ගැනීමට සමත් විය. එමෙන්ම ඉහත කී රටවලට අමතරව ජපානය සහ ජර්මනිය සමග සබඳතා පැවැත්වීමට අවශ්‍ය වුවද එයට ඇමරිකානු විදේශ ප්‍රතිපත්තිය තීරණය කිරීමට කිසිඳු අවස්ථාවක ඉඩ නොදුන්නේය. තවද නායකයකු ලෙස තමාගේ මැතිවරණ ව්‍යාපාරයේ ඔහු පොරොන්දු වූ ප්‍රතිසංස්කරණ සිය ජනතාව වෙතට ලබා දීමට මහත් කැපවීමෙන් කටයුතු කළේය. සියලු බාධා මැඩගෙන අටවසරක කාලයක් ජනාධිපති ධූරය දැරීමට බිල් ක්ලින්ටන් භාග්‍යවන්ත විය. ඇමරිකානු ඉතිහාසයේ ඉන්ද්‍රඛීලයක් බඳු ජනාධිපති බිල් ක්ලින්ටන් ජන හදවත් තුළ සදා අමරණීය වනු ඇත.

## මූලාශ්‍ර නාමාවලිය


Riley, R. (2017). *Bill Clinton: Life Before the Presidency | Miller Center*. [online] Miller Center. Available at: https://millercenter.org/president/clinton/life-before-the-presidency.

Armacost, M. (2001). *National Issues Forum Assessing Bill Clinton's Legacy: How Will History Remember Him? Panel I*. [online] Available at: https://www.brookings.edu/wp-content/uploads/2012/04/20010109_clintonlegacy.pdf [Accessed 22 Mar. 2022].

The Best Kept Secrets In Government A Report to President Bill Clinton. (1996). Available at: https://govinfo.library.unt.edu/npr/library/nprrpt/annrpt/vp-rpt96/npr1.pdf.

Haass, N.(1997), 'Fatal Distraction: Bill Clinton's Foreign Policy', *Foreign Policy*, 108, pp. 112-123. doi:10.2307/1149093.

Miller,B. (1994) 'The Clinton Years: Reinventing US Foreign Policy?', *International Affairs*, 70(4), pp. 621-634. doi 10.2307/2624550.

Immelman, A. (1998). The political personalities of 1996 U.S. presidential candidates Bill Clinton and Bob Dole. *The Leadership Quarterly*, 9(3), pp.335–366.

Greenstein, F.I. (1998). There He Goes Again: The Alternating Political Style of Bill Clinton. *PS: Political Science and Politics*, 31(2), p.178.

# ඩොනල්ඩ් ජේ. ට්‍රම්ප් (Donald J. Trump)



**කණ්ඩායම් සාමාජිකයන්**

- එම්.ආර්.කෞෂිකා
- ඩබ්.එම්.ඩී.එස්.කේ. ප්‍රියදර්ශනී
- ඩී.එම්.ඩී.එම්. දිසානායක
- එන්.වී.එන්.එන්. සමරසිංහ
- ආර්.ඒ.ඩී.එන්.සී.රණවක

# හැඳින්වීම

2016 එක්සත් ජනපද මැතිවරණයේදී ඩොනල්ඩ් ට්‍රම්ප් රිපබ්ලිකන් පක්ෂය ඔස්සේ මැතිවරණයට එළඹී අතර ඩිමොක්‍රටික් පක්ෂයේ ප්‍රබල අපේක්ෂිකාව වූ හිලරි ක්ලින්ටන් (Hillary Clinton) පරාජයට පත් කරමින් ඇමරිකාවේ හතළිස් පස්වන ජනාධිපතිවරයා බවට පත්විය. 2017 ජනවාරි මස 20 වන දින ඔහු සිය ධූරයෙහි වැඩ භාර ගන්නා ලදී. තමාටම ආවේණික වූ වෙනස් ප්‍රතිපත්තියකින් 2016 මැතිවරණය වන විට වැඩ කරන ඇමරිකානු ජනතාවගේ බලනහරය ඩොනල්ඩ් ට්‍රම්ප් විසින් ඉතාම සූක්ෂම වූත්, දක්ෂ ලෙසත් ස්පර්ශ කර තිබුණි. ට්‍රම්ප්ගේ ඇතැම් අත්තනෝමතික ක්‍රියාකලාපයන් ඇමරිකානු දේශපාලනය උඩු යටිකුරු කළ බවට බොහෝ දෙනා අතර ප්‍රචලිත කරුණකි. එසේ වුවද, ඔහුට ඇදහිය නොහැකි සාමාන්‍ය ජනතාවගේ ප්‍රසාදයක් හා ආකර්ශනයක් විය. ඍජු හා ආවේණික වාග් සන්දර්භයක් හා ක්‍රියාකලාපයක් මෙහෙයවීමත්, එකී වාග් මාලාවන්ගේ පැවැති ස්වාධීනත්වය තුළින් ආර්ථික, දේශපාලනික, සමාජීය යනාදී ක්ෂේත්‍රවල පෙරළියක් ඇති කිරීමට ක්‍රියාකළ නායකයෙක් ලෙස ට්‍රම්ප් හඳුන්වාදිය හැකිය.

එකී කරුණු තුළින් නිදහස බෙහෙවින් ඇලුම්කළ ඇමරිකානුවන් තුළ "ට්‍රම්ප්වාදය" (Trumpism) යනුවෙන් වාදයක් වර නැගුනේ ද මෙම කරුණු නිසාමය. ඒ තුළින් ඇතිකරගත් සාමාන්‍ය වැඩකරන පන්තියේ ජනතා කැමැත්ත එකතු කිරීමට ඔහුට හැකිවිය. එය වැඩිදුරටත් ජනප්‍රියවාදයක් දක්වා පරිවර්තනය කිරීමට ඔහු සමත් විය. ට්‍රම්ප්ගේ චරිත කතාව පිළිබඳ විමසීමේදී, ඔහු සතුව පැවති ව්‍යාපාරික ඥානය, ආර්ථිකය පිළිබඳව හසල දැනුම ඔහුගේ චරිතය තුළින් මනාව ආරූඪ්‍ය වේ. ස්වභාවයෙන්ම විනෝදාස්වාදයට ඇලුම් කළ ට්‍රම්ප් ධනවත්, නිශ්චල දේපල සංවර්ධනකරුවකු මෙන්ම ප්‍රබල ව්‍යාපාරිකයෙකු ලෙස හඳුන්වා දිය හැකිය. මේ නිසාම ඔහු ලෝකප්‍රකට ව්‍යාපාර කිහිපයක මුල් පුටුව හෙබවීමට ද සමත් වූ අතර "Trump Organization"හි සභාපතිවරයා වන්නේ ද ඔහුය.

කෙසේ වෙතත් ඩොනල්ඩ් ට්‍රම්ප් යනු, ඔහුටම අනන්‍ය වූ විලාසයකට අනුව ඇමරිකානු දේශපාලන සන්දර්භය තුළ ජනප්‍රියවාදයක ආරම්භයක් ලකුණු කළ මෑතකාලීන ලොව දිනූ පුරෝගාමී නායකයකු ලෙස හඳුන්වා දිය හැකිය.

## ළමා කාලය, අධ්‍යාපනය සහ දේශපාලනයට පිවිසීම



*ට්‍රම්ප් ළමා වියේදී*

දේපළ වෙළඳාම් සංවර්ධකයෙකු වන ෆෙඩ්රික් ක්‍රිස්ට් ට්‍රම්ප් (Federick Crist Trump) සහ ඔහුගේ බිරිඳ මේරි ඈන් මැක්ලියොඩ් (Mary Anne MacLeod) ට දාව 1946 ජුනි 14 වන දින නිව්යෝර්ක්හි ක්වීන්ස් (NewYork - Queens) හිදී කුඩා ට්‍රම්ප් උපත ලැබීය. නිව්යෝර්ක්හි ක්වීන්ස්බෝරෝ (Queensboro) ප්‍රදේශයේ දරුවන් පස් දෙනෙකුගෙන් යුත් පවුලේ සිවුවැන්නා ලෙස ට්‍රම්ප් හැදී වැඩුණු අතර බාලාංශයේ සිට හත්වන ශ්‍රේණිය දක්වා කීව් - ෆොරස්ට් (Kew - Forest) පෞද්ගලික පාසලෙන් අධ්‍යාපනය ලැබීය.

කුඩා කාලයේ සිටම ඩොනල්ඩ් ට්‍රම්ප් ජවසම්පන්න සහ දීප්තිමත් දරුවෙකු වූ අතර ඔහුගේ දෙමව්පියන් ඔහුට වයස අවුරුදු දහතුනේදී නිව්යෝර්ක් හමුදා ඇකඩමියට ඇතුළත් කළේ, පාසලේ විනය ඔහුගේ ශක්තිය ධනාත්මක ආකාරයකින් මෙහෙයවනු ඇතැයි අපේක්ෂාවෙනි. ට්‍රම්ප් සමාජීය හා ශාස්ත්‍රීය වශයෙන් ඇකඩමිය තුළ හොඳින් ක්‍රියා කළ අතර 1964 දී උපාධිය ලබා ගන්නා විට ඔහු තරුණ ක්‍රීඩකයකු මෙන්ම ශිෂ්‍ය නායකයෙකු ද විය. වැඩිදුර අධ්‍යාපනය සඳහා ඔහු ෆෝඩ්හැම් (Fordham) විශ්වවිද්‍යාලයට ඇතුළු වූ අතර පසුව පෙන්සිල්වේනියා

(Pennsylvania) විශ්වවිද්‍යාලයට මාරු වී එහිදී ඔහු 1968 දී ආර්ථික විද්‍යාව පිළිබඳ උපාධියක් ලබා ගත්තේය.

නිශ්චල දේපළ සංවර්ධනයේ වෘත්තියක් කිරීමට ට්‍රම්ප් තීරණය කිරීමේ දී ඔහුගේ පියාගෙන් දැඩි බලපෑමක් ඇති විය. නමුත්, ට්‍රම්ප්ගේ පෞද්ගලික අරමුණු ඔහුගේ පියාගේ අරමුණුවලට වඩා බොහෝ සෙයින් විශාල විය. උපාධිය ලැබීමෙන් පසු ට්‍රම්ප් පවුලේ ව්‍යාපාරය වන "ට්‍රම්ප් සංවිධානයට" සම්බන්ධ විය. 1971 දී ට්‍රම්ප් සිය නිවස මැන්හැටන් (Manhatton) වෙත ගෙන ගිය අතර එහිදී ඔහු බොහෝ බලගතු පුද්ගලයින්ගේ ඇසුරට හුරුපුරුදු විය. නගරයේ ආර්ථික අවස්ථා සම්බන්ධව හඳුනාගත් ට්‍රම්ප් ඉහළ ලාභ ඉපැයීමට, ආකර්ශනීය ගෘහ නිර්මාණ සැලසුම් භාවිතා කිරීමට සහ මහජන පිළිගැනීම දිනා ගැනීමට අවස්ථාව ලබා දෙන මැන්හැටන්හි විශාල ගොඩනැගිලි ව්‍යාපෘතිවලට සම්බන්ධ විය.

තම පියාගෙන් උරුම වූ ධනයෙන් සන්නද්ධ වූ ට්‍රම්ප් දශක ගණනාවක් පුරා ඔහුගේ විවිධ ව්‍යාපාරවල ඉදිරියෙන් සිටියේය. තවද ඔහු දේපල සංවර්ධකයෙකු, හෝටල් හිමිකරුවෙකු සහ ක්‍රීඩා සංදර්ශන සත්කාරකවරයෙකු ලෙස ප්‍රසිද්ධිය ඉසිලීය. මෙය පසුකාලීනව දේශපාලනය සාර්ථකත්වය උදෙසා පිටිවහලක් විය. මෙලෙස ජනතා ආකර්ශනය මැද මැතිවරණ අපේක්ෂකත්වය සඳහා අයදුම්පත් යොමු කිරීම සිදුවිය.

## නායකත්වය කරා ගිය ගමන් මග

විසි එක් වන සියවස තුළ ලොව දිනූ චරිත අතර ඩොනල්ඩ් ජේ. ට්‍රම්ප් යනු, සමකාලීන ලෝකය තුළ වඩාත් අවධානය දිනාගත් චරිතයකි. ජනාධිපති වීමට පෙර දේශපාලන හෝ හමුදා සේවයක් නොමැති එකම ඇමරිකානු ජනාධිපතිවරයා ඔහු වීම විශේෂත්වයකි. ට්‍රම්ප් නිල වශයෙන් 2000, 2012, 2016 සහ 2020 දී ජනාධිපති අපේක්ෂකයෙකු ලෙස සිව් වතාවක් තරග කර ඇත. ඔහු 2012 දී "නිල නොවන" මැතිවරණ ප්‍රචාරක ව්‍යාපාරයක් දියත් කළේය. ට්‍රම්ප්ගේ ප්‍රකාශිත දේශපාලන ව්‍යාපාරය ගත් කල එය ආරම්භ වූයේ 1980 ගණන්වල අග භාගයේදී ඔහු ජනාධිපති අපේක්ෂකයෙකු ලෙස ප්‍රසිද්ධියේ යෝජනා කිරීමත් සමග ය.

ඔහුගේ දේශපාලනය මුල් අවධියේ සිටම ස්ථිර ප්‍රතිපත්තියක් මත නොවූ කලින් කලට වෙනස් වූ ප්‍රතිපත්තියක් විය. ඔහු තමන් සහය දැක්වූ පක්ෂ වෙනස් කළේය. 1980 දශකයේ දී ඔහු රිපබ්ලිකන් පක්ෂයේ (Republican Party) රොනල්ඩ් රේගන්ට (Ronald Reagan) සහාය දුන් අතර 1987 වන විට තමාව රිපබ්ලිකන් පාක්ෂිකයෙකු ලෙස හඳුනා ගත්තේය. ඉන්පසු, වරින්වර තම පක්ෂපාතිත්වය ඩිමොක්‍රටික් පක්ෂය (Democratic Party), ස්වාධීන හා ප්‍රතිසංස්කරණ පක්ෂය (Reform Party) අතර දෝලනය විය. 1999 දී ඔහු ප්‍රතිසංස්කරණ පක්ෂයට සම්බන්ධ විය. ඩොනල්ඩ් ට්‍රම්ප් 1999 ඔක්තෝබර් 7 වන දින CNN (Convolutional Neural Network) හි Larry King Live සංස්කරණයේදී ජනාධිපති ගවේෂණ කමිටුවක් නිර්මාණය කිරීමට නිවේදනය කළේය. ට්‍රම්ප් කිසි විටෙකත් තේරී පත් වූ තනතුරු දැරුවේ නැතත්, ට්‍රම්ප් සංවිධානයේ ප්‍රධානියා ලෙස පොදු කටයුතු සහ ව්‍යාපාරික කටයුතු සඳහා ඔහු ප්‍රසිද්ධ විය. තවද 1988 දී රිපබ්ලිකන් පාක්ෂිකයෙකු ලෙස ජනාධිපතිවරණයට ඉදිරිපත් වීමට අපේක්ෂා කළ නමුත් තරඟ නොකිරීමට තීරණය කළේය. 2000 දී ගත්කල ට්‍රම්ප් තෙවන පාර්ශවීය අපේක්ෂකයෙකු ලෙස ජනාධිපති සටනට මුල පිරිණි. 2000 වර්ෂයේදී කැඩී බිඳී ගිය ප්‍රතිසංස්කරණ පක්ෂයේ ජනාධිපති අපේක්ෂකත්වය ලබා ගැනීමට ට්‍රම්ප් උත්සහ කළද, අභ්‍යන්තර ගැටුම් හේතුවෙන් ට්‍රම්ප් 2000 පෙබරවාරි මාසයේදී ප්‍රතිසංස්කරණ පක්ෂය හැර ගියේය. ට්‍රම්ප් 2000 පෙබරවාරි 14 වන දින NBC (National Broadcasting Company) හි The Today Show හි ඔහුගේ ප්‍රචාරණ ව්‍යාපාරය නිල වශයෙන් අවසන් කළේය. ප්‍රතිසංස්කරණ පක්ෂයේ ජනාධිපති අපේක්ෂකත්වය තමාට තවමත් ජයග්‍රහණය කළ හැකි යැයි ඔහු විශ්වාස කළද, ඔහුගේ ව්‍යාපාරයට සහය දැක්වීමට සහ මහ මැතිවරණය ජයග්‍රහණය කිරීමට පක්ෂයට නොහැකි බව ඔහුට හැඟුණි. මැතිවරණයෙන් පසු ට්‍රම්ප් NBC හි Apprentice හි සත්කාරකයා ලෙස වැඩි ප්‍රසිද්ධියක් ලබා ගත්තේය.

2015 ජූනි 16 තමන් ජනාධිපතිවරණයට තරඟ කරන බව ඔහු නිල වශයෙන් දැනුම් දුන්නේය. ඉන්පසු ඔහු රිපබ්ලිකන් පක්ෂයේ අපේක්ෂකයා බවට නිල වශයෙන් තේරී පත් වූ අතර ප්‍රතිවාදී අපේක්ෂකයා ලෙස ඩිමොක්‍රටික් පක්ෂයේ හිලරි ක්ලින්ටන් (Hillary Clinton) ඉදිරිපත් විය. ජනපති සටනේ මුල් අවධිය තුළ ක්ලින්ටන් ඉදිරියෙන් සිටිය ද පසුව ඇය රාජ්‍ය ලේකම්ව සිටිය අවධියේදී සිදුවූ

ඊමේල් පණිවිඩ සම්බන්ධ ප්‍රශ්නය නැවත කරලියට පැමිණීමත් සමඟ ඇයගේ ඡන්ද ප්‍රමාණය අඩුවිය. 2016 ඡන්දයේදී ඔහු විසින් ඉලක්ක කරගත්තේ නිතී විරෝධී සංක්‍රමණ, ඉස්ලාම් අන්තවාද හා ත්‍රස්තවාදී කණ්ඩායම්, ඇමරිකානු ජාතික ණය හා අපරාධ වැනි දේශීය ගැටලුය. ඔහුගේ විදේශ ප්‍රතිපත්තිය “America First” ලෙසත්, ජනාධිපතිවරණයේ තේමා පාඨය “Make America Great Again” ලෙසත් භාවිත කළේය. ඔහු තමාව ජනතාවට හඳුන්වා දුන්නේ ජාතිකවාදියකු ලෙසය. එම මැතිවරණයේදී ඔහු ඉලක්ක කරගත් ඡන්ද පදනම වූයේ ඇමරිකානු සුදු ජාතිකයන්ය.

මුස්ලිම් රටවල පුද්ගලයන්ට ඇමරිකාවට පැමිණීම තහනම් කිරීම, උතුරු ඇමරිකානු නිදහස් වෙළඳ ගිවිසුමෙන් (North American Free Trade Agreement-NAFTA) ඉවත්වීම, මෙක්සිකෝ ඇමරිකානු සීමාව තාප්පයකින් වෙන් කිරීම වැනි දේශපාලනික පොරොන්දු තුළින් ඔහුට සුදු ජාතිකයන් ආකර්ශනය කිරීමට හැකිවිය.

අවසානයේ දී 2016 නොවැම්බර් 08 ඇමරිකානු හතළිස් පස්වන ජනාධිපතිවරයා ලෙස ඔහු 2017 ජූනි 20 වන දින වැඩ ආරම්භ කරන ලදි. ඔහුගේ පාලන කාලය තුළ මැතිවරණ පොරොන්දු ක්‍රියාවට නංවමින් ඉරාකය (Iraq), ඉරානය (Iran), ලිබියාව (Libya), සිරියාව (Syria) වැනි මුස්ලිම් සංක්‍රමණිකයන්ට ඇමරිකාවට ඇතුවීම තහනම් කෙරුණි. එමෙන්ම තම ධූර කාලය තුළදී ඇමරිකාවට වාසිදායක හා ඉතා ශක්තිමත් වෙළඳ ගනුදෙනු සිදු කෙරිණි.




*ට්‍රම්ප් ගබ්සාවට එරෙහි රැලියකට සහභාගී වූ අවස්ථාව*

ඔහු ගබ්සා අයිතීන් වෙනුවෙන් පෙනී සිටියේය. අවි ආයුධ පාලනයට යොමු වූයේය. එසේම, ඔහු ත්‍රස්තවාදය සම්බන්ධයෙන් ලබාගත් ගෞරවාන්විත ජයග්‍රහණයක් ලෙස ISIS (Islamic State of Iraq and Syria) නායක අබු බකර් අල්-බග්දාදි (Abu Bakr al- Baghdadi) 2019 ඔක්තෝම්බර් 27 වන දින මරා දමන ලදි.

2020 අවසානය වනවිට කොරෝනා වසංගතයත් සමඟ ඔහුගේ පාලනයට දැඩි අභියෝග එල්ල විය. කෙසේ වෙතත් ඔහුගේ චරිත කතාව දෙස බැලීමේදී නායකත්වය කරා ආ ගමන තුළ ඔහු සාර්ථකත්වයන් ලබා ගත් අතර ඇමරිකාව තුළ බදු අඩු කිරීම, කොටස් වෙළඳපළ වර්ධනය අඩු කිරීම, සේවා වියුක්ති අඩු කිරීම වැනි දෑ තුළින් ඔහුගේ දේශපාලනය තුළ සැබෑ නායකත්වයේ ගුණාංග ඇමරිකානුවන්ට ලබා දීමට ඔහු සමත් විය.

## නායකත්වයට පැමිණීමෙන් පසු සිදුකළ සේවාව

ඩොනල්ඩ් ට්‍රම්ප් ජනාධිපතිවරයා ඇමරිකා එක්සත් ජනපද ප්‍රෞඪ ඉතිහාසය තුළ විශාල මෙහෙයක් ඉටු කළ ජනාධිපතිවරයෙක් ලෙස හඳුනාගත හැකිය. ඔහුගේ වසර හතරක පාලන සමය තුළ සිදුකළ සේවය ආර්ථික, දේශපාලන, සමාජීය, සෞඛ්‍ය යනාදී විවිධ ක්ෂේත්‍ර තුළ හඳුනා ගත හැකිය. ඩොනල්ඩ් ට්‍රම්ප් ඔහුගේ ජනාධිපති නිලයේ පළමු සතිය තුළ විධායක නියෝග හයකට එළඹී ඇත. ඒ අතරින් වැදගත් නියෝගයක් නම්, දේශසීමා ආරක්ෂාව ශක්තිමත් කිරීම හා මෙක්සිකෝ (Mexico) එක්සත් ජනපද දේශසීමාවේ තාප්පයක් ඉදිකිරීම ආරම්භ කිරීමයි. මෙය ඩොනල්ඩ් ට්‍රම්ප්ගේ ප්‍රධාන මැතිවරණ පොරොන්දුවක් විය. එම පොරොන්දුව එලෙසම ඉටු කරමින් ඇමරිකානු ජනතාව ඉදිරියේ තම මහත්මා ගතිගුණ ප්‍රදර්ශනය කිරීමට ඔහු සමත් විය. මෙක්සිකෝ දේශසීමාව හරහා නීති විරෝධීව ඇමරිකාවට ඇතුළුවන සංක්‍රමණිකයන් අඩු වැටුප් යටතේ සේවය සැපයීම ඇමරිකාවේ විරැකියාව වැඩිවීමට හේතු විය. එබැවින් ට්‍රම්ප් ජනාධිපතිවරයාට අවශ්‍ය වූයේ සංක්‍රමණික ගැටලුව අවම කිරීමටය. සැබැවින්ම ට්‍රම්ප් ජනාධිපතිවරයාගේ සමයේ ඇමරිකාවේ විරැකියාව පහත වැටීම පැහැදිලිව හඳුනාගත හැකිය.





*ට්‍රම්ප් ජනාධිපතිවරයාගේ සමයේ විරැකියාව පහත වැටීම.*

ඩොනල්ඩ් ට්‍රම්ප් ජනාධිපතිවරයාගේ පාලන සමය තුළ ඔහු මුහුණ දුන් ගෝලීය අභියෝගයක් විය. ඒ, කොවිඩ්-19 (Covid-19) වසංගතයයි. වසංගතයෙන් එක්සත් ජනපද වැසියන් ආරක්ෂා කරගැනීම උදෙසා ඔහු විශාල සේවාවක් සිදුකළේ ය. 2020 මාර්තු මාසයේදී වසංගතය හේතුවෙන් ඇමරිකානු ජන ජීවිතය අඩාල විය. ඒ මොහොතේ ජනාධිපතිවරයා ලෙස ට්‍රම්ප් මහතා වහා ක්‍රියාත්මක විය. ඔහු ජාතික හදිසි තත්ත්වයක් ප්‍රකාශයට පත්කර වසංගතයට මුහුණ දීමට අවශ්‍යය ප්‍රතිපාදන සැලසුවේය. ඉන් නොනැවතී කොරෝනා වෛරස් ආධාර, සහන සහ ආර්ථික, ආරක්ෂණ පනත (Coronavirus Aid, Relief, and Economic Security Act – CARES) නමින් ඩොලර් ට්‍රිලියන 2.2 ක උත්තේජක පනතක් ද අත්සන් කළේය. ගෝලීය වෛරස වසංගතය විසින් එක්සත් ජනපද ආර්ථිකයට සිදු කරන ලද ආර්ථික හානිය අවම කිරීම වෙනුවෙන් එම පනත අත්සන් කරන ලදී. එය ට්‍රම්ප්ගේ දූරදර්ශී බව මනාව විදහා දක්වයි. එසේම, ජනාධිපති ට්‍රම්ප්ගේ “Operation Warp Speed” වැඩසටහන යටතේ කොවිඩ්-19 වෛරසයට එරෙහි අනුමත එන්නත් දෙකක් නිපදවීමට පෞද්ගලික අංශයට සහය පළකර ඇත. ට්‍රම්ප් 2020 ජනවාරි 29 දින ධවල මන්දිරයේ කොරෝනා වෛරස් කාර්යය සාධක බලකායක් පිහිටුවීය. මාර්තු මස මැද සිට ට්‍රම්ප් දිනපතා කාර්යය සාධන බලකායේ මාධ්‍ය හමුවක් පැවැත්වීය. එහිදී වෛද්‍ය විශේෂඥයින් සහ අනෙකුත් පරිපාලන නිලධාරීන් සමඟ සම්බන්ධ වෙමින් කොරෝනා වෛරස ව්‍යාප්තියට එරෙහි ක්‍රියාකාරී සැලැස්මක් දියත් කළේය. ට්‍රම්ප් වරක් ප්‍රකාශ කරන්නේ, "වසර 51 කට පසු ප්‍රථම වතාවට, බෙහෙත් වට්ටෝරු ඖෂධවල මිල ඇත්ත වශයෙන්ම පහත වැටී ඇති" බවයි. ට්‍රම්ප් 2020 විධායක නියෝගයකට අත්සන් කරමින් පැවසුවේ සෞඛ්‍ය

මධ්‍යස්ථානවලට ඉන්සියුලින් ( Insulin) සහ එපිනෙෆ්‍රීන් (Epinephrine) සඳහා යම් වට්ටමක් රෝගීන්ට ලබා දිය යුතු බවය. සාරාංශයක් ලෙස ගත් කළ ට්‍රම්ප්ගේ සෞඛ්‍ය ආරක්ෂණ සේවාව ක්ෂේත්‍ර දෙකක් ඔස්සේ හඳුනාගත හැකිය. ඒ සෞඛ්‍ය ආරක්ෂණ ගැටලු විසඳීම සහ ඖෂධ පිරිවැය අඩු කිරීමයි. ඒ අනුව, සෞඛ්‍ය ක්ෂේත්‍රයට ඔහුගෙන් වූ අනගි සේවය පැහැදිලි වේ.

ජනාධිපතිවරයා වශයෙන් ට්‍රම්ප් ප්‍රධාන බදු ප්‍රතිසංස්කරණ පනත් සඳහා අත්සන් තැබූ අතර, ඔහුගේ ආරක්ෂණවාදී වෙළඳ ප්‍රතිපත්තිවලට විදේශීය ඇලුමිනියම්, වානේ, සහ වෙනත් නිෂ්පාදන සඳහා තීරු බදු ඇතුළත් විය. ඩොනල්ඩ් ට්‍රම්ප් එක්සත් ජනපද ඉතිහාසය තුළ රාජ්‍ය හෝ හමුදා අත්දැකීම් නොලත් එකම ජනාධිපතිවරයා ය. නමුත්, ට්‍රම්ප් මිලිටරි බලය වර්ධනය කිරීම සඳහා විශාල අනුග්‍රහයක් ලබා දුන් ජනාධිපතිවරයෙකි. ලෝක බලවතා ලෙස ඉතා ශක්තිමත් මිලිටරි බලයක් හිමි ඇමරිකා එක්සත් ජනපදය තව දුරටත් මිලිටරි බලයෙන් ශක්තිමත් කළ යුතු බව ඔහුගේ දැක්ම විය. ඒ අනුව, රාජ්‍ය අයවැයෙන් සැලකිය යුතු ප්‍රමාණයක් ඔහු මිලිටරි බලය වර්ධනය සඳහා වෙන් කළේය. එය එක්සත් ජනපද අයවැයෙන් සැලකිය යුතු මුදලකි. තවත් අතකට ඔහු අනවශ්‍ය මිලිටරි වියදම් නැවැත්වීමට කටයුතු කළ බව පෙනී යයි. ඒ සඳහා හොඳම නිදසුන නම්, ඇෆ්ගනිස්තානයෙන් (Afghanistan) තම හමුදා ඉවත් කර ගැනීමට ඔහු කටයුතු කිරීමයි. එසේම එය තවදුරටත් ලෝකය තුළ ඇමරිකා එක්සත් ජනපද අභිමානය ඉහළ නංවන්නට සමත් විය. අනෙක් අතින් අනවශ්‍ය මිලිටරි වියදම් කපා හැරීම රාජ්‍ය ආර්ථිකයෙහි ලා ඔහු සිදු කළ සේවයකි. ට්‍රම්ප් 2017 ජූනි මාසයේදී එක්සත් ජනපදය දේශගුණික විපර්යාස සම්බන්ධ පැරිස් සම්මුතියෙන් (Paris Agreement on Climate change) ඉවත් කරගැනීම ජාතික හා ජාත්‍යන්තර වශයෙන් කොතෙකුත් විවේචන එල්ල වුවද ඔහු එම තීරණයට එළඹියේ දේශීය බලශක්ති නිෂ්පාදනයට ඇති බාධා ඉවත් කරගැනීමත් නව රැකියා අවස්ථා ලබා දීමත් වෙනුවෙනි. ඉන් නොනැවතී 2019 ජුනි මාසයේදී, ට්‍රම්ප් පරිපාලනය පිරිසිදු බල සැලැස්ම වෙනුවට දැරිය හැකි පිරිසිදු බලශක්ති රීතිය ප්‍රතිස්ථාපනය කළ අතර, රෙගුලාසි ස්ථාපිත කිරීමට සහ පවතින ගල් අඟුරු බලාගාරවලින් විමෝචනය අඩු කිරීම සඳහා හොඳම ක්‍රම තීරණය කිරීමට ප්‍රාන්තවලට වැඩි බලයක් ලබා දුන්නේය. මෙම තීරණ මගින් දේශීය බලශක්ති නිෂ්පාදනය වැඩි කිරීමට මොහු උත්සුක විය.

නිල දත්තවලට අනුව 2019 දී එක්සත් ජනපදයේ මිලියන 4.2 කට අඩු පිරිසක් දරිද්‍රතාවයෙන් ජීවත් විය. මෙය එක්සත් ජනපද දරිද්‍රතා දර්ශකයේ සැලකිය යුතු පහත වැටීමක් විය. එය ට්‍රම්ප්ගේ ධූර කාලය තුළ වාර්තා වේ. දරිද්‍රතාවය අවම කිරීමෙහි ලා ඔහු සාර්ථක වී ඇති ආකාරය මනාව විද්‍යමාන වේ.



Source: Census Bureau.

*2019 වර්ෂයේදී ඇමරිකා එක්සත් ජනපදයේ දරිද්‍රතාවය අඩු වීම*

## <u>විදේශ ප්‍රතිපත්තිය</u>

ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් තම ධූර කාලය තුළ "පළමුව ඇමරිකාව" ප්‍රතිපත්තිය අනුගමනය කළ අතර ජාත්‍යන්තර කටයුතුවලට මැදිහත් නොවන හා ආරක්ෂණවාදී ප්‍රතිපත්ති ද අනුගමනය කළේ ය. ට්‍රම්ප් පරිපාලනයේ විදේශ ආර්ථික උපායමාර්ගය පදනම් වී ඇත්තේ මූලික මූලධර්ම පහක් මත ය. එක්සත් ජනපද ආර්ථික උපදේශක කවුන්සිලයේ (United States Council Of Economic Advisers) 2018 වාර්ෂික වාර්තාවේ සඳහන් කර ඇති පරිදි,

- රටේ ජාතික ආරක්ෂාව සහතික කිරීම.
- ඇමරිකානු ආර්ථිකය ශක්තිමත් කිරීම.
- එක්සත් ජනපදයට වඩාත් හිතකර වෙළඳ ගිවිසුම් ඇති කර ගැනීම.
- එක්සත් ජනපද වෙළඳ නීති විධිවිධාන ප්‍රවර්ධනය කිරීම.
- බහුපාර්ශවික ප්‍රතිසංස්කරණය කිරීම.

චීනය (China) සමග සබඳතා, එක්සත් ජනපද විදේශ ආර්ථික ප්‍රතිපත්තියේ සුවිශේෂී ස්ථානයක් ගනී. චීනය යනු, එක්සත් ජනපදයේ විශාලතම වෙළඳ

හවුල්කරුවාය. කෙසේවෙතත් බලයට පත් වූ විගසම ට්‍රම්ප් ජනාධිපතිවරයා හරිතාගාර වායු විමෝචනය අවම කිරීම හා දේශගුණය පිළිබඳ 2015 පැරිස් ගිවිසුමෙන් (Paris Agreement under the United Nations Framework Convention on Climate Change) එක්සත් ජනපදය ඉවත් කර ගැනීමට කටයුතු කළේය. ට්‍රම්ප් තම විදේශ ප්‍රතිපත්ති ඉලක්ක ඉදිරියට ගෙන යාමට බොහෝ විට ආර්ථික පීඩනය යොදා ගත් බව හඳුනා ගත හැකි ය. ඊට හොඳම නිදසුන නම් ට්‍රම්ප් චීනය සමඟ ඇති කරගත් වෙළඳ යුද්ධයයි. ට්‍රම්ප් පරිපාලනය චීනය මෙන්ම රුසියාව (Russia), කොරියාව (Korea), මැද පෙරදිග (Middle East) යනාදී රටවල් සමඟ ගෙනගිය විදේශ සම්බන්ධතා පිළිබඳ අවධානය යොමු කළ යුතුය.

ට්‍රම්ප් සහ චීන ජනාධිපති ෂී ජින්පින් (Xi Jinping) ද්විපාර්ශ්වික වශයෙන් ඉහළ මට්ටමේ වෙළඳ සාකච්ඡා පවත්වා ඇත. එම සබඳතා බොහෝවිට විවාදාත්මක ඒවා විය. ඒ සඳහා කදිම නිදසුනක් නම්, යෝධ සමාගමක් වන Huawei ඇතුළු එක්සත් ජනපදයේ ක්‍රියාත්මක වන ප්‍රධාන චීන තාක්ෂණ සමාගම්වලට සීමා පැනවීමය. බටහිර චීනයේ හිංසනයට ලක් වූ මුස්ලිම් සුළුතරයක් වන උයිගර්වරුන්ගේ (The Uyghurs) ගැටලුවට පවා ට්‍රම්ප් මැදිහත් වී ඇත. උයිගර්වරුන්ගේ නියෝජිතයින් හමු වී නිරන්තරයෙන් ඔවුන්ට එරෙහිව සිදුවන මානව හිමිකම් උල්ලංඝනය වීම් පිළිබඳ සාකච්ඡා කර ඇත. ආසියානු රටවල් සහ ට්‍රම්ප් පරිපාලනයේ විදේශ සබඳතා පිළිබඳ සාකච්ඡා කිරීමේදී ඇෆ්ගනිස්තාන යුද්ධය (Afghanistan War) (2001-2021) වැදගත් වේ. 2017 අගෝස්තු 21 වන දින ට්‍රම්ප් ප්‍රකාශ කළේ තමාට ඇෆ්ගනිස්ථානය සම්බන්ධයෙන් ඇමරිකානු ප්‍රතිපත්තිය වෙනස් කළ යුතු බවයි. 2020 පෙබරවාරි 29 වන දින, ට්‍රම්ප් පරිපාලනය තලේබාන් (The Taliban) සංවිධානය සමඟ දෝහා ගිවිසුමට (Doha Agreement) අත්සන් තැබීය. එය කොන්දේසි සහිත සාම ගිවිසුමකි. ඒ අනුව මාස 14කින් විදේශ හමුදා ඉවත් කර ගතයුතු විය. පසුව ට්‍රම්ප්ගේ අනුප්‍රාප්තිකයා වූ ජෝ බයිඩන් (Joe Biden) ජනාධිපතිවරයාගේ සමයේ ඇමරිකානු හමුදා ඉවත් කරගැනීම සිදු විය. විසි එක් වන සියවසේ ප්‍රධානම ගැටලුවක් වන්නේ, ත්‍රස්තවාදයයි ( Terrorism). මෙකී ත්‍රස්තවාදය තුරන් කිරීමට ට්‍රම්ප් විසින් ද වරින් වර විවිධ ප්‍රයත්න දරා ඇත. ඇමරිකා එක්සත් ජනපදය විසින් ආරම්භ කරන ලද ගෝලීය ත්‍රස්ත විරෝධී මිලිටරි ව්‍යාපාරය වන "ත්‍රස්තවාදයට එරෙහි ගෝලීය යුද්ධය" (War on Terror) තුළ

කටයුතු කළ ආකාරය ඔහුගේ විදේශ ප්‍රතිපත්තිය තුළ කැපී පෙනේ. ඒ යටතේ ට්‍රම්ප්ගේ පාලන කාලය තුළ එනම්, 2019 ඔක්තෝම්බර් මාසයේදී ඉස්ලාමීය රාජ්‍යය ත්‍රස්තවාදී සංවිධානයේ නායක අබු බකර් අල් බැග්දාඩිගේ (Abu Bakr al-Baghdadi) මරණය සන්ධිස්ථානයකි. මොහුගේ මරණය කෙරෙහි ට්‍රම්ප්ගේ ශක්තිමත් විදේශ ප්‍රතිපත්තිය යටතේ ගෙන ගිය හමුදා මෙහෙයුම හේතු විය.

ට්‍රම්ප්ගේ විදේශ ප්‍රතිපත්තිය තුළ ජාත්‍යන්තර ගිවිසුම් තවත් එක්තරා කැපීපෙනෙන අංගයකි. ඒ පිළිබඳ විමසීමේදී, ට්‍රම්ප්ගේ ඇමරිකා මූලික ප්‍රතිපත්ති න්‍යාය පත්‍රයේ අන්තර්ගත ප්‍රධාන කරුණක් වූයේ, රටින් රටට ගෙන ගිය ඒකපාර්ශවික විධිවිධානවලට පක්ෂව ද්විපාර්ශ්වික, බහුපාර්ශවික ගිවිසුම් සහ ගිවිසුම් අවලංගු කිරීමයි. දෙවන ලෝක සංග්‍රාමයෙන් (Second World War) පසු සෝවියට් සංගමයට (Soviet Union) 1991 න් පසු රුසියාවට එරෙහිව අන්‍යෝන්‍ය ආරක්ෂක සන්ධානයක් ඇති කිරීම සඳහා පිහිටුවන ලද, සංවිධානයක් වන උතුරු අත්ලාන්තික් ගිවිසුම් සංවිධානයෙන් (North Atlantic Treaty Organization - NATO) එක්සත් ජනපදය ඉවත් වන බවට ඔහු නිතර තර්ජනය කළේය. එයට හේතුව වූයේ නේටෝ සාමාජිකයන් සිය දළ දේශීය නිෂ්පාදනයෙන් 3%ක් ආරක්ෂාව සඳහා වැය කළ යුතු වුවත් ඇමරිකාව හැරුනු කොට අනෙකුත් බොහෝ රටවල් එය වැය නොකිරීමයි. ඒ හේතුවෙන් කලාපීය ආරක්ෂාව තහවුරු කිරීමට අනෙක් රාජ්‍යයන්ගේ සහය ලබා ගැනීම සඳහා ඇමරිකාව මෙම තීරණය ගෙන ඇත. තවද, කොවිඩ්-19 වසංගතය මධ්‍යයේ ට්‍රම්ප් ප්‍රකාශ කළේ එක්සත් ජනපදය ලෝක සෞඛ්‍ය සංවිධානයෙන් ඉවත් වන බවයි.

තවද, 2018 මැයි මාසයේදී ට්‍රම්ප් පරිපාලනය නිවේදනය කළේ එක්සත් ජනපදය, ඉරානය තවත් රටවල් පහක් සහ යුරෝපා සංගමය අතර පැවති, ඉරාන න්‍යෂ්ටික ගිවිසුමෙන් (Iran Nuclear Deal) එක්සත් ජනපදය ඉවත් වන බවයි. ලිහිල් කළ ආර්ථික සම්බාධක වෙනුවට දැඩි විදේශීය අධීක්ෂණය යටතේ මිලිටරි නොවන අරමුණු සඳහා න්‍යෂ්ටික තාක්ෂණය අනුගමනය කිරීමට මෙම ගිවිසුම ඉරානයට ඉඩ දුන්නේය. ට්‍රම්ප් මෙම ගිවිසුම බොහෝ රිපබ්ලිකානුවන් සමග කලක සිට ප්‍රතික්ෂේප කර ඇත. මේ යටතේ 2018 නොවැම්බරයේදී එක්සත් ජනපදය ඉරානයට පෙර ක්‍රියාත්මක වූ සියලුම ආර්ථික සම්බාධක නැවත පනවන ලදී.

ට්‍රම්ප් ඊශ්‍රායල-පලස්තීන ගැටුමට (Israeli - Palestinian Coflict) සම්බන්ධව ඒකපාර්ශ්වික ප්‍රවේශයක් යොදා ගත්තේය. 2017 දෙසැම්බරයේදී බොහෝ ලෝක නායකයින්ගේ විරුද්ධත්වය මත ට්‍රම්ප් ප්‍රකාශ කළේ එක්සත් ජනපදය ජෙරුසලම (Jerusalem) ඊශ්‍රායලයේ (Israel) අගනුවර ලෙස පිළිගන්නා බවයි. 2018 මැයි මාසයේදී එක්සත් ජනපදය ජෙරුසලමේ නව තානාපති කාර්යාලයක් නිල වශයෙන් විවෘත කළේය. ජෙරුසලම සම්බන්ධ ගැටුම විසඳීමේ අරමුණින් යුතුව ට්‍රම්ප් විසින් සාම සැලැස්මක් අනුගමනය කළේය. එයින් මොහුට අවශ්‍ය වූයේ ඊශ්‍රායලය ස්වාධීන රාජ්‍යයක් බව පෙන්වාදීමයි.

වෙළඳාම සම්බන්ධව ට්‍රම්ප්ගේ ප්‍රවේශය විමසීමේදී, ජනාධිපති බවට පත් වී දින කිහිපයක් ඇතුළත පැසිෆික් මායිම (Pacific Boarder) දිගේ රටවල් අතර වෙළඳාමට ඇති බාධක අඩු කිරීමට සැලසුම් කළ අතර යෝජිත ට්‍රාන්ස් පැසිෆික් හවුල්කාරිත්වයෙන් (Trans - Pacific Partnership) එක්සත් ජනපදය ඉවත් කර ගත්තේය. මෙක්සිකෝව, කැනඩාව (Canada) සහ එක්සත් ජනපදය අතර භාණ්ඩ සංචලනය ලිහිල් කළ 1994 උතුරු ඇමරිකානු නිදහස් වෙළඳ ගිවිසුම නැවත සාකච්ඡා කිරීමට සහ ඔහුගේ මැතිවරණ පොරොන්දුව ඉටු කරමින් ට්‍රම්ප් 2018 දී එක්සත් ජනපදය මෙක්සිකෝව සමග පැවති ගිවිසුම ප්‍රතිස්ථාපනය කිරීමට එකඟතාවයකට පැමිණියේය.

ට්‍රම්ප්ගේ විදේශ ප්‍රතිපත්තිය යටතේ, 2018 ජනවාරි මාසයේ සිට විශේෂයෙන්ම වානේ සහ ඇලුමිනියම් ඇතුළුව චීනයේ නිෂ්පාදන මාලාවක් සඳහා නව තීරුබදු හෝ ආනයන බදු පැනවීය. ඇමරිකාවේ නිෂ්පාදිත නිෂ්පාදනවල විකුණුම් ඉහළ නැංවීමේ අපේක්ෂාවෙන් ඇමරිකානු පාරිභෝගිකයින් සඳහා එම ආනයනවල පිරිවැය ඉහළ නැංවීය. කෙසේ වෙතත්, ඇමරිකානු නිෂ්පාදකයින් වෙනුවෙන් පෙනී සිටීම සම්බන්ධයෙන් ට්‍රම්ප්ට සමහර දේශපාලනඥයන්ගෙන් ප්‍රශංසා ලැබුණ ද ගෝලීය වෙළඳාමට හානි කිරීම සහ ඇමරිකානු පාරිභෝගිකයින් සඳහා පිරිවැය ඉහළ නැංවීම සම්බන්ධයෙන් ඔහුගේම පක්ෂයෙන් මෙන්ම ඩිමොක්‍රටික් පාක්ෂිකයන්ගෙන්ද විවේචන එල්ල විය. උතුරු කොරියාවේ (North Korea) උත්තරීතර නායකයා වන කිම් ජොන් උන් (Kim Jong un) සමඟ ට්‍රම්ප්ගේ සංකීර්ණ සම්බන්ධතාවයක් පවත්වාගෙන යන ලදී. කෙසේ වෙතත්, 2018 දී ට්‍රම්ප්

සිය ප්‍රවේශය වෙනස් කළේය. පෞද්ගලික සබඳතාවල බලය සහ තමාගේම ගනුදෙනු කිරීමේ දක්ෂතාවය විශ්වාස කරන ට්‍රම්ප් කිම් සමඟ පෞද්ගලික බැඳීම හරහා එක්සත් ජනපදය සහ උතුරු කොරියාව අතර දශක ගණනාවක් තිස්සේ පැවති ආරවුලක් විසඳීමට උත්සාහ කළේය. ට්‍රම්ප්ගේ මෙම ක්‍රියාව ගෝලීය වශයෙන් බොහෝදෙනාගේ අවධානයට ලක්විය. දෙරටේ නායකයන් 2018 ජූනි මාසයේදී පළමුවරට සිංගප්පූරුවේදී හමුවිය.



*ට්‍රම්ප් ජනාධිපතිවරයා හා උතුරු කොරියාවේ නායක කිම් ජොන් උන් අතර හමුව*

ට්‍රම්ප් පරිපාලනය හා රුසියාව අතර සබඳතා පිළිබඳ විමසීමේදී, දෙවන ලෝක යුද්ධයෙන් පසු සීතල යුද්ධය (Cold War) ආරම්භ වූ දා සිට රුසියාව සමග ඇති සම්බන්ධයට වඩා බෙහෙවින් වෙනස් ප්‍රවේශයක් ගත්තේය. එනම්, රුසියාව සමග සබඳතාව වඩ වඩාත් තර විය. කෙසේවෙතත් ට්‍රම්ප් ජනාධිපතිවරණ ව්‍යාපාරයේදී පුටින් ප්‍රබල නායකයෙකු ලෙස ප්‍රශංසා කළේය.

මෙකී කරුණු කාරණා සම්බන්ධයෙන් විමසීමේදී ට්‍රම්ප්ගේ විදේශ ප්‍රතිපත්තිය එදා මෙදා තුර ඇමරිකානු දේශපාලන සන්දර්භයේ සිටි ජනාධිපතිවරුන් අනුගමනය කළ විදේශ ප්‍රතිපත්තීන්වලට හාත්පසින්ම වෙනස් ස්වභාවයක් ගත් ආකාරයත්, ඔහුටම අනන්‍ය වූ ප්‍රතිපත්තියක් මත නොපිහිටි එකක් බව ද පසක් වේ. තවද ගෝලීය සන්දර්භය තුළ බොහෝ දෙනා ට්‍රම්ප්ගේ මෙම ක්‍රියාකාරීත්වයන් විවේචනාත්මක ස්වරූපයකින් විමසයි. නමුත්, මොහුගේ මෙම ප්‍රයත්නයන් ජාත්‍යන්තර වශයෙන් ඇමරිකාවේ යහපැවැත්ම තීරණය කිරීමෙහිලා තීරණාත්මක කාර්යභාරයක් ඉටුකළ බව පසක් කළ යුතුමය.

## ගතහැකි ආදර්ශ

ඩොනල්ඩ් ජේ. ට්‍රම්ප් තුළින් ලෝකයාට ලබාගත හැකි ආදර්ශ රැසකි. ඔහු කුඩා කල සිටම තමා පිළිබඳ විශ්වාසයෙන් කටයුතු කළ පුද්ගලයෙකි. එම විශ්වාසය ඔහුව ලොවක් හඳුනන නායකයෙකු බවට පත් කළේය. ඔහු අවුරුදු විසිහතර පමණ වනවිටම තමාගේ පවුලේ ව්‍යාපාර භාරගැනීමට සමත්විණි. ඔහු තම මැතිවරණ ව්‍යාපාරය තුළදී, තමාගේ දේශපාලන ප්‍රතිපත්ති තුළින් රටේ බහුතර ජනතාවගේ ආකර්ශනය දිනා ගැනීමට සමත්විණි. ඔහු ඉස්ලාම් අන්තවාදය හා ත්‍රස්තවාදයට එරෙහි වීම, ඉරානය සමග න්‍යෂ්ටික ගිවිසුම් අවසන් කිරීම වැනි තමාගේ ප්‍රතිපත්ති නොබියව ප්‍රකාශ කළේය.

එක්සත් ජනපදයේ සතුරන්ගෙන් සමාව අයැදීමේ පුරුද්ද අවසන් කරන බවත් රටේ මිත්‍ර පාක්ෂිකයින් වෙනුවෙන් පමණක් පෙනී සිටින බවත්, ඔහු පැවසූයේ සැමවිටම ඔහුගේ ජාතිකවාදී, නිර්භය, ස්ථාවර හා නායකත්ව ගුණාංග මනාසේ පිලිබිඹු කරමින්ය. ඔහු සැබැවින්ම ඉතාමත් නිර්භීත පුද්ගලයකි. ඔහු ඕනෑම දෙයක් ඉතාමත් නිර්භීතව විවේචනය කළේය. තම දේශපාලන ව්‍යාපාරය තුළ ට්‍රම්ප් කියා සිටියේ තමා තේරී පත් වුවහොත් ඉස්ලාමීය රාජ්‍ය සම්බන්ධයෙන් තමාට වඩා දැඩි නොවන කිසිවෙකු නොසිටින බවයි.

ට්‍රම්ප් විශිෂ්ට සාකච්ඡාකරුවෙකු වන අතර විවිධ කර්මාන්ත සහ ව්‍යාපාර පිළිබඳ ඔහුගේ දැනුම සමඟ සම්බන්ධ වූ සංකීර්ණ ගනුදෙනු තේරුම් ගැනීමට ප්‍රසිද්ධය. ඔහුගේ ව්‍යාපාර ඔහු ලොව පුරා ව්‍යාප්ත කොට ඇත. එමෙන්ම ඔහු නොබියව සැම අවස්ථාවක්දීම අවදානම්වලට මුහුණදෙන පුද්ගලයෙකි. ඔහුගේ ව්‍යාපාර යම් යම් අවස්ථාවල විශාල ලෙස පාඩු ලැබුවද ඔහු කිසි කලෙකත් පසුබට වූයේ නැත.
එසේම, ට්‍රම්ප් යනු මූල්‍ය කළමනාකරණය පිළිබඳ මනා සේ දැනුමක් හා හැකියාවක් ඇති අයෙකි. ට්‍රම්ප් ඔහුගේ පියාගේ දේපළ වෙළඳාම් සහ ඉදිකිරීම් සමාගම පවරා ගැනීමෙන් පසු එයට නායකත්වය දුන් අතර එය පසුව "ට්‍රම්ප් සංවිධානය" ලෙස නම් කරන ලදී. එමෙන්ම ඔහු රූපවාහිනී නිෂ්පාදකයෙකු ද වන අතර වසර දහයකට ආසන්න කාලයක් මිස් යූ.එස්.ඒ (Miss. U.S.A) තරඟාවලි ක්‍රියාත්මක කොට ඇත. ඔහු ඉතාමත් ධෛර්යය සම්පන්න පුද්ගලයකි. ඔහුගේ " කවදාවත් අත් නොහරින්න" "Never Give up" ආකල්පය වඩාත් දැඩි විරුද්ධවාදීන් පවා බියට පත් කළේය. ජනාධිපති ධූරයේ පමණක් නොව ඔහුට පෞද්ගලිකව

එල්ල වන අභියෝග, නඩු සහ දෝෂාභියෝග ඇතුළු සියලු අභියෝගවලට ඔහු නොසැලී මුහුණ දුන්නේය. ඔහුගේ තවත් ආකර්ශනීය ගුණාංගයක් නම්, සන්නිවේදන විලාසයෙහි ඍජු බවයි. ඔහු නිතරම Twitter තුළින් තම ජනතාව හා ඍජුව සන්නිවේදනය කිරීමට පෙළඹිණි. ඔහු විසි එක් වන ශතවර්ෂය තුළ තම නාමය ලොව පුරා පතල කරමින් තමාගේ සාර්ථකත්වය දිනෙන් දින වර්ධනය කරමින් සමකාලීන ලෝකය තුළ ලොවටම ආදර්ශවත් පුද්ගලයෙකි.

## සාරාංශය

ඇමරිකානු කලාපයේ දේශපාලන සන්දර්භය දෙස බලන විට සුවිශේෂී පුද්ගල චරිතයක් ලෙස ඩොනල්ඩ් ට්‍රම්ප් හැඳින්විය හැකිය. ඇමරිකාව තුළ පමණක් නොව මුළු මහත් ලෝකයෙහිම ආන්දෝලනාත්මක කතාබහක් ඇති කිරීමට සමත් වූ ඩොනල්ඩ් ට්‍රම්ප් වරින් වර විවිධාකාර චරිතයන්ට පණ පෙවූ නායකයෙකි. විසි එක් වන සියවසේ ලොව දිනූ චරිත අතර ඩොනල්ඩ් ට්‍රම්ප් නාමය අප කා අතරත් ප්‍රචලිතය. ඔහුගේ දේශපාලනය පිළිබඳව කතා කිරීමේ දී ආරම්භයේ සිට ස්ථිර ප්‍රතිපත්තියක් නොතිබුණි. තවද එය කාලයෙන් කාලයට වෙනස් විය. එවකට ඇමරිකානුවන් දැරූ ජාතික අභිලාෂයන් සාධනය ඔහුගේ පරම අපේක්ෂාවක් වූ අතර විදේශ ප්‍රතිපත්තිය අතිශය දක්ෂ ලෙස මෙහෙයවමින් ට්‍රම්ප් ක්‍රියා කළේය. එකී සාධක අනුව විදේශ ප්‍රතිපත්තිය රටක ජාතික අභිලාෂවල දිගුවක් නම් එය සැබැවින්ම සාක්ෂාත් කළ නායකයෙකු ලෙස ට්‍රම්ප් හඳුන්වා දිය හැකිය.

ආන්දෝලනාත්මක වාග් විලාසය හා හැසිරීමේ රටාව තුළින් ජනතාව අතරට ගිය ට්‍රම්ප් යමක් කළ යුතු යැයි අදිටන් කළහොත් එම කරුණ දෙවරක් නොසිතා ක්‍රියාවට නැංවූවෙකි. කුඩා කාලයේ සිටම ඉගෙනීමෙහි අනෙක් දරුවන්ට වඩා ඉදිරියෙන් සිටි ට්‍රම්ප් බාධක රැසක් හමුවේ ලොව දිනූ නායකයෙක් වශයෙන් හඳුන්වා දිය හැකිය. තවද ඩොනල්ඩ් ට්‍රම්ප් මූල්‍ය කළමනාකරණය, ආර්ථිකය මෙහෙයවීම, දක්ෂ ගනුදෙනුකාරවරයකු මෙන්ම ප්‍රකෝටිපතියෙකි. ඒ තුළින් ඔහුගේ සාර්ථකත්වය දිනෙන් දින වර්ධනය කරගත් ආකාරයත් අපට හඳුනාගත හැකිය. මෙකී කරුණු ඔස්සේ ට්‍රම්ප් චරිතය පිළිබඳ විමසීමේදී අපට පසක් වන කරුණක් වන්නේ, ඔහු සමකාලීන දේශපාලන සන්දර්භය තුළ ආදර්ශමත් මෙන්ම පුරෝගාමී නායකයෙකු වන බවයි.

## මූලාශ්‍ර නාමාවලිය

Campani, G., Fabelo Concepción, S., Rodriguez Soler, A. and Sánchez Savín, C. (2022). The Rise of Donald Trump Right-Wing Populism in the United States: Middle American Radicalism and Anti-Immigration Discourse. Societies, 12(6), p.154.doi:https://doi.org/10.3390/soc12060154/ [Accessed 28 Dec. 2022].


Chappelow, J. (2021). Coronavirus Aid, Relief, and Economic Security (CARES) Act. [online] Investopedia. Available at: https://www.investopedia.com/coronavirus-aid-reliefand-economic-security-cares-act-4800707/ [Accessed 28 Dec.2022].

The White House (2021). Donald J. Trump | The White House. [online] The White House. Available at: https://www.whitehouse.gov/about-the-whitehouse/presidents/donald-j-trump/ [Accessed 03 Jan.2023].

Calmes, J. (2017). Donald Trump: Domestic affairs | Miller Center. [online] Miller Center. Available at: https://millercenter.org/president/trump/domestic-affairs/ [Accessed 10 Jan. 2023]

Dimock, M. and Gramlich, J. (2021). How America Changed During Trump’s Presidency. [online] Pew Research Center. Available at: https://www.pewresearch.org/2021/01/29/how-america-changed-during-donald-trumpspresidency/ [Accessed 10 Jan. 2023]

# ලෙස්ටර් බෝල්ස් පියර්සන් (Lester B. Pearson)



**කණ්ඩායම් සාමාජිකයන්**

- අයි. පී. වීරසිංහ
- එල්. ආර්. ඒ. දිල්ෂානි
- එම්. එම්. ගයන්ති
- ආර්.එස්.පී. රූපසිංහ
- ඩබ්. ඒ. එස්. ඩබ්. ඩී. විජේමාන්න

## හැඳින්වීම

තම ජීවිත කාලය තුළ විශිෂ්ට ජයග්‍රහණ රාශියක් අත්කර ගත් ලෙස්ටර් බෝල්ස් පියර්සන් දක්ෂ රාජ්‍ය තාන්ත්‍රිකයෙකු, විශිෂ්ට දේශපාලනඥයෙකු සේම, කැනේඩියානු ඉතිහාසයේ අද්විතීය නායකයෙකු ලෙස ප්‍රසිද්ධියට පත්විය. කැනේඩියානු දේශපාලනයේ අසහාය නායකයෙකු ලෙස ඔහු තම පාලන සමය දේශපාලන, ආර්ථික, සමාජීය යනාදී සෑම ක්ෂේත්‍රයකම කැපී පෙනෙන වර්ධනයක් ඇති කළේය. ලොව අනෙක් රටවල් සමඟ සහයෝගයෙන් සාමකාමී ලෙස තම රජය පාලනය කළ පියර්සන් සාමය ඉතා ඉහළින් පිළිගත් නායකයෙකු විය. ලොව ප්‍රබල රටවල්වල නායකයන්ගේ පවා නොමඳ ගෞරවයට පාත්‍ර වූ පියර්සන් එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ සභාපතිවරයා ලෙස කටයුතු කළ එකම කැනේඩියානු අගමැතිවරයා විය. ජාත්‍යන්තර කටයුතු පිළිබඳව බහුශ්‍රැතයෙකු වූ පියර්සන් එම අත්දැකීම් පාදක කරගනිමින් සූවස් ඇළ අර්බුදය වැනි, විසඳීමට නොහැකිව තිබූ ජාත්‍යන්තර අර්බුද විසඳීමට සාම දූතයෙකු ලෙස මැදිහත් වූයේය. ඔහු ඒ සඳහා දැක්වූ දායකත්වය කොතෙක් ද යත් ඔහුට සාමය සඳහා වූ නොබෙල් ත්‍යාගය ද හිමිවිය. දශක හතරක් පුරාවට ඔහුගේ රාජ්‍ය තාන්ත්‍රික සංවේදීතාව, දේශපාලන ඥානය, ඔහුගේ පෞද්ගලික ජනප්‍රියත්වය වර්ධනය කරන්නට මහත් පිටිවහලක් විය. එතෙක් මෙතෙක් කැනඩාවේ බිහි වූ දක්ෂතම අගමැතිවරයකු වූ මෙතුමා කැනඩාවේ දියුණුව වෙනුවෙන් කැපී පෙනෙන සේවාවක් ඉටු කළ නායකයෙකි. එය ඉතා ලෙහෙසියෙන් ළඟා කර ගත නොහැකි ජයග්‍රහණයක් වූ අතර ඒ සඳහා ඔහුට බොහෝ දේ සිදු කරන්නට විය. එවන් සේවාවක් ඉටුකළ ලෙස්ටර් බෝල්ස් පියර්සන් නම් අප්‍රතිහත නායකයාගේ ළමා කාලය, අධ්‍යාපනය, දේශපාලනයට පිවිසීම, නායකත්වය කරා ගිය ගමන් මඟ, එතුමා ඉන්පසුව සිදුකළ විවිධ සේවාවන්, ලෝකය සමඟ සබඳතා පැවැත්වීමට ඔහු ගෙනගිය ප්‍රතිපත්ති සහ මෙවැනි අසහාය නායකයෙකුගෙන් ගත හැකි ආදර්ශ පිළිබඳව මෙහි දී ගැඹුරු විශ්ලේෂණයක් සිදු කරයි.


## ළමා කාලය, අධ්‍යාපනය හා දේශපාලනයට පිවිසීම

රාජ්‍ය තාන්ත්‍රික සංවේදීතාව, දේශපාලන ඥානය සහ පෞද්ගලික ජනප්‍රියත්වය නිසා ම කැපී පෙනුණ විශිෂ්ට නායකයෙකු ලෙස ලෙස්ටර් බෝල්ස් පියර්සන් (Lester Bowles Pearson) හඳුනා ගත හැකිය. ඔහු කැනඩාවේ ටොරොන්ටෝහි (Toronto) 1897 අප්‍රේල් 23 වන දින උපත ලැබීය. එනම්, ඔන්ටාරියෝහි (Ontario) නිව්ටන්බෲක් (Newtonbrook) නම් ස්ථානයේදීය. මෙතෝදිස්ත ඇමතිවරයෙකු වූ එඩ්වින් ආතර් පියර්සන් (Edvin Arthur Pearson) ඔහුගේ පියා වූ අතර ඈන් සාරා බෝල්ස් (Anne Sarah Bowles) ඔහුගේ මව විය. වෝගන් වයිටියර් පියර්සන් (Vaughan Whitier Pearson) සහ මාර්මඩුක් පියර්සන් (Marmaduke Pearson) ඔහුගේ සහෝදරයෝ වූහ. පියර්සන්ට වයස මාසයක් පමණ වන විට ඔහුගේ පවුල යොන්ග් වීදිය (Yonge Street) වෙත පදිංචියට ගියහ. එසේම, ඔහුගේ පියා යොන්ග් වීදියේ අවුරෝරා මෙතෝදිස්ත දේවස්ථානයේ (Aurora Methodist Church on Yonge Street) ඇමතිවරයාව සිටි කාලයේ සිය පවුල ටොරොන්ටෝ නගරයට උතුරින් පිහිටි ඔන්ටාරියෝහි අවුරෝරා වෙත ගෙන ගියේය. පියර්සන්ට සිය ළමා අවධිය තුළ ඔවුන්ගේ වාසස්ථානය නිතර වෙනස් කිරීමට සිදු වූ බැවින්, දකුණු ඔන්ටාරියෝහි විවිධ ස්ථානවලින් විවිධ අත්දැකීම් ලබා ගැනීමට අවස්ථාව උදා විය. පියර්සන් ඔහුගේ ළමා කාලය අවුරෝරාහි ගත කළ අතර පල්ලිය වීදියේ පොදු පාසලෙන් සිය මූලික අධ්‍යාපනය ලබා ගත්තේය.



*පියර්සන්ගේ උපන් ස්ථානය පිළිබඳ සමරු ඵලකය*

පියර්සන්ගේ අධ්‍යාපනය පිළිබඳ අවධානය යොමු කිරීමේදී ඔහු වයස අවුරුදු 16 දී ටොරොන්ටෝ විශ්වවිද්‍යාලයේ වික්ටෝරියා විද්‍යාලයට (Victoria College) ඇතුළත් විය. නමුත්, 1914 දී කැනඩාව යුද්ධය ප්‍රකාශ කිරීමත් සමඟ පියර්සන් විශ්වවිද්‍යාලය විසින් අනුග්‍රහය දක්වන රෝහල් ඒකකයක සේවය සඳහා ස්වේච්ඡාවෙන් ඉදිරිපත් විය. ඒ අනුව, කැනේඩියානු හමුදා වෛද්‍ය බලකායට ඇතුළු වී වසර දෙකක් ඊජිප්තුවේ හා ග්‍රීසියේ ගත කළේය. පසුව, ඔහුව රාජකීය පියාසර බලකායට මාරු කළද, ගුවන් අනතුරකින් තුවාල ලබා එයින් ඉවත් වන්නට සිදුවිය. ඉන් අනතුරුව, ඔහු යුද්ධයේ ඉතිරි කාලය සඳහා පුහුණු උපදේශකයකු ලෙස සේවය කළේය. ඒ අතරතුර කාලයේ විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන කටයුතු කර ගෙන යාමට ද අමතක නොකළ අතර 1919 දී සිය උපාධිය ලබා ගත්තේය.



*පියර්සන් කැනේඩියානු හමුදා වෛද්‍ය බලකායේ සේවය කිරීම, 1916*

ඉන් අනතුරුව, වසර දෙකක මැසී පදනමේ (Massey Foundation) ශිෂ්‍යත්වයක් දිනා ගත් පියර්සන්ට 1921 සිට 1923 දක්වා ඔක්ස්ෆර්ඩ්හි ශාන්ත ජෝන් විද්‍යාලයේ (St John’s College) ඉගෙනීමට අවස්ථාව හිමි විය. එහිදී, ඔහු ඉතිහාසය ක්ෂේත්‍රය යටතේ උපාධිය හා ශාස්ත්‍රපති උපාධිය ලබා ගත්තේය. එසේම, මලල ක්‍රීඩාවෙන් ද විශිෂ්ටත්වයට පත් වූ ඔහු ලැක්‍රෝස්, අයිස් හොකී සහ බේස් බෝල් (Lacrosse, Ice Hockey and Baseball) යන ක්‍රීඩාවන්හි විශිෂ්ට දස්කම් දැක්වූයේය. බේස් බෝල් ක්‍රීඩාව තුළ දැක්වූ දක්ෂතාවය නිසාම ඔන්ටාරියෝ ඉන්ටර්කවුන්ටි බේස් බෝල් ලීගය (Intercounty Baseball League) සමඟ ක්‍රීඩා කිරීමට අවස්ථාව හිමි විය.

1924 දී පියර්සන් ටොරොන්ටෝ විශ්වවිද්‍යාලයේ ඉතිහාස අංශයේ කාර්ය මණ්ඩලයට එක් වුණේය. 1925 දී එම විශ්වවිද්‍යාලයේ ඔහුගේම ශිෂ්‍යාවක වූ විනිපෙග්හි (Winnipeg) වාසය කළ මේරියන් මූඩී (Maryon Moody) සමග විවාහ වූයේය. ඔවුන්ට ජෙෆ්‍රි (Geoffrey) සහ පැට්‍රීෂියා (Patricia) නමින් දරුවන් දෙදෙනෙක් විය. මේරියන් සිය සැමියාගේ දේශපාලන ප්‍රයත්නයන්වලදී ඔහුට සහයෝගය දැක්වූ අතර එය පියර්සන්ට සිය වැඩ කටයුතු කර ගෙන යාමට මහත් ශක්තියක් විය. 1927 දී කැනේඩියානු විදේශ සේවා ප්‍රවේශ විභාගයෙන් වැඩිම ලකුණු ලබා ගැනීමෙන් පසුව ඔහු විදේශ කටයුතු දෙපාර්තමේන්තුවේ පළමු ලේකම් තනතුර භාර ගත්තේය. අග්‍රාමාත්‍ය ආර්. බී. බෙනට් (R. B. Bennett), පියර්සන්ගේ දක්ෂතා හඳුනා ගැනීමෙන් පසුව 1931 දී ධාන්‍ය අනාගත පිළිබඳ රාජකීය කොමිසමට සහ 1934 දී මිල ව්‍යාප්තිය පිළිබඳ රාජකීය කොමිසමට ඔහුව පත් කළේය. 1935 දී ඔහු එක්සත් රාජධානියේ කැනඩාවේ කාර්යාලයට අනුයුක්ත කරන ලදී. ඒ අනුව 1939 සිට 1942 දක්වා දෙවන ලෝක යුද සමයේ දී කැනඩා හවුස්හි (Canada House) දෙවන අණදෙන නිලධාරියා ලෙස සේවය කළේය. පසුව, මාස කීපයකට ඔටාවා (Ottawa) වෙත පැමිණි පියර්සන් 1941 සිට 1942 දක්වා සහකාර උප ලේකම්වරයෙක් වූයේය.

1942 ජුනි මාසයේදී වොෂින්ටන් ඩී. සී. හි (Washington DC) කැනේඩියානු තානාපති කාර්යාලයට අමාත්‍ය උපදේශකයකු ලෙස පත්විය. දෙවන ලෝක යුද සමයේ වසර දෙකකට ආසන්න කාලයක් දෙවන අණදෙන නිලධාරියා ලෙස කටයුතු කළ ඔහු 1945 ජනවාරි 01 වන දින එක්සත් ජනපදයේ දෙවැනි කැනේඩියානු තානාපතිවරයා බවට පත් වූ අතර 1946 සැප්තැම්බර් මාසය දක්වා එම තනතුරේ කටයුතු කළේය. එක්සත් ජාතීන්ගේ සංවිධානය (United Nations) සහ උතුරු අත්ලාන්තික් ගිවිසුම් සංවිධානය (North Atlantic Treaty Organization) ස්ථාපිත කිරීමේ දී තම රට වෙනුවෙන් වැදගත් තැනක් හිමි කර ගත් මොහු, 1946 එක්සත් ජාතීන්ගේ සංගමයේ පළමු ලේකම් තනතුරට නිර්දේශ විය. නමුත් සෝවියට් සංගමය විසින් ඔහුව නිෂේධ කරන ලදී.

දෙවන ලෝක යුද්ධය අවසන් වූ විට කැනේඩියානු අගමැති මැකෙන්සි කිං (Mackenzie King) පියර්සන්ව තම රාජ්‍ය කටයුතුවලට සම්බන්ධ කර ගැනීමට උත්සාහ කළේය. නමුත්, දේශපාලන ක්‍රම කෙරෙහි ඔහු තුළ තිබූ අකමැත්ත නිසාවෙන් එයට එකඟ නොවීය.

## නායකත්වය කරා ගිය ගමන් මඟ

1963 දී පියර්සන් කැනඩාවේ ජනාධිපති වීම දක්වා ඔහුගේ ජීවිතය විමසා බලන විට පෙනී යන්නේ, ඒ සඳහා අවශ්‍ය පසුබිම ඔහුගේ තරුණ අවධියේ සිටම සකස් වූ බවයි. නායකත්වය කරා යන ගමන, ශක්තිමත් කළ ඔහුගේ ජීවිතයේ අවස්ථා ගණනාවක් හඳුනාගත හැකිය.

ආරම්භයේ දී අග්‍රාමාත්‍ය මැකෙන්සිගේ ආරාධනාව ප්‍රතික්ෂේප කළ ද 1948 දී ඔහුගේ පරිපාලනය අවසානයේ පියර්සන් ආරාධනය පිළිගත්තේය. මැකෙන්සි විසින් විදේශ කටයුතු අමාත්‍යවරයා ලෙස පත් කිරීමෙන් පසුව, පියර්සන් උතුරු ඔන්ටාරියෝහි (Northern Ontario) අල්ගෝමා (Algoma) නැගෙනහිර පැවති අතුරු මැතිවරණයකින් ජයග්‍රහණය කිරීමෙන් අනතුරුව පාර්ලිමේන්තුවට තේරීපත්විය. එහි දී ඔහුගේ නායකත්වය යටතේ කැනඩාව 1949 දී උතුරු අත්ලාන්තික් ගිවිසුම් සංවිධානයට සම්බන්ධ වූයේය. එහි පැවැත්ම සෝවියට් සංගමයේ ඕනෑම ආකාරයක ආක්‍රමණයක් අධෛර්යමත් කරනු ඇතැයි ඔහුගේ බලාපොරොත්තුව විය.

1950 දී කොරියානු යුද්ධය ආරම්භ වීමත් සමඟ පියර්සන් එම යුද්ධයේදී කොරියාවට සහය දැක්වීය. කැනඩාව එම යුද්ධයේදී ප්‍රධාන ක්‍රීඩකයා බවට පත් වූ බවද සඳහන් වේ. එම වසරේම, ඔහු පළමු බහුපාර්ශ්වික ජාත්‍යන්තර සංවර්ධන වැඩසටහන වන දකුණු සහ අග්නිදිග ආසියාවේ සමුපකාර ආර්ථික සංවර්ධනය සඳහා වූ කොළඹ සැලැස්මට (Colombo Plan for Cooperative Economic Development in South and Southeast Asia) දායක වීමට කැනේඩියානු රජය දිරිමත් කළේය.

1952 දී ඔහු එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ සභාපති ලෙස කටයුතු කළ අතර එහිදී ඔහු ඇමරිකාව සහ ආසියාවේ ප්‍රතිපත්ති විවේචනය කළේය. එසේම පියර්සන්ට කොමියුනිස්ට්වාදයේ ව්‍යාප්තිය පාලනය කිරීමට පවා අවශ්‍ය විය. නමුත්, 1955 ඔක්තෝම්බර් මාසයේ දී පියර්සන් ස්ටාලින්ගේ මරණයෙන් පසු සෝවියට් සංගමයට ගිය පළමු බටහිර විදේශ ඇමතිවරයා බවට පත්විය. එම සංචාරය අතරතුර, ඔහු නිකිටා කෘෂෙව් (Nikita Khrushchev) සමඟ සමීප කතාබහක යෙදීමටද අමතක නොකළේය.

1956 අගභාගයේ දී ඊශ්‍රායලය විසින් ඊජිප්තුව ආක්‍රමණය කළ අතර පසුව එක්සත් රාජධානිය සහ ප්‍රංශය ආක්‍රමණය කරන ලදී. මෙම ආක්‍රමණය පිළිබඳව එක්සත් ජනපදයට දන්වා නොතිබූ අතර සෝවියට් සංගමය බ්‍රිතාන්‍යයට සහ ප්‍රංශයට එරෙහිව පරමාණුක අවි භාවිත කරන බවට එහි දී තර්ජනය කළේය. තත්ත්වය ඉක්මනින් උත්සන්න වීමට පටන් ගත් අතර, එය තුන්වන ලෝක යුද්ධයක් වේ යැයි බියක් ඇතිවිය. එය නිසැකවම න්‍යෂ්ටික යුද්ධයක් වීමට තිබුණු හැකියාව ඉතාමත් වැඩිය. මෙම කාරණය සම්බන්ධයෙන් කිසිදු ජාතියකට ඔවුන්ගේ පෞරුෂත්වය නැති කර ගැනීමට අවශ්‍ය නොවූ අතර, සටන් කරන පාර්ශ්වයන් වෙන් කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ හදිසි බලකායක් කලාපයට යැවීමට පියර්සන් යෝජනා කළේය. මෙම සිදුවීමෙන් පියර්සන් වචනාර්ථයෙන්ම ලෝකය බේරා ගත් නායකයෙක් ලෙස ජාත්‍යන්තරයට එක් විය.

පියර්සන් කැනඩාවේ අගමැති බවට පත් වූ ගමන දෙස බලන විට, ඔහුට ජයග්‍රහණ සහ පරාජයන් දෙකම අත්විඳීමට සිදුවීම කැපී පෙනේ. පියර්සන් 1957 මහ මැතිවරණයට ඉදිරිපත් වූ නමුත් ජයග්‍රහණය කිරීමට අපොහොසත් විය. මෙම පරාජයෙන් අනතුරුව පියර්සන් කැනඩාවේ ලිබරල් පක්ෂයේ නායකයා ලෙස පත් විය. 1962 දී, පියර්සන් නැවතත් මහ මැතිවරණයට ඉදිරිපත් වී එම මැතිවරණයෙන් ද පරාජයට පත්විය.

අත් නොහැර තම අරමුණ කරා ගමන් කිරීම විශිෂ්ට නායකත්ව ලක්ෂණයකි. මෙම ලක්‍ෂණය පියර්සන්ගේ චරිතයේ බොහෝ තැන්වල දක්නට ලැබෙන අතර, ඔහු 1963 මහ මැතිවරණයටද ඉදිරිපත් වූයේ, මෙම නායකත්ව ලක්‍ෂණ පෙන්වමිනි. පියර්සන්ගේ උත්සාහයේ ප්‍රතිඵලයක් ලෙස 1963 මහ මැතිවරණය ඔහු ජයග්‍රහණය කළේය. එම ජයග්‍රහණයත් සමඟ හිටපු නායක ඩීෆෙන්බකර් (Diefenbaker)

පරාජයට පත් කිරීමට පියර්සන් සමත් විය. එම අවස්ථාවේ දී ඔහු විසින් සුළුතර බලයක් සහිත ආණ්ඩුවක් පිහිටවනු ලැබුවේය. 1965 මහ මැතිවරණයේ දී පියර්සන් නැවතත් සුළුතර ආණ්ඩුවකින් බලයට පත් විය.

ඔහුගේ පාර්ලිමේන්තු දිවිය පුරාවටම ඔහු උතුරු ඔන්ටාරියෝහි ඇල්ගොමා නැගෙනහිර ප්‍රදේශය නියෝජනය කළේය. බහු අපේක්ෂක මැතිවරණවලදී පවා ඔහු සෑම මැතිවරණයක්ම 50% කට වඩා වැඩි ඡන්ද ප්‍රමාණයකින් ජයග්‍රහණය කළේය. පියර්සන් මහජන මන්ත්‍රී මණ්ඩලයට තේරී පත්වීම සඳහා අට වතාවක් ඉදිරිපත් වූ අතර 1948 අතුරු මැතිවරණය, 1949, 1953, 1957, 1958, 1962, 1963 සහ 1965 යනාදී මැතිවරණ අටෙන්ම තේරී පත්විය. ඔහු දේශපාලනය තුළ කොතෙක් පරිණත නායකයෙක් ද යන්න එමගින් පැහැදිලි වේ.

## නායකත්වයට පැමිණීමෙන් පසු සිදුකළ සේවාව

පියර්සන් දේශපාලනට පිවිසීමෙන් පසුව සමාජ සුබසාධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, සහ සාමය සහ ජනවාර්ගික එකමුතුකම ප්‍රවර්ධනය කිරීම සඳහා විශේෂ අවධානයක් දුන්නේය. ඔහුගේ ලිබරල් සුළුතර ආණ්ඩුව කැනේඩියානුවන්ට "සාම සාධක, මානුෂීයවාදය සහ ජාත්‍යන්තර වගකීම පිළිබඳ හැඟීම" උරුම කර දුන්නේය. පියර්සන් විසින් කාන්තා තත්ත්වය පිළිබඳ රාජකීය කොමිසම සහ ද්විභාෂා සහ ද්වි සංස්කෘතිකවාදය පිළිබඳ රාජකීය කොමිසම යනා දී රාජකීය කොමිෂන් සභා ගණනාවක් ආරම්භ කරන ලදි. කාන්තාවන් සඳහා නීතිමය සමානාත්මතාවය ඇති කිරීම, කාන්තා තත්ත්වය පිළිබඳ රාජකීය කොමිසම (The Royal Commission on the Status of Women) මඟින් සිදුවිය. ක්විබෙග්හි (Kviberg) ප්‍රංශ කැනේඩියානුවන් අතර ඇති වූ ආරවුල්වලට ප්‍රතිචාර වශයෙන්, ඔහු විසින් ද්විභාෂා සහ ද්වි සංස්කෘතිකවාදය පිළිබඳ රාජකීය කොමිසම (Commission on Bilingualism and Biculturalism) හඳුන්වාදී කැනඩාව ද්විභාෂා රටක් බවට පත් කරන ලදී. පියර්සන්ගේ නිල කාලයෙන් පසු ප්‍රංශ භාෂාව රාජ්‍ය භාෂාවක් බවට පත් කරන ලද අතර, කැනේඩියානු රජය ඉංග්‍රීසි සහ ප්‍රංශ යන භාෂා දෙකෙන්ම සේවා සැපයිය යුතු වූ බැවින්, අගමැති අපේක්ෂකයන් සඳහා එම භාෂා දෙකම චතුර ලෙස කතා කිරීම, නිල නොවන අවශ්‍යතාවයක් විය. රජයේ

මෙහෙයුම්වලදී මැතිවරණ දිස්ත්‍රික්ක නැවත බෙදා හැරීම සහ ව්‍යවස්ථාදායක ක්‍රියා පටිපාටි ප්‍රතිසංස්කරණය කිරීම පියර්සන්ගේ තවත් එක් සේවාවකි.



*නව කොඩිය සම්බන්ධයෙන් ලෙස්ටර් බී පියර්සන්ගේ මාධ්‍ය සාකච්ඡාව, 1964 දෙසැම්බර්*

කැනඩාව පිළිගත් රතු සහ සුදු ධජය පියර්සන් විසින් හඳුන්වා දෙන ලදී. එම ධජය, මත භේදයකින් තොරව කැනඩාවේ සියලුම පුරවැසියන් නියෝජනය කරන ඔවුන්ගේ ඒකීයත්වය විදහා දක්වන සංකේතයක් විය. ඔහු අග්‍රාමාත්‍යවරයා ලෙස සිටියදී කැනේඩියානු විශ්‍රාම වැටුප් සැලැස්ම, පවුල් ආධාර වැඩසටහන, මහලු ආරක්ෂක ප්‍රතිලාභ පුළුල් කිරීම සහ ශිෂ්‍ය ණය හඳුන්වා දීම යනාදී සේවාවන් සිදු කළේය. විශ්‍රාම වැටුප් සැලැස්මේ දී දායකයින් විශ්‍රාම යන විට, ආබාධිත වූ විට හෝ මියගිය විට විශ්‍රාම වැටුප් සහ ප්‍රතිලාභ ලබාදී ඇත. එමෙන්ම, මූල්‍ය අවශ්‍යතා පෙන්නුම් කරන පශ්චාත්-ද්විතීයික අධ්‍යාපනය ලබන සිසුන් සඳහා පහසුවෙන් ප්‍රවේශ විය හැකි ණය ලබාදීම "ශිෂ්‍ය ණය වැඩසටහන (Student Loan Program)" හරහා සිදු විය. එපමණක් නොව, තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනය සඳහා ද රජයේ ආධාර ලබා දුන්නේය. මෙමඟින් දරිද්‍රතාවය සහිත සිසුන්ට හෝ ඔවුන්ගේ පවුල්වලට ඉක්මනින් මුදල් ලබාගත හැකි වූ අතර ඒ හරහා ඔවුන්ට ඉහළ වැටුප් සහ වෘත්තීය අවස්ථා සඳහා ප්‍රවේශයට වැඩි අවස්ථාවක් ලැබුණි.

කැනඩාවට සෘජු ආර්ථික, යුධ හෝ දේශපාලන මැදිහත්වීමක් නොතිබුණ ද, පියර්සන් සූවස් අර්බුදය විසඳීමට මැදිහත් වූයේ, "ඇති වූ යුද්ධයක් වැළැක්වීමට වඩා යුද්ධයක් ඇති වීම වැළැක්වීම වැදගත් වේ." (Peace is far more than ceasing to fire) යන පාඨය පෙරදැරි කරගෙනය. එබැවින්, ඔහු ලොව ප්‍රථම මහා පරිමාණ සාම සාධක හමුදාව යෝජනා කළේය. සාම සාධක නූතන සංකල්පයේ පියෙකු වන මොහු 1957 දී සූවස් ඇළ අර්බුදය විසඳීම සඳහා වූ නොබෙල් සාම ත්‍යාගය දිනාගත් අතර මෙමඟින් කැනඩාවට මහත් කීර්තියක් ලැබුණි. සූවස් අර්බුදය හැරුණු විට කොරියානු යුද්ධය, සයිප්‍රස් අර්බුදය සහ ඊශ්‍රායලය ජාතියක් ලෙස

ස්ථාපිත වූ පලස්තීන අර්බුදය ඇතුළු බොහෝ ගැටුම් විසඳීමට පියර්සන් නායකත්වය දුන්නේය.

1964 දී ආරක්ෂාව පිළිබඳ ධවල පත්‍රිකාව (White Paper on Defence) ඉදිරිපත් කළ අතර මෙමඟින් කැනේඩියානු රාජකීය නාවික, ගුවන් සහ යුද හමුදාව ඒකාබද්ධ කර කැනේඩියානු හමුදා නමින් තනි සේවාවක් සකස් කළේය. 1968 පෙබරවාරි 1 දින සිට එය ක්‍රියාත්මක විය. මොහු මෙඩිකෙයා පනත (Medicare pact) මගින් රෝහල් රක්ෂණ සහ රෝග විනිශ්චය සේවා පනතේ ප්‍රතිපත්තිය විශ්වීය සෞඛ්‍ය සේවාව දක්වා පුළුල් කළේය. මෙමඟින්, සියලුම රක්ෂිත පුද්ගලයින්ට පිටපත් කිරීමකින් තොරව රක්ෂිත සේවා ලබා ගැනීමට හැකි වූ අතර වෛද්‍යවරුන්ට තම සිතැඟි පරිදි මුදල් අය කළ නොහැකි වූ නිසා, සෞඛ්‍ය සේවයේ බංකොලොත්භාවය පාලනය විය.

පියර්සන් කැනඩාවේ බහුපාර්ශ්වික න්‍යාය පත්‍රය, නිදහස් වෙළෙඳාම, සමූපකාර ෆෙඩරල්වාදය සහ සුබසාධන රාජ්‍ය යනාදී අංශ සඳහා පදනම දැමුවේය. ඔහු පැය 40 වැඩ සතිය, සති දෙකක නිවාඩු කාලය සහ ෆෙඩරල්-නියාමනය කරන ලද ප්‍රදේශවල කම්කරුවන් සඳහා නව අවම වැටුපක් ද ස්ථාපිත කළේය. ඔහු විශ්‍රාම යාමට පෙර කැනඩාවේ සියවස් සැමරුම අධීක්ෂණය කිරීමට අමතක නොකළේය. මෙම සියලු සේවාවන් පිළිබඳ අවධානය යොමු කිරීමේදී පියර්සන්ගේ සේවාව " දරිද්‍රතාවයට එරෙහි යුද්ධයක් (War on poverty)" සහ සමාජ සමානාත්මතාවය ඇති කිරීමට ගත් උත්සාහයක් ලෙස අවබෝධ කරගත හැකිය.

# විදේශ ප්‍රතිපත්තිය



*ලෙස්ටර් බී. පියර්සන්, 1945 ඇමරිකා එක්සත් ජනපදයේ කැලිෆෝනියාවේ සැන් ෆ්‍රැන්සිස්කෝහි ජාත්‍යන්තර සංවිධානය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සමුළුවේ දී*

පියර්සන්ගේ විදේශ ප්‍රතිපත්තිය කෙරෙහි අවධානය යොමු කිරීමේ දී කැනේඩියානු ශ්‍රේෂ්ඨතමයින් ශ්‍රේණිගත කිරීමේ ලැයිස්තුවේ ඔහුට හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි. පියර්සන් ඔහුගේ විදේශ ප්‍රතිපත්තිය ඉතාමත් සාමකාමී එසේම සාමූහික ආරක්ෂාව අගය කරමින් සිදු කරගෙන ගිය වැදගත් නායකයෙක් විය. යුද්ධයට වඩා සාමය ඔහු වඩාත් විශ්වාස කළේය. බොහෝ අවස්ථාවල යුද්ධයන් ඇතිවීම වළක්වා එය සාමකාමී මාවතකට ගෙන ඒමට මොහු මැදිහත් වී කටයුතු කළේය.

1964 ජනවාරි 15 වැනි දින ප්‍රංශයේ නිල රාජ්‍ය සංචාරයක නිරත වූ ප්‍රථම කැනේඩියානු අගමැතිවරයා බවට පියර්සන් පත්විය. පියර්සන් 1965 ජනවාරි මාසයේ දී කැනඩාව සහ එක්සත් ජනපදය අතර මෝටර් රථ සම්බන්ධයෙන් ස්ථාපිත කරන ලද ගිවිසුම අත්සන් කළේය. එය කැනේඩියානු විදේශ ප්‍රතිපත්තිය තුළ සිදුකළ වැදගත් ද්විපාර්ශ්වික සහසම්බන්ධතාවයක් විය. එමඟින් දේශසීමා හරහා යන කාර්, ට්‍රක්, කොටස් සහ උපාංග සඳහා ගාස්තු ඉවත් කරන ලදී. මෙම මෝටර් රථ ගිවිසුම අත්සන් කිරීම විරැකියාව අඩු කිරීමට පවා හේතු වූ බව සඳහන් වේ. මෙය කැනඩාවට විශාල වශයෙන් වාසිදායක විය. එසේම, එය උතුරු ඇමරිකානු ආර්ථික ඒකාබද්ධතාවයට ද තුඩු දෙනු ලැබීය.

පියර්සන් කැනඩාවට සංක්‍රමණය කිරීම දිරිමත් කිරීම සඳහා වෙනස්කම්වලින් තොර ලකුණු පදනම් වූ ක්‍රමයක් හඳුන්වා දුන්නේය. මෙමඟින් කැනඩාවට පෙරට වඩා සංක්‍රමණිකයන් සංක්‍රමණය වන්නට විය. ඇමරිකාව සමඟ නිදහස් වෙළඳ ගිවිසුම

(Free Trade Agreement) ක්‍රියාත්මක කිරීමට පෙර එක්සත් ජනපදයට ඩොලර් බිලියන 100 ක කැනේඩියානු වෙළෙඳ භාණ්ඩ අපනයනය කළ අතර එය දළ දේශීය නිෂ්පාදිතයෙන් 19%කට වඩා අඩු ප්‍රමාණයක් විය. නමුත්, නිදහස් වෙළෙඳ ගිවිසුම ක්‍රියාත්මක කිරීමෙන් පසු වසර 15ක් තුළ 33% දක්වා වර්ධනය වී ඇත.

පියර්සන් තම විදේශ ප්‍රතිපත්තිය තුළ වියට්නාම් යුද්ධයට පවා ඔහුගේ දායකත්වය ලබා දීමට කටයුතු කළේය. 1965 අප්‍රේල් 2 වන දින ෆිලඩෙල්ෆියාහි ටෙම්පල් විශ්වවිද්‍යාලයේදී (Temple University in Philadelphia) වියට්නාම් යුද්ධය පිළිබඳව අදහස් ප්‍රකාශ කළ අතර එම අර්බුදයට රාජ්‍ය තාන්ත්‍රික විසඳුමක් දිග හැරෙන පරිදි උතුරු වියට්නාමයට ඇමරිකානු බෝම්බ හෙලීමේ විරාමයක් සඳහා ඔහුගේ සහාය ලබා දුන්නේය. යුද්ධය අතරතුර දී, කැනඩාවේ අපනයනය කරන ලද අමුද්‍රව්‍ය සහ සම්පත් වියට්නාම් යුද්ධයේ දී ඉතාමත් ප්‍රයෝජනවත් වූ  බව ද සඳහන් වේ.

නායකත්වයෙන් පසුව ද තම රටෙහි ජාතික අභිලාෂවලින් ඔබ්බට ගොස් ජාත්‍යන්තර සුභසාධනය උදෙසා පියර්සන් ඔහුගේ අත්දැකීම් ප්‍රයෝජනයට ගත් ආකාරයද ඉතා වැදගත් වේ. 1968 සිට 1969 දක්වා පියර්සන් ලෝක බැංකුව විසින් අනුග්‍රහය දක්වන ලද ජාත්‍යන්තර සංවර්ධනය පිළිබඳ කොමිසමේ (Commission on International Development) සභාපතිවරයා විය. 1970 සිට 1972 දක්වා ඔහු ජාත්‍යන්තර සංවර්ධන පර්යේෂණ මධ්‍යස්ථානයේ පාලක මණ්ඩලයේ (Board of Governors of the International Development Research Centre) පළමු සභාපතිවරයා බවට පත්විය. ඔහුට ලෝකයේ අනෙක් රටවල් සමඟ පහසුවෙන් ගණුදෙනු කිරීමට මේවායින් ලද පන්නරය හේතු සැපයුවේය.

මේ ආකාරයට පියසර්න් ඔහුගේ විදේශ ප්‍රතිපත්තිය තුළ සාමකාමී විදේශ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කළ ආකාරය ඉතා පැහැදිලි වේ. ලෝකයේ රාජ්‍යයන් සමඟ සමීප සබඳතා පවත්වා ගනිමින් තීරණාත්මක අවස්ථාවන්හිදී ඔහුගේ දායකත්වය ඒ ඒ රාජ්‍යයන්ට සූක්ෂම ලෙස ලබා දුන් ආකාරය විශිෂ්ට යැයි කිව හැකිය.

## ගත හැකි ආදර්ශ

කැනඩාවේ පමණක් නොව මුලු ලෝකයේම පිළිගැනීමට ලක් වූ සාර්ථකත්ව සහ ජයග්‍රහණ සමග ලෙස්ටර් බී. පියර්සන් ජාත්‍යන්තරය ජයගත් ප්‍රබල නායකයෙකු ලෙස ප්‍රචලිතය. ජාත්‍යන්තර ආරවුල්වල මැදිහත්කරුවකු ලෙස ප්‍රමුඛත්වය දරමින් 1957 දී සාමය සඳහා වූ නොබෙල් ත්‍යාගයෙන් පිදුම් ලැබූ ලෙස්ටර් බෝල්ස් පියර්සන් ජනහිතකාමී නායකයෙකු ලෙස සැමගේ ගෞරවාදරයට පාත්‍ර වූයේය. කුඩා කල පටන්ම දේශහිතෛෂී පුද්ගලයකු වූ පියර්සන් පළමු ලෝක සංග්‍රාමයේ දී විශ්වවිද්‍යාලය හැරගොස් හමුදා සේවයට බැඳුණේය. නමුත්, එකල ඔහු දැඩි ආත්ම විශ්වාසයකින් හෙබි තරුණයකු විය. එම නිසා ඔහුගේ අධ්‍යාපනය අතරමග නතර නොකොට එය මනාව ඉදිරියට පවත්වාගෙන ගියේය.

පියර්සන්ගේ දේශමාමකත්වය වඩාත් ඔප්නංවමින් කැනේඩියානු විදේශ සේවයට බැඳුණු අතර ඔහුගේ ජීවිතයේ වැදගත්ම අවධිය විදේශ රටවල රජයන් සමග වැඩ කිරීමට යොදවන ලදී. එකල එක්සත් ජනපදය සහ කැනේඩියානු තානාපති කාර්යාල සමග ඉතා දක්ෂ ලෙස සේවය කළ පියර්සන් 1948 දී ඔහුගේ නායකත්ව ගති ලක්ෂණ ඉස්මතු කරමින් දේශපාලනයට පිවිසියේ ලිබරල් පක්ෂය නියෝජනය කරමින්ය. එතැන් පටන් ඔහු ජනහිතකාමී නායකයෙකු ලෙස එක්සත් ජාතීන්ගේ සංවිධානය තුළ කැනඩාව නියෝජනය කළේය. ඔහුගේ කැපී පෙනෙන නායකත්ව ගති ලක්ෂණ හේතුවෙන් ඔහුට එම කාල වකවානුවේදී එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ සභාපති තනතුරටද හිමිකම් කීමට හැකියාව ලැබුණි. ඔහු ගැටුම් කළමනාකරණයට මනා දක්ෂයෙක් වූ අතර ඒ සඳහා ඔහුට උපතින්ම හිමි වූ හැකියාවක් තිබුණි. එය මනාව පිළිබිඹු කිරීමට ඔහුට හැකියාව ලැබුණේ කොරියානු යුද්ධයේ අවසානය සමතයකට පත් කිරීමට උදව් ලබා දීමෙනි. එපමණක් නොව, ඔහු එක්සත් ජාතීන්ගේ සංවිධානය තුළ මනාව ක්‍රියාත්මක වෙමින් මැදපෙරදිග සූවස් ඇළ අර්බුදය විසඳීමට මැදිහත් වූයේය.

ඔහුගේ චරිතයෙන් ගත හැකි තවත් ආදර්ශක් ලෙස, අපක්ෂපාතීව ගැටුම් නිරාකරණය සඳහන් කළ හැකිය. ඔහු නිරන්තරයෙන්ම සාමකාමී විදෙස් ප්‍රතිපත්තියක් ගෙනගිය අතර කැනඩාව සහ එක්සත් ජනපදය අතර සහයෝගිතා වැඩි දියුණු කිරීම මගින් එය තවදුරටත් පැහැදිලි වේ. ඔහු නිරතුරුවම ජනතාවගේ නායකයා ලෙස කටයුතු කළ අතර තම රජය යටතේ ජනතාවගේ සුභසිද්ධිය පතා

කටයුතු කළේය. පියර්සන් ජනතාවගේ ගැටලු සාධාරණව විමසා බැලූ අතර ඒ සඳහා සුදුසුම තීරණවලට එළඹුණේය. ඔහු ආදර්ශවත් නායකයෙකු ලෙස කැනඩාව තුළ ප්‍රසිද්ධියක් ඉසිලීමට මෙයද හේතු විය.

කැනඩාවේ ස්වාධීනත්වය ලොවට හඬගා කියූ පියර්සන්ගේ දේශහිතෛෂී නායකත්වය ලොවට මහත් ආදර්ශයකි. ඔහු තම රටට ආදරය කළ තමාගෙන් ඉටුවිය යුතු සියලු කාර්යයන් මනාව හඳුනාගෙන කටයුතු කළ පුද්ගලයෙකි. ඔහු කොතරම් කාර්යබහුල වුවද, එදිනෙදා ජීවිතය සැහැල්ලුවෙන් ගත කිරීමට ඉතාමත් කැමති පුද්ගලයකු ලෙස හැඳින්විය හැකිය. මන්ද, ඔහු බේස්බෝල් ක්‍රීඩාවේ දක්ෂයකු ලෙස කැපී පෙනුණි. ඔහු ක්‍රීඩා දිවිය හා දේශපාලන දිවිය සමබරව පවත්වාගෙන ගිය නායකයෙකි. ඔහු තම පෞද්ගලික නිදහස හා දේශපාලන ජීවිතය එකිනෙක පටලවා ගනිමින් අපහසු ජීවිතයක් ගෙවමින් කාලය ගත කළ පුද්ගලයෙකු නොවීය. ඔහුගේ චරිතය තුළින් ඉස්මතු වූ ආදර්ශයක් ලෙස එය පෙන්වා දිය හැකිය. කැනඩා ඉතිහාසයේ ඔහු තරම් ක්‍රීඩාවට ආදරය කළ වෙනත් අගමැතිවරයකු නොවීය.

පියර්සන්ගේ අප්‍රතිහත ධෛර්ය නායකයෙකුගෙන් ගතහැකි තවත් එක් ආදර්ශයකි. තම රජය වෙනුවෙන් අවැසි අවස්ථාවලදී සුදුසුම තීරණවලට එළඹෙමින් නායකත්ව ගති ලක්ෂණ ඉස්මතු කර ඇත. ඔහුගේ පැහැදිලි සහ ඍජු තීරණ ගැනීම පියර්සන්ගේ දේශපාලන සහ රාජතාන්ත්‍රික දිවිය ශක්තිමත් කිරීමට සමත්විය. පියර්සන් තුළ තිබූ නිවැරදි දැක්ම, ප්‍රඥාව, නොපසුබට උත්සාහය සහ ධෛර්යය ඔහුගේ සාර්ථකත්වයට පිය නගන මාවත සකසා දුන්නේය.

නිවැරදි මාර්ගවලට අවතීර්ණ වෙමින් ගෞරවණීය නාමයක් සහිතව කටයුතු කළ ලෙස්ටර් බී. පියර්සන් කැනඩා ඉතිහාසයේ මෙන්ම ගෝලීය ඉතිහාසයේ ද කැපී පෙනෙන චරිතයකි. පියවරෙන් පියවර ඉදිරියට පැමිණි පියර්සන් මෙම තනතුරු ලබා ගැනීමේදී ඔහුට පවුල් පසුබිම කිසිවිටෙකත් ගැටලුවක් නොවීය. පරාජය යන වචනය පිළිබඳ තැකීමක් නැති නායකයෙකු ලෙස ඔහු තම අභිලාෂ සහ අධිෂ්ඨාන පිළිබඳ නිරතුරුවම විශ්වාසය තැබුවේය. ලොව පුරා පැතිර ගිය ඔහුගේ පෞරුෂත්වය සහ වෘත්තිය ජයග්‍රහණ ඔහුගේ චරිතය වේගයෙන් ඉහළට ඔසවා තැබීමට හේතු විය. නමුත් කිසිවිටෙකත් බල තණ්හාව හෝ ධන තණ්හාව මත තම ජාතියට කිසිදු හානියක් නොකොට, ලෙස්ටර් බී. පියසන් නම් ජනහිතකාමී

නායකයා ලොවටම ආදර්ශ රසක් ලබා දෙමින් ජාත්‍යන්තරය තුළ අදටත් අමරණීය නායකයෙකු වේ.

## සාරාංශය

පස් වසරක් පුරාවට කැනේඩියානුවන්ගේ ජන හදවත් තුළ නොමැකෙන ලෙස සනිටුහන් වෙමින් ජනතාව වෙනුවෙන්ම උපන් සාම දූතයෙක් වූ ලෙස්ටර් බී. පියර්සන් කැනේඩියානු ඉතිහාසයේ අමරණීය නායකයෙකි. මොහු කැනඩාවේ පමණක් නොව මුළු ලෝකයේම පිළිගැනීමට ලක්වූ කැනේඩියානු ඉතිහාසයට රන් සලකුණක් වැනිය. පියර්සන්ගේ ජයග්‍රහණ අතරට රාජ්‍ය තාන්ත්‍රික ලෝකය තුළ ඔහුට පිළිගැනීමක් ලබා දුන් ශාස්ත්‍රීය ජයග්‍රහණ ද ඇතුළත් වේ. ඔහු දක්ෂ රාජ්‍ය තාන්ත්‍රිකයෙකු වූවා සේම නොබෙල් සාම ත්‍යාගලාභියෙකු වීමට තරම් වාසනාවන්තයෙකු විය. ලෝකයේ ගෞරවණීය නායකයෙකු වූ පියර්සන් කැනඩා ඉතිහාසයේ මෙන්ම ගෝලීය ඉතිහාසයේ ද කැපී පෙනෙන චරිතයකි. සාමය අගයන පවුල් පසුබිමකින් පැමිණි පියර්සන් ඔහුගේ අධ්‍යාපනය සේම වෘත්තීය ජීවිතය ඇදහිය නොහැකි මට්ටම් කරා වර්ධනය කළේය.

මෙතුමා 20 වැනි සියවසේ වඩාත්ම බලගතු කැනේඩියානු ජාතිකයා වන්නේ ඔහු සමාජ සුබසාධන වැඩසටහන්, සාමය සහ විවිධ ජනවාර්ගික ජාතියක එකමුතුකම ප්‍රවර්ධනය කිරීම හේතුවෙනි. ඔහුගේ අගමැති ධූර කාලය තුළ ඔහුගේ ලිබරල් සුළුතර ආණ්ඩුව කැනේඩියානු විශ්‍රාම වැටුප් සැලැස්ම, මෙඩිකෙයා සහ ශිෂ්‍ය ණය හඳුන්වාදීම හරහා සාමාන්‍යකරණය වූ දරිද්‍රතාවයට එරෙහි වැඩසටහන් ක්‍රියාත්මක කළේය. එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ සභාපතිවරයා ලෙස, සාම සාධක හමුදාවක් පිහිටුවීමේ ඔහුගේ විසඳුම අවසානයේ සූවස් ඇළ අර්බුදය විසඳා ඇත. ක්විබෙග්හි ප්‍රංශ කැනේඩියානුවන් අතර ඇති වූ ආරවුල්වලට ප්‍රතිචාර වශයෙන්, ද්විභාෂා සහ ද්වි සංස්කෘතිකවාදය පිළිබඳ රාජකීය කොමිසම හරහා අද වන විට කැනඩාව ද්විභාෂා ජාතියක් බවට පියර්සන් පත් කර ඇත.

එපමණක් නොව අද වන විටත් එතුමාගේ ප්‍රධානත්වයෙන් නිර්මාණය වූ කැනඩාවේ ජාතික ධජය, ජාති, භාෂා, විශ්වාසය හෝ මත භේදයකින් තොරව කැනඩාවේ සියලුම පුරවැසියන් නියෝජනය කිරීම ඔහු ලද ජයග්‍රහණයකි. පියර්සන්

නම් වූ අසහාය නායකයා එදා මෙදාතුර කැනේඩියානුවන්ට සාම සාධක උරුමයක් ලබා දුන්, කැනේඩියානුවන් තුළ මානුෂීයවාදය සහ ජාත්‍යන්තර වගකීම පිළිබඳ දැඩි හැඟීමක් ඇතිකළ දේශහිතෛෂී නායකයෙකු ලෙස සදා අමරණීය වනු ඇත.

## මූලාශ්‍ර නාමාවලිය

Anderson, W., 2020.*Lester B Pearson:Biography& Prime minister.* [Online] Available at: https://schoolworkhelper.net/lester-b-pearson-biography-prime-minister/
[Accessed 12 January 2023].

Bothwell, R., Bruin, T. D. & Mclntosh, A., 2011. *Lester B. Pearson.* [Online]
Available at: https://www.thecanadianencyclopedia.ca/en/article/lester-bowlespearson.
[Accessed 15 December 2022].

Gellman, P., 1989. Lester B Pearson, Collective Security, and the world order tradition of Canadian Foreign Policy. *Sage Publications,* 44(1), pp. 68-101.

Gellman & Stuart, P., 1987.*Lester B Pearson,Canadian Foreign Policy And the Quest for world order.* [Online] Available at: https://www.google.com/url?sa=t&source=web&rct=j&url=https://search
[Accessed 24 January 2023].

Hillmer, N. & Azzi, S., 2013. *Evaluating Prime-Ministerial performance: The Canadian Experience.*s.l.:Oxford University Press.

IMDB, 1990.*Lester B Pearson.* [Online] Available at: https://www.imdb.com/name/nm0669321/bio
[Accessed 3 January 2023].


Lafrenie, M., 2017.*A diplomat,a prime minister, and a scholar : remembering Lester B.Pearson.* [Online]
Available at: https://thediscoverblog.com/2017/12/27/a-diplomat-a-prime-ministerand-a-scholar-remembering-
[Accessed 20 January 2023].

Lecture, N., 1957.*Lester Bowles Pearson.* [Online]
Available at: https://www.nobelprize.org/prizes/peace/1957/pearson/lecture/.
[Accessed 22 January 2023].

Option, P., 2003.*The Best Prime Minister of the last Fifty years - Pearson , by a landslide.* [Online]
Available at: https://policyoptions.irpp.org/magazines/the-bestpms-in-the-past-50-years/the-best-prime-minister-of-
[Accessed 1 January 2023].

Options, P., 2003.*Windows of opportunity: Social reform under Lester B. Pearson.* [Online]
Available at: https://policyoptions.irpp.org/magazines/corporate-governance/windowsof-opportunity-social-
[Accessed 20 January 2023].

# පියැර් තෲඩෝ (Pierre Trudeau)



**කණ්ඩායම් සාමාජිකයන්**

- කවිෂි ඉමායා සුරවීර
- සුභානි වික්‍රමසිංහ
- දේශානි බණ්ඩාර
- කවිත්‍රා ගයාශිනි
- කල්හාරි මදුවන්ති

## හැඳින්වීම

ගතානුගතික දේශපාලන න්‍යායපත්‍රවලින් ඔබ්බට ගොස් නව ප්‍රගතිශීලී අදහස් ඔස්සේ රට තුළ සාමය ස්ථාපිත කරලීම උදෙසා දුෂ්කර, අභියෝගාත්මක එනමුත් සාර්ථක යාත්‍රාවක නිරත වූ අසහාය දේශපාලන පෞරුෂයක් වශයෙන් කැනඩාවේ (Canada) හිටපු අගමැති පියැර් තෲඩෝ (Pierre Trudeau) පෙන්වා දිය හැකිය. 1960 දශකයේදී සක්‍රීය දේශපාලනයට පිවිසි ඔහු, ඊට අවශ්‍ය පසුබිම පාසල් වියේ සිටම ක්‍රමයෙන් සකසා ගන්නා ලද අතර ඔහු දෙවරක්ම එරට අගමැති ධූරයට පත්වීම තුළ ඔහුගේ දේශපාලන පරිණතභාවය මොනවට ප්‍රකට වේ.

ස්වභාවයෙන්ම විප්ලවවාදී අදහස් දැරූ ලිබරල්වාදී දේශපාලනඥයෙක් වූ පියැර් තෲඩෝගේ දේශපාලන ආගමනය කැනඩාව කෙරෙහි ධනාත්මක බලපෑම් ඇති කරන්නට සමත්වූයේ, ඔහු සතු කාලෝචිත දේශපාලන ප්‍රතිසංස්කරණ මෙන්ම මානව හිතවාදී ගුණාංග යන සියල්ල එක ලෙස ඉවහල් වීම හේතුවෙනි. පියැර් නාමය ජාතික සහ ජාත්‍යන්තර ප්‍රජාව අතර සාම හිතෛශී නායකයෙකු ලෙස පැසසුමට ලක්වීමට ඔහු තම අගමැති සමයේදී කැනේඩියානු රාජ්‍ය තාන්ත්‍රිකත්වය ගෙනගිය ආකාරය හේතුවිය. වසර දහයක පමණ කාලයක් පුරා එකල ලෝකයේ පැවති අර්බුදවලට සෘජුවම සම්බන්ධ වූ ලෝකයේ සුපිරි බලවතා වීමට ප්‍රබල ප්‍රයත්නයක් දරමින් සිටි ඇමරිකාව වැනි අති බලවත් රාජ්‍යයක අසල්වැසියා වීම තුළ භූ-දේශපාලනික වශයෙන් තීරණාත්මක තත්ත්වයක සිටි කැනඩාව වැනි රටකට එම බල කඳවුරු සටනේ ගොදුරක් වීමට ඉඩ නොදී, ස්වාධීන ප්‍රතිපත්තියක් තුළ සිටිමින් සිය නායකත්වය මෙහෙයවීමට පියැර් සමත් විය.

සහජයෙන්ම පියැර් සතුව ඉහළ නායකත්ව සහ සංවිධාන හැකියාවන්ගෙන් යුත් චරිත ලක්ෂණ තිබූ අතර ඔහුගේ අධ්‍යාපනය, විශේෂයෙන්ම විදේශ රටවල විශ්වවිද්‍යාලවලින් ලත් උසස් අධ්‍යාපනය, නීතිය සහ දේශපාලනය පිළිබඳව ඔහු කාලයක් තිස්සේ රැස්කරගත් හසල දැනුම, ඔහුව කැනේඩියානු ඉතිහාසයේ විශිෂ්ට ගණයේ දේශපාලන පෞරුෂයක් බවට පත්කරන්නට හේතු කාරණා සැපයීය. එවන් වූ අග්‍රගණ්‍ය දේශපාලන නායකයෙකුගේ ළමා කාලය, අධ්‍යාපනය, දේශපාලන ආගමනය, නායකත්වය කරා ගිය ගමන, නායකයෙකු ලෙස ඔහු ඉටුකළ සේවාව හා ඔහු සිය රටේ ජාතික අභිලාෂ සාක්ෂාත් කරගැනීම උදෙසා අනුගමනය කරන ලද විදේශ ප්‍රතිපත්තීන් සහ අවසානයේ මෙවැනි අද්විතීය නායකයෙකුගේ චරිතයෙන් ගත හැකි ආදර්ශ මෙහිදී විචාරාත්මකව විමසා බැලේ.

## ළමා කාලය, අධ්‍යාපනය, හා දේශපාලනයට පිවිසීම

**ළමා කාලය**

පියැර් එලියට් තෲඩෝ 1919 ඔක්තෝම්බර් 18, කැනඩාවේ මොන්ට්‍රියෙල් (Montreal) හිදී චාල්ස්-එමිල් තෲඩෝ (Charles-Émile Trudeau) සහ ග්‍රේස් එලියට් (Grace Elliott) යන දෙමව්පියන්ට දාව උපත ලැබීය. පියැර්ගේ පියා ප්‍රංශ කැනේඩියානුවෙක් වූ අතර ධනවත් ව්‍යාපාරිකයෙක් ද විය. පියැර්ගේ මව වන ග්‍රේස් එලියට් සමෘද්ධිමත් මොන්ට්‍රියෙල් පවුලකින් පැවත එන්නියකි. චාලි සහ ග්‍රේස් ඉක්මනින් විවාහ වූ අතර ඔවුනට දරුවන් දෙදෙනෙක් ලැබුණි. 1918 දී සුසෙට් (Suzette) ඔවුන්ගේ පළමු දරුවා ලෙස උපන් අතර ඉන් පසුව, 1919 දී පියැර් තෲඩෝ මෙලොව උපත ලබන්නේ තෲඩෝ යුවලගේ දෙවන දරුවා වශයෙනි. පසුව ඔවුන් තවත් දරුවකු හදාවඩා ගැනීමට ගත්හ. ඔහු ටිප් (Tip) නමින් හැඳින්විණි.



*පියැර් තෲඩෝ ළමා අවධියේදී*

1920 අවසානය වන විට මෙම පවුල ඌත්‍රමොන්ත් (Outremont) සිට වෙනත් නගරයකට පදිංචියට ගිය අතර එතැන් පටන් 1948 දී සසෙක්ස් ඩ්‍රයිව් (Sussex Drive) හි අගමැති නිවසට යන තෙක් පියැර්ගේ ළමා කාලය ගතවූයේ සහ ඔහු හැදී වැඩුණේ ඔවුන් එලෙස පදිංචියට ගිය මහල් නිවාස සංකීර්ණයේය. කෙසේ වෙතත් පියැර්ගේ පියා දක්ෂ මෝටර් රථ ව්‍යාපාරිකයෙකු වූ අතර ඔහුගේ පියා දැඩි ලෙස ආදරය කළ දරුවා වූයේ ද පියැර්ය. එමෙන්ම, තම පියාගේ හැකියාවන්

පියැර් තෲඩෝ සතුව ද දායාදයක් ලෙස එලෙසම පැවතුණි. 1935 වසරේ තම පියාගේ අභාවය පියැර්ට දැඩි ලෙස බලපාන ලදි.

**අධ්‍යාපනය**

පියැර් තෲඩෝගේ අධ්‍යාපනය සම්බන්ධව සාකච්ඡා කිරීමේදී ඔහුගේ පියා සතුවූ ධාරණ ශක්‍යතාව ඔහු තුළද එලෙසින්ම පැවතීම හේතුවෙන් ඔහු වැඩි වැඩියෙන් ඉංග්‍රීසි භාෂාව ඉගෙන ගැනීමට යොමු විණි. ඔහු දක්ෂ සහ ක්‍රියාකාරී ලෙස ඉංග්‍රීසි භාෂා පුහුණු පාසල (English-Speaking Home) සහ ඉංග්‍රීසි භාෂාව කතා කරන මොන්ට්‍රියෙල් ව්‍යාපාරික පන්තිය සමඟ නිරන්තරයෙන්ම සම්බන්ධ විය. පියැර්, උෟත්රමොන්ත්හි ද්වි භාෂා ඇකඩමියේ ඉංග්‍රීසි භාෂාවෙන් පන්තිද ආරම්භ කළ අතර ප්‍රංශ භාෂාව හැදෑරීම සඳහා ඔහුගේ පියා විසින් 1932 දී ජේසුයිට්ස්ගේ නව විද්‍යාලයට (Jesuits' New Collège Jean-de-Brébeuf) ඔහුව ඇතුළත් කරන ලදි.

පාසල් කාලයේදීම ඔහු පුවත්පත්කරණයට යොමු වූ අතර විද්‍යාලයේ අවසන් වසරේදී (1939-1940 කාලයේදී) බ්‍රෙබියු (Brébeu) නම් පාසල් පුවත්පත සංස්කරණය කළ අතර, ඔහු පුවත්පත් හරහා ඉදිරිපත් කළ විවේචනාත්මක අදහස් විද්‍යාලයේ පරිපාලනයට අභියෝගයක් විය.

පාසල් අධ්‍යාපනයෙන් අනතුරුව, ඔහු අනිවාර්ය කැනේඩියානු නිළධාරීන්ගේ පුහුණු බලකායට ඇතුළත් විය. ඉන් අනතුරුව, කොලාජ් ෂොන් ද බ්‍රෙබෆ් (Collège Jean-de-Brébeuf) සහ මොන්ට්‍රියෙල් විශ්වවිද්‍යාලයේ නීති පීඨයේ උපාධි පාඨමාලා හැදෑරුවේය. එමෙන්ම, ඔහු හාවඩ් විශ්වවිද්‍යාලය (Harvard University), පැරිස් විශ්වවිද්‍යාලය (Paris University) සහ London School of Economics යන උසස් අධ්‍යාපන ආයතනයන්ට ඇතුළත්ව දේශපාලන-ආර්ථික විද්‍යාව හැදෑරුවේය. ඔහු තම තාරුණ්‍යයේ දී දීර්ඝකාලීන මිතුරෙකු වූ ජැක් කොබේ (Jack Corbett) ද සමඟ ඔවුන්ගේ අත්දැකීම් පිළිබඳව පුළුල් ලෙස ලියන ලදි.

පාසල් කාලයේ පටන්ම පියැර් විප්ලවවාදියෙකු විය. 1950 දී පියැර් විසින් ක්වෙබෙක් (Quebec) හි යූනියන් නැෂනල් පාලනයට විරුද්ධ වූ "free city" නමින් සමාජ ප්‍රතිසංස්කරණ සඟරාවක් ආරම්භ කරන ලදි. ඔහු "Two Innocents

in Red China" (රතු චීනයේ අහිංසකයන් දෙදෙනෙකු-1961) සහ "Federalism and the French Canadians" (ෆෙඩරල් වාදය සහ ප්‍රංශ කැනේඩියානුවන්-1968) යනුවෙන් පොත් කිහිපයක්ම රචනා කරන ලදි.

**දේශපාලනයට පිවිසීම**

පියැර් තෲඩෝ යනු, කැනේඩියානු ජාතික නීතීඥයෙක්, ලේඛකයෙක්, විශ්වවිද්‍යාල මහාචාර්වරයෙක් සහ දේශපාලඥයෙක් වේ. ඔහු 1950-1951 දී අගමැති උපදේශක කාර්යාලයේ (Privy Council) උපදේශකයෙක් ලෙස ඔටාවා (Ottawa) හි කෙටි කාලයක් සේවය කළේය. ඉන්පසු, ඔහු නැවත මොන්ට්‍රියෙල් වෙත පැමිණියේ ය. ඔහු ක්වෙබෙක්හි මොරිස් ඩුප්ලෙසිස්ගේ යූනියන් නැෂනල් රජයට (Union Nationale Government of Maurice Duplessis) විරුද්ධ වූ අතර සමාජ හා දේශපාලන වෙනසක් උදෙසා උද්ඝෝෂණ කළේය. පියැර්ගේ මෙම ක්‍රියාකලාපය හේතුවෙන් ඔහු රැඩිකල් සමාජවාදියෙකු ලෙස සමාජයේ ප්‍රචලිත වන්නට විය. ඔහු විසින් ඉදිරිපත් කළ සාරධර්ම, ලිබරල්වාදයට හා ප්‍රජාතන්ත්‍රවාදයට සමීප විය.

1952 දී පියැර්, මොනිට්‍රියෙල් හි කම්කරු නීති පරිචයක් විවෘත කළේය. 1960 වන විට ඔහු මොන්ට්‍රියෙල් විශ්වවිද්‍යාලයේ නීති පීඨයට සම්බන්ධ විය. පියැර් තෲඩෝගේ දේශපාලන ගමන්මගට මෙලෙස පෙරහුරුකම් වැටෙද්දී 1965 දී ඔහුට ෆෙඩරල් ලිබරල් පක්ෂයේ සාමාජිකත්වය ලැබිණි. පියැර් "නව රැල්ල" (New Wave) ලෙස පාර්ලිමේන්තුවට තේරී පත්විය.

## නායකත්වය කරා පැමිණි ගමන් මග

පියැර් තෲඩෝගේ දේශපාලන ගමනේ හැරවුම් ලක්ෂය වූයේ, 1965 දී ෆෙඩරල් ලිබරල් පක්ෂයට (The Federal Liberal Party) සම්බන්ධ වීමයි. ඔහු වෘත්තීය සමිති නායක ෂොන් මෂොන් (Jean Marchand) සහ මාධ්‍යවේදී ෂෙරාඩ් පිලෙතිය(ර්) (Gérard Pelletier) සමඟ එම පක්ෂයට බඳවා ගන්නා ලදී. පියැර් පාර්ලිමේන්තුවට තේරී පත් වූයේ ප්‍රබල මැතිවරණ දිස්ත්‍රික්කවලින් එකක් වූ මවුන්ට් රෝයල් (Mount Royal) නගරයෙනි. පසුව, ඔහු අගමැති ලෙස්ටර් පියර්සන්ගේ (Lester Pearson) පාර්ලිමේන්තු ලේකම් ලෙස පත් කරන ලදී.

ලිබරල් පක්ෂයේ නැගී එන නායකයෙක් වූ පියැර්ව 1967 දී අධිකරණ අමාත්‍යවරයා ලෙස පත්කරන ලදී. මෙම භූමිකාවේදී ඔහු එරට එතෙක් පැවති ගබ්සාව, සමලිංගිකත්වය සහ ලොතරැයි (Public lotteries) පිළිබඳ නීති ලිහිල් කිරීම මෙන්ම, දික්කසාද නීතිය ප්‍රතිසංස්කරණය කිරීම උදෙසාද, අපරාධ නීති සංග්‍රහය සංශෝධනය කිරීම හේතුවෙන් ජාතික අවධානය දිනා ගත්තේය. ඔහු ක්වෙබෙක්හි ජාතිකවාදී ඉල්ලීම්වලට එරෙහිව ශක්තිමත් ෆෙඩරල් ආණ්ඩුවක ආරක්ෂකයෙකු ලෙස කීර්තියක් ලබා ගැනීමට සමත් විය.



*පියැර් තෲඩෝ 1968 දී ලිබරල් පක්ෂයේ නායකත්වය දිනාගත් අවස්ථාව*

"ජනතාවගේ පෞද්ගලික ජීවිතයට අනවශ්‍ය අතපෙවීම් කිරීමට රාජ්‍යයට හෝ දේශපාලන අධිකාරියට අයිතියක් නැත." ("There is no place for the state in the bedrooms of the nation") යන පියැර් විසින් ලබා දුන් තර්කය, කැනඩාවේ නව ලිබරල් යුගයේ පිබිදීම පිළිබඳව මනාව පැහැදිලි කරන්නක් විය.

පියැර් 1968 දී ලිබරල් පක්ෂයේ නායකත්වය දැරීමට තීරණය කරන ලදී. ඔහු තරග කරන ලද සිව්වන මැතිවරණයෙන් පාර්ලිමේන්තුවට තේරී පත් විය. 1968 ජූනි 25 වන දින මහා මැතිවරණය ජයග්‍රහණය කිරීමෙන් පසු, "තෲඩෝමේනියාව" (Trudeaumania) යන සංකල්පය ආධිපත්‍යය දැරූ මහමැතිවරණයෙන් ඔහුගේ ආණ්ඩුව ආසන 153 (249න්) ක් සහ ජනප්‍රිය ඡන්දවලින් සියයට 45.37ක් ලබාගෙන විශාල ජයග්‍රහණයක් ලැබීමට සමත්විය. 1968 අප්‍රේල් 20 වන දින ඔහු කැනඩාවේ 15 වැනි අගමැති ලෙස දිවුරුම් දුන්නේය. විලියම් ලයන් මැකෙන්සි කිං (William

Lyon Mackenzie King) සහ ශ්‍රීමත් ජෝන් ඒ. මැක්ඩොනල්ඩ් (Sir John A.Macdonald) යන අගමැතිවරුන් දෙදෙනා හැරුණු කළ, කැනේඩියානු ඉතිහාසය තුළ ඉහළම ජනතා ප්‍රසාදය දිනාගෙන අගමැති ධූරයට පත්වූ පුද්ගලයෙකු ලෙස පියැර් තෲඩෝ ඉතිහාසගත වේ.

## නායකත්වයට පැමිණීමෙන් පසු සිදුකළ සේවාව

කැනඩාවේ පහළොස්වන අගමැතිවරයා ලෙස සිය ධූර කාලය ආරම්භ කළ පියැර් තෲඩෝ වසර දහයකට අධික කාලයක් කැනේඩියානු අගමැතිවරයා වශයෙන් සේවය කළේය (පළමු ධූර කාලය (1968-1979), දෙවන ධූර කාලය (1980-1984)). ඔහු කැනේඩියානු ඉතිහාසයේ විශිෂ්ට සේවාවක් කළ අගමැතිවරයෙකු ලෙස හැඳින්විය හැකිය. 1979 දී ඔහුගේ අග්‍රමාත්‍ය ධූරය අහිමි වූ අතර, මාස කිහිපයක් විපක්ෂ නායක ලෙස කටයුතු කළ ඔහු ඊළඟ වර්ෂයේ (1980) නැවත බලයට පත්විය. කැනඩාවේ ස්වෛරීත්වය ලබා ගැනීමට විශාල සේවාවක් කළ පියැර් තෲඩෝට විශාල අභියෝග ගණනාවක් මධ්‍යයේ තම රාජ්‍ය මෙහෙයවීමට සිදුවිය.

**සමාජීය හා දේශපාලන සේවාව**

ජාතිකවාදයේ තියුණු විවේචකයෙකු වූ පියැර් තෲඩෝ විසින් සිදු කළ වැදගත් සේවාවක් වන්නේ, 1960 රාජ්‍ය භාෂා පනත (Official Language Act) සම්මත කිරීමයි. මෙම රාජ්‍ය භාෂා පනත මගින් ඉංග්‍රීසි හා ප්‍රංශ භාෂාවන්ට සමානාත්මතාවයක් ලබාදී, රාජ්‍ය නිල භාෂාවන් වශයෙන් පිළිගත් අතර මෙය එරට පැවති ප්‍රංශ-කැනේඩියානු ජාතික වාදය දුර්වල කිරීමටද හේතුවක් විය. එමෙන්ම මෙම පනත බලාත්මක කිරීම හරහා, කැනේඩියානු පුරවැසියන් හට තමන් කැමති භාෂාවක් භාවිත කිරීමටද අවස්ථාව හිමි විය.


ඉන් අනතුරුව, පියැර් විසින් 1970 ඔක්තෝම්බර් අර්බුදය වැළැක්වීමට කටයුතු කිරීම හා ත්‍රස්තවාදයට එරෙහිව ක්‍රියාකිරීමද දේශපාලකයෙකු වශයෙන් ඔහු සිදුකළ වැදගත් සේවාවන් වේ. 1970 ඔක්තෝම්බර් 5 වන දින බ්‍රිතාන්‍ය වෙළඳ කොමසාරිස්වරයකු වූ ජේම්ස් රිචඩ් (James Richard) සහ බ්‍රිතාන්‍ය අගමැතිවරයෙකු වූ පියැර් ලැපොත් (Pierre Lapotte) යන දෙදෙනාව ත්‍රස්තවාදී කණ්ඩායමක් විසින් පැහැර ගන්නා ලදී. ත්‍රස්තවාදය තුරන් කිරීම සඳහා පියැර්

විසින් යුධ නීතිය භාවිත කළ ද පියැර් ලැපොත් අමාත්‍යවරයාව ත්‍රස්තවාදීන් විසින් ඝාතනය කරන ලදී. ඔහු විසින් 1980 හදිසි යුධ නීතිය ගෙනාවේය. ඔහු සමාජ සාධාරණත්වය අපේක්ෂා කළ නායකයෙකි.

1982 දී නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් හඳුන්වාදීම හා ප්‍රකාශයට පත්කිරීම කැනේඩියානු ඉතිහාසයේ වැදගත් අවස්ථාවකි. එයට කැනේඩියානු අයිතිවාසිකම් හා නිදහස පිළිබඳ ප්‍රඥප්තියක්ද ඇතුළත් විය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කැනඩාවේ උත්තරීතර නීතියක් බවටත්, එක්සත් රාජධානියෙන් රටේ නිදහස සුරක්ෂිත කිරීමටත් ඔහු ක්‍රියාකරන ලදී. මෙම ප්‍රඥප්තියට කැනේඩියානු ආදිවාසීන්ගේ නිදහස හා මානව අයිතිවාසිකම් පිළිබඳ වගන්තීන් අන්තර්ගත කොට තිබීමද විශේෂත්වයකි. ඒ අනුව, ඔහු විශාල දේශපාලනික සේවාවක් කළ රාජ්‍ය නායකයෙකු ලෙස ඉතිහාසගත වී ඇත.

**ආර්ථික සේවාව**

පියැර්ගේ ධූර කාලය කැනේඩියානුවන්ට ආර්ථික වශයෙන් ඉතාමත් සමෘද්ධිමත් කාලයක් නොවූවද ආර්ථික වශයෙන් ඔහු තම රටට විශාල සේවයක් කළ අගමැතිවරයෙකි. ඔහු විසින් ජාතික බලශක්ති යෝජනා ක්‍රමයක් හඳුන්වා දුන් අතර, ඒ හරහා ගෘහස්ථ ඉන්ධන හා ගෑස්, අවම මිල ගණනක් යටතේ සපයා දීමට කටයුතු කරන ලදී. දෙවන ලෝක යුද්ධයෙන් ( The Second World War) පසු, එරට ආර්ථිකයට සිදුවූ රාජ්‍ය මැදිහත්වීම්වලින් එක් විශාල වැඩසටහනක් ලෙස මෙය හඳුන්වාදිය හැකිය. එසේම ඔහු විසින් විරැකියාව අඩු කිරීම, මාතෘ නිවාඩු සඳහා ප්‍රතිලාභ ලබාදීම, තරුණ රැකියා වැඩසටහන් ආරම්භ කිරීම මෙන්ම විදේශ ආයෝජන පාලනය කිරීම යනාදී අරමුණු සාක්ෂාත් කරගැනීමට වැඩපිළිවෙලවල් හඳුන්වා දෙන ලදී. මෙවැනි වැඩසටහන් ඔහුගේ "සමාජ සාධාරණත්වය" සඳහා වන අරමුණු ළඟාකර ගැනීමට උපකාරී විය.



*අගමැති පියැර් තෘඩෝ ජාතිය අමතන අවස්ථාවක්*

කැනඩා සංවර්ධන සංස්ථාව (The Canada Development Cooperation) යනු, විදේශ ආයෝජන නිකුත් කිරීම සඳහා පියැර් විසින් නිර්මාණය කරන ලද ආයතනයකි. විදේශ ආයෝජකයන් සතු සමාගම්ද නැවත මිලදීගත් අතර විදේශ ආයෝජන සමාලෝචන නියෝජිතායතනය ද (The Foreign Investment Review Agency) නිර්මාණය කරන ලදී. මෙම ක්‍රියාමාර්ගවල ප්‍රතිඵලයක් වශයෙන්, විදේශ ආයෝජන ගලා ඒම හරහා කැනේඩියානුවන්ට ඔවුන්ගේ ව්‍යාපාර දිගටම කරගෙන යාමට හැකි වීම තුළ එරට ආර්ථිකයට ධනාත්මක ප්‍රවේශයක් ඇතිවිණි. මේ ආකාරයෙන් ආර්ථික අතින්ද මෙම අගමැතිවරයා විසින් තම රටට විශාල කාර්යභාරයක් ඉටු කර ඇත.

මෙලෙස වසර ගණනාවක් තිස්සේ පියැර් තෲඩෝ සිදුකරන ලද සේවාව ප්‍රසංශනීය වේ.

## විදේශ ප්‍රතිපත්තිය

පියැර් අගමැතිවරයාගේ විදේශ ප්‍රතිපත්තියට කැනඩාව වඩාත් ස්වාධීන රාජ්‍යයක් කිරීම යන ප්‍රතිපත්තිය ප්‍රධාන වශයෙන්ම ඇතුළත් විය. දේශපාලනික වශයෙන් බ්‍රිතාන්‍යය වෙත තිබූ නැඹුරුතාවය අවම කිරීමට පියැර් අගමැතිවරයා විසින් කැනඩාවේ ව්‍යවස්ථාව බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තු පනතින් (Constitutional Patriation) ස්වාධීන කැනේඩියානු ව්‍යවස්ථාවකට පරිවර්තනය කිරීම සඳහා කැනේඩියානු පනත (Canadian Act) සම්මත කරන ලදි. කැනඩාවේ ආර්ථිකය සඳහා වැඩි නිදහසක් අපේක්ෂා කරමින්, කාර්මික ප්‍රජාතන්ත්‍රවාදී රටවල් සහ සංවර්ධනය වෙමින් පවතින රටවල් අතර වඩා හොඳ වෙළෙඳ සබඳතා ගොඩනගා ගැනීමට ඔහු ක්‍රියා කළේය. විදේශ කටයුතුවලදී ඔහු කැනඩාව උතුරු අත්ලාන්තික් ගිවිසුම් සංවිධානයේ (NATO - North Atlantic Treaty Organiation) තබාගත් නමුත්, ජාත්‍යන්තර සබඳතාවලදී ස්වාධීන මාවතක් අනුගමනය කළේය. එමෙන්ම, ඔහු සෝවියට් දේශය, චීනය (China), සහ කියුබාව (Cuba) වැනි කොමියුනිට්ස්වාදී රටවල් සමඟ ද සමීප සබඳතා පැවැත්වීය. කෙසේ නමුත් මෙය ධනේශ්වර බටහිර ජාතීන්ගේ තරමක අමනාපයට ද හේතු විය.

පියැර් අගමැතිවරයා සිය විදේශ ප්‍රතිපත්තිය තුළ පුද්ගල සිවිල් අයිතිවාසිකම් වෙනුවෙන් සහ ස්වාධීන රාජ්‍යයන්ට ඔවුන්ගේ කටයුතුවලට සිදුවන

අත්තනෝමතික මැදිහත්වීම්වලින් නිදහස් වීමට ඇති අයිතිවාසිකම් වෙනුවෙන් ස්ථිරසාර සහ කැපීපෙනෙන ප්‍රතිපත්තිවල සිට කටයුතු කළේය. ජාත්‍යන්තර නීතිවේදියකු වූ ඔහු වාර්ගික වාදය සහ වර්ණභේදවාදය කෙරෙහි විරුද්ධවාදියකු වූ නමුදු නැගෙනහිර යුරෝපයේ සමාජවාදී රාජ්‍යයන් තුළ වූ පුද්ගල දේශපාලන නිදහස පිළිබඳ ප්‍රශ්නය සම්බන්ධයෙන් විවාදශීලී වූයේ මද වශයෙනි.

එක් එක් රාජ්‍යයන් කෙරෙහි ඔහුගේ මතයන් විවිධාකාරී වුවත්, ඔහු ඒ රාජ්‍යයන් සියල්ලම සමග කටයුතු කිරීමට උත්සාහ කළේය. උදාහරණයක් ලෙස, තමාට වැදගත් සහ තමාට වඩා බලවත් රාජ්‍යයක් වන සෝවියට් දේශය සමග සාමය ආරක්ෂා කර ගැනීම සඳහා ඔහු සෝවියට් දේශය සමඟ රඳවා ගැනීමේ උපාය මාර්ගය (Détente) ප්‍රවර්ධනය කළේය. අනෙක් අතට ඔහු ටැංසානියාවේ (Tanzania) ජුලියස් නියරේ (Julius Nyerere) හා කියුබාවේ ෆිදෙල් කැස්ත්‍රෝ (Fidel Castro) ගේ සමීප මිතුරෙකු වූයේ, එම නායකයන් තම තමන්ට අවේණික දේශපාලන-ආර්ථික මතවාදයන් ලෝකයේ යථාර්තයන් බවට පත් කිරීම උදෙසා උත්සාහ ගනිමින් සිටි නිසාය. පියැර් අගමැතිවරයා ඔවුන්ව අගය කළේය. මන්ද, ඔහුද එවැන්නෙකු වූ නිසාය. ඔහු පහළ ආර්ථික මට්ටමකින් යුත් රටවල් සමඟ වඩාත් හොඳින් සබඳතා පවත්වාගෙන ගිය අතර, රටවල් සමඟ ශක්තිමත් සබඳතා පවත්වා ගැනීමේ විශාල ප්‍රවර්ධකයෙකු විය. ඇතැම් අවස්ථාවල මෙම කාරණා එක්සත් ජනපදය සමඟ නිරන්තර ගැටලුවලට හේතු විය.

සිය ධූර කාලය තුළ ඔහු මහා උතුරු-දකුණු බෙදීම (North-South Devide) සම්බන්ධයෙන් වූ ගැටලුව නිරාකරණය කිරීම සඳහා ස්වීඩනයේ (Sweden) ඔලාෆ් පාම් (Olof Palme) ඇතුළු තවත් ලෝක නායකයන් කිහිපදෙනෙකු සමඟ ජාත්‍යන්තර ක්‍රියාමාර්ග සඳහා දේශපාලන මැදිහත්වීමක් ඉල්ලා සිටියේය.

**තුෂ්ණී යුද්ධය සහ පියැර් අගමැතිවරයාගේ විදේශ ප්‍රතිපත්තිය**

පියැර් අගමැතිවරයා තුෂ්ණී යුද්ධය අතරතුර රඳවා තබා ගැනීමේ සංකල්පය ඉතා හොඳින් ප්‍රවර්ධනය කළ අයෙකු විය. ඔහු න්‍යෂ්ටික අවිවලින් සිදුවන විනාශයන් කෙරෙහි විශේෂයෙන් අවධානය යොමු කළේය. 1972දී කැනේඩියානු නිෂ්පාදිත ප්‍රතික්‍රියාකාරකයකින් (Canadian-Made Reacter) නිපදවන ලද ද්‍රව්‍ය භාවිතා කරමින් ඉන්දියාව න්‍යෂ්ටික අවියක් පුපුරවා හැරීමත් සමඟ පියැර් අගමැතිවරයා දැඩි ලෙස කලකිරීමට පත් විය. තුෂ්ණී යුද්ධ සමයේදී එක්සත් ජනපදය සහ

සෝවියට් සංගමය අතර න්‍යෂ්ටික අවි තරඟය පිටුපස ඇති තාක්ෂණික ආවේගය (Technological Impetus) තුරන් කිරීම අරමුණු කරගනිමින් පියැර් අගමැතිවරයා නව්‍ය අවි පාලන ප්‍රතිපත්ති (Innovative Arms Control Policies) සඳහා ඔහුගේ සහයෝගය දැක්වීය.

1978 මැයි මාසයේදී නිරායුධකරණය පිළිබඳ එක්සත් ජාතීන්ගේ පළමු විශේෂ සැසියේදී ඔහු ආයුධ පාලනය කරන ක්‍රියාමාර්ග හතරකින් සමන්විත, විශේෂ උපායමාර්ගයක් (Strategy of Suffocation) පිළිබඳ අදහස් ඉදිරිපත් කළේය. සුපිරි බලවතුන් එම උපායමාර්ගය සහ ක්‍රියාමාර්ග හතර පිළිබඳ බොහෝ දුරට උදාසීන වුවද, කැනඩාවට අනාගත නිරායුධ රාජ්‍යතාන්ත්‍රික කටයුතු සඳහා නායකත්ව භූමිකාවක් ඉටු කිරීමට හැකිවන පරිදි ආයතනික ධාරිතාව වැඩි කිරීම සඳහා, කැනේඩියානු විදේශ කටයුතු දෙපාර්තමේන්තුවට මෙම අදහස් උපකාරී විය.

**නේටෝ සංවිධානයේ සාමාජිකත්වය**

1968 දී නේටෝ සංවිධානය සංවෘත (a Closed Doctrine) එකක් විය. බටහිර යුරෝපයේ ගොඩබිම් යුද්ධයක් සඳහා සටන් කිරීමේ අරමුණින් සුවිශේෂී ලෙස කැනේඩියානු හමුදාවක් නඩත්තු කිරීමට නව අගමැති පියැර්ට අවශ්‍ය නොවීය. 1968-69 අතර කාලයේදී යුරෝපය තුළ සිටි කැනේඩියානු හමුදාවන් අඩු කිරීම වොෂිංටනයේ (Washington) කැළඹීමක් ඇති කළ අතර, පියැර් අගමැති යනු, තුෂ්ණී යුධ අභියෝගවලට අවම මැදිහත්වීමක් දක්වන වාමාංශිකයෙකුය, යන මතය ප්‍රවර්ධනය කරන්නට එය හේතු විය. එමෙන්ම ඉදිරි වසර විස්සක කාලය තුළ බටහිර රටවල් මඟින් ඔහුව විවේචනයට ලක්වීම සඳහාද එය හේතුවක් විය. නැගෙනහිර-බටහිර ගැටුමේ ප්‍රචණ්ඩත්වය අඩු කිරීමේ අවශ්‍යතාව සම්බන්ධයෙන්, විශේෂයෙන්ම න්‍යෂ්ටික අවිහරණය සම්බන්ධයෙන්, පියැර් අගමැතිවරයාට කල් පවතින ආකාරයේ ක්‍රියාමාර්ග ගැනීමේ අවශ්‍යතාවයක් තිබිණි. සෘජු ගැටුම්වල අන්තරායන්ගෙන් ඉවත්වීමේ අවශ්‍යතාව ඔහු තරයේම විශ්වාස කළේය.

ජාතිය ගොඩනැගීම සහ ජාත්‍යන්තරවාදය පිළිබඳ ඔහුගේ තීරණ ස්ථිර වූ අතර, ඔහුගේ ක්‍රියාවන් නොවැළැක්විය හැකි ලෙස අසල්වැසි රටවලට බලපෑම් කරන්නට විය. ඔහුගේ ප්‍රතිපත්ති, ක්‍රියාකලාපයන් ඔහු "ඇමරිකානු විරෝධී ද?" යන පැනය මතු කළේය. ඔහුට අනුව එක්සත් ජනපදය, කැනේඩියානු භූ දර්ශනයේ සාමාන්‍ය

ලක්ෂණයක් විය. කැනඩා-එක්සත් ජනපද සබඳතා ආරක්ෂා කිරීම සඳහා පුළුල් උපායමාර්ගික මාර්ගෝපදේශනයක් අවශ්‍ය බව ඔහු විශ්වාස කළේය.

එක්සත් ජනපද ජනාධිපතිවරුන් සමඟ ඔහුගේ සබඳතා විවිධ විය. රිචඩ් නික්සන් (Richard Nixon) ජනාධිපතිවරයා ලිබරල්වාදීන්ට සහ බුද්ධිමතුන්ට අකමැති වූ නමුත්, ජිමී කාටර් (Jimmy Carter) ජනාධිපතිවරයා තුළින් පියැර් අගමැතිවරයාට කැනේඩියානු ජාතික සමගියට සහය දුන් හොඳ මිතුරෙකු හමු විය.

### චීනය සම්බන්ධ විදේශ ප්‍රතිපත්තිය

තුෂ්ණී යුද්ධය ක්‍රියාත්මක වූ කාල වකවානුව තුළ, බොහෝ බටහිර රටවල් චීනය සමඟ සබඳතා පැවැත්වූයේ නැත. කැනඩාව සහ චීනය අතර සාකච්ඡා 1969 දී, ස්ටොක්හෝම් (Stockholm) හිදී රහසිගතව සිදුවිය. දෙරට අතර රැස්වීම් හැකිතරම් රහසිගතව ඉතා කුඩා කණ්ඩායම් වශයෙන් පැවැත්විණි. 1970 වන විට කැනඩාව සහ චීනය අතර සබඳතා ඉතා ශක්තිමත් වී තිබිණි. 1972 දී එක්සත් ජනපද ජනාධිපති රිචඩ් නික්සන් විසින් වසර විසිපහක් තිස්සේ නැවතී තිබුණු එක්සත් ජනපද-චීන රාජ්‍යතාන්ත්‍රික සබඳතාවලට නැවත මුලපුරන ලද අතර, පියැර් අගමැතිවරයාගේ මැදිහත්වීමද ඒ සඳහා උපකාරී විණි.

### ආක්ටික් හි ස්වාධීනත්වය (Arctic Sovereignity)

පියැර් අගමැතිවරයාගේ නීතිමය තාර්කිකත්වය සහ ජාතිය ගොඩනැඟීම එක්සත් ජනපදය විසින් කැනඩාව තර්ජනයක් ලෙස දකින්නට හේතුවක් විය. ආක්ටික් සාගරය සම්බන්ධයෙන් ඔහුගේ ප්‍රතිපත්තීන්ද ඊට හේතු විය. පියැර් කැනඩාවේ ආක්ටික් ජලය පිළිබඳව අධිකරණ බලය තහවුරු කළේ, වෙනස්වනසුලු ආක්ටික් පරිසරය ආරක්ෂා කිරීමේ වගකීම ඔහු අවධාරණය කළ බැවිනි. සෝවියට් සංගමය සහ එක්සත් ජනපදය අතර තුෂ්ණී යුධ එදිරිවාදිකම් සාගරය ඔස්සේ, විශේෂයෙන්ම ධ්‍රැවීය අයිස් තට්ටුව (Polar Ice Cap) ඔස්සේ සංකීර්ණ ලෙස ක්‍රියාත්මක වුණු කාලවකවානුවක් තුළ කැනේඩියානු ස්වෛරීත්වය වැඩිදියුණු කිරීමට සහ ආක්ටික් කලාපයේ ආර්ථික සංවර්ධනය ප්‍රවර්ධනය කිරීමට පියැර් අගමැතිවරයා ගත් උත්සාහයන් එක්සත් ජනපදය සමඟ යම් ඝර්ෂණයක් (Friction) ඇති කරන ලදී. කෙසේ වුවත්, පාරිසරික ආරක්ෂණ අරමුණු සඳහා ආක්ටික් කලාපය තුළ කැනේඩියානු ස්වෛරීභාවය තහවුරු කිරීමට මුල පුරමින් ඔහු සැතපුම් 200ක

ආර්ථික කලාපයක් සඳහා වගකියනු ලබන, මුහුදු සම්මුතියේ (Sea Convention) නව නීතියක් කෙටුම්පත් කිරීමෙහිලා පුරෝගාමියා විය.

වසර ගණනාවක් පුරා නිකුත් කරන ලද විවිධ ප්‍රකාශ සහ ප්‍රතිපත්තීන් දෙස බලන විට, කැනඩාවේ ආක්ටික් ප්‍රතිපත්තිවල මූලික ප්‍රමුඛතා 1970 ගණන්වල පියැර්ගේ පාලන සමයේ සිට කැපී පෙනෙන ලෙස ස්ථාවරව පවතී.

## ආර්ථික ජාතිකවාදය (Economic Nationalism) සහ තුන්වන විකල්පය (Third Option)

තුන්වන විකල්පය යනු, 1972 දී පියැර් අගමැතිවරයාගේ ප්‍රමුඛත්වයෙන් බිහිවූ කැනේඩියානු විදේශ කටයුතු පිළිබඳ රාජ්‍ය ලේකම් මිෂෙල් ෂාප්ගේ (Mitchell Sharp) යෝජනාවක් වන අතර, එමගින් කැනඩාව සහ එක්සත් ජනපදය අතර වෙළඳ හා සංස්කෘතික සබඳතා මෙන්ම, වෙනත් රටවල් සහ වෙනත් වෙළඳ කණ්ඩායම් (Trading Block) සමඟ වෙළඳ හා ආර්ථික අන්තර්ක්‍රියා වැඩි කිරීම හරහා කැනඩාවේ වෙළඳ හා වාණිජ සබඳතා පුළුල් කිරීම සහ විවිධාංගීකරණය කිරීම අරමුණු කෙරිණි. මෙම තුන්වන විකල්පය නම් උපායමාර්ගය, කැනඩාව ආර්ථික හා සංස්කෘතික වශයෙන් එක්සත් ජනපදයට නතු කරගැනීම පිළිබඳ ඇතිවූ භීතියට පියැර්ගේ ආණ්ඩුව දැක්වූ ප්‍රතිචාරය විය.

## G7හි හත්වන සමුළුව



*1981 ජූලි මාසයේදී හත්වන G7 සමුළුව පැවති කැනඩාවේ ක්වෙබෙක්හිදී සමුළුවට සහභාගි වූ නායකයන් සමඟ පියැර් අගමැතිවරයා*

අන්‍යෝන්‍ය වශයෙන් සමීප දේශපාලන, ආර්ථික, රාජ්‍යතාන්ත්‍රික හා මිලිටරි සබඳතා පැවැත්වීමේ අරමුණින් දියුණු ආර්ථිකයන් සහිත ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයන් වන, කැනඩාව, ප්‍රංශය (France), ජර්මනිය (Germany), ඉතාලිය (Italy), ජපානය (Japan), එක්සත් රාජධානිය (United Kingdom) සහ එක්සත් ජනපදය විසින් ඒකරාශී වූ අන්තර් රාජ්‍ය දේශපාලන සංසදයක් වූ G7 (Group of Seven) හි හත්වන සමුළුව සඳහා පියැර් අගමැතිවරයාගේ ප්‍රධානත්වය යටතේ කැනඩාව විසින් සත්කාරකත්වය දක්වන ලදී.

**නැගෙනහිර - බටහිර ගැටුම**

නැගෙනහිර සහ බටහිර කඳවුරු දෙක අතර තුෂ්ණී යුධ ගැටුම් තදින් ඇවිල ගිය එම කාලවකවානුව තුළ, එක්සත් ජනපදය සහ ධනවාදී බටහිර පිලේ අනෙකුත් රටවල් මෙන් නොව, පියැර් අගමැතිවරයා විශ්වාස කළේ ලෝක සාමය රඳා පවතින්නේ, විශේෂයෙන්ම සුපිරි බලවතුන් දෙදෙනාට, එනම්, එක්සත් ජනපදයට හා සෝවියට් දේශයට එක්වීමට ඇති හැකියාව මත බවයි. ඔහු නැගෙනහිර සහ බටහිර අතර ජාත්‍යන්තර සබඳතා සඳහා අන්‍යෝන්‍ය වශයෙන් පිළිගත හැකි චර්යාධර්ම සංග්‍රහයක් (Code of Behaviour) නැවත නිර්මාණය කළ යුතු බව යෝජනා කළේය. එමෙන්ම, බටහිර රටවලට මෙන්ම සංවර්ධනය වෙමින් පවතින රටවලටද බලපෑම් ඇති කරන ඇෆ්ගනිස්ථාන (Afghanistan) අර්බුදයට විසඳුම් සෙවිය යුතු බව ඔහුගේ අදහස විය.

විදේශ ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් තමා කොමියුනිස්ට්වාදයට පක්ෂපාතී යැයි පියැර් අගමැතිවරයා වෙත විවේචන එල්ල වුවද, ඔහු දැරූ මතය වූයේ, නිදහස මූලිකම කාරණය බවයි. එනම්, පුද්ගලයන්ගේ සහ රාජ්‍යයන්ගේ නිදහස, නැගෙනහිර බටහිරින් වෙන් කරන දේශපාලන නිදහස, ආර්ථිකයන් පදනම් වී ඇති වෙළෙඳපොළ ක්‍රමයේ නිදහස යනාදී ලෙස නිදහස භුක්ති විඳීමට හැකිවිය යුතු බවයි.

**සාම මුලපිරීම (Peace Initiative)**

1983 සැප්තම්බර් 01 වන දින, නිව්යෝක් (New York) හි JKF ගුවන් තොටුපලේ සිට දකුණු කොරියාවේ සෝල් (Seoul) දක්වා ගමන් කරමින් සිටි 007 නම් වූ කොරියානු එයාර් ගුවන් යානය, සෝවියට් අන්තර්වාරකයන් විසින් වෙඩි තබා බිම

හෙළිමෙන් අනතුරුව, මෙම සිද්ධිය හේතුවෙන් නැගෙනහිර-බටහිර කඳවුරු දෙක අතර උත්සන්න විය හැකි අන්තරායන් පිළිබඳව පියැර් අගමැතිවරයා වහාම අවධානය යොමු කළේය. සීමර් හර්ෂ් (Seymour Hersh) ඔහුගේ "The Target is Destroyed" කෘතියේ වාර්තා කර තිබුණේ, මෙම සිද්ධිය සම්බන්ධයෙන් එකම විදෙස් නායකයෙක් පමණක් කතා කළ බවයි. එම නායකයා කැනඩාවේ පියැර් තෘඩෝ අගමැතිවරයාය.

මෙම සිද්ධිය පදනම් කරගනිමින් නැගෙනහිර-බටහිර ගැටුම උත්සන්න වීමේ ඇති අන්තරාය පිළිබඳ අවධානය දෙමින්, ඔහු තම 'සාම මුලපිරීම' දියත් කළේය. එහිදී, මාසයක් ඇතුළත රාජ්‍ය නායකයන් විසිතුන් දෙනෙකු හමුවී, සුපිරි බලවතුන්ට ගැටුම්වලින් ඉවත් වන්නැයි ඉල්ලා සිටීමට සියලුම ලෝක නායකයන්ට වගකීමක් ඇති බව කියා සිටීමට ඔහුට අවශ්‍ය විය.

සිය පාලන කාලය තුළ ඔහු කැනේඩියානු විදේශ ප්‍රතිපත්තිය දැඩි ලෙස තාර්කික පරීක්ෂණවලට ලක් කරමින් නිර්මාණය කළේය. ඔහු විදේශ ප්‍රතිපත්තිය තුළින් අරමුණු කළ කැනඩාවේ ජාතික අභිලාෂයන් තාර්කිකවූ අතර ඒවා කැනේඩියානු සාරධර්ම මත පදනම් විය.

## <u>ගත හැකි ආදර්ශ</u>

"අපි දැන් කැනේඩියානුවන් ලෙස අපව එකට බැඳ තබන මූලික මූලධර්ම, මූලික සාරධර්ම සහ විශ්වාසයන් ස්ථාපිත කළ යුතුයි, එවිට අපගේ කලාපීය පක්ෂපාතීත්වයට ඔබ්බෙන් එවැනි නිදහසක් සහ අපරිමිත සතුටක් ලබා දුන් රට ගැන අපට ආඩම්බර වන ජීවන රටාවක් සහ සාරධර්ම පද්ධතියක් හිමිවනු ඇත."

දේශප්‍රේමී අසහාය කැනේඩියානුවා වරක් එලෙස ප්‍රකාශ කරන්නට වූයේ සිය ජනතාව තුළ ජාතිකත්වය සහ දේශප්‍රේමීත්වය වැනි හැඟීම් අවදි කිරීමටය. කැනඩාව වූකලී, සාමකාමී, නිවහල් රාජ්‍යයක් බවත් සියලු කැනේඩියානුවන් සිය රටේත් ප්‍රජාවගේත් අභිවෘද්ධිය උදෙසා වගකීම් සහගතව ක්‍රියා කළ යුතු බවත් සිය ප්‍රජාව අමතමින් නිරන්තරයෙන්ම ප්‍රකාශ කළ කැනඩාවේ පහළොස්වැනි අගමැතිවරයා වූ පියැර් තෘඩෝ යනු, විසිවන සියවසේ බිහිවූ ශ්‍රේෂ්ඨතම කැනේඩියානු ජාතිකයා වශයෙන් හැඳින්වෙන පුද්ගලයාය.

පියැර් අනුගමනය කරන ලද ප්‍රතිපත්තීන්වලට පදනම වූයේ, ඔහු කුඩාකල සිටම ලද විධිමත් අධ්‍යාපනය, පුවත්පත් කලාවට සම්බන්ධව ලත් අත්දැකීම්, සිය පියාගෙන් දායාදලත් ව්‍යාපාරික හා කළමනාකරණ දැනුම තුළින් ලත් ආර්ථික-දේශපාලන සහ සමාජයීය පන්නරයයි. මෙම කරුණු තුළින් ඔහු සිවිල් වැසියෙකු, උගතෙකු මෙන්ම දේශපාලනඥයෙකු යනාදී වශයෙන් සමාජයේ විවිධ මට්ටම්වල කටයුතු කිරීම තුළ ලත් පරිණතභාවය, විචාරශීලීත්වය, දුරදක්නා නුවණ ආදී ගුණාංග පිළිබඳ මනාව පිළිබිඹු වේ. පියැර් වූකලී බොහෝ ඇසූ පිරූ තැන් ඇති, උගත්, බුද්ධිමත් මිනිසෙකි. ඔහු කුඩා අවධියේ සිටම තම කාලය නිසි ලෙස කළමණාකරණය කොට ගෙන විවිධ කාර්යයන්හි යෙදී ලත් පුහුණුව, දේශපාලන නායකයෙකු ලෙස පරිපූර්ණත්වයට පත්වීමට ඔහුට දොරටු විවරකර දුණි.

පියැර් දේශපාලනයට පිවිසෙන්නේ අහම්බයකින් නොවේ, එය ඔහු ලැබූ අධ්‍යාපනය හා සමාජීය අත්දැකීම් තුළින් ක්‍රම ක්‍රමයෙන් තමන් වෙත ළඟාකරගන්නා ලද්දකි. ඔහුගේ දේශපාලන ගමන්මග තුළ ඔහු ක්‍රමිකව ලත් අත්දැකීම්, ඔහුව තවත් එක් දේශපාලනඥයෙක් බවට පත් නොකොට සිය රටට හා ජනතාවට අවැසි ආකාරයේ සේවයක් කළ හැකි සක්‍රීය දේශපාලන පෞරුෂයක් බවට පත්කරන්නට හේතු විය. ඔහු දේශපාලනයට පිවිසීමට පෙර හොඳ අධ්‍යාපනයක් ලබා සිය පදනම ශක්තිමත් කරගැනීම ප්‍රමුඛ කොට සැලකීය. ඒ අනුව පියැර්ගේ චරිතය හරහා උගත හැකි තවත් ආදර්ශයක් නම්, යම් කාර්යයකට ප්‍රවිශ්ඨ වීමට පෙර ඒ සඳහා සුදුසු පරිදි වටපිටාව සකස් කරගැනීමත්, කිසිදු බාහිර බලපෑමකින් බිඳලිය නොහැකි ආකාරයේ ශක්තියකින් ඊට ප්‍රවිශ්ට වීමත් තුළ සාර්ථක අවසානයක් කරා පිවිසීමට හැකි බවයි. දිගුකලක් තිස්සේ කැනඩාවේ මෙන්ම පිටරටවල (යුරෝපීය) උසස් අධ්‍යාපන ආයතන සහ විශ්වවිද්‍යාලවල උසස් අධ්‍යාපනය හැදෑරූ පියැර්, ඉංග්‍රීසි භාෂාව, ආර්ථික විද්‍යාව සහ නීතිය යනාදී විෂය පථයන් ඔස්සේ නිරන්තරයෙන්ම අධ්‍යාපන කටයුතු සිදුකරගෙන යෑම තුළ ඔහු සතුවූ දැනුම් පිපාසය කෙතරම්ද යන්න පැහැදිලි වේ. ඕනෑම පුද්ගලයෙකු විශිෂ්ටත්වයට පත් කරලීමට අධ්‍යාපනය විසින් සිදු කරන සේවාව අතිමහත්ය. ඒ අනුව, පියැර් ඉතා හොඳ අධ්‍යාපනයක් ලබා ගැනීම, ඔහුගේ විශිෂ්ටත්වය කරා යන ගමන්මගට මූලාරම්භය විය. ඔහු අධ්‍යාපනය කෙරෙහි දැක්වූ ආකල්පය ඉතා යහපත් මෙන්ම අන් අයටද ආදර්ශමත් එකකි.

පියැර් නායකයෙකු ලෙස තීරණ ගැනීමේදී නිරන්තරයෙන්ම සිය අනුගාමිකයන්ට සවන්දීම හා ඔවුන්ගේ අදහස්වලට ඉඩදීම විදේශ ප්‍රතිපත්තිය සම්බන්ධව ගත් ප්‍රතිපත්තීන් තුළ කැපී පෙනිණි. ද්විපාර්ශ්විකත්වය සහ බහුපාර්ශ්විකත්වය යන රාජ්‍යතාන්ත්‍රික ක්‍රම දෙකම සමසමව ප්‍රායෝගිකව යොදාගත් පියැර් ඒවා තුළ විවිධ රටවල දේශපාලනඥයින් සමග සමීපව කටයුතු කිරීම සහ ඔවුන් සමග සාකච්ඡා කොට ඔවුන්ගේ අත්දැකීම්ද ආශ්‍රය කරගනිමින් තීරණ වලට එළඹීම, ඔහු තුළ පැවති ඉතා උසස් ගුණාංගයකි. දේශපාලනඥයෙකු ලෙස ඔහු නිරතුරුවම පරිණත, කාලෝචිත හා දූරදර්ශී ප්‍රතිපත්ති අනුගමනය කරන්නට වූයේ, සිය ජීවිතයේ විවිධ කාලවලදී ලත් අත්දැකීම් ප්‍රයෝජනයට ගැනීම තුළිනි. එලෙස ක්‍රියා කිරීම තුළ සාර්ථක වීමට ඇති හැකියාව ඉහළය. ඔහුගේ පාලන සමය තුළ ලෝකය බල අරගල නිසා සාමය, මානව හිමිකම්, සංවර්ධනය යනාදී වශයෙන් විවිධ ක්ෂේත්‍රවල ගැටලුකාරී තත්ත්වයන්ට මුහුණදී සිටි අතර ඔහු ලෝකය තුළ ක්‍රමිකව ගිලිහී යමින් තිබූ ඒ සියල්ල යළිත් ඇති කිරීමට බොහෝ මැදිහත්වීම් සිදු කළේ සුදුසු වේලාවට සුදුසු තීරණ ගැනීම සහ ප්‍රමුඛ සංසිද්ධිය තෝරාගෙන එයට අනුව සිය රජය, ප්‍රජාව සහ රාජ්‍යතාන්ත්‍රිකත්වය මෙහෙයවීම යන ඔහු සතු වූ සුවිශේෂී නායකත්ව ගුණාංග නිසාවෙනි.

සිය පුත්‍රයෙකු වන ජස්ටින් ත්‍රෲඩෝ (Justin Trudeau) කැනඩාවේ විසිතුන්වෙනි අගමැතිවරයා ලෙස 2015 වසරේ පටන් අද දක්වා ප්‍රශස්ත සේවාවක නියැලෙමින් සිටින අතර පියෙකු මෙන්ම නායකයෙකු ලෙස ඔහු ආදර්ශමත් වූ තවත් අවස්ථාවක් ලෙස එය පෙන්වා දිය හැකිය.

සමාජීය ජීවීන් වශයෙන් සමාජය තුළ ජීවත්වීමේදී, කණ්ඩායම් වශයෙන් පුද්ගලයන් සමග කටයුතු කිරීමේදී, ආදී වශයෙන් සෑම පුද්ගලයෙකුටම කුමන හෝ මට්ටමකදී නායකයෙකු ලෙස කටයුතු කිරීමට සිදුවේ. නායකත්ව ගුණාංග සෑම පුද්ගලයෙකු තුළම අඩු වැඩි වශයෙන් පවතින අතර මෙම ගුණාංග ඔප්නංවා ගැනීම තුළ ඕනෑම ක්ෂේත්‍රයකදී සාර්ථකත්වයට පත්විය හැකිය. එලෙස නායකත්ව ගුණාංග වර්ධනය කරගැනීම උදෙසා අධ්‍යනය කළහැකි විශිෂ්ට ගණයේ නායකත්ව පෞරුෂයක් ලෙස කැනේඩියානු හිටපු අගමැති පියැර් ත්‍රෲඩෝ පෙන්වා දිය හැකිය.

## සාරාංශය

විසිවන සියවසේ ශ්‍රේෂ්ඨතම කැනේඩියානු ජාතිකයා වශයෙන් හැඳින්වීම තුළම පියැර් තෘඩෝ එරට සමාජ-දේශපාලන රාමුව තුළ කෙතරම් අනභිභවනීය නායකයෙකුද යන්න හඳුනාගැනීමට කරුණු සපයයි. සිය ධූර කාලය තුළදී කැනඩාවේ රාජ්‍ය පාලනය මනා ලෙස මෙහෙයවූවා මෙන්ම, විදේශ රාජ්‍යයන් සමගද ඉතා දියුණු මට්ටමේ රාජ්‍යතාන්ත්‍රික සබඳතා පවත්වමින් ලෝක දේශපාලනය තුළ කැනඩාවේ භූමිකාව කැපී පෙනෙන තලයකට ගෙනයාමට ඔහු සමත් විය. ඉහළ අධ්‍යාපන සුදුසුකම් සපුරාගෙන දේශපාලන ක්ෂේත්‍රයට පිවිසීම තුළින් ලද පන්නරය, ඔහුගේ දේශපාලන ජීවිතය ශක්තිමත් කළ අතරම, ඔහුට පරිණත දේශපාලනඥයෙකු වීමට මංපෙත් විවර කර දුණි.

කැනඩාවේ ෆෙඩරල් ලිබරල් පක්ෂයෙන් දේශපාලන ගමන ඇරඹූ පියැර්, 1968 දී කැනඩාවේ පහළොස්වැනි අගමැතිවරයා ලෙස ඉතා ඉහළ ජනතා ප්‍රසාදයකින් තේරී පත්වූ අතර 1980 දී දෙවන වරටත් එම තනතුරට පත් වූ ඔහු අගමැතිවරයෙකු ලෙස වසර දහයක් වැනි දිගු කාලයක් පුරා සේවය කොට ඇත. පියැර් තෘඩෝ එරට රාජ්‍ය තාන්ත්‍රිකත්වය මෙහෙය වූ ආකාරය, කැනඩාව කෙරෙහි ලෝකයේ ප්‍රශංසනීයත්වය හිමිවීමට බලපෑ කරුණකි. ලෝකයේ බලකඳවුරුවාදය ක්‍රියාත්මක වූ ඔහුගේ පාලන සමයේදී එම බලකඳවුරුවාදයට ගැති නොවී ස්වාධීන පිළිවෙතක් අනුගමනය කරමින් ලෝකයේ ඕනෑම රටක් සමග මිතුරු ඇසුර පවත්වාගෙන යාමට ඔහු ක්‍රියා කළේය. අදටත් කැනඩාව ලෝකයේ සාමකාමී හා ස්වාධීන රාජ්‍යයක් වශයෙන් දේශපාලන-ආර්ථික සහ සමාජීය වශයෙන් ස්ථාවරව පවතින්නේ විශේෂයෙන්ම ලෝක දේශපාලනයේ අර්බුද බහුලව පැවති බල හුවමාරුවීම් සිදුවූ අතිශය තීරණාත්මක කාලසීමාවන් වූ විසිවැනි සියවස වැනි කාලයන්හි රට පාලනය කළ පියැර් වැනි පරිණත නායකයින් අර්බුද මධ්‍යයේ දුරදක්නා සහ නිර්භීතව ගනු ලැබූ තීරණ සහ ප්‍රතිපත්තීන්හි ප්‍රතිඵලයන් ලෙසයි. ආර්ථික ජාතිකවාදය, තුන්වන විකල්පය හා සාම මුලපිරීම පියැර් තෘඩෝ අගමැතිවරයාගේ විදේශ ප්‍රතිපත්තිය තුළ කැපී පෙනෙන ධනාත්මක ප්‍රතිපත්තීන් ලෙස පෙන්වාදිය හැකිය. බහුපාර්ශ්විකවාදය මෙන්ම ද්වීපාර්ශ්විකවාදය යන දෙකම අවශ්‍යතාවය අනුව යොදාගනිමින් කැනඩාව තුළ සාමය සහ ස්ථාවරත්වය ස්ථාපනය කිරීම පියැර්ගේ රාජ්‍යතාන්ත්‍රිකත්වය තුළ කැපී පෙනුණු ලක්ෂණයකි. පියැර්ගේ කාලය තුළ එරට ආර්ථිකය කැපීපෙනෙන දියුණුවක් නොලැබුවද ඔහු

සතු ආර්ථික විද්‍යා හා ව්‍යාපාර පරිපාලන දැනුම යොදාගෙන ඔහු එරට ආයෝජන ක්ෂේත්‍රයට කරන ලද ප්‍රතිසංස්කරණ කල්පවතින ආර්ථික ප්‍රතිලාභ එරටට හිමිකර දෙන්නට හේතුවිය.

ලේඛන කලාවේ දක්ෂයෙකු වූ පියැර් නිතැතින්ම නව අදහස්, නිර්මාණශීලි සහ විචාරශීලී චින්තනයකින් හෙබි උගතෙක් මෙන්ම බුද්ධිමතෙක් විය. එමෙන්ම, ඔහු ඉංග්‍රීසි, ප්‍රංශ භාෂාවන්හි ප්‍රවීණයෙක්ද විය. මෙම සියලුම දක්ෂතාවන් ඒකරාශී කොටගත් පියැර් සිය ජනතාව තුළ ජාතිමාමක හැඟීම් අවදි කරමින් සිය රටට සේවය කිරීමට ඔවුන්ව පොලඹවාලන සුළු ප්‍රකාශ නිරන්තරයෙන්ම සිදුකරන ලද නායකයෙකි. කැනේඩියානුවන් අතර පමණක් නොව අත්ලාන්තික් සාගරයේ පටන් පැසිෆික් සාගරය දක්වාම රටවල්වල ප්‍රසිද්ධියට පත්වෙමින් කැනඩාව විශිෂ්ට රාජ්‍යයක් බවට පත්කිරීමට මෙන්ම සමස්ත ලෝකයම යහපත් තැනක් බවට පත්කිරීමට පියැර් අගමැතිවරයා ගෙනගිය උත්සාහයන්, විවිධ වූ ක්ෂේත්‍රයන්ට, නානාවිධ වශයෙන් සිදුකරන ලද සේවාවන් නිසා ඔහු ලෝක ප්‍රජාව අතර විශිෂ්ට ගණයේ නායකයෙකු ලෙස ප්‍රචලිත වීමට සාධක සැපයීය. ඔහු සිදුකරන ලද කාර්යයන් සැමවිටම සාර්ථක නොවුනද සමස්තයක් ලෙස ගත්කළ ඔහු කැනඩාව රාජ්‍යයක් ලෙස දියුණු කිරීම සහ ලෝකයට කැනඩාව යන රාජ්‍යය, ශක්තිමත් රාජ්‍යයක් ලෙස විවෘත කිරීම, ඔහු සිය පාලන කාලය තුළ සිදුකරන්නට දැඩි ලෙස උත්සාහ ගත්තකි. මෙවන් අතිමහත් සේවාවන් රාශියක් සක්‍රීයව මෙහෙය වූ, පියැර් තෲඩෝ නාමය කැනේඩියානු ඉතිහාසය තුළ පමණක් නොව සමස්ත උතුරු ඇමරිකානු කලාපයේද, ඉන් ඔබ්බට ගොස් ජාත්‍යන්තර පද්ධතිය තුළ පවා, කීර්තිමත් අග්‍රගණ්‍ය දේශපාලන චරිතයක් ලෙස අමරණීයව පවතිනු ඇත.

## <u>මූලාශ්‍ර නාමාවලිය</u>

Bonder, J. L., 2019.*Policy Options Politiques.*[Online] Available at: https://policyoptions.irpp.org/magazines/july-2019/redefining-canadas-foreign-policies/
[Accessed 8 February 2023].

Canada, 2021.*Statement by the prime minister on the 50th anniversary of Canada's multiculturalism policy.*[Online] Available at: https://pm.gc.ca/en/news/statements/2021/10/08/statement-prime-minister-50th-anniversary-canadas-multiculturalism
[Accessed 30 January 2023].

Cataliotti, J., 2022. *study.com.* [Online] Available at: https://study.com/academy/lesson/pierre-trudeau-family-facts-legacy.html
[Accessed 12 9 2022].

DCB, 1991-2000. *DCB.*[Online] Available at: http://www.biographi.ca/en/bio/trudeau_pierre_elliott_22E.html

Gordon Mace, G. H., December, 1989. Canada's Third Option : A complete failure?. *JSTOR,* 15(4), pp. 387-404.

History, C. M. o., n.d. *Canadian Museum of History.*[Online] Available at: https://www.historymuseum.ca/cmc/exhibitions/hist/biography/biographi270e.html
[Accessed 7 February 2023].

Kinsman, J., Winter, 2001/2002. Who is my neighbour? Trudeau and Foreign Policy.*JSTOR,* 57(1), pp. 57-77.

McKercher, A., March, 2018. Reason over passion: Pierre Trudeau, human rights, and Canadian foreign policy. *Jstor,* 73(1), pp. 129-145.

News, C., 2014.*CBC News.* [Online] Available at: https://www.cbc.ca/news/canada/north/pierre-trudeau-s-arctic-policy-sparked-friction-with-u-s-cia-1.2747526
[Accessed 26 August 2014].

Ottawa Citizen (2023). *Smol: Was Pierre Trudeau really the enemy of the Canadian Armed Forces?* [online] ottawacitizen. Available at: https://ottawacitizen.com/opinion/columnists/smol-was-pierre-trudeau-really-the-enemy-of-the-canadian-armed-forces [Accessed 14 Feb. 2023].

Parliament of Canada (2017).*Government Ministries and Prime Ministers of Canada Since 1867 - House of Commons Procedure and Practice, Third edition, 2017 - ProceduralInfo - House of Commons of Canada*. [online] www.ourcommons.ca. Available at: https://www.ourcommons.ca/procedure/procedure-and-practice-3/App06-e.html.

PARLIAMENT OF CANADA (2017).*The Right Honourable Pierre Elliott Trudeau - History, Arts and Architecture - House of Commons*. [online] www.ourcommons.ca. Available at: https://www.ourcommons.ca/About/HistoryArtsArchitecture/fine_arts/prime_ministers/15261-e.htm [Accessed 14 Feb. 2023].

# ස්ටීවන් හාපර් (Stephen Harper)



**කණ්ඩායම් සාමාජිකයන්**

- ඒ. ඒ. අයෝධ්‍යා ඉඳුනිල්
- ඒ. එච්. එම්. කල්පනී මල්කා අබේරත්න
- ආර්. එම්. දිල්කි රුවංගා බණ්ඩාර
- ඩබ්ලිව්. එම්. චලිනි නිශාජා වීරසිංහ
- චතුරි භාග්‍යා කුමාරි රණසිංහ

## හැදින්වීම

ස්වකීය බහු සංස්කෘතික සමාජ පසුබිම, ස්වභාව සෞන්දර්යය කැටිකොටගත් භූ විෂමතාවය හා සබැඳි ආර්ථික ප්‍රභවයන් සහ ඵලදායි අධ්‍යාපන ක්‍රමවේදයන් තියුණු මෙවලම් බවට පත් කරගනිමින් කැනේඩියානු ජාතික සහ ජාත්‍යන්තර භූමිකාව මනාව රඟදැක්වීමෙහි ලා එරට උත්කෘෂ්ට නායකයන් සහ ප්‍රතිපත්ති සම්පාදකයන් ගෙන ඇති ප්‍රයත්නයන් වඩා සාර්ථක වූ ඒවා බව සාධනය කිරීමට විද්වත් පුරෝකථනයන් මගින් ගම්‍යවන කරුණු මෙන්ම වඩාත් නිරවද්‍ය වූ දත්ත මූලාශ්‍රයන් බොහෝමයක් නිහඬව සාක්ෂි දරයි.

කැනඩාවේ විසිදෙවන අගමැතිවරයා වන ස්ටීවන් හාපර් (Stephen Harper) ආර්ථික විද්‍යාව පිළිබඳව තමා තුළ වූ හසලත්වය ජාතික හා ජාත්‍යන්තර අරමුණු, අභියෝග හා ඉදිරි දැක්ම සඳහා මනා තෝතැන්නක් බවට පත්කර ගනිමින් කැනේඩියානු ආර්ථිකය, සමාජ සංවර්ධනය සහ දේශපාලන ස්ථාවරත්වය වඩාත් සාධනීය වූ තලයකට ගෙන යාම සඳහා ඇප කැප වූ නායකයෙක් ලෙස නිර්වචනය කිරීම හුදෙක් සුදුහුණු ගෑමක් නොවන බව ඔහුගේ ධූර කාලය තුළ සිදුවූ ආර්ථික පරිවර්තනයන් සියුම්ව විච්ඡේදනය කිරීමේදී මනාව තහවුරු කරගත හැකිය. නිදහස් වෙළඳ ප්‍රතිපත්ති හඳුන්වා දෙමින් ව්‍යාපාරිකයන් හා ආයෝජකයන් ස්වකීය ආර්ථික අරමුණුවල නියමුවන් කිරීමට ඔහු නිරන්තර අවධානය යොමු කළේය. දේශ සීමා අතික්‍රමණය කළ ඔහුගේ දේශපාලන භූමිකාව කැනේඩියානු දේශපාලන ඉතිහාසය ප්‍රබල මැදිහත් කරුවෙකු ලෙස කටයුතු කළ බවට ලියැවීමට සමත් වූ බව කැනේඩියානු නූතන දේශපාලන සාහිත්‍යයන්හි පුන පුනා සඳහන් වේ.

මෙම ලිපිය මගින් අගමැතිවරයෙකු ලෙස ඔහු රඟදැක්වූ භූමිකාව ඇගයීමක්, ගවේෂණයක් හා විශ්ලේෂණයක් ලෙස ඔහුගේ ජීවන පරිච්ඡේදයන් හා දේශපාලන සන්ධිස්ථානයන් විදහා දක්වමින් කැනඩාවේ වත්මන් ප්‍රගමනය උදෙසා ඔහු ඉටුකළ මෙහෙවර කෙතරම් දුරට ඉවහල් වී ද යන්න උරගා බැලීමට ගත් තවත් එක් ප්‍රයත්නයක ප්‍රතිඵලයකි.

## ළමා කාලය, අධ්‍යාපනය හා දේශපාලනයට පිවිසීම

වර්ෂ 1959 අප්‍රේල් මස 30 වන දින ඔන්ටාරියෝ (Ontario) හි උපත ලද ස්ටීවන් ජෝශප් හාපර් (Joshap Stephen Harper) දරුවන් තිදෙනකුගෙන් යුක්ත මධ්‍යම පාන්තික පවුලක වැඩිමල් පිරිමි දරුවා විය. ඔහුගේ සම්පූර්ණ නාමය වන්නේ, ස්ටීවන් ජෝශප් හාපර් (Stephen Joshap Harper) ය. ජෝසප් හැරිස් (Joshap Heris) වූ පියා වෘත්තිමය වශයෙන් ගණකාධිකාරීවරයෙකු ලෙස කටයුතු කර ඇත. මවගේ නාමය මාගට් ජොන්ස්ටන් (Marget Jonstan) විය. කුඩා කාලයේ සිට ඉගෙනීමට දස්කම් දැක් වූ හාපර්ගේ ප්‍රියතම ක්‍රීඩාව වූයේ, අයිස් හොකී (Ice Hoeky) ය.

ස්ටීවන් හාපර් මූලික අධ්‍යාපනය ලබා ඇත්තේ ඔහු ජීවත් වූ ටොරොන්ටෝ (Toronto) ප්‍රදේශයේ පිහිටා ඇති පොදු පාසලක ය. පසුව, ඔහු ද්විතීක අධ්‍යාපනය සඳහා ජෝන් ජී. ඇල්මහවුස් ( Jon G. Almahouse) මධ්‍ය විද්‍යාලයට ඇතුළත් වී ඇත. මෙකී පාසල් දෙක හරහා මනාව අධ්‍යාපනය හැදෑරූ ස්ටීවන් හාපර් තම උසස් අධ්‍යාපන කටයුතු සඳහා රිච්වීව් කොලේජියට් (Richview Collagiet) නම් ආයතනයට යොමු වී ඇත. පසුව, වර්ෂ 1978 දී එම ආයතනයේ අධ්‍යාපන කටයුතු සාර්ථකව නිමා කරමින් තම ප්‍රථම උපාධිය ලබා ගැනීමට හාපර් සමත් විය. මෙම කාල වකවානුව තුළ දී තමා අධ්‍යාපනය හැදෑරූ රිච්වීව් කොලේජියට් (Richview Cologiate) නම් ආයතනය නියෝජනය කරමින් ඔහු රූපවාහිනියෙන් විකාශනය කරන ලද රීච් ෆෝ ද ටොප් (Reach for the top) වැඩසටහනෙහි, තම කණ්ඩායමේ ප්‍රධාන සාමාජිකයෙකු වශයෙන් කටයුතු කර ඇත.

මෙලෙස ස්වකීය ද්විතියික අධ්‍යාපනය හමාර කළ හාපර්, ඇල්බාර්ටා (Albarta) හි පිහිටි තැපැල් කාර්යාලයක සේවය කරමින් සිටින අතරතුර පරිගණක තාක්ෂණය පිළිබඳව ඔහු තුළ තිබූ හසලතාවය නිසාම පරිගණක පද්ධතිවල වැඩ කිරීම සම්බන්ධයෙන් ඔහුට විශේෂ උසස්වීමක් හිමි විය. පසුකාලීනව, කැල්ගරි විශ්වවිද්‍යාලයට (University of Calgary) ඇතුළත්වන මොහු එහි දී ආර්ථික විද්‍යාව පිළිබඳව ශාස්ත්‍රවේදී සහ ශාස්ත්‍රපති යන උපාධීන් සාර්ථක ව සම්පූර්ණ කර ඇත. මෙලෙස 1991 පමණ වන විට, ස්වකීය අධ්‍යාපනය නිම කරන හාපර්

ශක්තිමත් දේශපාලන ගමනක් සඳහා වන අධ්‍යාපනික අඩිතාලම සාර්ථකව නිම කර ඇත.
ස්ටීවන් හාපර්, උසස් පාසලේ තරුණ ලිබරල් කණ්ඩායමේ සාමාජිකයෙක් ලෙස දේශපාලනයට පිවිසියේය. 1985 දී ඔහු ප්‍රගතිශීලී කොන්සර්වේටිව් පක්ෂයේ (Conservative Party) ජිම් හෝක්ස්ගේ (Jym Hocks) විධායක සහකාර ලෙස පත් කරන ලදී. මේ ආකාරයට ඔහු තම දේශපාලන ගමනට පූර්වාරම්භයක් ගන්නා ලදී.

## නායකත්වය කරා පැමිණි ගමන් මග

ස්ටීවන් හාපර්ගේ (Stephen Harper) නායකත්වය කරා පැමිණි ගමන් මග පිළිබඳව විමසීමේදී, පැහැදිලිවම පෙනෙන කරුණක් වන්නේ, එය ඉතා දීර්ඝ විකාශනයක් ඔස්සේ සිදු වූවක් බවයි. ඔහු තම දේශපාලන ගමන අරඹයා තෝතැන්නක් බවට පත් කර ගනුයේ, කැනඩාවේ ප්‍රතිසංස්කරණ පක්ෂ මන්ත්‍රී මණ්ඩලයයි (The Reform Party of Canada) .

හාපර්, ප්‍රතිසංස්කරණ පක්ෂ මන්ත්‍රී මණ්ඩලයේ ඉතා ප්‍රසිද්ධ චරිතයක් බවට පත් විය. ඔහු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය කරුණු කෙරෙහි දැඩි උනන්දුවක් දැක්වූ අතර, 1995 දී කැනඩාවේ පැවැත්වූ ජනමත විචාරණය සඳහා ප්‍රතිසංස්කරණ පක්ෂයේ ප්‍රචාරක කටයුතු සහ එහි සැලසුම් වර්ධනය කිරීමට මහගු සේවයක් ඉටු කළේය. මෙම කාලවකවානුව තුළදී කැනඩාව "විමධ්‍යගත කිරීම සහ නවීකරණය කිරීම" සඳහා තම පක්ෂයට අහිමි වූ ඡන්ද සම්බන්ධයෙන් එනම්, ප්‍රතික්ෂේපිත ඡන්ද සම්බන්ධයෙන් කරුණු විස්සක යෝජනාවලියක් ඉදිරිපත් කිරීමට හාපර් මහතා කටයුතු කරනු ලැබීය.

ප්‍රතිසංස්කරණ සභාවේ මන්ත්‍රීවරයෙක් වශයෙන් සේවය කළ හාපර්ගේ නිල කාලය තුළ ඔහු විෂයන් ගණනාවක් සම්බන්ධයෙන් ගතානුගතික අදහස් කිහිපයක් ඉදිරිපත් කර තිබේ. ඒ අතර, 1994 දී මොහු සමලිංගික යුගල සඳහා කලත්‍ර ප්‍රතිලාභ ලබා දීමට දරන උත්සාහයට තදින්ම විරුද්ධවාදියෙකු ලෙස කටයුතු කිරීම ඔහුගේ සමාජ කතිකාවත් අතර කැපී පෙනේ. ඒ හා සම්බන්ධව ඔහු මෙසේ පැවසීය. " එක්සත් කිරීමේ විෂයට වඩා සැලකිය යුතු සමාජ හා ආර්ථික අභියෝග තිබේ"

("What I hope they learn is not to get into it. There are more important social and economic issues, not to mention the unity question".)

මොහු නායකත්වය කරා පැමිණි ගමනේ තවත් වැදගත් සන්ධිස්ථානයක් වනුයේ, 1998 දී ඔහු ප්‍රගතිශීලී කොන්සවේටිව් පක්ෂයේ නායකත්වය සඳහා තරග කිරීමයි. නමුත්, 2000 වර්ෂයේ දී පැවති මැතිවරණයෙන් හාපර් මහතාට ජය හිමිනොවූ අතර කැනේඩියානු එලායන්ස් පක්ෂයේ (Canadian's Alliance Party) ස්ටොක්වෙල් ඩේ (Stockwell Day) ජය ලබා ගත්තේය. නමුත්, මොහුගේ දුර්වල පාලන ක්‍රියාවලිය හේතුවෙන් එරට තුළ ආර්ථිකය විශාල වශයෙන් පිරිහීමට ලක් විය. ඒ සමඟම නැවතත් ස්ටීවන් හාපර් තම දේශපාලන සැලසුම් ක්‍රියාත්මක කරනු ලැබුවේය. රට තුළ පැවති දේශපාලන හා ආර්ථික අස්ථාවරභාවයන් සමඟ නැවතත් 2002 වර්ෂයේ මාර්තු විසි වන දින කැනඩාවේ නායකත්වය සඳහා වූ නිලවරණයක් ප්‍රකාශ කරන ලදී. මෙම නායකත්ව නිලවරණය හාපර් මහතාගේ දේශපාලන ගමනේ සුවිශේෂී සන්ධිස්ථානයක් බවට පත්විය. ස්ටොක්වෙල් ඩේ මහතාගේ 37%ක ඡන්ද ප්‍රතිශතය පරාජය කරමින් හාපර් මහතා 55%ක ඡන්ද ප්‍රතිශතයක් ලබාගෙන ජයග්‍රහණය ලබා කොන්සර්වේටිව් පක්ෂයෙන් පාර්ලිමේන්තුවට තේරී පත් විය.

2002 වර්ෂයේදී පැවති නායකත්ව නිලවරණයෙන් පසුව, කැනඩාවේ 2004 වර්ෂයේදී ෆෙඩරල් මැතිවරණයක් (Federal Election) පවත්වනු ලැබීය. එහිදී හාපර්ගේ කොන්සවේටිව් පක්ෂයට පරාජය හිමි වූ අතර, පක්ෂය තුළ වූ අභ්‍යන්තර ගැටුම්, මාධ්‍ය නිවේදන හරහා සිදු වූ ප්‍රහාරක දැන්වීම් මීට හේතු සාධක විය. මෙහි දී කැනඩාවේ ඔන්ටාරියෝ හා ක්විබෙක් (Quebeck) ප්‍රාන්තවල ආසන දිනා ගැනීමට ස්ටීවන් හාපර් මහතාට හැකි වූ නමුත් මෙම මැතිවරණයේදී ලිබරල්වාදීන් සුළුතර රජයක් සමඟ නැවත තේරී පත්විය. ඉන්පසුව, වැඩිම ආසන සංඛ්‍යාවක් ලබාගනිමින් ජයග්‍රහණය කරනු ලැබූ පාවුල් මාර්ටින් (Paul Martin) විසින් හාපර් ඇතුළු විපක්ෂ නායකයින් තිදෙනාට ලිපියක් යවමින් සභාග ආණ්ඩුවක් ගොඩනැගීමට ආරාධනා කළ නමුත් හාපර් ඇතුළු අනෙකුත් නායකයන් ද සභාග ආණ්ඩුවක් ගොඩනැගීමේ උත්සාහය ප්‍රතික්ෂේප කරනු ලැබීය.

කැනඩාව තුළ තවදුරටත් විශාල වශයෙන් වර්ධනය වූ දේශපාලන හා ආර්ථික අස්ථාවරභාවය හේතුවෙන් රටෙහි පාලනය නිසිලෙස ගෙන යාමේ විශාල

තර්ජනයකට මුහුණ පෑමට එරට නායකයන්ට සිදු විය. මාටින්ගේ පාලන ක්‍රමවේදයේ දුර්වලතා විශාල වශයෙන් මීට හේතු විය. එබැවින් “මාටින් පාලනය” (Martin Rule) කෙරෙහි විශ්වාසභංග යෝජනාවක් හාපර් මහතා විසින් ඉදිරිපත් කරනු ලැබූ අතර එය වැඩි ඡන්දයෙන් අනුමත වීමත් සමග පාර්ලිමේන්තුව විසිරුවා හරිනු ලැබීය.

ස්ටීවන් හාපර් නායකත්වයට පැමිණීමේදී එහි උච්චතම අවස්ථාව ලෙස, 2006 වර්ෂයේ දී පැවැත්වූ ෆෙඩරල් මැතිවරණය හඳුන්වා දිය හැකිය. මෙම මැතිවරණ ව්‍යාපාරයේ දී ඔහුගේ ප්‍රතිපත්ති සහ දැක්ම හේතුවෙන් ඔහු ජනතාව අතර වඩාත් ජනප්‍රිය වීමත් සමග මොහුගේ කොන්සවේටිව් පක්ෂයට වඩාත් හොඳ ජනතා ආකර්ශනයක් ලබා ගැනීමට හැකි විය. ඒ අනුව 2006 දී පැවති මැතිවරණයෙන් ජය ලබාගත් ස්ටීවන් හාපර් 2006 පෙබරවාරි මස හය වන දින කැනඩාවේ විසි දෙවන අගමැතිවරයා ලෙස දිවුරුම් දුන්නේය.

## නායකත්වයට පැමිණීමෙන් පසු සිදුකළ සේවාව

විසිදෙවන අග්‍රාමාත්‍යවරයා ලෙස ස්ටීවන් හාපර් වසර දහයකට වැඩි කාලයක පටන් කැනඩාවේ ආර්ථික, ආරක්ෂක හා භූ දේශපාලනික අභියෝග මධ්‍යයේ කැනඩාව මෙහෙයවීය.

### ආර්ථිකමය සේවාවන්

හාපර් විසින් සිදු කරන ලද ආර්ථිකමය සේවාවන් අතර, 2008 වර්ෂයේ දී ඇති වූ ගෝලීය ආර්ථික අවපාතය හමුවේ කැනඩාවේ සමකාලීන මිතුරු රාජ්‍යයන්ට බලපෑ කැනේඩියානු ආර්ථිකය ශක්තිමත් ලෙස නැවත ගොඩනැගීමට හාපර්ගේ රජය සමත් විය. ඒ අනුව, 2008 ගෝලීය ආර්ථික අවපාතයෙන් පසු නැවත ආර්ථිකය ශක්තිමත් ලෙස ගොඩනැගීම සම්බන්ධයෙන් කැනඩාව ජී-සෙවන් (G-7) රටවල් අතර හොඳම ආර්ථික කාර්යය සාධනයක් පෙන්නුම් කිරීමට සමත් විය.

හාපර් මහතාගේ රජය 2015 වර්ෂයේ දී අයවැය තුලනය කිරීමේ පොරොන්දුව ඉටු කරනු ලැබීය. හාපර් විසින් 2015 වසරේදී ඉදිරිපත් කරන ලද කැනඩාවේ ආර්ථික ක්‍රියාකාරී සැලැස්ම (Economic Action Plan 2015), සහ විචක්ෂණ මූල්‍ය

කළමනාකාරීත්වය මෙන්ම රැකියා වර්ධනය සහ සුරක්ෂිතභාවය සඳහා රජයේ අවම බදු මට්ටම පවත්වා ගැනීමේ ප්‍රතිපත්තිය ඍජුවම බලපෑවේ ය. 2008 වර්ෂයේ දී ඇති වූ ගෝලීය ආර්ථික අවපාතයේ මුල් අවධියේ සිට, ශුද්ධ නව රැකියා මිලියන 1.2 කට වඩා වැඩි ප්‍රමාණයක් නිර්මාණය කිරීමට හාපර් මහතාගේ රජය සමත් විය. මෙලෙස නිර්මාණය කළ ශුද්ධ නව රැකියාවලින් බහුතරයක් ඉහළ වැටුප් සහිත පුද්ගලික අංශයේ කර්මාන්තවල පූර්ණ කාලීන රැකියා වීමද විශේෂත්වයකි.

ඒ අතරම, හාපර් මහතාගේ රජය බලයට පත් වූ දා සිට සෑම වසරකම බදු අඩු කර ඇති අතර වසර පනහකට වැඩි කාලයක් තුළ අවම සමස්ත ෆෙඩරල් බදු බර (Federal Tax) පවත්වාගෙන ගියේය. ඒ අනුව, 2006 සිට 2015 දක්වා, ආයතනික බදු, දළ දේශීය නිෂ්පාදිතයෙන් (GDP) 2.6% සිට 2% දක්වා පහත වැටුණි. එමෙන්ම, ආදායම් බදු (Income Tax) දළ දේශීය නිෂ්පාදිතයෙන් (Gross Domestic Product) 7.4% සිට 6.9% දක්වා අවම කරන ලදී.

හාපර්ගේ රජය 2008 ඇති වූ ආර්ථික අවපාතයට පෙර කැනඩාව විසින් ලබාගෙන තිබූ ඩොලර් බිලියන තිහක විදේශ ණය නැවත ගෙවා දැමීමට සමත් විය. ඒ අනුව, කැනඩාවේ ශුද්ධ ණය බර ඕනෑම ජී-සෙවන් (G-7) රටකින් අඩුම වීමට සහ දියුණු තත්ත්වයේ පවතින ජී-විස්ස (G-20) රටවල් අතර අවම මට්ටමක පවත්වාගෙන යාමට සමත් විය. 2006 වර්ෂයේ සිට හාපර්ගේ රජය විසින් ගනු ලැබූ ආර්ථික සහ සමාජ ප්‍රතිපත්තිවල ප්‍රතිඵලයක් වශයෙන් සාමාන්‍ය පුරවැසියන් දෙදෙනකුගෙන් යුත් කැනේඩියානු පවුලකට 2015 දී බදු සහන සහ ඩොලර් 6,600 දක්වා වැඩි මූල්‍ය ප්‍රතිලාභ ලබා දීමට ද හැකියාව ලැබුණි.

**සමාජීය සේවාවන්**

හාපර් මහතා විසින් සිදු කරන ලද සමාජීය සේවාවන් අතර අපරාධ යුක්ති විනිශ්චය කිරීමේ අධිකරණ පද්ධතිය (Criminal Justice System) ප්‍රතිසංස්කරණය කිරීමට පියවර ගන්නා ලදී. එමෙන්ම, කැනේඩියානුවන්ගේ ජීවන තත්ත්වය සැලකිය යුතු ලෙස වැඩිදියුණු කිරීමට 2015 වර්ෂයේ දී හාපර් මහතාගේ රජය විසින් ඇතිකළ "2015 ආර්ථික ක්‍රියාකාරී සැලැස්ම" (2015 Economic Action Plan) මඟින් හැකි විය. එපමණක් නොව, මෙම ආර්ථික ක්‍රියාකාරී සැලැස්ම හරහා රජයේ මූල්‍ය කළමනාකරණයද ශක්තිමත් ලෙස සිදු වී ඇත.

එමෙන්ම, හාපර් මහතාගේ රජයේ මැදිහත්වීම යටතේ විශ්ව ළමා ආරක්ෂණ ප්‍රතිලාභය (Universal Child Care Benefit) වැඩි කිරීම සිදුවිය. එමෙන්ම, පවුල් බදු කප්පාදුව හඳුන්වා දීම සහ එමඟින් ළමා ආරක්ෂණ වියදම් වැඩි කර ගැනීම සඳහා දරුවන් සිටින කැනේඩියානු පවුල්වලට උපකාර කිරීමට ද හාපර් මහතාගේ රජය සමත් විය. එම ප්‍රතිලාභවලින් තුනෙන් දෙකක් අඩු සහ මධ්‍යම ආදායම් ලබන කැනේඩියානුවන්ට ලැබීමටද සැලැස්වීය.

ඒ අනුව, හාපර් මහතා නායකත්වයට පැමිණි පසු, තම ධූර කාලය තුළ කැනඩාව වෙනුවෙන් ඉතා විශිෂ්ට සේවයක් සිදුකළ බව පැහැදිලි වේ.

## විදේශ ප්‍රතිපත්තිය

අග්‍රාමාත්‍ය ස්ටීවන් හාපර්ගේ නායකත්වයෙන් යුතු කැනඩාවේ කොන්සවේටිව් පක්ෂ ආණ්ඩුව වසර 70ක පශ්චාත් යුධ කැනේඩියානු රාජ්‍ය තාන්ත්‍රිකත්වයේ විශාල පිබිදීමක් ලෙස දැක්විය හැකිය. සත්‍ය වශයෙන්ම හාපර්, ලිබරල් පක්ෂයේ බහුපාර්ශවික හා ජාත්‍යන්තරවාදී ප්‍රතිපත්තිවලින් ඈත් වූ අතර එක්සත් ජාතීන්ගේ සංගමයේ සාම සාධක කටයුතු, ගැටුම් නිරාකරණය හා බහුපාර්ශවිකවාදය කෙරෙහි කැනඩාවේ අවධාරණය අඩු කළේය.

හාපර්ගේ ධූර කාලය තුළදී විදේශ කටයුතු අමාත්‍ය ධූරය වරින් වර වෙනස් විය. හාපර්ගේ පළමු විදේශ අමාත්‍යවරයා වූයේ, පීටර් මැකේය (Peter MacKay). පසුව, 2007 අගෝස්තු 14 වෙනිදා, කැබිනට් සංශෝධනයකදී මැක්සිම් බර්නියර් (Maxime Bernier) විදේශ අමාත්‍යවරයා බවට පත්විය. 2008 මැයි 26 දින මැක්සිම් බර්නියර් ඉල්ලා අස්වූ අතර ඔහු වෙනුවට ඩේවිඩ් එමර්සන් (David Emerson) පත් විය. එම වසරේදීම, කැනේඩියානු ෆෙඩරල් මැතිවරණයෙන් පසුව ලෝරන්ස් කැනන් (Lawrence Cannon) විදේශ අමාත්‍යවරයා විය. 2011 කැනේඩියානු ෆෙඩරල් මැතිවරණයෙන් ජෝන් බෙයාර්ඩ් (John Baird) විදේශ අමාත්‍යවරයා ලෙස පත් වූ අතර, 2015 පෙබරවාරි 03 වන දින බෙයාර්ඩ් ඉල්ලා අස් වූ අතර ඒ වෙනුවට රොබ් නිකල්සන් (Rob Nicholson) පත්විය.

හාපර්, එක්සත් ජනපදය (United Kingdom) සමඟ විශේෂයෙන්ම එම රටේ ත්‍රස්තවාදයට එරෙහිව යුද්ධයේදී දෙරටේ සහයෝගීතාව ශක්තිමත් කිරීමට උත්සහ

කළේය. මෙම ප්‍රතිපත්තියේ කොටසක් ලෙස, ඔහුගේ ආණ්ඩුව එක්සත් ජනපදය විසින් මෙහෙයවන ලද ඇෆ්ගනිස්ථානයේ යුද්ධයට කැනඩාවේ සහයෝගය අඛණ්ඩව ලබාදුනි. හාපර්, ලිබියානු සිවිල් යුද්ධයේදී (Libyan Civil war) සහ සිරියානු සිවිල් යුද්ධයේදී (Syrian Civil War) කැනඩාව (Canada) මෙහෙයවීය. ඊට සමාන්තරව, හාපර් ඔහුගේ මුළු අගමැතිකම පුරාවටම ඊශ්‍රායලයට (Israel) නිර්දය ලෙස සහය දැක්වීය.

ස්ටීවන් හාපර්ගේ විදේශ ප්‍රතිපත්තිය ඔහුගේ පූර්වගාමීන්ට වඩා බොහෝ වෙනස්වූ බව විචාරක මතයයි. 2013 මැනිං සම්මන්ත්‍රණයේදී කැනේඩියානු විදේශ ප්‍රතිපත්ති මණ්ඩල සාමාජිකයින් අතර පිළිගැනීම වූයේ, ආණ්ඩුව තමාට එරෙහිව නැගෙන ගතානුගතික ව්‍යාපාර කෙරෙහි ප්‍රතිපත්තියක් හෝ එබඳු විදේශ ප්‍රතිපත්තියක් නොමැති බවයි.

ටොරොන්ටෝ ස්ටාර් විචාරක ඉයුජින් ලැන්ග් (Toronto Star Commentator Eugene Lang) ට අනුව හාපර්ගේ විදේශ ප්‍රතිපත්තිය වූයේ, "සියලු යුද්ධ රාජ්‍යතාන්ත්‍රික නැති බවයි". ඔහු හාපර්ගේ අග්‍රාමාත්‍ය ධූර කාලය තුල එරට හමුදාවන් වඩා ක්‍රියාශීලී කාල පරිච්ඡේදයක් ගතකර ඇති බව දක්වයි. ඇත්ත වශයෙන්ම, හාපර් ඇෆ්ගනිස්ථානයේ යුද්ධයට (Afghanistan War) හා ලිබියානු-සිරියානු (Syria-Libya Conflict) ගැටුම්වලටද සහභාගි විය. ඉයුජින් ලැන්ග්ට අනුව, කැනඩාවේ සාමය ප්‍රවර්ධනය කිරීමේ අරමුණ සාක්ෂාත් කරගැනීම සඳහා හාපර් මිලිටරි බලය අධිකව යොදා ගෙන ඇත.

ඇන්ඩෘ නිකිෆොර්ක් (Andrew Nikiforuk)ට අනුව හාපර්ගේ විදේශ ප්‍රතිපත්තිය හැදෑරිය යුත්තේ, කැනඩාව තුළ විවිධ සංක්‍රමණික ප්‍රජා කණ්ඩායම්වල ඡන්ද ලබා ගැනීමට භාවිත කළ මෙවලමක් ලෙසය. ටොරොන්ටෝ හි දෙමළ ප්‍රජාවගේ සහයෝගය දිනාගැනීමේ මාර්ගයක් ලෙස ශ්‍රී ලංකාවේ මානව හිමිකම් උල්ලංඝනය කිරීම් පිළිබඳව හාපර්ගේ මතය මෙහිදී ඔහු පෙන්වා දේ.

2011 ෆෙඩරල් මැතිවරණයේදී කැනේඩියානු යුදෙව්වන්ගේ සහය ලබා ගැනීමට හාපර් විසින් ඊශ්‍රායලයට සහය ලබා දුන් බව තවත් කදිම නිදසුනකි (මොවුන් පෙර මැතිවරණවලදී ලිබරල් පක්ෂයට ඡන්දය දුන් පිරිසකි). ඇන්ඩෘ නිකිෆොර්ක්

නිගමනය කළේ හාපර් සතුව ඩයස්පෝරාව විසින් මෙහෙයවන විදේශ ප්‍රතිපත්තියක් ඇති බවයි.

කැනඩාවේ වාණිජ සබඳතා වෙනුවෙන් බොහෝ පියවරයන් ඔහු විසින් ගෙන ඇත. වෙළඳ සාකච්ඡා ඉන් එකකි. මෙතුමා විසින් කැනේඩියානු-යුරෝපීය වෙළඳ ගිවිසුම (Comprehensive Economic and Trade Agreement), කැනේඩියානු-කොරියා නිදහස් වෙළඳ ගිවිසුම (Canada-Korea Free Trade Agreement), කැනේඩියානු-කොළොම්බියා නිදහස් වෙළඳ ගිවිසුම (Canada Colombia Free Trade Agreement), කැනේඩියානු-ඊශ්‍රායෙල් නිදහස් වෙළඳ ගිවිසුම (Canada Isreal Free Trade Agreement) ආදී ගිවිසුම්වලට එළඹී ඇත. මීට අමතරව ද්වීපාර්ශවීය ආයෝජන, සංවර්ධන ආධාර හරහා කොළොම්බියාව (Colombia), ටැංසානියාව (Tanzania) වැනි දියුණු වෙමින් පවතින ආර්ථිකයන් නගා සිටුවීමට කටයුතු කරන ලද්දේ ඉතා ප්‍රගතිශීලී විදේශ ප්‍රතිපත්තියක් අනුගමනය කරමින්ය.

## ගත හැකි ආදර්ශ

හාපර්ගේ, ආර්ථික, සමාජ සහ දේශපාලන ප්‍රතිපත්තීන් සැමවිටම මානව හිතවාදී සහ දේශීය සංවර්ධනය උදෙසා තුඩු දෙන ඒවා වීම විශේෂත්වයකි. මන්ද යත්, ඔහුගේ ධූර කාලය තුළ කැනඩාවේ ආර්ථිකය දරුණු අවපාතයන්ට මුහුණ දුන් අවස්ථා හෝ දේශපාලනික වශයෙන් අස්ථාවරත්වයට පත් වූ අවස්ථා හෝ සමාජ ව්‍යසනයන්ට ගොදුරු වූ අවස්ථා කිසිවක් කැනේඩියානු දේශපාලන ඉතිහාසය තුළ සටහන් නොවන බැවිනි.

විශේෂයෙන් යටිතල පහසුකම් සංවර්ධනය, ළමා හා කාන්තා සනීපාරක්ෂක සේවා ඇතුළු සෞඛ්‍ය සේවා කෙරෙහි ඔහු ප්‍රමුඛස්ථානය ලබා දීමට කටයුතු කර ඇත. දේශීය-විදේශීය වෙළෙඳ සබඳතා දිරිමත් කරමින් කැනේඩියානු වෙළඳ ජාලය පුළුල් මාවතක් කරා රැගෙන යාම ඔහුගේ ධූර කාලය තුළ කැපී පෙනෙන ලක්ෂණයක් විය. කැනේඩියානු තරුණ-තරුණියන්ගෙන් යුක්ත ශ්‍රම බලකායක් නිර්මාණය කිරීමෙහිලා නව රැකියා අවස්ථා රාශියක් ලබාදීමට ඔහු ගත් වෑයම ප්‍රශංසනීය වේ. ජාතික සමගිය, සහයෝගිතාවය සහ දේශපාලන ස්ථාවරත්වය ඔහුගේ විදේශ ප්‍රතිපත්තීන් හි කැපී පෙනුණු අතර, ඒ සඳහා ඔහු ජාතික සහ ජාත්‍යන්තර සංවිධාන

සමග සම්බන්ධ වෙමින් සහ ඔවුන්ව දිරිගන්වමින් කළ සේවය ඉතා ආදර්ශවත් වූ එකකි.

එමෙන්ම, ලෝක ත්‍රස්තවාදය කෙරෙහි විරුද්ධවාදී අදහස් දැක්වූ ඔහු ත්‍රස්තවාදී බලකඳවුරු නිෂේධ කිරීමෙහිලා ප්‍රබල මැදිහත්කරුවකු වශයෙන් කැනඩාව මෙහෙයවූ අතර, සිය ධූර කාලය තුළ ත්‍රස්තවාදයෙන් පීඩා විඳි රටවල් වෙනුවෙන් පෙනී සිටි නායකයෙක් ලෙස හැඳින්විය හැකිය. ඔහුගේ ප්‍රතිපත්තීන් ඇතැම්විට විවේචනයට බඳුන් වූ ඒවා වුවද සමස්තයක් වශයෙන් ඔහුගේ සේවය ආදර්ශමත් වූ සහ ප්‍රතිපත්තිගරුක වූවක් බව බොහෝ විචාරකයන්ගේ මතයයි.

## සාරාංශය

2015 වසරේ දී ස්වකීය ධූරයට සමුදුන් කැනේඩියානු අගමැති හාපර් එරට ඉතිහාසය තුළ කීර්තිමත් සහ ප්‍රගතිශීලී නායකයෙකු ලෙස බොහෝ දෙනා හඳුන්වනු ලැබේ. ඉහත දැක්වූ පරිදි ඔහුගේ ළමා කාලය තුළින් ගොඩනගා ගත් අධ්‍යාපනික පසුබිම සමග ගොඩනගා ගත් දේශපාලනික ප්‍රතිරූපය නිසා 2015 වසරේ දී කැනඩාවේ විසි දෙවන අගමැතිවරයා ලෙස ධූරයට පැමිණි ඔහු ස්වකීය පාලන සමය තුළ ආර්ථික ප්‍රතිපත්තීන් කෙරෙහි වැඩි නැඹුරුවක් දැක්වූ බව පෙනෙන්නට තිබෙන කරුණකි. එමෙන්ම, ඔහුගේ විදේශ ප්‍රතිපත්තීන් කැනඩාවේ ප්‍රගමනය උදෙසා සැම විටම බලපෑ බව කීම අපහසුය. මන්ද, ඔහුගේ ප්‍රතිපත්තීන් විවේචනයට ලක්වූ අවස්ථාද කැනේඩියානු නූතන ඉතිහාසයෙහි කියැවීම්වල දක්නට ලැබේ.

ඉහත දැක්වූ පරිදි ඔහුගේ සේවය කැනඩාවේ ආර්ථික පිබිදීම කෙරෙහි සෘජුවම බලපෑ නමුත් වසර දහයකට ආසන්න පාලන සමය තුළ කැනේඩියානුවන් වෙහෙසට පත්ව සිටි බවත්, ඔවුන් නව වෙනසක් උදෙසා දේශපාලන විප්ලවයක් බලපොරොත්තු වූ බවත් කියැවේ. එහි ප්‍රතිඵලයක් ලෙස 2015 ජනාධිපතිවරණයේ දී ජනතා බලය විසින් ස්වකීය නව අගමැතිවරයා ලෙස ජස්ටින් තෲඩෝ (Justin Trudeau) පත් කරගෙන ඇත. මෙහිදී නිගමනය කළ හැකි කරුණ වන්නේ, හාපර් සැමවිටම විශිෂ්ටයකු ලෙස කැනේඩියානුවන් පිළිනොගත් බවත්, එහෙත් ඔහුගේ බොහෝ ආර්ථික ප්‍රතිපත්තීන් ශක්තිමත් සහ දූරදර්ශී ඒවා වූ බවත් ය. ඒ අනුව

හාපර් යනු, ජාත්‍යන්තර දේශපාලනය තුළ ආර්ථික විද්‍යාඥයෙකු, ප්‍රබල දේශපාලන මැදිහත්කරුවෙකු සහ අගමැතිවරයෙකු ලෙස තුලනාත්මක මෙහෙවරක් ඉටුකළ ආදර්ශමත් නායකයෙක් වූ බවයි.

# මූලාශ්‍ර නාමාවලිය

CODY, H., 2009. *American Review of Canadian Studies.* [Online] Available at: https://www.tandfonline.com/doi/pdf/10.1080/02722010809481819

Dean, P. W. L. a. R., 2016. *Canada's Northern Strategy under Prime Minister Stephen Harper,* s.l.: s.n.

Fletcher, R., 2016. *Stephen Harper's long political path from plucky upstart to the nation's helm.* [Online] Available at: https://www.cbc.ca/news/canada/calgary/stephen-harper-political-path-video-archive-1.3736053
[Accessed 26 Aug 2016].

Kukucha, C. J., 2009. *Constitutional Studies.* [Online] Available at: https://www.constitutionalstudies.ca/wp-content/uploads/2019/08/14RevConstStud21.pdf

Laird, R. A., 2018. *Canadian Feminist Foreign Policy from Harper to Trudeau and Beyond,* s.l.: s.n.

McIntosh, A., 2012. *The Canadian Encyclopedia.* [Online] Available at: https://www.thecanadianencyclopedia.ca/en/article/stephen-joseph-harper

News, B., 2016. *BBC News.* [Online] Available at: https://www.bbc.com/news/world-us-canada-13217949

"මහජන මුදලින් අධ්‍යාපනය ලැබූ අප
ලත් දැනුමෙන් රට දැය පෝෂණය කරමු"

# ලොව දිනූ චරිත

# 5

අනාගත පරපුර ලෙස
ලොව සුවිශේෂී චරිත කෙරෙන්
අපගේ ජීවිතයට
උකහා ගත හැකි
යහපත් දේ බොහෝ වෙතත්
මෙකී චරිත පිළිබඳව
සිංහල භාෂාවෙන් ලියවුනු
ග්‍රන්ථ සහ ලිපි
ඉතා අල්ප වේ.
පාඨකයන්ට
මෙවන් වූ
සුවිශේෂී චරිත පිළිබඳව
තොරතුරු දැනගැනීමේ අවස්ථාව
සීමා වී ඇති හෙයින්
එකී අඩුව පිරවීම උදෙසා
සිදුකරන ලද
සාමූහික ප්‍රයත්නයක
ප්‍රතිඵලයකි මේ.

ජාත්‍යන්තර අධ්‍යයනය අධ්‍යනාංශය
කැලණිය විශ්වවිද්‍යාලය